## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව

# 2018

## විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය

විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය කහ පැහැති පසුබිමක වෘත්තාකාර ස්වරූපයකින් තිබෙන අතර එහි පරිවරණයේ ඒක කේන්ද්‍රීය වෘත තුනක් එකිනෙකට සමීපව පිහිටා ඇත. මෙම වෘත්ත මධ්‍යයේ කුඩා ඒක කේන්ද්‍රීය වෘත්තයක නෙළුම් මලක් සටහන් වී ඇති අතර නෙළුම් මලේ එක් පෙති තට්ටුවක් යටින් තවත් පෙති තට්ටුවක් ආකාරයට පෙති තට්ටු දෙකක් වේ. වෘත්තය මධ්‍යයේ ඒක කේන්ද්‍රීය .වෘත්ත දෙකට මැදවී මලේ කේශර පිහිටා ඇත. නෙළුම් මල පිහිටි ඒක කේන්ද්‍රීය වෘත්ත යන්ට පිටතින් ද ඒක කේන්ද්‍රීය වෘත්ත තුනට මැදි වන සේ විශ්වවිද්‍යාලයේ නම සිංහල අක්ෂර වලින් දැක්වේ. එහි ඉහළින් පුරාණ බෞද්ධ ග්‍රන්ථයකින් උපුටා ගත් “විජ්ජා උපප ත තං සෙට්ඨා” (“සියල්ල අතරින් ප්‍රඥාව ශ්‍රේෂ්ඨය”)

යනුවෙන් සඳහන් ආදර්ශ පාඨය සඳහන් වේ.

## විශ්වවිද්‍යාලයේ දැක්ම

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යමත් කිරීම

## විශ්වවිද්‍යාලයේ මෙහෙවර

අපගේ අධ්‍යාපන සම්ප්‍රදාය තුලින් තිරසාර අනාගතයක් උදෙසා සංස්කෘතික උරුමයෙන් හා ප්‍රඥාවෙන් ප්‍රබෝධමත් වූ ගෝලීය ප්‍රවීණත්වයෙන් යුතු පුරවැසියන් බිහි කිරීම

# උපකුලපතිතුමාගේ සමාලෝචනය



## හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ඉතිහාසය හා බැඳී පවත්නා අප්‍රතිහත ධෛර්යය විදහා දැක්වූ 2018 වර්ෂය විශ්වවිද්‍යාලයට අතිශයින් වැදගත් වර්ෂයකි. ආරම්භයේ දී එනම් 2018 පෙබරවාරි තුන් වන දින විශ්ව විද්‍යාල කුලපති ධුරන්ධර මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනු නා හිමියන්ගේ කණගාටුදායක අපවත් වීම සිදු විය.

විශ්ව විද්‍යාලයේ අටවන කුලපති වශයෙන් සියම් නිකායේ කෝට්ටේ කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ මහා නායක අතිපූජ්‍ය ඉත්තෑපාන ධම්මාලංකාර මහා නායක හිමිපාණන් 2018 පෙබරවාරි 28 දින සිට වසර පහක් සඳහා විශ්ව විද්‍යාලයේ කුලපති ධුරයට පත් විය.

වසරේ ප්‍රථම කාර්තුව විශ්වවිද්‍යාලයට අභියෝගාත්මක කාලයක් විය. මෙම කාලයේ දී විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට එළඹීම හේතුවෙන් විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යාම දුෂ්කර වූ නමුත් විදේශ සබඳතා හා දේශීය කර්මාන්ත සමඟ ද්විපාර්ශික හා සාමූහික සබඳතා පවත්වා ගෙන සිටිමින් අනෙකුත් වැඩසටහන් මනා ලෙස පවත්වා ගෙන යාමට විශ්වවිද්‍යාලය සමත් විය. වෘත්තීය සමිති ක්‍රියාමාර්ග කාලසීමාව තුළ විදේශීය හා දේශීය උසස් අධ්‍යාපන ආයතන සමග අවබෝධතා ගිවිසුම් කීපයකට ම එළඹීමට හැකි වීම වැදගත් කරුණකි.

වෘත්තීය සමිති ක්‍රියාමාර්ග 2018 අප්‍රේල් මස 18 වන දින නිම වීමත් සමග විශ්වවිද්‍යාලය යළිත් ජවසම්පන්න ලෙස සුපුරුදු ක්‍රියාවන්හි නියැළිනි. විශ්වවිද්‍යාලය කඩ ඉම් සලකුණු කළ වැදගත් වසරක් වූ 2018 ක්‍රමවත් ලෙස වෛද්‍ය විද්‍යාපීඨ වසර විසිපහක් පිරීම නිමිත්තෙන් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී "වෙදැස 2018" නමින් වෛද්‍ය ප්‍රදර්ශනයක් පැවැත්විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ 7කින් සමන්විත වේ. එනම්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය, වෛද්‍ය විද්‍යා පීඨය, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, තාක්ෂණ පීඨය හා ඉංජිනේරු පීඨයයි. සම සෞඛ්‍ය විද්‍යා පීඨය 2019 මුල් කාර්තුව තුළ ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ.

මීට අමතරව කොළඹ 8, ලෙස්ලි රණගල මාවතෙහි පිහිටි කළමනාකරණ විද්‍යාව උපාධි ආයතනය විශ්ව විද්‍යාලයට අනුබද්ධ ආයතනයකි. මෙම ආයතන සිය අධ්‍යයන කටයුතු මැදපෙරදිග රටවල් වල ද ක්‍රියාත්මක කරයි.

සමාලෝචිත වසර තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශ සංඛ්‍යාව වැඩි වී ඇත. 2017 දී 12,141 වූ ශිෂ්‍ය සංඛ්‍යාව මේ වසරේ දී 12,608 ලෙස කැපී පෙනෙන වර්ධනයක් දක්වා ඇත. එමෙන්ම 2014 වසර අවසානයේ දී 174,118 ක් වූ බාහිර උපාධි ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව ද 2018 වසර අවසානයේ දී 177,197 දක්වා වැඩි වී ඇත. තවද 2017 වසරේ පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව 1221 වූ අතර 2018 දී එය 1998 විය.

සමාලෝචිත වසර තුළ දී විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා නව පත්වීම් සංඛ්‍යාව ද වැඩි වී ඇත. 2017 දී 887 වූ අධ්‍යයන කාර්ය මණ්ඩලය 2018 දී 931 විය. සමස්ත කාර්ය මණ්ඩලය 2017 දී 1598 ක් වූ අතර 2018 දී 1726 දක්වා වර්ධනය සනිටුහන් කරයි.

නව අධ්‍යයන අංශ දෙකක් සමාලෝචන වසර තුළ දී ස්ථාපනය කරන ලදි. ව්‍යවහාරික විද්‍යා පීඨයේ බහුඅවයවික විද්‍යා අධ්‍යයනාංශය. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පැවති ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනය ලෙස වැඩිදියුණු කරන ලදි. ඒ අනුව 2018 අවසානයේ දී විශ්ව විද්‍යාලයේ අධ්‍යයන අංශ 62න් සමන්විත වේ.

විශ්වවිද්‍යාලය සෑම විටම එය හා සම්බන්ධ ප්‍රධාන පාර්ශවයන් හට විශිෂ්ටතම පහසුකම් සැලසීම සඳහා කැපවී ඇති ආයතනයකි, ඒ අනුව අධ්‍යයන අංශ ගණනාවක් අලුත්වැඩියා කිරීම හා නව භාණ්ඩ හා උපකරණ ලබා දීම සිදු කෙරුණි. විශ්වවිද්‍යාල නේවාසිකාගාර පහසුකම් ලබා දීමේ හැකියාව සංඛ්‍යාව 2017 අවසානයේ දී 4555 වූ අතර එය 2018 වසරේ දී 5424 දක්වා වැඩි වී ඇත.

දැනුමෙන් හා හැකියාවෙන් පෝෂිත මානව සම්පත් ජාතියට දායාද කරමින් විශ්වවිද්‍යාලය තිරසාර විශ්වවිද්‍යාලයක් බවට පත් වීමේ අරමුණ ඇතිව යන ගමන් මගෙහි ස්වයං මූල්‍ය ඉපයීම 2017 අවසානයේ දී රුපියල් 499,134,029 වූ අතර 2018 අවසානයේ දී තීව්‍ර වර්ධනයක් එනම් රුපියල් 606,609,357 සනිටුහන් කර ඇත.

අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නායක හිමිපාණන් හා අති පූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත හිමිපාණන් වහන්සේලාගේ පුරෝගාමීත්වය නොවන්නට අද සාර්ථක විශ්වවිද්‍යාලයක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පැවැත්මක් නොවන බව සඳහන් කළ යුතු ය. කෘතගුණ සැලකීමේ වස් එම නාහිමි දෙපොළ ගේ වාර්ෂික ගුණානුස්මරණ උත්සවයන් මෙම වසරේ දී ද පිළිවෙළින් අප්‍රේල් 26 හා ජුලි 18 දිනයන්හි පැවැත්විණි.

## විශ්වවිද්‍යාලයේ ඉතිහාසය

විශ්ව විද්‍යාලයේ ඉතිහාසය අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නායක හිමියන් නායකත්වයෙන් හා අනුශාසකත්වයෙන් 1873 දී ආරම්භ කරන ලද වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මේ දක්වා පැමිණි ප්‍රගතියේ දිගු ගමන් මග මෙම වාර්තාවෙහි ඉදිරි පිටුවලින් විද්‍යාමාන වේ. එදා මෙම විශ්ව විද්‍යාලය ආරම්භ වූයේ එවකට අප රටෙහි පැවති උසස් අධ්‍යාපන ආයතනයන් වූ පිරිවෙන් දෙකෙන් එකක් වශයෙනි.

1958 අංක 45 දරන විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත මගින් ස්ථාපනය කළ විද්‍යෝදය විශ්වවිද්‍යාලය 1959 පෙබරවාරි 18 වන දින ආරම්භ විය. විද්‍යෝදය පිරිවෙන හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමිපාණන් විසින් ආරම්භ කරන ලද්දේ කොළඹ මාලිගාකන්ද ප්‍රදේශයේ වූ අතර වර්තමාන පිහිටීම වන ගංගොඩවිල ප්‍රදේශයේ විශ්වවිද්‍යාලය ස්ථාපනය වූයේ 1961 දීය. 1971 ලංකා විශ්වවිද්‍යාල පනත මගින් විද්‍යෝදය විශ්වවිද්‍යාලය ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යෝදය මණ්ඩපය බවට පත් විය. මෙම පනත අත්හිටුවා නව විශ්වවිද්‍යාල පනත එනම් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත බල ගන්වන ලදි. එම පනතට අනුව වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යන නාමය හිමි විය.

විශ්වවිද්‍යාලය එදා සිට අද දක්වා පැමිණි විශිෂ්ට ගමන් මග සනිටුහන් කිරීම පිණිස විශ්ව විද්‍යාලයට හැට වසරක් පිරීම මෙන් ම පිරිවෙන් ලෙස ආරම්භ වී එක සිය හතළිස් පස් වසරක් පිරීම, 2019 වසරේ දී ඉදිරි දියුණුව වෙත මං පෙත් හෙළි කිරීම වෙනුවෙන් වූ වැඩසටහන් වලින් සමන්විත අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට සමාලෝචිත වසරේ දී අඩිතාලම දමන ලදි.

පටුන

විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය .......... 3
විශ්වවිද්‍යාලයේ දැක්ම.......... 3
විශ්වවිද්‍යාලයේ මෙහෙවර .......... 3
උපකුලපතිතුමාගේ සමාලෝචනය .......... i
හැඳින්වීම.......... i
විශ්වවිද්‍යාලයේ ඉතිහාසය .......... ii
2018 වර්ෂයේ කාර්ය සාධන වාර්තා සාරාංශය .......... 1
ශිෂ්‍ය සම්බන්ධතා හා සුබසාධන කටයුතු.......... 1
2018 උපාධි අපේක්ෂක / පශ්චාත් උපාධි අපේක්ෂක වාර්තාව .......... 1
විදේශික ශිෂ්‍ය විස්තර .......... 1
උපාධිධාරී සාරාංශය .......... 2
නේවාසික පහසුකම් .......... 3
විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර .......... 3
**කාර්ය මණ්ඩල සාරාංශය** .......... 4
2018 වසර තුළ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහයක හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාරාංශය.......... 4
පරිපාලන හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩල විස්තර .......... 4
අනධ්‍යයන කාර්ය මණ්ඩලය .......... 5
මේ දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත ව සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය හා 2018 වසර තුළ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර වාර්තාව.......... 5
2018 වසරේ මතකයේ රැඳුණු ඡායාරූප කිහිපයක්.......... 6
පොදු හැඳින්වීම සහ පරිපාලනය .......... 9
විශ්වවිද්‍යාලය .......... 9
විශ්වවිද්‍යාලයේ නිලධාරීන්.......... 9
විශ්වවිද්‍යාලයේ පාලක බල මණ්ඩලය.......... 11
රැස්වීම්.......... 13
පරිපාලන නිලධාරීන්.......... 14
**මූල්‍ය පරිපාලන නිලධාරීන්** .......... 15
විශ්වවිද්‍යාලයේ පරිපාලන ව්‍යුහය.......... 17
විශ්වවිද්‍යාලයේ පීඨ .......... 19
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය .......... 19
පීඨය මඟින් පිරිනමන උපාධි හා ඩිප්ලෝමා .......... 20
පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා.......... 21
ඩිප්ලෝමා පාඨමාලා .......... 21
සහතික පත්‍ර පාඨමාලා .......... 22
පීඨය මගින් නිකුත් කරන ප්‍රතිඵල.......... 22
පීඨය නිකුත් කළ 2017 හා 2018 වසර වල ප්‍රථිඵල සංසන්දනය .......... 23

ශිෂ්‍ය සම්පත් විස්තරය....................23
දේශිය ශිෂ්‍ය විස්තර....................24
අධ්‍යයන කාර්ය මණ්ඩලය....................25
අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර....................25
සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන....................26
වැඩසටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර....................26
ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර....................27
ව්‍යවහාරික විද්‍යා පීඨය....................28
2018 වසරේ පීඨයෙන් නිකුත් කරන ලද ප්‍රථිඵල.....................30
2017 හා 2018 වසර ප්‍රථිඵල සංසන්දනය....................31
2018 ශිෂ්‍ය සම්පත් විස්තරය....................32
2018 දේශිය ශිෂ්‍ය සම්පත් විස්තරය....................32
අධ්‍යයන කාර්යමණ්ඩල විස්තර....................33
අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර....................34
සිදුකරන ලද පර්යේෂණ,නවෝත්පාදන හා ප්‍රකාශන....................34
වැඩ සටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු....................34
ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර....................35
නව පාඨමාලා ආරම්භකිරීම් පිළිබඳ විස්තර....................35
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය....................36
පිරිනමන උපාධි,ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා....................37
2018 වර්ෂය සඳහා පීඨය මඟින් නිකුත් කරන ලද ප්‍රතිඵල....................39
2017 හා 2018 නිකුත් කරන ලද ප්‍රතිඵල අතර සංසන්දනය....................39
දේශීය සිසුන්ගේ විස්තර....................41
කාර්ය මණ්ඩල විස්තර....................41
අධ්‍යයන කාර්යමණ්ඩල විස්තර....................41
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර....................42
පීඨය මගින් පවත්වන ලද වැඩසටහන්....................42
වෛද්‍ය විද්‍යා පීඨය....................44
පීඨය මගින් පිරිනමන උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා....................45
පීඨය මගින් නිකුත් කරන ලද ප්‍රතිඵල - 2018....................45
2017 හා 2018 වසර වල ප්‍රතිඵල සැසඳීම....................46
ශිෂ්‍ය සම්පත් විස්තරය....................46
දේශීය ශිෂ්‍ය විස්තරය....................46
අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර....................47
අනධ්‍යයන කාර්ය මණ්ඩලය....................48
පර්යේෂණ නවෝත්පාදන සහ ප්‍රකාශන....................48
වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු....................48

ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර ........ 48
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය ........ 50
**ශිෂ්‍ය දත්ත** ........ 52
උපාධි අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ආරාධිත දේශන ........ 57
හරිත විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය ........ 58
උපාධි අධ්‍යයන පීඨය මගින් අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම් ........ 58
**තාක්ෂණ පීඨය** ........ 59
2018 පීඨයෙන් නිකුත් කළ ප්‍රතිපල පිළිබඳ විස්තර ........ 60
ශිෂ්‍ය හා සම්පත් විස්තරය ........ 61
දේශීය ශිෂ්‍ය විස්තරය ........ 61
අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තරය ........ 61
අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර ........ 61
සිදුකරන ලද පර්යේෂණ,නවෝත්පාදන හා ප්‍රකාශන ........ 62
පවත්වන ලද වැඩ සටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු විස්තර ........ 62
ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර ........ 62
ආරම්භකරන ලද නව පාඨමාලා  පිළිබඳ විස්තර ........ 62
ඉංජිනේරු පීඨය ........ 63
පීඨය මගින් පිරිනමනු ලබන උපාධි ........ 63
ශිෂ්‍ය සම්පත් විස්තරය ........ 63
දේශිය ශිෂ්‍ය විස්තරය ........ 63
අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර ........ 64
අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර ........ 64
සිදුකරන ලද පර්යේෂණ, නිවෝත්පාදන සහ ප්‍රදර්ශණ ප්‍රමානය ........ 64
වැඩ සටහන්,සම්මන්ත්‍රණ හා වැඩමුළු විස්තර ........ 65
ලැබූ පුදාන පිළිබඳ විස්තර ........ 65
සම්මානයෙන් පිදුම් ලද විස්තර ........ 66
සුචිගත සගරාතඅළ ප්‍රකාශිත සම්පූර්ණ පත්‍රිකා ලැයිස්තුව ........ 66
2018 දී පේටන් බලපත්‍ර විස්තර ........ 66
2018 දී විද්‍යා හා තාක්‍ෂණ සංවර්ධන නිමැවුම් විස්තර ........ 67
අභ්‍යන්තර උපාධි /පශ්චාද් උපාධි ඉගැන්වීම් කටයුතු සඳහා අන්තර්ජාතික කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පැවැත්වූ වැඩමුළු ........ 67
ශිෂ්‍ය කටයුතු හා ශිෂ්‍ය සුභසාධන කටයුතු ........ 68
සිසුන් ලියාපදිංචි කිරීම ........ 68
සිසුන් ලියාපදිංචිය පිළිබඳ තොරතුරු ........ 68
මහපොළ ශිෂ්‍යත්ව ........ 69
ශිෂ්‍යාධාර ........ 70
විභාග අංශය ........ 71

විභාග රාජකාරී කටයුතු......71
උපාධි ප්‍රදානෝත්සව කටයුතු......72
ස්වර්ණ මුද්‍රිකා......72
සහතික නිකුත් කිරීම හා සනාථ කිරීම......73
වෙනත් කටයුතු......73
විශ්වවිද්‍යාලීය වෛද්‍ය මධ්‍යස්ථානය......73
ශාරීරික අධ්‍යාපන අංශය......73
හැඳින්වීම......73
ශාරීරික අධ්‍යාපන අංශයේ අරමුණු......74
ක්‍රීඩා උපදේශක මණ්ඩලය......74
ක්‍රීඩා සංගමය......74
ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ තරගාවලි......75
2018 දී අප විසින් මෙහෙයවන ලද විශේෂ සිදුවීම්......76
2018 අන්තර් විශ්වවිද්‍යාල ශූරතා ප්‍රතිඵල......77
ශූරයින්ගේ ඡායාරූප......78
වසර තුළ සහභාගි වූ දේශීය ක්‍රීඩා තරගාවලින් (ආරාධිත හා අනෙකුත් තරග)......79
වර්ණ ප්‍රදානය......80
ක්‍රීඩා පහසුකම්......80
**වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය**......82
**වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමය (CSDS)**......82
ජ'පුර සේවා නියුක්ති නිපුණතා සම්මාන 2018 (JESA 2018)......83
සාමාන්‍ය පාලන හා සේවා අංශය......90
කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය......91
තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය......97
බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය......98
පුස්තකාලය......99
අභ්‍යන්තර විගණන අංශය......101
මූලධන සේවා හා සැලසුම්......102
2018 වර්ෂය තුළදී අධ්‍යයන, පරිපාලන,අධ්‍යයන සහයක සහ අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර......105
වර්ෂය තුළ අධ්‍යායන, පරිපාලන, වෙනත් මාණ්ඩලික සහ අධ්‍යයන සහයක කාර්යමණ්ඩලය......105
**පර්යේෂණ කවුන්සිලය**......112
**පිරිනමන ලද විශ්ව විද්‍යාල පර්යේෂණ ප්‍රතිපාදන සංඛ්‍යාව (2015-2018)**......114
**පිරිනමන ලද විදේශ චාරිකා ප්‍රදාන (OTG)- 2018**......115
පර්යේෂණ මධ්‍යස්ථාන......117
පර්යේෂණ සම්මාන 2017......118
**අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය** (IQAU)......121
ඉදිරි සැලසුම්......129

වාර්ෂික ගිණුම් වාර්තා ........................................................................................................................................ 131

පුනරාවර්තන වියදම් විස්තර 2018 ........................................................................................................ 132

මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 2018 පීය වශයෙන් එක් ශිෂ්‍යයකු සඳහා වන වියදම (අභ්‍යන්තර උපාධි අපේක්ෂ) ........................................................................................................................................ 133

මූලධන වියදම් විස්තරය 2015-2018 (රු'000) ........................................................................................ 133

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ පුනරාවර්තන වියදම් – 2018 රු. ( '000) .................................................... 133

පසුගිය වසර 5ක කාලය තුළ මූල්‍යමය තත්වය (අගයන් රු.'000 වශයෙන්) ............................................ 134

පසුගිය වසර 5ක කාලයේ දී මූල්‍යමය තත්වය (අගයන් රු.'000) ............................................................ 135

පසුගිය වසර 5ක කාලයේදී මූල්‍ය ප්‍රතිපාදනයන්හි තත්වය (අගයන් රු.'000) ............................................ 136

2018 දෙසැම්බඡ් 31 දිකට මූල්‍ය තත්ව පිළිබද ප්‍රකාශය8 ................................................................. 137

2018 දෙසැම්බර් 31 දිනත් අවසන් වසරට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ................................................... 139

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය .............................................. 140

යොදාගනු ලැබූ වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය 2018 ......................................................... 143

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(I) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව ........................ 155

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අනුකූලව ගන්නාලද ක්‍රියාමාර්ග ........................................................................ 171

# 2018 වර්ෂයේ කාර්ය සාධන වාර්තා සාරාංශය

## ශිෂ්‍ය සම්බන්ධතා හා සුබසාධන කටයුතු

### 2018 උපාධි අපේක්ෂක / පශ්චාත් උපාධි අපේක්ෂක වාර්තාව

| පීඨයන් | අධ්‍යයනාංශ | පාඨමාලා | මුලු ශිෂ්‍ය සංඛ්‍යාව එකතුව | උපාධිධාරීන් 2018 |
|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 14 | 24 | 3308 | 816 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 11 | 11 | 2378 | 590 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 12 | 12 | 4869 | 1267 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 17 | 5 | 1052 | 110 |
| තාක්ෂණ පීඨය | 03 | 03 | 642 | - |
| ඉංජිනේරු පීඨය | 05 | 01 | 361 | - |
| පශ්චාද් උපාධි අධ්‍යයන | - | | 1998 | |
| බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා | 14 + 05 | 6 | 3036* | 2405 |

* 2018 ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව

### විදේශික ශිෂ්‍ය විස්තර

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | 2018 නව බඳවා ගැනීම | 1වන | 2වන | 3වන | 4වන | 5වන | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වසර ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | |
| මානව ශාස්ත්‍ර | පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ ශිෂ්ටාචාරය | ඉංග්‍රීසි | 03 | 03 | 04 | - | - | | |
| ව්‍යවහාරික | ජීව විද්‍යා | ඉංග්‍රීසි | | | 01 | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| කළමනාකරණ | | | - | - | - | - | - | | |
| වෛද්‍ය | MBBS | ඉංග්‍රීසි | | | | | | 11 | |
| තාක්ෂණ | | ඉංග්‍රීසි | - | | | | | | |
| ඉංජිනේරු | | ඉංග්‍රීසි | - | | | | | | |

## උපාධිධාරී සාරාංශය

| **පීඨය** | පළමු පෙළ | දෙවන පෙළ ඉහල | දෙවන පෙළ පහළ | සමත් | සමත් මුලු ගණන |
|---|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර | 65 | 466 | 202 | 105 | 838 |
| ව්‍යවහාරික | 50 | 169 | 104 | 267 | 590 |
| කළමනාකරණ | 141 | 308 | 273 | 554 | 1276 |
| වෛද්‍ය | 01 | 26 | 25 | 58 | 110 |



## නේවාසික පහසුකම්

විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් හා සපයන ලද නේවාසික පහසුකම් පහත සඳහන් පරිදි වේ:

| පීඨය | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 1798 | 273 | 2071 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 236 | 100 | 336 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 1171 | 384 | 1555 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 184 | 156 | 340 |
| තාක්ෂණ පීඨය | 172 | 201 | 373 |
| ඉංජිනේරු පීඨය | 26 | 100 | 126 |
| **එකතුව** | 3587 | 1214 | 4801 |

## විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර

| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | තාක්ෂණ පීඨය | ඉංජිනේරු පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1524 | 1058 | 180 | 101 | 16 | - | 2879 |

විශ්වවිද්‍යාලය මගින් නඩත්තු කරන ලද හෝ කුලී පදනම මත පවත්වා ගෙන යන ලද නේවාසිකාගාර හා එහි නේවාසික සිසුන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | තාක්ෂණ පීඨය | ඉංජිනේරු පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 547 | 468 | 160 | 264 | 357 | 126 | 1922 |

නේවාසික මුලු සිසුන් සංඛ්‍යාව = 2879+ 1922 =4801

මුලු සිසුන් සංඛ්‍යාව = 14608

නේවාසික මුලු සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය = $\frac{4801}{14608} \times 100\ \%$

33%

2018 වසර තුළ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහයක හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාරාංශය

## අධ්‍යයන කාර්ය මණ්ඩල

| **පීඨය** | **අනුමත තනතුරු** | **පවතින තනතුරු *** | **පුරප්පාඩු** |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 167 | 131 | 36 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 160 | 133 | 27 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 229 | 175 | 54 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 169 | 139 | 30 |
| ඉංජිනේරු පීඨය | 31 | 13 | 18 |
| තාක්ෂණ පීඨය | 61 | 29 | 32 |
| පුස්තකාලය | 14 | 13 | 1 |

- ඇතුළත් කර අත්තේ ස්ථිර කාර්ය මණ්ඩලය පමණි

## පරිපාලන හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩල විස්තර

| කාර්ය මණ්ඩල | අනුමත තනතුරු | පවතින තනතුරු* | පුරප්පාඩු |
|---|---|---|---|
| පරිපාලන තනතුරු | 38 | 36 | 2 |
| වෙනත් විධායක තනතුරු | 16 | 8 | 8 |
| වෛද්‍ය නිලධාරි | 7 | 3 | 4 |
| අධ්‍යයන සහයක තනතුරු | 80 | 40 | 40 |

## අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| පීඨය | අනුමත තනතුරු | පවතින තනතුරු | පුරප්පාඩු |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 50 | 50 | 0 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 127 | 118 | 9 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 84 | 75 | 9 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 188 | 170 | 18 |
| ඉංජිනේරු පීඨය | 62 | 35 | 27 |
| තාක්ෂණ පීඨය | 70 | 29 | 41 |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | 17 | 16 | 1 |
| පරිපාලන හා අනෙකුත් සේවා | 574 | 527 | 47 |
| එකතුව | 1172 | 1020 | 152 |

## මේ දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත ව සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය හා 2018 වසර තුළ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර වාර්තාව

| පීඨය | 2018.12.31 දිනට අධ්‍යයන නිවාඩු ලබා සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය | පශ්චාද් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර 2018 වසර තුළ විශ්වවිද්‍යාල සේවයට වාර්තා කළ අධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | 09 | 01 |
| ව්‍යවහාරික විද්‍යා | 15 | 03 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා | 21 | 03 |
| වෛද්‍ය විද්‍යා | 16 | 07 |
| තාක්ෂණ | - | - |
| ඉංජිනේරු | - | - |


අපේ කුලපති නා හිමි


අතිපූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමිපාණන්ගේ ආදාහන පූජෝත්සවය
www.sjp.ac.lk


Ven. Dr. Ittapana Dhammalankara Thero Assumed Duties as the Chancellor
www.sjp.ac.lk


අතිපූජ්‍ය ඉත්තෑපාන ධම්මාලංකාර හිමියන්
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
කුලපති ධූරයට






University of Sri Jayewardenepura
proudly presents
MEDICAL
EXH ION






MOU Between USJP and RIT International, USA

DELIVERING
Dialog




Faculty of Engineering to be established in Kottawa

## පොදු හැඳින්වීම සහ පරිපාලනය




### විශ්වවිද්‍යාලය

අංක 45 දරණ විද්‍යොදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත යටතේ 1959 ජනවාරි 01 දින විද්‍යෝදය විශ්වවිද්‍යාලය පිහිටවන ලදි. 1972 අංක 1 දරණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව එය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල විද්‍යොදය මණ්ඩපය නමින් හැඳින්විණි. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධි විධාන අනුව එය නැවතත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නමින් හැඳින්විණි.

ප්‍රතිපත්ති සැලසුම්, අධ්‍යයන හා පරිපාලන ක්‍රියාවලිය, පනතේ විධිවිධාන අනුව නිල බල මණ්ඩල මගින් සිදු කෙරේ. පාලක සභාව, සනාතන සභාව, පීඨ මණ්ඩල, පශ්චාද් උපාධි අධ්‍යානය මණ්ඩල විශ්වවිද්‍යාලයේ නිල බල මණ්ඩල වේ.

විශ්වවිද්‍යාලයේ විවිධ නිලධාරීන් විසින් මෙම මණ්ඩලවල තීරණ ක්‍රියාත්මක කරනු ලැබේ.

## විශ්වවිද්‍යාලයේ නිලධාරීන්

| | |
|---|---|
| කුලපති | මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි |
| | ඉත්තෑපානේ ධම්මාලංකාර මහ නායක නාහිමි |
| උපකුලපති | මහාචාර්ය සම්පත් අමරතුංග මහතා |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | ආචාර්ය ඩී.පී.එස්.චන්ද්‍රකුමාර |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්ය එස්.එස්.එල්.ඩබ්ලිව් ලියනගේ මහතා |
| කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය | ආචාර්ය යූ. අනුර කුමාර මහතා |
| වෛද්‍ය විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ජී යසවර්ධන මහත්මිය |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | ජ්‍යෝෂ්ඨ මහාචාර්ය හේමන්ති රණසිංහ මහත්මිය |
| තාක්ෂණ පීඨය | මහාචාර්ය පී.බී. මණ්ඩවල මහතා<br>(2018.07.08 දක්වා)<br><br>මහාචාර්ය එස්.එස්.එල්.ඩබ්ලිව් ලියනගේ මහතා<br>(2018.07.09 සිට වැ.බ. පීඨාධිපති) |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය එස්.ඒ.ඒ.එම් සුභසිංහ මහතා |
| ලේඛකාධිකාරී | එල්.එල්.ඩබ්ලිව් පෙරේරා මහතා<br>(වැ.බ ලේඛකාධිකාරී 2018.03.14 දක්වා)<br><br>කේ.ජී.බ්‍රිටෝ මහතා(2018.03.15 සිට) |
| මූල්‍යාධිකාරී | කේ.ටී.සී.ප්‍රියංගනී මහත්මිය |
| පුස්තකාලයාධිකාරි | ආචාර්ය ඩබ්ලිව්.ඩී.ඒ.එන්.ඩී.විජේසුන්දර මහත්මිය |
| විනයාධිකාරි | ඒ.ආර්.පී.සී. උදයකුමාර මහතා |

නියෝජ්‍ය විනයාධිකාරීන්

| | |
|---|---|
| මානව ශාස්ත්‍ර | මීපිටියේ සීලරතන හිමි<br>ආචාර්ය ගාමිණී රණසිංහ මහතා<br>බී.ඒ.එස්.සී.කුමාර මහතා<br>එස්.ඩී.ආර්.ගුණසේකර මහතා |
| ව්‍යවහාරික විද්‍යා | ආචාර්ය පී.ආර්.එස්.ද සිල්වා මහතා<br>ආචාර්ය පී.කේ.පි.පෙරේරා මහතා<br>ආචාර්ය පී.කේ.ඩී.ඩී.පී.පිටිගල මහතා<br>ආචාර්ය ආර්.ආර්.එම්.කේ.පී.රණතුංග මහතා<br>ආචාර්ය එන්.එම්.එස්.සිරිමුතු මහතා |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ටී.එස්.එම්.අමරසේන මහතා<br>යූ.කේ. තල්ගස්පිටිය මහත්මිය |
| වෛද්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය පී.පී.ආර්.පී. පෙරේරා |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය කේ.එම්.සී.කොන්තසිංහ මහතා<br>ආචාර්ය ඩී.එම්.ආර්.දිනලංකාර මහතා |
| තාක්ෂණ පීඨය | ආචාර්ය ආර්.ඩී.ගුණරත්න මහතා |

## විශ්වවිද්‍යාලයේ පාලක බල මණ්ඩලය

**2018 පාලක සභාව**

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල සංශෝධන පනතින් සංශෝධනය වූ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ **vii** කොටසේ 44 වන ඡේදය අනුව විශ්වවිද්‍යාල පාලක සභාව  පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත ය.

**නිල බලයෙන්**

| | |
|---|---|
| උපකුලපති (සභාපති) | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා |
| ලේඛකාධිකාරී (ලේකම්) | එල්.එල්.ඩබ්.පෙරේරා මහතා (වැඩබලන) ( 2018.03.15 වෙනි දින දක්වා) |
| | කේ.ජී.බ්‍රිටෝ මහතා (2018.03.15 වෙනි දින සිට) |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | මහාචාර්ය ඩී.පී.එස්.චන්ද්‍රකුමාර |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.එස්.එල්.ඩබ්. ලියනගේ මහතා |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ආචාර්ය යූ. අනුර කුමාර මහතා |
| වෛද්‍ය විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ජී. යසවර්ධන මහත්මිය |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය  හේමන්ති රණසිංහ මහත්මිය |
| තාක්ෂණ පීඨය | මහාචාර්ය පී.බී.මණ්ඩාවල මහතා (2018.07.08 වෙනි දින දක්වා)<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.එස්.එල්.ඩබ්ලිව් ලියනගේ මහතා (වැඩබලන 2018.07.09 වෙනි දින සිට) |
| ඉංජිනේරු පීඨය | ආචාර්ය එස්.ඒ.ඒ.එම්.සුභසිංහ මහතා |

සානාතන සහා නියෝජිත

මහාචාර්ය එම්.එම්.පත්මලාල් මහතා

මහාචාර්ය එච්.දිසාබණ්ඩාර මහතා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කල සාමාජිකයන්

1. ආචාර්ය කිරින්දේ අස්සජි නාහිමි (2018.04.05 දක්වා)
2. අයිවන් පෙරේරා පියතුමා (2018.04.05 දක්වා)
3. ටී.ධර්මරාජා මහතා (2018.04.05 දක්වා)
4. එච්.ටී.කමල් පත්මසිරි මහතා (2018.04.05 දක්වා)
5. සිරි රණසිංහ මහතා (2018.04.05 දක්වා)
6. සුජීව රාජපක්ෂ මහතා (2018.04.05 දක්වා)
7. රෝලන් මුණසිංහ මහතා (2018.04.05 දක්වා)
8. ජේ.සී.වැලිඅමුණ මහතා (2018.04.05 දක්වා)
9. සන්ධ්‍යා සල්ගාදු මහත්මිය (2018.04.05 දක්වා)
10. අශෝක හෙට්ටිගොඩ මහතා
11. ඊ.කේ. ගණිහිගම මහතා
12. මහාචාර්ය ඩී.ටී.බී.තෙන්නකෝන් මහතා (2018.04.20 සිට)
13. මහාචාර්ය ඒ.ඕ.එම් ද සොයිසා මහතා (2018.04.20 සිට)
14. නීතිඥ නිශද ගමගේ මහතා (2018.04.20 සිට)
15. ආචාර්ය පල්ලේගම රතනසාර නාහිමි (2018.04.20 සිට)
16. මහාචාර්ය ආර්.එල්.ජයසේකර මහතා((2018.04.20 සිට)
17. ආචාර්ය ඒ.එම්.මුබාරක් මහතා (2018.04.20 සිට)
18. ආචාර්ය තිසත් දේවප්‍රිය බණ්ඩාර විජයගුණවර්ධන මහතා (2018.04.20 සිට)
19. සම්මානිත මහාචාර්ය තක්ෂලා සේරසිංහ මහත්මිය (2018.04.20 සිට)
20. ජී.චමින්ද ද සිල්වා මහතා (2018.04.20 සිට)

**පාලක සභාවේ අනුකමිටු**

1. විශ්වවිද්‍යාල මුදල් හා ප්‍රාග්ධන කමිටුව
2. නිවාඩු හා ප්‍රදාන කමිටුව
3. විගණන හා කළමනාකරණ කමිටුව
4. සැලසුම් හා සංවර්ධන කමිටුව

**සනාතන සභාව**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 46 වැනි වගන්තියෙහි සඳහන් සාමාජිකයින්ගෙන් සනාතන සභාව සමන්විත වේ.

**සනාතන සභාවේ අනුකමිටු**

I. බාහිර උපාධි කමිටුව
II. පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව
III. පරිගණක කමිටුව

## රැස්වීම්

2018 වර්ෂය තුළ පාලක සභාව, සනාතන සභාව ඇතුළු අනෙකුත් නාම යෝජනා කරන ලද කමිටු පහත සඳහන් පරිදි රැස්වී ඇත.

| | රැස්වීම් ගණන |
|---|---|
| පාලක සභා | 12 |
| සනාතන සභා | 11 |
| මුදල් හා ප්‍රාග්ධන කමිටු | 10 |
| නිවාඩු හා ප්‍රදාන කමිටු | 12 |
| පර්යේෂණ කමිටු | 11 |
| බාහිර විභාග කමිටු | 07 |
| සැලසුම් හා සංවර්ධන කමිටු | 04 |
| විගණන හා කළමනාකරණ කමිටු | 03 |

## පරිපාලන නිලධාරීන්

ලේඛකාධිකාරී කේ.ජී.බ්‍රිටෝ මහතා යටතේ පහත සඳහන් නිලධාරීන් විසින් පරිපාලන කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී**

| | |
|---|---|
| අධ්‍යයන, ශිෂ්‍ය කටයුතු හා ප්‍රකාශන අංශය | එල්.එල්.ඩබ්.පෙරේරා මහතා |
| තාක්ෂණ පීඨය | ඒ.එම් ශ්‍රියාංගනී මෙන්ඩිස් මෙය |
| අධ්‍යයන ආයතන අංශය | ඒ.බී.වැලිවිට මහතා |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | ඊ.කේ.එන්. ධර්මරත්න මහතා |
| විභාග අංශය | යූ.ඩී.ඩී.එස්.ගුණසිංහ මෙනෙවිය |
| ශිෂ්‍ය සුබ සාධක අංශය | කේ.පී.වයි.ටී.මල්කාන්ති මහත්මිය |

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**

| | |
|---|---|
| වෛද්‍ය විද්‍යා පීඨය | එච්.පී.වෙහෙරගොඩ මහත්මිය |
| | එස්.එන්.පලගසිංහ මහත්මිය (2018.02.15 වෙනි දින සිට) |
| බාහිර විභාග අංශය | එච්.කේ.එස්.ඩී.ගීගනගේ මහත්මිය |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | එම්.එන්.තල්ගහගොඩ මහතා (2018.09.30 දින දක්වා) |
| | එස්.ඩී.ඩී.හිරන්ති මෙනෙවිය ( 2018.10.01 දින සිට) |
| මූලධන හා සැලසුම් අංශය | එම්.එන්.තල්ගහගොඩ මහතා (2018.10.01 වෙනි දින සිට 2018.12.17 වෙනි දින දක්වා) |
| සාමාන්‍ය පාලන හා සේවා අංශය | එම්.එන්.තල්ගහගොඩ මහතා (2018.12.18 වෙනි දින සිට) |
| නීති හා ප්‍රලේඛන අංශය | සී.ඩී.ආර්.පිරිස් මහත්මිය (කොන්ත්‍රාත් පදනම මත) |

**සහකාර ලේඛකාධිකාරී**

| | |
|---|---|
| අනධ්‍යයන ආයතන අංශය | සී.ජී.බාලසූරිය මහත්මිය |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | කේ.අයි.මලල්ගොඩ මහත්මිය |
| සාමාන්‍ය පාලන හා සේවා අංශය | ඒ.ඩී.එස්.සමාදරී මෙනෙවිය (2018.12.17 වෙනි දින දක්වා) |
| මූලධන හා සැලසුම් අංශය | ඒ.ඩී.එස්.සමාදරී මෙනෙවිය (2018.12.18 වෙනි දින සිට) |

| | |
|---|---|
| ඉංජිනේරු පීඨය | ඒ.කේ.ඒ.එස්.අමරසිංහ මහත්මිය |
| වෛද්‍ය විද්‍යා පීඨය | ඩබ්.එම්.එස්.මදුවන්ති මෙනෙවිය (2018.02.15 වෙනි දින දක්වා) |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | ඩබ්.එම්.එස්.මදුවන්ති මෙනෙවිය (2018.02.16 වෙනි දින සිට) |
| බාහිර විභාග හා විස්තාරිත පාඨමාලා ඒකකය | වී.බී. ද ලැබ්රෝයි මෙනෙවිය |
| ආයතන තොරතුරු හා සේවා අංශය | ඩබ්.කේ.බී.පී.ලක්ෂාන්ති මහත්මිය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ඩී.එස්.එම්.රණසිංහ මහත්මිය |
| ව්‍යාපෘති ඉංජිනේරු | එස්.සී. අතුකෝරල මහතා (කොන්ත්‍රාත් පදනම මත) (2018.10.22 දින දක්වා) |
| ව්‍යාපෘති කළමනාකරු | කේ.රත්නම් මහතා (2018.10.15 වෙනි දින සිට) |
| වැඩ ඉංජිනේරු (සිවිල්) | ඕ.ඒ.ඩබ්.කරුණාරත්න මහතා |

## මූල්‍ය පරිපාලන නිලධාරීන්

වරලත් ගණකාධිකාරිණියක වූ මූල්‍යාධිකාරී කේ.ටී.සී.ප්‍රියංගනී මහත්මියගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් නිලධාරි හු මූල්‍ය පරිපාලන කටයුතුවල නිරත වූහ.

**නියෝජ්‍ය මූල්‍යාධිකාරී**

| | |
|---|---|
| මුදල් අංශය | පී.එච්.සී.එම්. හිරිපිටිය මහත්මිය |
| | ජේ.ටී.එල්.ධර්මසේන මහත්මිය |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | එම්.ඒ.පී.පී.චන්ද්‍රදාස මහත්මිය |

**නියෝජ්‍ය අභ්‍යන්තර විගණක**

| | |
|---|---|
| අභ්‍යන්තර විගණන අංශය | එන්.විජේවර්ධන මහතා (සේවා පැවරුම් පදනම මත) (2018.12.02 වෙනි දින දක්වා) |
| | ඩබ්.එම්.කේ.එන්. බණ්ඩාර මහතා (2018.12.03 වෙනි දින සිට) |

**ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී**

| | |
|---|---|
| මුදල් අංශය (ගෙවීම්) | එම්.එන්. සූරවීර මෙනෙවිය |
| සැපයීම් අංශය | කේ.කේ.එම්.එස්.ඩී.කේ.ගල්කඩුව මහත්මිය |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | කේ.එච්.යූ.ඩී.වසන්ත කුමාර මහතා |
| වෛද්‍ය විද්‍යා පීඨය | ඒ.ඒ.කේ.එන්.රණසිංහ මෙනෙවිය |
| බාහිර විභාග අංශය | එස්.වල්පොල මහත්මිය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | කේ.ජේ.එම්.නන්දන මහතා (2018.07.23 වෙනි දින දක්වා) |
| තාක්ෂණ පීඨය | කේ.ජේ.එම්.නන්දන මහතා (2018.07.24 වෙනි දින සිට) |

**සහකාර මූල්‍යාධිකාරී**

| | |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | ජී.ඩබ්.එල්.ප්‍රියන්තිකා මහත්මිය |
| තාක්ෂණ පීඨය | එම්.ඩී.ඩී.යූ.දිසානායක මහත්මිය (2018.12.10 වෙනි දින දක්වා) |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | එම්.ඩී.ඩී.යූ.දිසානායක මහත්මිය (2018.12.11 වෙනි දින සිට) |
| පශ්චාත් උපාධි පීඨය | එම්.ජී.කුඹුකගේ මෙනෙවිය |
| ඉංජිනේරු පීඨය | එච්.එම්.එස්.එච්.සඳරේණු මෙනෙවිය (2018.10.29 දින සිට) |

# විශ්වවිද්‍යාලයේ පරිපාලන ව්‍යුහය



PIM - පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය
මානව ශාස්ත්‍ර -මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
ව්‍යවහාරික - ව්‍යවහාරික විද්‍යා පීඨය
කළමනා -කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
වෛද්‍ය -වෛද්‍ය විද්‍යා පීඨය
පශ්චාද් - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
තාක්ෂණ -තාක්ෂණ පීඨය
ඉංජිනේරු - ඉංජිනේරු පීඨය
IQAU - අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය

නි.ලේ - නියෝජ්‍ය ලේඛකාධිකාරී
ජ්‍යෙ.ස.ලේ. - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ස.ලේ - සහකාර ලේඛකාධිකාරී
නි.මු. - නියෝජ්‍ය මූල්‍යාධිකාරී
ජ්‍යෙ.ස.මු - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ස.මු - සහකාර මූල්‍යාධිකාරී
ජ්‍යෙ.ස.පු -ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි
ස.පු -සහකාර පුස්තකාලයාධිකාරි
පි/ගැ - පිරිමි/ගැහැණු

# විශ්වවිද්‍යාලයේ පීඨ

විශ්වවිද්‍යාලය පහත සඳහන් පීඨ හතකින් සමන්විත වේ.

1. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
2. ව්‍යවහාරික විද්‍යා පීඨය
3. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
4. වෛද්‍ය විද්‍යා පීඨය
5. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
6. තාක්ෂණ පීඨය
7. ඉංජිනේරු පීඨය

# මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය



1959 ජනවාරි 1 වැනි දින මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනෙහි ආරම්භ වු විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය ආරම්භ විය. පසුව පීඨය වර්තමාන ගංගොඩවිල පරිශ්‍රයට ගෙන යන ලදී.

මේ වන විට ශාස්ත්‍ර පීඨය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය නමින් ස්ථාපිත වී ඇත.

රටේ සංස්කෘතික උරුමය හා ප්‍රජා සංවර්ධන හා ජාතියේ පුනර්ජීවනය, දැනුම බෙදා හැරීම මගින් වැඩි දියුණු කිරීම ශාස්ත්‍ර පීඨයේ වගකීමයි.

ශාස්ත්‍රවේදී හා ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි සඳහා සිසුන් 900ක් පමණ පීඨයට ඇතුළත් කෙරෙන අතර විෂයයන් 25ක් සඳහා අධ්‍යයන කටයුතු කරනු ලැබේ. පීඨය අධ්‍යයනාංශ දහහතරකින් සමන්විතවේ.

| | **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධාන** |
|---|---|---|
| 1. | සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය | මහාචාර්ය පූජ්‍ය මැදගම්පිටියේ විජිත ධම්ම හිමි (වැඩ බලන)-2018.10.12 සිට<br>මහාචාර්ය ඒ.වී.ඩී රත්නසිරි මහතා- 2018.10.11 තෙක් |
| 2. | ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය කේ.එම්.ඇලෙක්සැන්ඩර් මහතා |

| | | |
|---|---|---|
| 3. | භූගෝල විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ආර්.එම්.කේ.රත්නායක මහතා |
| 4. | සමාජ විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය එම්.ටී.සමරකෝන් මහතා |
| 5. | මානව විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය එච්.ඩී.වයි.ඩී.ජයතිලක මහත්මිය |
| 6. | භාෂා හා සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසාංගික කලා අධ්‍යයනාංශය | ආචාර්ය ඩබ්.බී.ඒ.විතාරණ මහතා |
| 7. | ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | කේ.ජී.පී.වීරසිංහ මහතා |
| 8. | සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය | ඩී.පී.කේ.මානෙල් මහත්මිය- 2018.07.01 සිට<br>එච්.පී.දියුණුගල මහතා- 2018.06.30 තෙක් |
| 9. | ඉංග්‍රිසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ආර්.එම්.සී.ජයතිලක මහත්මිය-2018.07.01 සිට<br>ආචාර්ය එම්.ජී.එල්.ආනන්ද මහතා - 2018.06.30 තෙක් |
| 10. | පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය | මහාචාර්ය පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි |
| 11. | දර්ශනය හා මනෝ විද්‍යා අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්.ඒ.ජී.පෙරේරා මහතා |
| 12. | දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය | පී.එල්.ටී.පුරසිංහ මහතා |
| 13. | අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය | එම්.පී.ඒ.ඒ.බුද්ධදාස මහත්මිය |
| 14. | ඉංග්‍රිසි ඉගැන්වීමේ අධ්‍යයනාංශය | පී.බී.එස්.එල්.පුෂ්පකුමාර මහතා - 2018.07.01 සිට<br>ඩී.එල්.එස්.ආනන්ද මහතා - 2018.06.30 තෙක් |

## පීඨය මඟින් පිරිනමන උපාධි හා ඩිප්ලෝමා

**උපාධි**

01. ශාස්ත්‍රවේදී උපාධිය

02. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- පුරා විද්‍යාව

03. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- ඉතිහාසය

04. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- බෞද්ධ ශිෂ්ටාචාරය

05. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- බෞද්ධ දර්ශනය

06. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- දර්ශනය හා මනෝවිද්‍යාව

07. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- පාලි

08. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- හින්දි

09. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- සංස්කෘත

10. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- සංගීතය සහ සංස්කෘතික අධ්‍යයනය

11. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- නර්තනය සහ සංස්කෘතික අධ්‍යයනය

12. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- ආර්ථික විද්‍යාව

13. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- සමාජ විද්‍යාව

14. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- අපරාධ විද්‍යාව

15. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- මානව විද්‍යාව

16. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- සිංහල

17. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- ජනසන්නිවේදනය

18. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- දේශපාලන විද්‍යාව

19. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- ඉංග්‍රීසි භාෂාව

20. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- සමාජ සංඛ්‍යානය

21. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- භූගෝල විද්‍යාව

22. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි

23. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය

24. ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය- තොරතුරු කළමනාකරණය හා සන්නිවේදන තාක්ෂණය

## පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා

1 ලේඛකත්ව හා සන්නිවේදන පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා

2 සමාජ විද්‍යා පශ්චාද් උපාධි ඩිප්ලෝමා

3 අපරාධ විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා

4. නාට්‍ය හා රංගකලාව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව

## ඩිප්ලෝමා පාඨමාලා

1 ලේඛකත්ව හා සන්නිවේදන පිළිබඳ ඩිප්ලෝමාව

2 අපරාධ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව

3 දහම් ගුරු ඩිප්ලෝමාව

4 ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමාව

5 භූගෝලීය තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ ඩිප්ලෝමාව

6 බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව

7 ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ඩිප්ලෝමාව

8 ඉංග්‍රීසි ඩිප්ලෝමාව

9 සමාජ විද්‍යා ඩිප්ලෝමාව

## සහතික පත්‍ර පාඨමාලා

01 ඉංග්‍රීසි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

## පීඨය මගින් නිකුත් කරන ප්‍රතිඵල

| උපාධිය | ප්‍රථම පන්තිය | දෙවන පෙළ ඉහල | දෙවන පෙළ පහල | සාමාන්‍ය සාමර්ථ | සමත්වූ සම්පූර්ණ |
|---|---|---|---|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 02 | 37 | 56 | 27 | 122 |
| ශාස්ත්‍රවේදී (විශේෂ) | 61 | 410 | 144 | 63 | 678 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) නැවත පෙනී සිටි | - | - | - | 09 | 09 |
| ශාස්ත්‍රවේදී (විශේෂ) නැවත පෙනී සිටි | - | 01 | 01 | 05 | 07 |
| විද්‍යාවේදී (තොරතුරු තාක්ෂණ) | 02 | 18 | 01 | 01 | 22 |
| **ශාස්ත්‍රවේදී (විශේෂ/සාමාන්‍ය ) එකතුව** | 65 | 466 | 202 | 105 | 838 |

## පීඨය නිකුත් කළ 2017 හා 2018 වසර වල ප්‍රතිඵල සංසන්දනය

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය නිකුත් කරන ලද ප්‍රතිඵල සමාලෝචනය**

| | ප්‍රථම පන්තිය | | දෙවන පෙළ ඉහල | | දෙවන පෙළ පහල | | සමත් | | සමත් මුලු ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2017 හා 2018 වසර** | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර |
| ශාස්ත්‍රවේදී (විශේෂ) | 95 | 61 | 424 | 410 | 190 | 144 | 61 | 63 | 770 | 678 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 02 | 02 | 14 | 37 | 41 | 56 | 35 | 27 | 92 | 122 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) නැවත පෙනී සිටින | - | - | | - | - | - | 10 | 09 | 10 | 09 |
| ශාස්ත්‍රවේදී (විශේෂ) නැවත පෙනී සිටින | | - | 02 | 01 | 02 | 01 | 05 | 05 | 09 | 07 |
| එකතුව | 97 | 63 | 440 | 448 | 233 | 201 | 111 | 104 | 881 | 816 |

## ශිෂ්‍ය සම්පත් විස්තරය

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | අධ්‍යයන කාර්යමණ්ඩලය | | අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|---|---|
| අධ්‍යයනාංශය | 1 වන වසර | සාමාන්‍ය | විශේෂ | | | ස්ථිර | තාවකාලික | |
| | | | II | III | IV | | | |
| සිංහල හා ජන සන්නිවේදන | 909 | 396 | 30 | 51 | 61 | 13 | 02 | 02 |
| ඉතිහාසය හා පුරාවිද්‍යා | | | 62 | 59 | 80 | 11 | 02 | 02 |
| භූගෝල විද්‍යා | | | 65 | 55 | 67 | 14 | - | 05 |
| සමාජ විද්‍යා | | | 27 | 52 | 48 | 03 | 02 | 02 |
| මානව විද්‍යා | | | 12 | 53 | 24 | 06 | 02 | 03 |
| අපරාධ විද්‍යා | | | 39 | 40 | 33 | 09 | 01 | 02 |
| භාෂාව, සංස්කෘතික අධ්‍යයනය සහ රංග කලාව | | | 38 | 40 | 38 | 14 | 05 | 02 |
| ආර්ථික විද්‍යාව | | | 53 | 54 | 53 | 08 | 02 | 03 |
| සමාජ සංඛ්‍යානය | | | 42 | 40 | 42 | 10 | 03 | 02 |
| පාලි හා බෞද්ධ | | | 108 | 86 | 54 | 12 | 06 | 02 |
| දර්ශනය සහ මනෝ විද්‍යාව | | | 61 | 78 | 112 | 05 | 02 | 02 |
| දේශපාලන විද්‍යා | | | 65 | 38 | 42 | 08 | 02 | 02 |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යා | | | 28 | 20 | 16 | 08 | 05 | 02 |
| B.SC IT | | | 19 | 23 | 13 | - | 01 | 02 |
| එකතුව | | | 649 | 689 | 683 | 121 | 35 | 27 |

## දේශීය ශිෂ්‍ය විස්තර

| පාඨමාලාව | | මාධ්‍ය | 2018 කණ්ඩායම | 2වන | 3වන | 4වන | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| **සාමාන්‍ය** | | සිංහල/ඉංග්‍රීසි | 909 | 219 | 177 | - | 131 |
| **විශේෂ** | මානව විද්‍යා | | | 12 | 53 | 25 | 26 |
| | පුරා විද්‍යා | | | 25 | 21 | 26 | 34 |
| | බෞද්ධ ශිෂ්ටාචාරය | | | 59 | 63 | 35 | 51 |
| | බෞද්ධ දර්ශනය | | | 34 | 18 | 13 | 10 |
| | ව්‍යාපාර සංඛ්‍යානය | | | 34 | 24 | 29 | 14 |
| | අපරාධ විද්‍යාව | | | 39 | 40 | 33 | 26 |
| | නැටුම් | | | 9 | 14 | 14 | 15 |
| | ආර්ථික විද්‍යාව | | | 53 | 54 | 53 | 50 |
| | භූගෝල විද්‍යාව | | | 65 | 55 | 67 | 67 |
| | හින්දි | | | 8 | 8 | 8 | 8 |
| | ඉතිහාසය | | | 37 | 38 | 54 | 55 |
| | ජන සන්නිවේදනය | | | 12 | 17 | 36 | 25 |
| | සංගීතය | | | 16 | 17 | 11 | 10 |
| | පාලි | | | 15 | 5 | 6 | 6 |
| | දර්ශනය හා මනෝවිද්‍යාව | | | 61 | 78 | 115 | 129 |
| | දේශපාලන විද්‍යාව | | | 65 | 38 | 42 | 31 |
| | සංස්කෘත | | | 5 | 1 | 7 | 5 |
| | සිංහල | | | 18 | 34 | 27 | 30 |
| | සමාජ විද්‍යාව | | | 27 | 52 | 48 | 54 |
| | ඉංග්‍රීසි | | | 8 | 4 | 9 | 11 |
| | සමාජ සංඛ්‍යාන | | | 8 | 16 | 15 | 15 |
| | B.Sc. IT | | | 19 | 23 | 19 | 22 |
| | දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම | | | 20 | 16 | 8 | 13 |
| | එකතුව | | 909 | 868 | 866 | 700 | 838 |

## අධ්‍යයන කාර්ය මණ්ඩලය

| විෂය | මාධ්‍ය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | කථිකාචාර්ය | කථිකාචාර්ය (ආධුනික) | තාවකාලික සහය කථිකාචාර්ය | තාවකාලික නිබන්ධක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිංහල හා ජන සන්නිවේදන | සිංහල/ඉංග්‍රීසි | 01 | 01 | 01 | 07 | 03 | - | - | 02 | - | 15 |
| ඉතිහාසය හා පුරාවිද්‍යා | | - | 03 | 01 | 04 | - | 02 | 01 | 02 | - | 13 |
| භූගෝල විද්‍යා | | - | 01 | 02 | 04 | 03 | - | 04 | - | - | 14 |
| සමාජ විද්‍යා | | - | 02 | - | 01 | - | - | - | 02 | 01 | 06 |
| මානව විද්‍යා | | - | 02 | - | 04 | - | - | - | 02 | - | 08 |
| අපරාධ විද්‍යා | | - | 01 | 01 | 04 | 01 | - | 02 | 01 | - | 10 |
| භාෂා, සංස්කෘතික අධ්‍යයනය හා ප්‍රසාංගික කලා අධ්‍යයනය | | 01 | 01 | - | 06 | 03 | - | 03 | 05 | 01 | 20 |
| ආර්ථික විද්‍යා | | - | 04 | - | 03 | 02 | 01 | - | 02 | - | 10 |
| සමාජ සංඛ්‍යානය | | - | - | - | 03 | 02 | 01 | 04 | 03 | - | 13 |
| ඉංග්‍රීසි හා වාග්විද්‍යා | | - | - | - | 05 | 04 | - | - | 05 | - | 14 |
| ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය | | - | - | - | - | 04 | 01 | 03 | 04 | - | 12 |
| පාලි හා බෞද්ධ | | 01 | 05 | - | 03 | 03 | - | - | 06 | - | 18 |
| දර්ශනය හා මනෝවිද්‍යාව | | 01 | 01 | - | 01 | 01 | 01 | - | 02 | - | 07 |
| දේශපාලන විද්‍යාව | | - | - | - | 02 | 06 | - | - | 02 | - | 10 |
| **එකතුව** | | 04 | 21 | 05 | 47 | 32 | 06 | 17 | 38 | 02 | 171 |

## අනධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර

| අධ්‍යයනාංශය/ඒකකය | ජ්‍යෙෂ්ඨ තම | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | ආධුනික කර්යම ණ්ඩලය | කනිෂ්ඨ සේවක | එකතුව |
|---|---|---|---|---|---|
| පීඨ කාර්යාලය | 01 | 02 | 09 | 05 | 15 |
| සිංහල හා ජන සන්නිවේදන | - | - | 01 | 01 | 02 |
| ඉතිහාසය හා පුරාවිද්‍යා | - | 01 | - | 01 | 02 |
| භූගෝල විද්‍යා | - | - | 02 | 03 | 05 |
| සමාජ විද්‍යා | - | - | 01 | 01 | 02 |
| මානව විද්‍යා | - | - | 01 | 02 | 03 |
| භාෂා, සංස්කෘතික අධ්‍යයනය හා ප්‍රසාංගික කලා අධ්‍යයනය | - | - | 01 | 01 | 02 |
| ආර්ථික විද්‍යා | 01 | - | - | 02 | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සමාජ සංඛ්‍යාන | - | - | 01 | 01 | 02 |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යා | - | - | 01 | 01 | 02 |
| පාලි හා බෞද්ධ | - | - | 01 | 01 | 02 |
| දර්ශනය හා මනෝවිද්‍යාව | - | - | 01 | 01 | 01 |
| අපරාධ විද්‍යා | - | - | 01 | 01 | 02 |
| ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය | - | - | 01 | 01 | 02 |
| දේශපාලන විද්‍යා | - | - | 01 | 01 | 02 |
| පරිගණක විද්‍යාගාර | - | - | 01 | 03 | 04 |
| එකතුව | 02 | 03 | 23 | 26 | 54 |

## සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන

| විෂය | ප්‍රසිද්ධියට පත් කළ | වාණිජ්‍ය කරනරය කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| පර්යේෂණ අප්‍රමාණය | 44 | | 14 |
| නවෝත්පාදන ප්‍රමාණය | | | |
| ජර්නල් ප්‍රමාණය | 06 | | |
| පොත් ප්‍රමාණය | 18 | | |
| ලිපි ප්‍රමාණය | 62 | | 05 |
| වෙනත් | 18 | | 11 |
| එකතුව | 148 | | 30 |

## වැඩසටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | සහභාගී වීම | සම්පූර්ණ කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පශ්චාද් උපාධි වැඩසටහන් ප්‍රමාණය | 13 | 03 | 02 |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා | 03 | 03 | 02 |
| උපාධි වැඩසටහන් ප්‍රමාණය | 14 | 11 | 02 |
| ඩිප්ලෝමා ප්‍රමාණය | 06 | 10 | 01 |
| සහතික පත්‍ර පාඨමාලා ප්‍රමාණය | 05 | 06 | |
| එකතුව | 41 | 33 | 07 |

## ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රදාන සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය ප්‍රදාන | 02 | | |
| ජාතික ප්‍රදාන | 02 | 01 | |
| ජාත්‍යන්තර ප්‍රදාන | 01 | | |
| වෙනත්(විශේෂ ප්‍රදාන ,ත්‍යාග හා රන් පදක්කම්) | 01 | 01 | 01 |
| එකතුව | 06 | 02 | 01 |

# ව්‍යවහාරික විද්‍යා පීඨය



වර්ෂ 1962 දී පිහිටුවන ලද මෙම විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ විද්‍යා පීඨයන් අතර පැරණිතම ව්‍යවහාරික විද්‍යා පීඨය වේ. ආරම්භයේ සිටම ප්‍රඥාවෙන් ඉගැන්වීමේ සහ පර්යේෂණ කටයුතු වලින් පිරිපුන් මෙම පීඨය ශිෂ්‍ය සංඛ්‍යාවෙන් ද ප්‍රමුඛ ස්ථානයක් ගනී. වර්තමානයේ අධ්‍යයනාංශ 11 ක් සහ 150කට ආසන්න ආචාර්ය මණ්ඩලයකින් , 2300කට වැඩි ප්‍රථම උපාධි හා 200කට ආසන්න පශ්චාද් උපාධි අපේක්ෂකයන්ගෙන් මෙම පීඨය සමන්විත වේ.

මෙම පීඨය විද්‍යා අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රමුඛ ස්ථානයක් ලබා විද්‍යාව සිංහලෙන් ඉගැන්වීමේ පුරෝගාමියෙක් විය. එමෙන්ම මත්ස්‍ය ජීව විද්‍යාව,බහුඅවයවික විද්‍යාව,ආහාර විද්‍යාව,වන හා පරිසර විද්‍යාව,සංඛ්‍යාන විද්‍යාව,පරිගණක විද්‍යාව සහ කළමනාකරණ විද්‍යාව වැනි ව්‍යවහාරික විෂයයන් මෙම පීඨයේ විද්‍යාවේදී උපාධි විෂය මාලාවට අයත් වේ.

ව්‍යවහාරික විද්‍යා පීඨයට අධ්‍යයනාංශ එකොළහක් අයත් වේ.

පීඨාධිපති - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා

| **අධ්‍යයනාංශය** | | **අධ්‍යයනාංශ ප්‍රධාන** |
|---|---|---|
| 1. | උද්භිද විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය පී. කේ. එන්. දසනායක මිය |
| 2. | රසායන විද්‍යා අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. පී. එම්. ජයවීර මහතා |
| 3. | පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | ඩී. ඩී. ඒ. ගාමිණී මහතා |
| 4. | ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය ආර්. ඒ. යූ. ජේ. මාරපන මහතා |
| 5. | වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය එස්. එම්. සී. යූ. පී. සුබසිංහ මහතා |
| 6. | ගණිත විද්‍යා අධ්‍යයනාංශය | කේ.කේ.ඩබ්ලිව්.ඒ. එස්. කුමාර මහතා |

| | | |
|---|---|---|
| 7. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ඩබ්ලිව්. ඩී. ජී. ටී. විජේරත්න මහතා |
| 8. | සංඛ්‍යාන විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ඩී. සී. වික්‍රමාරච්චි මහතා |
| 9. | සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය එම්. එම්. පත්මලාල් මහතා |
| 10. | ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එන්. එම්. එස්. සිරිමුතු මහතා |
| 11. | බහුඅවයවික විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ලලිත් කරුණානායක මහතා |

පීඨය මගින් පිරිනමන උපාධි, පශ්චාද් උපාධි හා ඩිප්ලෝමා

01. විද්‍යාවේදි (සාමාන්‍ය) උපාධිය
02. විද්‍යාවේදි (සාමාන්‍ය) තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධි පාඨමාලාව
03. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - ආහාර විද්‍යාව හා තාක්ෂණය
04. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - රසායන විද්‍යාව
05. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - බහු අවයවික රසායන විද්‍යාව
06. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - කර්මාන්ත රසායන විද්‍යාව
07. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - ජෛව විද්‍යාව
08. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - ශාක ජෛව තාක්ෂණ
09. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - ශාක ජීව විද්‍යාව
10. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - ක්ෂුද්‍රජීව විද්‍යාව
11. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - ජලජ සම්පත් කළමනාකරණය
12. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - සත්ත්ව විද්‍යාව
13. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - පාරිසරික කළමනාකරණය හා වන විද්‍යාව
14. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - ගණිතය
15. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - පරිගණක විද්‍යාව
16. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - භෞතික විද්‍යාව
17. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - සංඛ්‍යානය
18. විද්‍යාවේදි (විශේෂ) උපාධි පාඨමාලාව - ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය
19. විද්‍යාවේදි (ගෞරව) උපාධි පාඨමාලාව - ව්‍යවහාරික විද්‍යාව

**<u>පශ්චාද් උපාධි පාඨමාලා</u>**

01. බහුඅවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
02. කාර්මික ගණිතය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ විද්‍යාපති පාඨමාලාව
03. ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ විද්‍යාපති පාඨමාලාව
04. පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ විද්‍යාපති පාඨමාලාව
05. කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ විද්‍යාපති පාඨමාලාව

06. ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍ර පාඨමාලාව

07. ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ විද්‍යාපති පාඨමාලාව

08. ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව

09. වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ විද්‍යාපති පාඨමාලාව

10. ශාකසාර නිෂ්පාදන විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව

## 2018 වසරේ පීඨයෙන් නිකුත් කරන ලද ප්‍රතිඵල.

| උපාධිය | ප්‍රථම පන්තිය | දෙවන පෙළ ඉහල | දෙවන පෙළ පහල | සමත් | සමත් සංඛ්‍යා එකතුව |
|---|---|---|---|---|---|
| විද්‍යාවේදී (ගෞරව) ජලජ විද්‍යා | 01 | 05 | - | - | 06 |
| විද්‍යාවේදී (ගෞරව) රසායන විද්‍යා | 09 | 19 | 02 | - | 30 |
| විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා | 03 | 04 | - | 01 | 08 |
| විද්‍යාවේදී (ගෞරව) ආහාර විද්‍යාව හා තාක්ෂණය | 14 | 24 | 06 | 06 | 50 |
| විද්‍යාවේදී (ගෞරව) පාරිසරික කළමනාකරණය හා වන විද්‍යා | 01 | 10 | 01 | - | 12 |
| විද්‍යාවේදී (ගෞරව) ගණිතය | 05 | 06 | - | - | 11 |
| විද්‍යාවේදී (ගෞරව) භෞතික විද්‍යා | 01 | 08 | 02 | 01 | 12 |
| විද්‍යාවේදී (ගෞරව) සංඛ්‍යානය | 04 | 06 | 01 | 01 | 12 |
| විද්‍යාවේදී (ගෞරව) සත්ත්ව විද්‍යා | 02 | 10 | - | - | 12 |
| විද්‍යාවේදී (ගෞරව) ක්ෂුද්‍රජීව විද්‍යා | 05 | 01 | - | - | 06 |
| විද්‍යාවේදී (ගෞරව) ශාක ජෛව තාක්ෂණය | 01 | 05 | - | - | 06 |
| විද්‍යාවේදී (ගෞරව) ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | 03 | 06 | 09 | 19 | 37 |
| **විද්‍යාවේදී (ගෞරව)** උපාධි පාඨමාලාව ව්‍යවහාරික විද්‍යා | **01** | **57** | **46** | **05** | **109** |
| **විද්‍යාවේදී (ගෞරව)** එකතුව | **50** | **161** | **67** | **33** | **311** |
| **විද්‍යාවේදී (සාමාන්‍ය)** එකතුව | **-** | **08** | **37** | **234** | **279** |
| **එකතුව** | **50** | **169** | **104** | **267** | **590** |

## 2017 හා 2018 වසර ප්‍රතිඵල සංසන්දනය

| පීඨය විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල සමාලෝචනය 2017 -2018 වසර | ප්‍රථම පන්තිය | | දෙවන පෙළ ඉහල | | දෙවන පෙළ පහල | | සාමාන්‍ය සාමාර්ථ | | සමත්වූ සම්පූර්ණ සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2017 -2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර |
| විද්‍යාවේදි (ගෞරව) ජලජ විද්‍යා | - | 01 | 10 | 05 | - | - | - | - | 10 | 06 |
| විද්‍යාවේදි (ගෞරව) ජෛවීය විද්‍යා | 01 | - | 04 | - | - | - | - | - | 05 | - |
| විද්‍යාවේදි (ගෞරව) රසායන විද්‍යා | 07 | 09 | 19 | 19 | 02 | 02 | - | - | 28 | 30 |
| විද්‍යාවේදි (ගෞරව) පරිගණක විද්‍යා | 02 | 03 | 06 | 04 | 03 | - | - | 01 | 11 | 08 |
| විද්‍යාවේදි (ගෞරව) ආහාර විද්‍යා හා තාක්ෂණය | 15 | 14 | 17 | 24 | 02 | 06 | 01 | 06 | 35 | 50 |
| විද්‍යාවේදි (ගෞරව) පාරිසරික කළමනාකරණය හා වන විද්‍යා | 03 | 01 | 10 | 10 | - | 01 | - | - | 13 | 12 |
| විද්‍යාවේදි (ගෞරව)ගණිතය | 04 | 05 | 06 | 06 | - | - | 02 | - | 12 | 11 |
| විද්‍යාවේදි (ගෞරව) භෞතික විද්‍යා | 01 | 01 | 07 | 08 | 03 | 02 | 01 | 01 | 12 | 12 |
| විද්‍යාවේදි (ගෞරව) ශාක ජෛව තාක්ෂණය | 02 | 01 | 03 | 05 | - | - | - | - | 05 | 06 |
| විද්‍යාවේදි (ගෞරව) සංඛ්‍යානය | 05 | 04 | 05 | 06 | 01 | 01 | - | 01 | 11 | 12 |
| විද්‍යාවේදි (ගෞරව) සත්ත්ව විද්‍යා | 01 | 02 | 06 | 10 | - | - | - | - | 07 | 12 |
| විද්‍යාවේදි (ගෞරව) ක්ෂුද්‍රජීව විද්‍යා | 05 | 05 | 03 | 01 | 01 | - | - | - | 09 | 06 |
| විද්‍යාවේදි (ගෞරව) ශාක ජෛව විද්‍යා | - | - | 01 | - | - | - | - | - | 01 | - |
| විද්‍යාවේදි (ගෞරව) ක්‍රීඩා විද්‍යාව හා කළමණාකරනය | 07 | 03 | 06 | 06 | 08 | 09 | 19 | 19 | 40 | 37 |
| **විද්‍යාවේදි (ගෞරව) උපාධි පාඨමාලාව ව්‍යවහාරික විද්‍යා** | 02 | 01 | 46 | 57 | 37 | 46 | 06 | 05 | 91 | 109 |
| **විද්‍යාවේදි (සාමාන්‍ය)** | 04 | - | 23 | 08 | 40 | 37 | 196 | 234 | 263 | 279 |
| එකතුව | **59** | **50** | **172** | **169** | **97** | **104** | **225** | **267** | **553** | **590** |

## 2018 ශිෂ්‍ය සම්පත් විස්තරය

| පාඨමාලාව | මුලු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩල එකතුව | මුලු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| ජෛව විද්‍යා (සාමාන්‍ය) | 687 | 150 | 114 |
| භෞතික විද්‍යා(සාමාන්‍ය) | 726 | | |
| ආහාර විද්‍යා හා තාක්ෂණය | 184 | | |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | 166 | | |
| තොරතුරු සංනිවේදනය හා තාක්ෂණය | 94 | | |
| අනෙකුත් විශේෂ පාඨමාලා | 413 | | |
| විද්‍යාවේදි (ගෞරව) උපාධි පාඨමාලාව ව්‍යවහාරික විද්‍යා | 108 | | |
| එකතුව | 2378 | | |

## 2018 දේශීය ශිෂ්‍ය සම්පත් විස්තරය

| පාඨමාලාව | මාධ්‍යය | 2018 කණ්ඩායම | ශිෂ්‍ය සංඛ්‍යාව | | | | උපාධිධාරීන් |
|---|---|---|---|---|---|---|---|
| | | | 1වන | 2වන | 3වන | 4වන | |
| ජෛව විද්‍යා (සාමාන්‍ය) | සිංහල | 300 | 283 | 231 | 173 | - | |
| භෞතික විද්‍යා(සාමාන්‍ය) | | 300 | 269 | 231 | 226 | - | |
| ආහාර විද්‍යා හා තාක්ෂණය | | 60 | 48 | 44 | 42 | 50 | |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | | 55 | 46 | 41 | 43 | 36 | |
| අනෙකුත් විශේෂ පාඨමාලා | | - | 94 | 85 | 125 | 109 | |
| තොරතුරු සංනිවේදනය හා තාක්ෂණය | | 70 | 53 | 41 | - | - | |
| විද්‍යාවේදි (ගෞරව) උපාධි පාඨමාලාව ව්‍යවහාරික විද්‍යා | | - | - | - | - | 108 | |
| එකතුව | | **785** | **793** | **673** | **609** | **303** | |

## අධ්‍යයන කාර්යමණ්ඩල විස්තර

| අංශය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | කථිකාචාර්ය | තාවකාලික කථිකාචාර්ය | ආධුනික කථිකාචාර්ය | උපදේශක | තාවකාලික උපදේශක/ප්‍රදර්ශක | විද්‍යාත්මක සහකාර | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පීඨ කාර්යාලය | ඉංග්‍රීසි | - | - | - | 01 | 05 | - | 01 | 02 | 02 | 06 | - | **17** |
| රසායන විද්‍යා | ඉංග්‍රීසි | 03 | 03 | - | 07 | 11 | - | 04 | - | - | 19 | - | **47** |
| සංඛ්‍යාන විද්‍යා | ඉංග්‍රීසි | - | 01 | - | 02 | 04 | 01 | - | 02 | 01 | 04 | - | **15** |
| පරිගණක විද්‍යා | ඉංග්‍රීසි | - | 02 | - | 03 | 03 | 01 | - | 03 | 02 | 06 | - | **20** |
| උද්භිද විද්‍යා | ඉංග්‍රීසි | 02 | 02 | - | 01 | 06 | 01 | 02 | - | - | 11 | - | **25** |
| භෞතික විද්‍යා | ඉංග්‍රීසි | - | 02 | - | 07 | 04 | 02 | 02 | - | - | 14 | - | **31** |
| සත්ත්ව විද්‍යා | ඉංග්‍රීසි | 03 | 02 | - | 02 | 03 | - | - | 01 | - | 11 | - | **22** |
| ගණිත විද්‍යා | ඉංග්‍රීසි | - | 01 | - | 04 | 05 | 01 | 02 | 03 | 02 | 14 | 01 | **33** |
| වන හා පාරිසරික විද්‍යා | ඉංග්‍රීසි | 02 | 03 | - | 01 | 04 | 02 | 01 | - | - | 05 | 03 | **21** |
| ආහාර විද්‍යා හා තාක්ෂණ | ඉංග්‍රීසි | 01 | 03 | - | 02 | 03 | 01 | - | 01 | - | 05 | 02 | **18** |
| ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය | ඉංග්‍රීසි | - | - | - | - | 01 | 01 | 02 | 05 | 03 | 02 | - | **14** |
| **එකතුව** | | 11 | 19 | - | 30 | 49 | 10 | 14 | 17 | 10 | 97 | 06 | 263 |

පීඨයේ ආචාර්ය උපාධි ලබා ඇති ආචාර්යවරුන් ගණන 106 කි.

## අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

| පීඨය | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සේවක භවතුන් | මාණ්ඩලික සේවක භවතුන් | සාමාන්‍ය සේවක භවතුන් | කණිෂ්ඨ සේවක භවතුන් | එකතුව |
|---|---|---|---|---|---|
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 08 | 06 | 45 | 55 | 114 |

## සිදුකරන ලද පර්යේෂණ,නවෝත්පාදන හා ප්‍රකාශන

| **විෂය** | ප්‍රසිද්ධ කරන ලද | වාණිජ්‍ය කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| (අ) පර්යේෂණ ප්‍රමාණය | 95 | - | 61 |
| (ආ) නවීකරණය | 05 | - | - |
| (ඇ) ජර්නල් ප්‍රමාණය | 54 | - | 27 |
| ශාස්ත්‍රීය ලිපි(සම්පූර්ණ පත්‍රිකා) | 57 | - | - |
| (ඈ) පොත් ප්‍රමාණය | 02 | - | - |
| (ඉ) ලිපි ප්‍රමාණය | 68 | - | 15 |
| වෙනත් | | | |
| සාර සංක්ෂේප | 111 | - | 17 |
| පොත් පරිච්ඡේද | 05 | - | - |
| පර්යේෂණ පත්‍රිකා | 27 | - | 02 |
| වැඩමුළු | - | 04 | - |
| **එකතුව** | 424 | 04 | 122 |

## වැඩ සටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු

| **විෂය** | **සහභාගිවීම්** | **සම්පූර්ණ කරන ලද** | **ඉදිරිපත් කිරීම්** |
|---|---|---|---|
| ඒ) පශ්චාද් උපාධි වැඩ සටහන් ප්‍රමාණය | 07 | 02 | 05 |
| (බී) පශ්චාද් උපාධි ඩිප්ලෝමා | - | - | 01 |
| (සී) උපාධි වැඩ සටහන් ප්‍රමාණය | 08 | 05 | 02 |
| (ඩී) ඩිප්ලෝමා වැඩ සටහන් ප්‍රමාණය | - | - | - |
| (ඊ) සහතික පත්‍ර වැඩසටහන් ප්‍රමාණය | 03 | 02 | - |
| (එෆ්) වෙනත් වැඩසටහන් | 03 | 06 | 08 |
| **එකතුව** | 21 | 15 | 16 |

## ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර

**ව්‍යවහාරික විද්‍යා පීඨය**

| **විෂය** | ප්‍රදාන සංඛ්‍යාව | ආචාර්යවරුන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය ප්‍රදාන | 23 | 10 | 02 |
| විදේශීය ප්‍රදාන | 13 | 03 | 03 |
| වෙනත් විශේෂ ප්‍රදාන ත්‍යාග හා රන් පදක්කම් | 05 | - | 01 |
| **එකතුව** | 41 | 13 | 06 |

## නව පාඨමාලා ආරම්භකිරීම් පිළිබඳ විස්තර

| පාඨමාලාව | මාධ්‍යය |
|---|---|
| විද්‍යාවේදී (විශේෂ) කර්මාන්ත රසායන විද්‍යාව | ඉංග්‍රීසි |
| විද්‍යාවේදී (විශේෂ) බහු අවයවික රසායන විද්‍යාව | ඉංග්‍රීසි |
| ප්‍රවේණි හා අණුක ජීව විද්‍යාව<br>(ප්‍රථම බඳවා ගැනීම 2019 වර්ෂයේදී සිදු කරන ලදි) | ඉංග්‍රීසි |

## කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය




කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ශ්‍රී, ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියෙහි ප්‍රමුඛතම කළමනාකරණ පීඨය වන අතර එය කළමනාකරණ අධ්‍යාපනයෙහි විශිෂ්ඨතම කේන්ද්‍රස්ථානය ලෙස සැලකේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි, කළමනාකරණ අධ්‍යාපනයට වසර 60 කට වඩා දිගු ඉතිහාසයක් ඇත.

වර්ෂ 1959/60 දී ශාස්ත්‍ර පීඨයේ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර හා රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශයන් යටතේ උපාධි වැඩ සටහන් දෙකක් හඳුන්වා දීමත් සමගම පීඨයෙහි පළමු අධ්‍යයන වැඩසටහන් ආරම්භ විය. 1968 දී මෙම අධ්‍යයනාංශය කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව ලෙස ප්‍රතිනිර්මාණය කරන ලදි. එය වර්ෂ 1972 දී විශ්වවිද්‍යාලංකාර පද්ධතිය ප්‍රතිසංවිධානය අනුව කළමනාකරණ අධ්‍යයන අධ්‍යයනාංශය සහ වාණිජ විද්‍යා අධ්‍යයනාංශය යන අධ්‍යයනාංශ දෙකකින් යුත් කළමනාකරණ අධ්‍යයනය හා වාණිජ විද්‍යා පීඨයක් පිහිට වනු ලැබීය.

අධ්‍යයනාංශ 12 කින් සමන්විත වත්මන් පීඨය කළමනාකරණ හා වාණිජ්‍ය යන පුළුල් ක්ෂේත්‍රයන් හි ලෝකයේ අතිශයින් තරඟකාරී උපාධි වැඩ සටහන් දියත් කරනු ලබයි. මෙම පීඨය පසුගිය දශක හතරක් තුළ උසස් පෙළ වාණිජ විෂය ධාරාවේ විශිෂ්ටතම ප්‍රතිඵල ලබා ගන්නා සිසුන් අතර ප්‍රියතම පීඨය බවට පත් විය. නමුදු ශ්‍රී ලංකීය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල පීඨයෙහි කාර්යභාරය උපාධි අධ්‍යයනයටම සීමා නොවේ. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය නිරන්තර වෘත්තීය සංවර්ධනය හා වෘත්තිමය නායකයන් බිහි කිරීමේ ලා ඇප කැප වී සිටියි. ඒ සඳහා අප පීඨය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සමග එකතුව කළමනාකරණ විෂයයෙහි අතිශයින් පිළිගත් ආචාර්ය උපාධි හා පශ්චාද් උපාධි වැඩසටහන් (Ph.D., MBA,MPM iy M.Sc) ක්‍රියාත්මක කරනු ලබයි. තවද, ශ්‍රී ලාංකීය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි වැඩි සමාජ සහභාගීත්වයක අවශ්‍යතාව අවබෝධ කොට ගනිමින් අප පීඨය කළමනාකරණ හා වාණිජ විද්‍යා විෂය ක්ෂේත්‍රයන්හි බාහිර/අර්ධ කාලීන උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර වැඩසටහන් පවත්වනු ලබයි.

**පීඨාධිපති** ආචාර්ය යූ. අනුර කුමාර මයා

2018 වසර තුල කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ හා අධ්‍යයනාංශ ප්‍රධානීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධානීන්** |
|---|---|
| 1. ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එස්.ඩී.එබ්ලිව්. ජයවර්ධන මහතා |
| 2. රාජ්‍ය පරිපාලන විද්‍යා  අධ්‍යයනාංශය | ආචාර්ය. ඒල්.ඒ.පී. මධුවන්ති මිය (2018.07.01 සිට) |
| | ජ්‍යෙ.මහාචාර්ය ආර්. ලලිතා එස්. ප්‍රනාන්දු මිය |
| 3. වාණිජ විද්‍යා අධ්‍යයනාංශය | ජ්‍යෙ.මහාචාර්ය ඊ. දයාරත්න මහතා |
| 4. දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එන්.සී. වික්‍රමාරච්චි මිය |
| 5. ගණකාධිකරණ අධ්‍යයනාංශය | ආචාර්ය ඒ.එච්.එන්.කාරියවසම් මහතා |
| 6.අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය | අචාර්ය කේ.පී.එල් චන්ද්‍රලාල් මහතා |
| 7. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශයආ | ආචාර්ය. ජී.ඩී.එන්. පෙරේරා මිය (2018.06.02 සිට) |
| | ආචාර්ය එම්.ජී.ජී. තරංගනී මිය |
| 8. මූල්‍ය අධ්‍යයනාංශය | ආචාර්ය. පී.ඒ.එන්.එස්. අනුරාධා මෙය (2018.08.07 සිට) |
| | මහාචාර්ය ඩී.බී.පී.එච්. දිසාබණ්ඩාර මහතා |
| 9. ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ඩී.ආර්.ජේ. සිරිවර්ධන මිය (2018.05.30 සිට) |
| | ආචාර්ය එම්.ඒ.කේ. ශ්‍රියාලතා මිය |
| 10. තොරතුරු තාක්ෂණ  අධ්‍යයනාංශය | ආචාර්ය පී.ඩී.කේ. අමිත කුමාර මහතා |
| 11. තීරණ විද්‍යා අධ්‍යයනාංශය | දිලීපා එඳගමගේ මිය |
| 12.  ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය | එම්.වී.එස්.එස්. උදයංග මහතා (2018.10.01 සිට) |
| | ආර්.එන්.වීරසිංහ මහතා |

## පිරිනමන උපාධි,ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා

**අභ්‍යන්තර උපාධි පාඨමාලා**

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ)

විද්‍යාවේදී රාජ්‍ය  කළමනාකරණ (විශේෂ)

වාණිජවේදී  (විශේෂ)

විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ)

විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ)

විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ)

විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ)

විද්‍යාවේදී මූල්‍ය (විශේෂ)

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) (විශේෂ)

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (තොරතුරු පද්ධති) (විශේෂ)

විද්‍යාවේදී මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ (විශේෂ)

විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ)

**බාහිර උපාධි පාඨමාලා**

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය)

වාණිජවේදී (සාමාන්‍ය)

විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (සාමාන්‍ය)

**උසස් ඩිප්ලෝමා පාඨමාලා**

පරිගණක පදනම් ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා

අලෙවි කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා

ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා

**ඩිප්ලෝමා පාඨමාලා**

රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා

පරිගණක පදනම් ගිණුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා

අලෙවි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා

ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා

**සහතික පත්‍ර පාඨමාලා**

ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
Certificate Course on Management Leading to fulfill the Third Efficiency Bar Examination for the Officers in Grade 1 of Sri Lanka Technological Service

**පුහුණු පාඨමාලා**

පරිගණක පාදක දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩසටහන

## 2018 වර්ෂය සඳහා පීඨය මගින් නිකුත් කරන ලද ප්‍රතිඵල

| උපාධි | ප්‍රථම පන්ති සාමාර්ථය | දෙවන පෙළ ඉහළ සාමාර්ථය | දෙවන පෙළ පහළ සාමාර්ථය | සමත් | සමත් මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) | 15 | 41 | 64 | 122 | 242 |
| විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) | 8 | 18 | 17 | 47 | 90 |
| වාණිජවේදී (විශේෂ) | 5 | 19 | 27 | 72 | 123 |
| විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ) | 1 | 15 | 16 | 48 | 80 |
| විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) | 43 | 71 | 41 | 67 | 222 |
| විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) | 6 | 24 | 21 | 39 | 90 |
| විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) | 7 | 21 | 25 | 19 | 72 |
| විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) | 35 | 46 | 31 | 50 | 162 |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) (විශේෂ) | 11 | 19 | 13 | 21 | 64 |
| විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) | 5 | 8 | 10 | 46 | 69 |
| විද්‍යාවේදී මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ (විශේෂ) | 4 | 25 | 8 | 20 | 57 |
| විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) | 1 | 1 | | 3 | 5 |
| **එකතුව** | 141 | 308 | 273 | 554 | 1276 |

## 2017 හා 2018 නිකුත් කරන ලද ප්‍රතිඵල අතර සංසන්දනය

| පීඨය විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල සමාලෝචනය 2017 -2018 වසර | ප්‍රථම පන්තිය | | දෙවන පෙළ ඉහල | | දෙවන පෙළ පහල | | සාමාන්‍ය සාමාර්ථ | | සමත්වූ සම්පූර්ණ සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) | 16 | 15 | 46 | 41 | 67 | 64 | 119 | 122 | 248 | 242 |
| විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂ) | 3 | 8 | 26 | 18 | 20 | 17 | 63 | 47 | 112 | 90 |
| වාණිජවේදී (විශේෂ) | | 5 | 15 | 19 | 28 | 27 | 97 | 72 | 140 | 123 |
| විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ) | 2 | 1 | 10 | 15 | 11 | 16 | 54 | 48 | 77 | 80 |
| විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ) | 47 | 43 | 74 | 71 | 29 | 41 | 67 | 67 | 217 | 222 |
| විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ) | 7 | 6 | 18 | 24 | 20 | 21 | 40 | 39 | 85 | 90 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) | 3 | 7 | 11 | 21 | 13 | 25 | 27 | 19 | **54** | **72** |
| විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) | 31 | 35 | 45 | 46 | 25 | 31 | 67 | 50 | **168** | **162** |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) (විශේෂ) | 7 | 11 | 19 | 19 | 10 | 13 | 21 | 21 | **57** | **64** |
| විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) | 4 | 5 | 6 | 8 | 7 | 10 | 44 | 46 | **61** | **69** |
| විද්‍යාවේදී මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ (විශේෂ) | 9 | 4 | 13 | 25 | 8 | 8 | 18 | 20 | **48** | **57** |
| විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) | 1 | 1 | | 1 | 3 | | 7 | 3 | **11** | **5** |
| **එකතුව** | 130 | 141 | 283 | 308 | 241 | 273 | 624 | 554 | 1278 | 1276 |

- 2017 ප්‍රතිඵල (උපාධි වලංගු දිනය 2016.12.10)
- 2018 ප්‍රතිඵල (උපාධිය වලංගු දිනය 2017.10.14)

## දේශීය සිසුන්ගේ විස්තර

| පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය) | ශිෂ්‍ය සංඛ්‍යාව | | | | උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | 1වන | 2වන | 3වන | 4වන | |
| කළමනාකරණ පොදු පාඨමාලාව | 1211 | | | | 1211 |
| ව්‍යාපාර පරිපාලන | | 229 | 243 | 246 | 718 |
| රාජ්‍ය පරිපාලන | | 74 | 72 | 83 | 229 |
| වාණිජ | | 128 | 127 | 128 | 383 |
| දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා | | 58 | 58 | 70 | 186 |
| ගණකාධිකරණ | | 200 | 204 | 203 | 607 |
| අලෙවි කළමනාකරණ | | 100 | 92 | 94 | 286 |
| මානව සම්පත් කළමනාකරණ | | 74 | 70 | 67 | 211 |
| මූල්‍ය | | 159 | 164 | 155 | 478 |
| ව්‍යාපාර ආර්ථික විද්‍යා | | 67 | 79 | 71 | 217 |
| තොරතුරු තාක්ෂණ | | 48 | 49 | 54 | 151 |
| තීරණ විද්‍යා | | 56 | 42 | 53 | 151 |
| ව්‍යවසායකත්ව | | 16 | 9 | 16 | 41 |
| **එකතුව** | 1211 | 1209 | 1209 | 1240 | 4869 |

## කාර්ය මණ්ඩල විස්තර

| පීඨය | අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර) | අධ්‍යයන කාර්ය මණ්ඩලය (තාවකාලික) | පරිපාලන කාර්ය මණ්ඩල | අධ්‍යයන සහයක (ස්ථිර) | අධ්‍යයන සහයක (තාවකාලික) | අනධ්‍යයන (ස්ථිර) |
|---|---|---|---|---|---|---|
| 177 | 38 | 04 | 11 | 12 | 74 | 03 |

## අධ්‍යයන කාර්යමණ්ඩල විස්තර

| අධ්‍යයනාංශය/ ඒකකය | මාධ්‍ය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (කොන්ත්‍රාත්) | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) | තාවකාලික සහය කථිකාචාර්ය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපාර පරිපාලන** | ඉංග්‍රීසි | | | | 7 | 6 | | 2 | 7 | 4 |
| **රාජ්‍ය පරිපාලන** | | 1 | | | 1 | 5 | | 1 | 3 | 3 |
| **වාණිජ** | | 1 | | | 1 | 3 | | 2 | 3 | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා | | 1 | 2 | | 2 | 1 | | 1 | 1 | 6 |
| ගණකාධිකරණ | | 2 | | | 10 | 7 | | 1 | 2 | 3 |
| අලෙවි කළමනාකරණ | | 1 | 1 | | 3 | 5 | | | 2 | 2 |
| මානව සම්පත් කළමනාකරණ | | 2 | 1 | | 9 | | | | 1 | |
| මූල්‍ය | | 1 | 2 | | 5 | 1 | | 1 | 4 | 3 |
| ව්‍යාපාර ආර්ථික විද්‍යා | | 1 | | | 7 | 6 | | 1 | 4 | 2 |
| තොරතුරු තාක්ෂණ | | | 1 | | 5 | 6 | | | | 9 |
| තීරණ විද්‍යා | | 1 | | | 7 | 3 | | | 4 | 4 |
| ව්‍යවසායකත්ව | | | | | 2 | 2 | | | 5 | 1 |
| ITRC | | | | | | | | | | |
| ව්‍යාපාර සන්නිවේදන ඒකකය | | | | | 1 | 3 | | | 2 | |
| නීති අධ්‍යයන ඒකකය | | | | | | 2 | | | 2 | 1 |
| එකතුව | | 11 | 7 | 0 | 60 | 50 | 0 | 9 | 40 | 38 |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂය | සම්පූර්ණ කරන ලද | ප්‍රසිද්ධ කරන ලද |
|---|---|---|
| අ.)පර්යේෂණ සංඛ්‍යාව | - | 186 |
| ආ)පොත් සංඛ්‍යාව | - | 18 |
| ඇ)පොත් පරිච්ඡේදය | - | 13 |
| ඈ)සොයා ගැනීම්, නිමැවුම්/නිපැයුම් | - | 0 |
| ඉ) ජර්නල් සංඛ්‍යාව/සඟරා | - | 14 |
| එකතුව | - | 231 |

## පීඨය මගින් පවත්වන ලද වැඩසටහන්

| විෂය | සහභාගී වීම් | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| (අ) උපාධි වැඩසටහන් - අභ්‍යන්තර | - | - | 12 |
| උපාධි වැඩසටහන් - බාහිර | - | - | 03 |
| (ආ) උසස් ඩිප්ලෝමා වැඩ සටහන් | - | - | 03 |
| (ඇ) ඩිප්ලෝමා වැඩසටහන් | - | - | 04 |
| (ඈ) සහතික පත්‍ර වැඩසටහන් | - | - | 02 |
| (ඉ) පුහුණු වැඩසටහන් | - | - | 01 |
| (ඊ) පීඨය මගින් සංවිධානය කරන වෙනත් වැඩසටහන්: | | | |
| පර්යේෂණ සැසිය | - | - | 06 |
| ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/ සම්මන්ත්‍රණ/ සංසද | - | - | 03 |
| වැඩමුළු | - | - | 22 |
| ව්‍යාපෘති | - | - | 01 |

| | | | |
|---|---|---|---|
| සම්මන්ත්‍රණ | - | - | 30 |
| පුහුණු වැඩසටහන් | - | - | 26 |
| ක්ෂේත්‍ර චාරිකාව | - | - | 16 |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | - | - | 10 |
| ආරාධිත දේශන | - | - | 63 |
| CSR ව්‍යාපෘති | - | - | 09 |
| කාර්මික නැරඹුම් | - | - | 18 |
| වෙනත් වැඩසටහන් | - | - | 43 |

# වෛද්‍ය විද්‍යා පීඨය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිව්වැනි පීඨය වශයෙන් 1993 වර්ෂයේ වෛද්‍ය විද්‍යා පීඨය ස්ථාපිත විය. 2007 වර්ෂය වන විට මෙම පීඨය අධ්‍යයනාංශ 17 කටින් යුක්ත සියලු සුදුසුකම් ඇති පීඨයක් බවට පත් විය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට මෙම පීඨය විද්‍යාවේදී (හෙද), විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා සහ ඖෂධවේදී යන පාඨමාලා සඳහා උපාධි පිරිනැමීම ආරම්භ කරන ලදි.

ශිෂ්‍ය ලියාපදිංචි කටයුතු විභාග කටයුතු හා මූල්‍ය කටයුතු යන කටයුතු සියල්ල පීඨයෙන් ම සිදු කරන විශ්වවිද්‍යාලයේ එක පීඨයයි. 2013 වසරේ දී සම සෞඛ්‍ය අධ්‍යයනාංශය ආරම්භ කරන ලදි.

2018 වර්ෂයේ දී වෛද්‍ය විද්‍යා පීඨය පහත සඳහන් අධ්‍යයනාංශ හා අධ්‍යයනාංශ ප්‍රධානීන්ගෙන් සමන්විත විය.

| | අධ්‍යයනාංශය | අධ්‍යයනාංශ ප්‍රධාන |
|---|---|---|
| 1. | ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය පී.එච්.දිසානායක මයා |
| 2. | කායික විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ඩී.සී.හේවගේ මයා |
| 3. | ජෛව රසායන අධ්‍යයනාංශය | මහාචාර්ය පී.පී.ආර් පෙරේරා මයා |
| 4. | පරපෝෂ විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය පී.එච්.කේ.අයි.එස්.රණසිංහ මිය |
| 5. | ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එම්.එම්.වීරසේකර මිය |
| 6. | ව්‍යාධි විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එච්.ඩබ්.සී.කේ.කුලතිලක මිය |
| 7. | භිෂග්වේද අධ්‍යයනාංශය | මහාචාර්ය සී.නිර්මලා විජේකෝන් මිය |
| 8. | ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය එස්.ප්‍රතාපන් මිය |
| 9. | අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | මහාචර්ය එම්.විදානපතිරණ මයා |
| 10. | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ජේ.ඉන්ද්‍රකුමාර් මයා |
| 11. | ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය | වෛද්‍ය කේ.සී.ඩී.පී.සිල්වා මයා |
| 12. | ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එම්.ඒ.එම්.එන් ගමගේ මිය |

| | | |
|---|---|---|
| 13. | ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය බී.ඩී.ගමගේ මයා |
| 14. | මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ජයමාල් ද සිල්වා මයා |
| 15. | පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ටී.එස්.පී.සමරනායක මිය |
| 16. | වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය | වෛද්‍ය ආර් බී.මාරසිංහ මයා |
| 17 | සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එම්.බී.එස්.සෙනවිරත්න මිය |

## පීඨය මගින් පිරිනමන උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා

උපාධි

01 MBBS උපාධිය

02. ඖෂධ වේදී (ගෞරව) උපාධිය

03. විද්‍යාවේදී හෙද(ගෞරව) උපාධිය

04. විද්‍යාවේදී මානව ජීව විදයා (ගෞරව) උපාධිය

05. විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය

ඩිප්ලෝමා

උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා

## පීඨය මගින් නිකුත් කරන ලද ප්‍රතිඵල - 2018

| උපාධිය | ප්‍රථම පන්තිය | දෙවන පෙළ ඉහළ | දෙවන පෙළ පහළ | සමත් | සමත් මුලු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| MBBS උපාධිය | - | - | - | 06 | 06 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | 01 | 03 | 13 | 22 | 39 |
| විද්‍යාවේදී හෙද(ගෞරව) උපාධිය | - | 13 | 09 | 19 | 41 |
| විද්‍යාවේදී මානව ජීව විද්‍යා (ගෞරව) උපාධිය | - | - | - | 03 | 03 |
| විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | | 10 | 03 | 08 | 21 |
| එකතුව | **01** | **26** | **25** | **58** | **110** |

## 2017 හා 2018 වසර වල ප්‍රතිඵල සැසඳීම

| පාඨමාලාව | ප්‍රථම පන්තිය | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සමත් | | සමත් එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර | 2017 වසර | 2018 වසර |
| MBBS උපාධිය | 03 | - | 23 | - | 50 | - | 76 | 06 | 152 | 06 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | 01 | 01 | - | 03 | 07 | 13 | 07 | 22 | 15 | 39 |
| විද්‍යාවේදී හෙද(ගෞරව) උපාධිය | - | - | 04 | 13 | 08 | 09 | 11 | 19 | 23 | 41 |
| විද්‍යාවේදී මානව ජීව විද්‍යා (ගෞරව) උපාධිය | - | - | - | - | - | - | - | 03 | - | 03 |
| විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | 03 | - | 13 | 10 | 10 | 03 | 08 | 08 | 34 | 21 |

## ශිෂ්‍ය සම්පත් විස්තරය

| පාඨමාලාව | මුලු ශිෂ්‍ය සංඛ්‍යාව | මුලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුලු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| MBBS - 769<br>ඖෂධ වේද - 89<br>හෙද - 81<br>මානව ජීව විද්‍යා - 6<br>වෛද්‍ය රසායනාගාර - 107 | 1052 | 139 | 177 |

## දේශීය ශිෂ්‍ය විස්තරය

| පාඨමාලාව | මාධ්‍ය | වසර සිසුන් | | | | | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | 1වන | 2වන | 3වන | 4වන | 5වන | |
| MBBS උපාධිය | ඉංග්‍රීසි | 160<br>+ 163 | 150 | 155 | 153 | 151 | 6 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | | 18 | 21 | 19 | 23 | - | 41 |
| විද්‍යාවේදී හෙද(ගෞරව) උපාධිය | | 23 | 27 | 22 | 17 | - | 39 |
| විද්‍යාවේදී මානව ජීව විද්‍යා (ගෞරව) උපාධිය | | 27 | 27 | 25 | 28 | - | 21 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | | | 03 | 03 | - | - | - | 3 |
| එකතුව | | | 394 | 228 | 221 | 221 | 151 | 110 |

## අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

| අධ්‍යයනාංශය | | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය ආධුනික | තාවකාලික කථිකාචාර්ය | උපදේශක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යුහ විද්‍යා | | 1 | - | 1 | 4 | - | 3 | - | - | 9 |
| කායික විද්‍යා | | - | 1 | 2 | 4 | - | 3 | - | - | 10 |
| ජෛව රසායන විද්‍යා | | 2 | 4 | - | 2 | - | 2 | - | - | 10 |
| පරපෝෂ විද්‍යා | | - | 1 | - | 2 | - | 3 | - | - | 6 |
| ක්ෂුද්‍රජීව විද්‍යා | | 1 | 2 | - | 5 | - | - | - | - | 8 |
| ව්‍යාධි විද්‍යා | | - | 1 | - | 7 | 1 | 2 | - | - | 11 |
| භිෂග් වේද | | - | 3 | - | 1 | - | 3 | - | - | 7 |
| ප්‍රජා වෛද්‍ය | | 1 | - | - | 4 | - | 3 | - | - | 8 |
| අධිකරණ වෛද්‍ය විද්‍යා | | - | 1 | - | 4 | - | - | - | - | 5 |
| වෛද්‍ය විද්‍යා | | - | 2 | - | 3 | 1 | 1 | - | - | 7 |
| ප්‍රසව හා නාරිවේද | | - | 1 | - | 4 | - | - | - | - | 5 |
| ළමා රෝග විද්‍යා | | - | 1 | - | 4 | - | 1 | - | - | 6 |
| ශල්‍ය වෛද්‍ය විද්‍යා | | - | 3 | - | 2 | - | 1 | - | - | 6 |
| මනෝ වෛද්‍ය විද්‍යා | | 1 | - | - | 3 | 2 | 1 | - | - | 7 |
| පවුල් වෛද්‍ය විද්‍යා | | - | - | - | 2 | 1 | 2 | - | - | 5 |
| වෛද්‍ය අධ්‍යාපන | | - | - | - | 1 | - | 1 | - | - | 2 |
| සම සෞඛ්‍ය විද්‍යා | ඖෂධවේදී | - | - | - | 5 | - | 4 | - | - | 9 |
| | හෙද | - | - | - | 4 | - | 5 | - | - | 9 |
| | වෛද්‍ය රසායනාගාර විද්‍යා | - | - | - | 3 | - | 4 | - | - | 7 |
| සම්පත් මධ්‍යස්ථානය | | - | - | - | - | 1 | 1 | - | - | 2 |
| එකතුව | | 6 | 20 | 3 | 64 | 6 | 40 | - | - | 139 |

## අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| අධි ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ | කණිෂ්ඨ | සුළු සේවක | එකතුව |
|---|---|---|---|---|
| 08 | 16 | 68 | 69 | 161 |

## පර්යේෂණ නවෝත්පාදන සහ ප්‍රකාශන

| කාරණය | ප්‍රසිද්ධ කරන ලද | වානිජ්‍ය කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ. පර්යේෂණ ප්‍රමාණය | 384 | 2 | 155 |
| ආ. නවෝත්පාදන ප්‍රමානය | 2 | - | 2 |
| ඇ. සඟරා ප්‍රමාණය | 5 | - | - |
| ඈ. පොත් ප්‍රමාණය | 26 | 3 | 14 |
| ඉ. ලිපි ප්‍රමාණය | 146 | - | 104 |
| ඊ. වෙනත් | 14 | - | 1 |
| එකතුව | 577 | 5 | 276 |

## වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු

| විෂය | සහභාගී වූ | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| a. පශ්චාද් උපාධි වැඩසටහන් | 68 | 13 | 7 |
| b. පශ්චාද් උපාධි ඩිප්ලෝමා | 15 | 8 | 3 |
| c. උපාධි පාඨමාලා ප්‍රමනය | 5 | 2 | 2 |
| d. ඩිප්ලෝමා පාඨමාලා ප්‍රමාණය | 2 | | |
| e. සහතික පත්‍ර පාඨමාලා ප්‍රමාණය | 2 | 1 | 1 |
| f. වෙනත් | 46 | 1 | 4 |
| එකතුව | 138 | 25 | 17 |

## ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර

වෛද්‍ය විද්‍යා පීඨය

| විෂය | ප්‍රදාන ප්‍රමාණය | ආචාර්ය සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය ප්‍රදාන | 47 | 09 | 07 |
| ජාතික ප්‍රදාන | 17 | 02 | |
| ජාත්‍යන්තර ප්‍රදාන | 09 | 04 | |
| වෙනත් (විශේෂ ප්‍රදාන, ත්‍යාග සහ රන් පදක්කම් | 07 | 03 | 03 |
| එකතුව | 80 | 18 | 10 |

# පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය




1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48අ වගන්තිය යටතේ 1996 ජනවාරි මාසයේ විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ උපාධි අධ්‍යයන පීඨය ආරම්භ කරන ලදි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව, පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ උසස් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ලබා ගැනීමට මඟ පෙන්වන අධ්‍යයන පාඨමාලා පවත්වනු ලබන ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය බවට මෙම පීඨය පත්ව තිබෙන අතර “දිවයින තුළත්, ඉන් පිටත දීත් උසස් ඉගනුම්, පර්යේෂණ සහ ශිෂ්‍යත්ව සඳහා විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථිර වශයෙන් ම ස්ථාපනය වීම” මෙම පීඨයේ දැක්ම වේ.

උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යයන හා පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන පීඨාධිපතිවරයෙකු උපාධි අධ්‍යයන පීඨයේ ප්‍රධානත්වය දරයි. මෙහෙයුම් අංශයේ ප්‍රධානියා වශයෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයකු කටයුතු කරන අතර සහකාර මූල්‍යාධිකාරිවරයා මූල්‍ය අංශයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි.

මෙම පීඨය මේ වන විටත් ස්ථාපනය කර ඇති අධ්‍යයන මණ්ඩල නවයක් සහිතව ක්‍රියාත්මක වන අතර පීඨ සහ අධ්‍යයනාංශ සමඟ සමීප සමායෝජනයක් සහිතව මෙම පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සහ ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධි වැඩසටහන් පවත්වනු ලබයි. ඒ ඒ අධ්‍යයන මණ්ඩලය මගින් දර්ශනපති උපාධි වැඩසටහන් සහ දර්ශනශූරි උපාධි වැඩසටහන් පවත්වයි. මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, ජීව විද්‍යා, භෞතික විද්‍යා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යය, වෛද්‍ය විද්‍යා, බහුවිධ අධ්‍යයන, ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය යන අධ්‍යයන මණ්ඩල මෙම පීඨයේ ස්ථාපනය කර ඇති අධ්‍යයනය මණ්ඩල වේ. සහතික පත්‍ර පාඨමාලා, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ඒක වාර්ෂික ශාස්ත්‍රපති උපාධි පාඨමාලා, පාඨමාලා කටයුතු සහ පර්යේෂණ අනුව පිරිනමනු ලබන ශාස්ත්‍රපති උපාධි සහ පර්යේෂණ සඳහා පමණක් පිරිනමනු ලබන උසස් උපාධි පාඨමාලා උපාධි අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන වැඩසටහන්වලට ඇතුළත් වේ. සියලුම අධ්‍යයන වැඩසටහන් දිවයිනේ මිණුම් සලකුණ ලෙස සැලකෙන ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සමඟ පෙළ ගැසී ඇත. තවද, උපාධි අධ්‍යයන පීඨය වාර්ෂිකව බහුවිධ ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් පවත්වනු ලබන අතර වසරකට දෙවරක් බහුවිධ අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සඟරාවක් ද ප්‍රකාශයට පත් කරයි. එමෙන්ම, මෙම පීඨය මගින් ශාස්ත්‍රඥයින් සහ කර්මාන්තවල නිරත ව සිටින පිරිස් සඳහා කෙටි පාඨමාලා, වැඩමුළු, ආරාධිත දේශන රාශියක් පවත්වයි.

උපාධි අධ්‍යයන පීඨය මගින් පිරිනමනු ලබන පාඨමාලා සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමු (SLQF) මට්ටම් සහ එම පාඨමාලා සඳහා ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් පහත දැක්වේ.

| ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මට්ටම් | පිරිනමනු ලබන සුදුසුකම් | අධ්‍යයන සම්භාර ගණන / අධ්‍යයන කාල සීමාව | යෝග්‍යත්ව |
|---|---|---|---|
| 7 | පශ්චාත් උපාධි සහතික පත්‍ර | 20 | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 5 හෝ 6 |
| 8 | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 25 | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 5 හෝ 6 |

| | | | |
|---|---|---|---|
| 9 | පාඨමාලා කටයුතු අනුව ලබා දෙන ශාස්ත්‍රපති උපාධිය (එක් වසර) | 30 | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 5 හෝ 6 |
| 10 | පාඨමාලා කටයුතු සහ පර්යේෂණ මගින් ලබා දෙන ශාස්ත්‍රපති උපාධිය | 60 | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 5 හෝ 6 |
| 11 | පර්යේෂණ මගින් ලබා දෙන ශාස්ත්‍රපති උපාධිය (MAR) | දෙවසරක පූර්ණ කාලීන | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 5 හෝ 6 |
| 11 | දර්ශනපති උපාධිය (M Phil) | දෙවසරක පූර්ණ කාලීන | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 6 සහ ඊට ඉහළ |
| 12 | Doctor of Philosophy (PhD) | තෙවසරක පූර්ණ කාලීන | ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 6 සහ ඊට ඉහළ |

උපාධි අධ්‍යයන පීඨය මගින් පිරිනමනු ලබන සියලුම පාඨමාලා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව - 2015 ට (SLQF - 2015) ගැළපෙන පරිදි සම්පාදනය කර ඇත. ඉගෙනීමේ ප්‍රධාන විෂය හතර වන දැනුම, කුසලතා, ආකල්ප සහ මනෝ විහිතිය සහ ආදර්ශය K-SAM ආකෘතිය මගින් විදහා දැක්වේ. මෙම ඉගනුම් ඵල සාක්ෂාත් කර ගත හැකි වන පරිදි සියලුම පාඨමාලා සකස් කර ඇත. ඉගෙනුම් ඵලවල ප්‍රධාන ක්ෂේත්‍ර සහ කාණ්ඩ පහත දැක්වේ;

| ප්‍රධාන ක්ෂේත්‍රය | ඉගෙනුම් ඵල කාණ්ඩ |
|---|---|
| දැනුම | විෂය / සෛධාන්තික දැනුම |
| | ප්‍රායෝගිත දැනුම සහ භාවිතය |
| කුසලතා | සන්නිවේදනය |
| | සාමූහික ප්‍රයත්නය සහ නායකත්වය |
| | නිර්මාණශිලීතාව සහ ගැටළු විසඳීම |
| | කළමනාකරණ සහ ව්‍යවසායකත්වය |
| | තොරතුරු භාවිතය සහ කළමනාකරණය |
| | ජාල කරණය සහ සමාජීය කුසලතා |
| | අනුවර්ත්‍යතාව සහ නම්‍යතාව |
| ආකල්ප, සාරධර්ම, වෘත්තීය දක්ෂතා, ජීවන දර්ශනය | ආකල්ප, සාරධර්ම, වෘත්තීය දක්ෂතා, |
| | ජීවන දර්ශනය |
| මනෝ විහිතිය සහ ආදර්ශය | ස්වයං යාවත්කාලීන කිරීම / ජීවිත කාලය පුරා ඉගෙනීම |

## ශිෂ්‍ය දත්ත

උපාධි අධ්‍යයන පීඨය මගින්

- සහතික පත්‍ර පාඨමාලා 02 ක් ද,
- පශ්චාත් උපාධි ඩිප්ලෝමා 09 ක් ද,
- ශාස්ත්‍රපති උපාධි 55 ක් ද,
- දර්ශනපති උපාධි 41 ක් ද,
- ආචාර්ය උපාධි 35 ක් ද පිරිනමයි.

2018 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරී ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අධ්‍යයන වැඩසටහන | එකතුව |
|---|---|
| **සහතික පත්‍ර පාඨමාලා** | |
| සංස්ථාපිත පාරිසරික තිරසාර භාවය පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රය | 4 |
| සමෝධානිත අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රය | 7 |
| **එකතුව** | 11 |
| | |
| **පශ්චාද් උපාධි ඩිප්ලෝමා** | |
| ලේඛකත්ව සහ ජන සන්නිවේදනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 33 |
| අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 45 |
| අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 59 |
| අධීක්ෂණ හා ඇගයීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 22 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 35 |
| සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 5 |
| | |
| **එකතුව** | **199** |
| | |
| **විද්‍යාපති, ශාස්ත්‍රපති, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය** | |
| ව්‍යවසායකත්ව **විද්‍යාපති** උපාධිය (MEntr) | 124 |
| කළමනාකරණය පිළිබඳ **ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධිය** | 495 |
| වෘත්තීය ගිණුම්කරණය පිළිබඳ **විද්‍යාපති** උපාධිය (MPAcc) | 90 |
| බහු අවයවික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ **විද්‍යාපති** උපාධිය | 93 |
| භූගෝලීය තොරතුරු පද්ධතිය සහ දුරස්ථ සංවේදනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 132 |
| දේපළ වෙළඳාම් කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 67 |
| ආහාර විද්‍යාව හා තාක්‍ෂණය පිළිබඳ **විද්‍යාපති** උපාධිය | 28 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා / විද්‍යාපති උපාධිය | 127 |
| වන විද්‍යා හා පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 49 |
| ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 22 |
| කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධිය | 21 |
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 45 |
| කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 122 |
| සිංහල පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 1 |
| සංස්කෘතික අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 2 |
| මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 2 |

| | |
|---|---|
| බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 2 |
| බුද්ධ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 1 |
| දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 3 |
| ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 2 |
| සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 2 |
| අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 1 |
| අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (Master of Arts Test) | 42 |
| | |
| **එකතුව** | **1473** |
| | |
| **දර්ශනපති උපාධි** | |
| සිංහල පිළිබඳ දර්ශනපති උපාධිය | 5 |
| දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය | 12 |
| බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ දර්ශනපති උපාධිය | 3 |
| පාලි පිළිබඳ දර්ශනපති උපාධිය | 3 |
| ජන සන්නිවේදනය පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| සංස්කෘතික අධ්‍යයන පිළිබඳ දර්ශනපති උපාධිය | 8 |
| සංස්කෘත භාෂාව පිළිබඳ දර්ශනපති උපාධිය | 3 |
| ඉංග්‍රීසි පිළිබඳ දර්ශනපති උපාධිය | 2 |
| භූගෝල විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 5 |
| අපරාධ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 5 |
| සමාජ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 2 |
| පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 4 |
| මානව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 2 |
| සංගීතය පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| ආහාර විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 7 |
| වන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 4 |
| උද්භිද විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 4 |
| සත්ව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 11 |
| ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 9 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| ජෛව රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 9 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| වෛද්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍ය විද්‍යා පිළිබඳ දර්ශනපති උපාධිය | 7 |
| ව්‍යුහ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 4 |
| කායික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 5 |
| පරපෝෂිත විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 2 |
| රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 19 |
| භෞතික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 9 |
| ගණිතය පිළිබඳ දර්ශනපති උපාධිය | 5 |
| පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 4 |
| බහුවිෂයික දර්ශනපති උපාධිය | 6 |
| | |
| **එකතුව** | **163** |
| | |

| | |
|---|---|
| ආචාර්ය උපාධි (දර්ශනශූරි උපාධිය, විද්‍යා ආචාර්ය උපාධිය, වෛද්‍ය ආචාර්ය උපාධිය, ශල්‍ය විද්‍යාපති උපාධිය,........) | |
| සිංහල පිළිබඳ දර්ශනශූරි උපාධිය | 2 |
| ජන සන්නිවේදනය පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| සංස්කෘතික අධ්‍යයන පිළිබඳ දර්ශනශූරි උපාධිය | 2 |
| ඉංග්‍රීසි පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| දර්ශනය පිළිබඳ දර්ශනශූරි උපාධිය | 3 |
| අපරාධ විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| භූගෝල විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 3 |
| සත්ව විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 10 |
| උද්භිද විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 4 |
| ආහාර විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 14 |
| වන විද්‍යා හා පාරිසරික කළමනාකරණය පිළිබඳ දර්ශනශූරි උපාධිය | 6 |
| පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 6 |
| භෞතික විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| කළමනාකරණය පිළිබඳ දර්ශනශූරි උපාධිය | 67 |
| රසායන විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 2 |
| ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 4 |
| ජෛව රසායන විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 3 |
| වෛද්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍ය විද්‍යා පිළිබඳ දර්ශනශූරි උපාධිය | 5 |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| කායික විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 3 |
| බහුවිෂයික දර්ශනශූරි උපාධිය | 8 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| ව්‍යුහ විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| | |
| **එකතුව** | **152** |
| | |
| **මුළු එකතුව** | **1998** |

**උපාධි අධ්‍යයන පීඨයේ සංස්කාරක කමිටු සඳහා උපාධි අධ්‍යයන පීඨ මණ්ඩලය**

උපාධි අධ්‍යයන පීඨය මගින් ශ්‍රී ලංකාවේ කීර්තිමත් ප්‍රකාශකයන් සමඟ එක්ව වැඩි දියුණු කරන ලද වැඩපිළිවෙළට අනුකූලව මාර්ගෝපදේශ සකස් කර, ප්‍රකාශයට පත් කිරීමට සුදුසු ශාස්ත්‍රීය නිබන්ධනය තෝරා ගැනීමට කටයුතු කරන ලෙස සියලුම අධ්‍යයන මණ්ඩලවලට දැනුම් දී තිබුණි. මෙම කාර්යය සඳහා සංස්කාරක මණ්ඩලය ස්ථාපනය කරන ලදී. මෙය විශ්වවිද්‍යාලය මගින් අනාවරණය කර ගන්නා ලද පර්යේෂණ තොරතුරු ඒවා භාවිතා කරන මහජනතාව වෙත බෙදා හැරීම සඳහා දරන ලද ප්‍රයත්නයකි. පර්යේෂණයේ වඩාත්ම වැදගත් සොයා ගැනීම්, ඉලක්කගත ප්‍රේක්ෂකයින් / ප්‍රතිග්‍රාහකයන් සහ පර්යේෂණ ප්‍රතිඵලය උපයෝගී කර ගැනීම සඳහා යෝජිත යාන්ත්‍රණය පිළිබඳ තොරතුරු ඇතුළත් ආකෘතිපත්‍රයක් ද තම ශාස්ත්‍රීය නිබන්ධනයට ඇතුළත් කරන ලෙස ස්වකීය ශාස්ත්‍රීය නිබන්ධන ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ සිසුන් වෙත දැනුම් දෙනු ලැබේ.

**උපාධි අධ්‍යයන පීඨයේ ආචාරධර්ම කමිටුව**

උපාධි අධ්‍යයන පීඨයේ ආචාරධර්ම කමිටුව නිල වශයෙන් ස්ථාපනය කර විශ්වවිද්‍යාල සනාතන සභාවේ අනුමතිය ද ලබා දී ඇති අතර මානව විෂයයන් සම්බන්ධ පර්යේෂණ සඳහා ආචාර ධර්ම මාර්ගෝපදේශ සකස් කිරීමේ කාර්යය උපාධි අධ්‍යයන පීඨයේ ආචාරධර්ම කමිටුව වෙත පවරා ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය සහ විද්‍යාත්මක ලේඛනකරණ පාඨමාලාව**

උසස් ගුණාත්මකභාවයෙන් යුත් පශ්චාත් උපාධිධාරීන් බිහිකිරීමේ අරමුණින්, උපාධි අධ්‍යයන පීඨය මගින් ''පර්යේෂණ ක්‍රමවේදය සහ විද්‍යාත්මක ලේඛනකරණය'' පිළිබඳ කෙටි පාඨමාලාවක් ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාව සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බැවින්, මෙම පාඨමාලාව වසරකට දෙවරක් පිරිනැමීමට උපාධි අධ්‍යයන පීඨය තීරණය කර ඇත. 2018 වර්ෂයේ දී, ශිෂ්‍යයන් 63 දෙනෙකුගෙන් සමන්විත වූ තෙවන කණ්ඩායම සඳහා මෙම පාඨමාලාව 2018 මැයි 31 සිට 2018 ජූලි 20 දක්වා පවත්වන ලද අතර ශිෂ්‍යයන් 35 දෙනෙකුගෙන් සමන්විත වූ සිව්වන කණ්ඩායම සඳහා දේශන 2018 නොවැම්බර් 07 සිට 2018 දෙසැම්බර් 27 දක්වා පවත්වන ලදී. උපාධි අධ්‍යයන පීඨයේ වර්තමාන පශ්චාත් උපාධි අපේක්ෂකයන්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ බාහිර පුද්ගලයන්ගේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන පවත්වන ලදී.

**බහුවිධ ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - 2018**

**බහුවිධ ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - 2018 (**ICMA - 2018 )2018 අනුගාමී පස්වන වරටත් 2018 අගෝස්තු 31 සිට 2018 සැප්තැම්බර් 02 දක්වා කළුතර ටැංජරීන් බීච් හෝටලයේ දී සාර්ථකව පවත්වන ලදී. මෙවර සමුළුවේ තේමාව වූයේ ''බහුවිධ පර්යේෂණ තුළින් තිරසාර සංවර්ධනය'' යන්නයි. 2018 වර්ෂයේ දී, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට අමතරව, ජාතික විද්‍යා පදනම ද සම හවුල්කරුවෙකු වශයෙන් මෙම සමුළුවට සම්බන්ධ විය. විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා මහනුවර උරුමය පිළිබඳ අමාත්‍ය, ගරු ආචාර්ය සරත් අමුණුගම මහතා මෙම සමුළුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වූ අතර ගෞරව සහිතව විශ්‍රාමලත්, කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා ප්‍රධාන කථිකයා වශයෙන් මෙම අවස්ථාවට සහභාගී විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති, මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පර්යේෂණ සිදු කිරීමේ අවශ්‍යතාව ඇති කරවන ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව අතර සම්බන්ධතාවය පැහැදිලි කළේය.

5 වන බහුවිධ ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - 2018 (ICMA 2018) සඳහා පර්යේෂණ සාරාංශ 200 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇත. ඒවා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් (ඉන්දියාව, කැනඩාව සහ ඉරානයේ පර්යේෂණ සාරාංශ සමඟ) ඉදිරිපත් කරන ලද පර්යේෂණ සාරාංශ විය. විශේෂඥ සමාලෝචන ක්‍රියාවලියකින් පසුව මෙම සමුළුවට ඉදිරිපත් කිරීම සඳහා පර්යේෂණ සාරාංශ 174 ක් පිළිගෙන ඇති අතර ඉංජිනේරු විද්‍යාව, තාක්ෂණය හා භෞතික විද්‍යා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, කළමනාකරණය, වාණිජ්‍ය හා කර්මාන්ත සංවර්ධනය, සෞඛ්‍ය විද්‍යා හා පෝෂණය, පාරිසරික තිරසාරභාවය, හරිත නවෝත්පාදන හා ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ ස්වාභාවික හා ජීවින විද්‍යා යනාදී විවිධ අංශවලින් සංවිධානය කරනු ලැබූ වාචික ඉදිරිපත් කිරීම් 124 කින් සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් 50 කින් එම පර්යේෂණ සාරාංශ සමන්විත වේ.

ඉහත කරුණුවලට අමතරව, තේමා කතා තුනක් සංවිධානය කර ඇති අතර ආරාධිත සම්පත්දායකයින් විසින් එම තේමා කතා පවත්වා ඇත. මෙම සම්පත්දායකයින් ඔවුන්ගේ විශේෂිත පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍ර ඔස්සේ ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව ඇත.

1. ලෝකයේ ප්‍රයිමේට් සත්ත්වයන් පිළිබඳ සිදු කරනු ලබන පර්යේෂණවල තත්වය පිළිබඳ තේමා කතාව - ජපානයේ කියොතෝ විශ්වවිද්‍යාලයේ ප්‍රයිමේට් පර්යේෂණ ආයතනයේ මහාචාර්ය මයිකල් ඒ. හෆ්මන්.

2. පාරිසරික තිරසාරභාවය, හරිත නවෝත්පාදන හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ තේමා කතාව - කැනඩාවේ ඇල්බර්ටා හි ලේක්ලන්ඩ් විද්‍යාලයේ පාරිසරික අධ්‍යයන පීඨයේ පීඨාධිපති මහාචාර්ය මල්විල දිසානායක.

3. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඵලදායිතාව සහතික කිරීම පිළිබඳ තේමා කතාව: ශ්‍රී ලංකාවේ ඩර්ඩන්ස් රෝහලේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ වෛද්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය විමල් කරන්නාගොඩ මහතා

අධ්‍යයන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් වට මේස සාකච්ඡා දෙකක් සංවිධානය කර පවත්වන ලදී.

<u>වට මේස සාකච්ඡාව 01</u>

තේමාව: 'අන්තර්කරණ හරිත වර්ධනය වෙත'
සභාපති: මහාචාර්ය සිරි හෙට්ටිගේ, ගෞරව සහිතව විශ්‍රාමලත් කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය සහ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි ආර්එම්අයිටී විශ්වවිද්‍යාලයේ සහාය මහාචාර්ය සහ Sociology Cluster drafting sustainable vision 2030 හි ප්‍රධානි

**කණ්ඩායම් සාමාජිකයන්:**

- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හේමන්ති රණසිංහ, පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, වන විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
- ආචාර්ය ශාන්තා විජේසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
- ආචාර්ය තමරා ඩයස්, අතිරේක අධ්‍යක්ෂ, ජාතික විද්‍යා පදනම, ශ්‍රී ලංකාව
- හරේන්ද්‍ර දසනායක මහතා, ප්‍රධානී, ජනාධිපති ලේකම් කාර්යාලයේ ජාත්‍යන්තර මාධ්‍ය අංශය
- රන්දීව මලලසූරිය මහතා, ප්‍රධාන විධායක නිලධාරී, ලංකා බිස්කට්ස් ලිමිටඩ්.

<u>වට මේස සාකච්ඡාව 02</u>

තේමාව: 'හරිත නවෝත්පාදන පිළිබඳ කාර්මික සැසිය'
සභාපති: මහාචාර්ය අජිත් අල්විස්, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය.

**කණ්ඩායම් සාමාජිකයන්:**

- මහාචාර්ය චැටර්ජි සුදීප්තා, සහකාර මහාචාර්ය සහ ප්‍රධානී, ස්වාභාවික සම්පත් අධ්‍යයනාංශය, TERI විශ්වවිද්‍යාලය, ඉන්දියාව.
- මහාචාර්ය මල්විල දිසානායක, පීඨාධිපති, පරිසර විද්‍යා පීඨය, ලේක්ලන්ඩ් විද්‍යාලය කැනඩාව.
- ශාරිකා සේනානායක මහත්මිය, තිරසාරත්වය පිළිබඳ ප්‍රධානී, මාස් හෝල්ඩින්ග්ස්
- ඉංජිනේරු. සේනා පෙරිස්, හිටපු විධායක අධ්‍යක්ෂ, නැෂනල් ක්ලීනර් ප්‍රොඩක්ෂන් සෙන්ටර්.
- අශෝක හෙට්ටිගොඩ මහතා, අධ්‍යක්ෂ, හෙට්ටිගොඩ කර්මාන්ත

**බහුවිධ අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව**

බහුවිධ අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව (IJMS) යනු පර්යේෂකයන්ට ඔවුන්ගේ බහුවිධ පර්යේෂණ කටයුතු ඉදිරිපත් කිරීම සඳහා පවතින අග්‍රගණ්‍ය වේදිකාවකි. මෙය ද්විවාර්ෂික සඟරාවක් වන අතර 5 වන වෙළුමේ කලාප දෙකක් 2018 ජූලි සහ දෙසැම්බර් මාසවල දී ප්‍රකාශයට පත් කරන ලදී.

**විෂයමාලා සංවර්ධනය හා තත්ත්ව සහතික කමිටුව**

පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම පිළිබඳව උපාධි අධ්‍යයන පීඨ මණ්ඩලයට වාර්තා කිරීමේ වගකීම උපාධි පීඨ මණ්ඩලයේ අනුකමිටුවක් වන විෂයමාලා සංවර්ධන හා තත්ත්ව සහතික කිරීමේ කමිටුව වෙත පවරා ඇත.

- ප්‍රගති වාර්තා සහ නිබන්ධන සඳහා යෝජනා අධීක්ෂණය සම්බන්ධ දේශීය හා විදේශීය ඇගයුම්කරුවන් වෙනුවෙන් ගාස්තුවක් නිර්ණය කිරීම, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයට අයත් රටවල් කාණ්ඩය සහ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයට අයත් නොවන රටවල් කාණ්ඩය ද ඇතුළත්ව විදේශීය ශිෂ්‍ය ගාස්තු නිර්ණය කිරීම.

- ඒකාබද්ධ පර්යේෂණ උපාධි සඳහා ගාස්තු නිර්ණය කිරීම.

- ගෝලීය හා ජාතික පර්යේෂණ ප්‍රමුඛතා පිළිබඳව සලකා බලමින් විශ්වවිද්‍යාලයේ සියළුම අධ්‍යයන විෂයයන් ඇතුළත් කිරීම සඳහා විශ්ව විද්‍යාලය සඳහා පර්යේෂණ රාමුවක් සැලසුම් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. මෙම කාර්යය උපාධි අධ්‍යයන පීඨයේ සහ ජාතික පර්යේෂණ කවුන්සිලයේ සමායෝජනයෙන් සිදු වේ.

## උපාධි අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ආරාධිත දේශන

පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමේ අරමුණින් සහ කාලීන වැදගත්කමක් සහිත කරුණු සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් ලබා දීම පිණිස මාසිකව ආරාධිත දේශන මාලාවක් පැවැත්වීම ආරම්භ කර තිබුණි. ශ්‍රී ලංකා තත්ත්ව හා ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා වූ සංගමය සමඟ ඒකාබද්ධව, ශ්‍රී ලංකා ඩර්ඩන්ස් රෝහලේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සහ වෛද්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය විමල් කරන්නාගොඩ මහතා විසින් "ඵලදායිතාව ළඟා කර ගැනීම සඳහා නව ප්‍රවේශයක්" යන මැයෙන් පවත්වන ලද ආරාධිත දේශනය සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ උද්භිද විද්‍යා අධ්‍යයනාංශය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලදුව, ඇමරිකා එක්සත් ජනපදයේ හූස්ටන් විශ්ව විද්‍යාලයේ ජීව විද්‍යා හා ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශයේ යූඑච්- ජානමය ද්‍රව්‍ය අනුක්‍රමණය හා ජාන සංස්කරණය පිළිබඳ ප්‍රධාන මහාචාර්ය ප්‍රීති එච්. ගුණරත්න විසින් "ජානමය ද්‍රව්‍ය විප්ලවය මගින් විද්‍යාත්මක සොයා ගැනීම් පරිවර්තනය කිරීම" යන මැයෙන් පවත්වන ලද ආරාධිත දේශනය ද මාසික ආරාධිත දේශන මාලාව යටතේ පවත්වන ලද ආරාධිත දේශන විය.

**පර්යේෂණාත්මක සැලසුම් සහ දත්ත සංඛ්‍යා විද්‍යාත්මකව විශ්ලේෂණය පිළිබඳ දින පහක් සඳහා පවත්වනු ලබන කඩිනම් කෙටි පාඨමාලාව**

උපාධි අධ්‍යයන පීඨය මගින් 2018 ජූලි 02 සිට 06 දක්වා වූ දින පහක කාලයක් සඳහා පවත්වන ලද පර්යේෂණාත්මක සැලසුම් සහ දත්ත සංඛ්‍යා විද්‍යාත්මකව විශ්ලේෂණය පිළිබඳ කඩිනම් කෙටි පාඨමාලාව සඳහා 31 දෙනෙකු සහභාගී වූ අතර 2018 ඔක්තෝබර් 01 සිට 05 දක්වා වූ දින පහ පවත්වන ලද එම පාඨමාලාව සඳහා 26 දෙනෙක් සහභාගී වූ අතර මෙම පාඨමාලා ඉතා සාර්ථක අන්දමින් පැවැත්වීමට උපාධි අධ්‍යයන පීඨයට හැකියාව ලැබුණි. පර්යේෂණාත්මක සැලසුම් සහ නිරීක්ෂණ අධ්‍යයන, බහු විචල්‍ය සංඛ්‍යාලේඛන විද්‍යාව, විවිධ සංඛ්‍යාලේඛනමය මෙවලම් භාවිතයෙන් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සහ Atlas.ti / SPSS / Minitab මෘදුකාංග භාවිතයෙන් ගුණාත්මක දත්ත විශ්ලේෂණය යන ක්ෂේත්‍ර මෙම පාඨමාලාව මගින් ආවරණය කරන ලදී.

**තත්ත්ව කව / කාර්ය කණ්ඩායම් / හරස් ක්‍රියාකාරී / සීඅයි කණ්ඩායම් / ඵලදායිතා වැඩිදියුණු කිරීමේ කණ්ඩායම් පැවතීම**

## හරිත විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය

පීඨවල සියලුම පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී, මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) නියෝජිත, වැඩ ඉංජිනේරු, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, උද්‍යාන අධීක්ෂක, නේවාසිකාගාර පාලකයන්, සිසුන් සහ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය හා පරිපාලන කාර්ය මණ්ඩලය නියෝජනය කරමින් සහභාගී වූ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නියෝජනය සහිතව විශ්ව විද්‍යාලයේ හරිත කණ්ඩායම ස්ථාපනය කිරීම සඳහා උපාධි අධ්‍යයන පීඨය මගින් නායකත්වය සපයන ලදී. අපද්‍රව්‍ය කළමනාකරණය, ජලය, බලශක්තිය ඇතුළු සම්පත් සංරක්ෂණය වැනි ක්ෂේත්‍ර සඳහා උපදෙස් ලබා දීම හා පරිසර හිතකාමී පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම කණ්ඩායම ස්ථාපනය කරන ලදී. ඉදිරිපත් කිරීම් සහ ගස් සිටුවීම, අපද්‍රව්‍ය කළමනාකරණය යනාදි ප්‍රායෝගික අංශ ඇතුළු වැඩසටහන් කිහිපයක් ලෝක පරිසර දිනය වෙනුවෙන් 2018 ජුනි 06 දින සංවිධානය කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය විශ්ව විද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ සහ වෙනත් අධ්‍යනාංශවල තබා ගැනීම සඳහා වර්ණ අපද්‍රව්‍ය බඳුන් කිහිපයක් සැපයීම මගින් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා විශ්ව විද්‍යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදී.

## උපාධි අධ්‍යයන පීඨය මගින් අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම්

2016, 2017 සහ 2018 යන වර්ෂවල දී පවත්වන ලද බහුකාර්ය ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (අයිසීඑම්ඒ) පැවැත්වීම සඳහා ඒකාබද්ධ සංවිධායකයෙකු සහ අනුග්‍රාහකයෙකු වශයෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය උපාධි අධ්‍යයන පීඨය සමඟ සහයෝගයෙන් කටයුතු කර තිබේ.

සන්නාම ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් අන්තර්ජාතික විශ්ව විද්‍යාල, කර්මාන්ත හා පර්යේෂණ ආයතන වැනි විවිධ දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගීතා ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්වලට එළැඹෙන ලද අතර විදේශීය රටවල පුද්ගලයන්ගේ සහභාගීත්වය ලබා ගැනීම සඳහා මෙන්ම දැනුම හුවමාරු කර ගැනීම සඳහා ද විදේශීය විශ්ව විද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් කිහිපයක් අත්සන් තබා ඇත.

**<u>2018 වර්ෂයේ දී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම් සහ වෙනත් ගිවිසුම්</u>**

1. ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය උපාධි අධ්‍යයන පීඨය (එෆ්ජීඑස්) සහ සම්පත් බැංකුව පීඑල්සී අතර අත්සන් ලබන ලද අවබෝධතා ගිවිසුම
2. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ බත්තරමුල්ල ඇතුල් කෝට්ටේ පාරේ අංක 316 දරන ස්ථානයේ පිහිටි වෝටර්ස් එජ් ලිමිටඩ් අතර අත්සන් ලබන ලද අවබෝධතා ගිවිසුම
3. ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය උපාධි අධ්‍යයන පීඨය (එෆ්ජීඑස්) සහ ඉන්දියාවේ නවදිල්ලි නුවර ටෙරී උසස් අධ්‍යයන පාසල අතර අත්සන් ලබන ලද අවබෝධතා ගිවිසුම
4. ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය උපාධි අධ්‍යයන පීඨය (එෆ්ජීඑස්) සහ කැනඩාවේ ඇල්බර්ටාහි කැල්ගරි ප්‍රදේශයේ පිහිටි කැල්ගරි විශ්ව විද්‍යාලයේ ("යූකාල්ගරි") ආණ්ඩුකාරවරුන් අතර අත්සන් ලබන ලද අවබෝධතා ගිවිසුම
5. ජාතික විද්‍යා පදනමේ (එන්එස්එෆ්) විදේශීය විද්වතුන් සඳහා විදේශ සංචාරක ප්‍රදානය.

# තාක්ෂණ පීඨය




ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල අතර 2013 දී ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වාදෙන ලද අ.පො.ස (උ.පෙළ) තාක්ෂණික විෂය ධාරාව සඳහා තාක්ෂණික පීඨයක් ස්ථාපනය කිරීමේ වගකීමට උරදීම සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයි. මේ සඳහා සකස් කරන ලද තාක්ෂණික අධ්‍යයන පටිපාටිය විශ්වවිද්‍යාලයේ සානාථන සභාව විසින් 2015 සැප්තැම්බර් මස 23 වන දින විශ්වවිද්‍යාල පාලක සභාවට නිර්දේශ කරන ලද අතර එයට 2015 ඔක්තෝම්බර් මස 08 වන දින කරන ලද නිර්දේශය පරිදි 2015 නොවැම්බර් මස 19 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මාහාචාර්ය සම්පත් අමරතුංග මහතා ඇතුලු කණ්ඩායමේ ඉමහත් කැපවීම මත ගරු උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින් 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 27(01) වගන්ති ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන ලද 2016 ජනවාරි 08 වන දින දරණ අංක 1948/59 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පීඨය පිහිටුවන ලදී.

තාක්ෂණ පීඨය පහත දක්වා ඇති අධ්‍යයනාංශ තුනකින් සමන්විතය;

| | අධ්‍යයනාංශය | අධ්‍යයනාංශ ප්‍රධාන |
|---|---|---|
| 01. | ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය නිල්මිණී ලියනගේ මහත්මිය |
| 02. | ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය රන්දිකා ජයසිංහ මහත්මිය |
| 03. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය | ආචාර්ය බී.එන්.එස්.ලංකාසේන මහතා |

මෙම අධ්‍යයනාංශය ශ්‍රී ලංකාවේ ඉහළ ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රයන්හි ගෞරව උපාධි පිරිනමයි. මෙම උපාධි පාඨමාලා පූර්ණ කාලීන සිව් අවුරුදු වෘත්තීය උපාධි පාඨමාලාව වන අතර ඒවා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (SLQF) 6 මට්ටමේ දී පිරිනමනු ලැබේ.

ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය විසින් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය සඳහා වන විෂය නිර්දේශය ක්‍රියාත්මක කරයි. මෙම විෂය නිර්දේශය සිඩ්නි සම්මුතිය මත පදනම් වූ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වසර 04 ක උපාධි පාඨමාලාව සඳහා වන පිළිගැනීමේ කාර්ය සංග්‍රහය අනුව පිළියෙළ කර ඇත. මෙම ඉංජිනේරු තාක්ෂණවේදී විෂය මාලාව විසින් බලශක්ති හා පරිසර තාක්ෂණවේදය, යාන්ත්‍රික තාක්ෂණවේදය, ඉදිකිරීම හා ගොඩනැගිලි සේවා, පුරාතාක්‍ෂණය, බහු අවයවික ක්‍රියාවලි තාක්ෂණවේදය සහ මෝටර් රථ තාක්ෂණවේදය යන ප්‍රධාන ක්ෂේත්‍ර හයක් ඉලක්ක කර ගනිමින් සුවිශේෂ හැකියාවන් ඇති උපාධිධාරීන් බිහිකිරීමට කටයුතු කරනු ලැබේ. එසේම මෙම අධ්‍යයනාංශය විසින් අනෙකුත් අධ්‍යයනාංශවලට අදාල පොදු විෂයයන්ද ඉදිරිපත් කරනු ලබයි.

ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය විසින් ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය සඳහා වන විෂය නිර්දේශය ක්‍රියාත්මක කරයි. මෙම විෂය නිර්දේශ යටතේ කාර්මික ජෛව ක්‍රියාවලි තාක්ෂණය, ආහාර සැකසුම් ක්‍රියාවලි තාක්ෂණය සහ කෘෂිකාර්මික හා පාරිසරික තාක්ෂණවේදය යන ප්‍රධාන ක්ෂේත්‍ර තුන ඉලක්ක කරගනිමින් සුවිශේෂ හැකියාවන් ඇති උපාධිධාරීන් බිහිකිරීමට කටයුතු කරනු ලැබේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය සඳහා වන විෂය නිර්දේශය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම විෂය නිර්දේශය ශ්‍රී ලංකාවේ පරිගණක සංසදයේ මග පෙන්වීම යටතේ පිළියෙළ කරන ලද මෘදුකාංග තාක්ෂණය, බහුමාධ්‍ය තාක්ෂණය හා ජාල තාක්ෂණය යන ප්‍රධාන ක්ෂේත්‍ර තුන ඉලක්ක කර ගනිමින් සුවිශේෂ හැකියාවක් ඇති උපාධිධාරීන් බිහිකිරීමට කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පීඨයේ දෙවන ශිෂ්‍ය කණ්ඩායම සඳහා නම්නීකරණ වැඩසටහන සිසුන් 321 කගේ හා දෙමාපියන්ගේ සහභාගිත්වයෙන් 2017 දෙසැම්බර් මස 16 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී සිදු කරන ලදී. එහි නම්නීකරණ වැඩසටහන අවසානයේ දී ක්‍රීඩා දිනයක් 2017 දෙසැම්බර් මස 22 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය ක්‍රිඩා පිටියේදී පවත්වා අවසන් කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පීඨයේ තෙවන ශිෂ්‍ය කණ්ඩායම සඳහා නම්නීකරණ වැඩසටහන 2019 පෙබරවාරි මස 24 දින පැවැත්වීමට සැලසුම් කරන ලදී.

## 2018 පීඨයෙන් නිකුත් කළ ප්‍රතිපල පිළිබඳ විස්තර

| පාඨමාලව | ප්‍රථම පන්තිය | දෙවන පෙළ ඉහල | දෙවන පෙළ පහළ | සමත් | මුලු සමත් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| **ඉංජිනේරු තාක්ෂණ උපාධිය** | **(තවම උපාධි ලබන මට්ටමට අධ්‍යයන කටයුතු අවසන්ව නොමැත)** | | | | |
| **ජෛව පද්ධති තාක්ෂණ උපාධිය** | | | | | |
| **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය** | | | | | |
| එකතුව | | | | | |

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය

| පාඨමාලාව | මුලු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යමණ්ඩලය | අනධ්‍යයන කාර්යමණ්ඩලය |
|---|---|---|---|
| **ඉංජිනේරු තාක්ෂණ උපාධිය** | 172 | 11 | 6 |
| **ජෛව පද්ධති තාක්ෂණ උපාධිය** | 321 | 13 | 10 |
| **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය** | 149 | 05 | 7 |
| පීඨ කාර්යාලය | අදාල නොවේ | 9 | |

## දේශීය ශිෂ්‍ය විස්තරය

| පාඨමාලාව | මාධ්‍ය | ශිෂ්‍ය වසර | | | | උපාධිධාරීන් |
|---|---|---|---|---|---|---|
| | | 1වන | 2වන | 3වන | 4වන | |
| **ඉංජිනේරු තාක්ෂණ උපාධිය** | සිංහල | 86 | 86 | | | |
| **ජෛව පද්ධති තාක්ෂණ උපාධිය** | | 160 | 161 | | | |
| **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය** | | 75 | 75 | | | |
| එකතුව | | 321 | 321 | | | |

## අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තරය

| ශාඛය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | කථිකාචාර්ය | තාවකාලික කථිකාචාර්ය | ආධුනිකාචාර්ය | උපදේශක | තාවකාලික උපදේශක/නිබන්ධක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පීඨ කාර්යාලය | | 01 | | | | | | | | | 01 |
| ඉංජිනේරු තාක්ෂණ උපාධිය | | | | | 07 | 03 | | 01 | | | 11 |
| ජෛව පද්ධති තාක්ෂණ උපාධිය | | | | 01 | 09 | | | 03 | | | 13 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය | | | | | 03 | 02 | | | | | 05 |
| **එකතුව** | | 01 | | 01 | 19 | 05 | | 04 | | | 30 |

## අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර

| පීඨය | ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ | ආධුනික | කණිෂ්ඨ | එකතුව |
|---|---|---|---|---|---|
| තාක්ෂණ පීඨය | | 02 | 15 | 14 | 32 |

## සිදුකරන ලද පර්යේෂණ,නවෝත්පාදන හා ප්‍රකාශන

| විෂය | ප්‍රසිද්ධකළ | වාණිජ්‍ය කරනය කළ | ඉදිපත්කළ |
|---|---|---|---|
| අ) පර්යේෂණ ප්‍රමානය | 06 | - | 05 |
| ආ) නවෝත්පාද ප්‍රමානය | 02 | - | 03 |
| ඇ) ජර්නල් ප්‍රමානය | 07 | - | |
| ඈ) පොත් ප්‍රමානය | - | - | |
| ඉ) ලිපි ප්‍රමාණය | 10 | - | |
| ඊ) වෙනත් (පර්යේෂණ පිටු) | 21 | - | 03 |
| එකතුව | 46 | - | 11 |

## පවත්වන ලද වැඩ සටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු විස්තර

| විෂය | සහභාගීවූ | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| අ) පශ්චාද් උපාධි වැඩසටහන් | - | - | - |
| ආ) පශ්චාද් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| ඇ) උපාධි වැඩසටහන් | - | - | - |
| ඈ) ඩිප්ලෝමා වැඩසටහන් | - | - | - |
| ඉ) සහතික පත්‍ර වැඩසටහන් | - | - | - |
| ඊ) වැඩසටහන් | 05 | - | - |
| උ) වැඩමුළු | 14 | 01 | 01 |
| එකතුව | 19 | 01 | 01 |

## ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රදාන සංඛ්‍යාව | අධ්‍යයන කාර්යමණ්ඩලය | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය ප්‍රදාන | 11 | - | - |
| ජාතික ප්‍රදාන | 01 | - | - |
| ජාත්‍යාන්තර ප්‍රදාන | - | - | - |
| වෙනත් ( විශේෂ ප්‍රදාන,ත්‍යාග සහ රන් පදක්කම්) | 01 | - | - |
| එකතුව | 13 | - | - |

## ආරම්භකරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර

| පාඨමාලාව | මාධ්‍ය |
|---|---|
| ජෛව පද්ධති තාක්ෂණ උපාධිය | ඉංග්‍රීසි |

# ඉංජිනේරු පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන නව ඉංජිනේරු පීඨ වේ. 2016 ජනවාරි මසදී පිහිටුවන ලද මෙම ඉංජිනේරු පීඨය අධ්‍යයන දෙපාර්තමේන්තු පහකින් සමන්විත වන අතර "විද්‍යාවේදී ඉංජිනේරු" පිළිබඳ උපාධිය ප්‍රධානය කරයි.

මෙම ඉංජිනේරු පීඨය පහත සඳහන් පරිදි අධ්‍යයන දෙපාර්තමේන්තු පහකින් සමන්විත වේ.

| | අධ්‍යයනාංශය | අධ්‍යයනාංශ ප්‍රධානීන් |
|---|---|---|
| 1. | සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය කේ.එම්. සී. කොන්තසිංහ මහතා |
| 2. | පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය ඩී.එම්.ආර්. දිනලංකාර මහතා |
| 3. | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය සී. ද අල්විස් මහතා |
| 4. | විශයාන්තර අධ්‍යයනාංශය | ආචාර්ය එම්. එම්. අන්වර් මහතා |
| 5. | යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය පී.එම්.ටී. බණ්ඩාර මහතා |

## පීඨය මගින් පිරිනමනු ලබන උපාධි

උපාධි

1. විද්‍යාවේදී ඉංජිනේරු උපාධි පාඨමාලාව

## ශිෂ්‍ය සම්පත් විස්තරය

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යමණ්ඩලය | අනධ්‍යයන කාර්යමණ්ඩලය |
|---|---|---|---|
| විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය | 361 (2018.12.31 සිට) | 52 | 38 |
| | 361 | 52 | 38 |

## දේශීය ශිෂ්‍ය විස්තරය

| පාඨමාලාව | මාධ්‍යය | ශිෂ්‍ය වසර | | | | උපාධිධාරීන් |
|---|---|---|---|---|---|---|
| | | 1වන | 2වන | 3වන | 4වන | |
| විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය | ඉංග්‍රීසි | 121 (2018 නොවැම්බර් 19 දින සිට) | 120 | 120 | - | - |

## අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

| විෂය | මහාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 | කථිකාචාර්ය(කොන්ත්‍රාත්) | තාවකාලික උපදේශක/ නිබන්ධක | උපදේශක | එකතුව |
|---|---|---|---|---|---|
| පීඨකාර්යාලය | 0 | 0 | 0 | | 0 |
| සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය | 3 | 0 | 2 | 5 | 10 |
| පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය | 3 | 3 | 0 | 5 | 11 |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය | 4 | 4 | | | 8 |
| විශයාන්තර අධ්‍යයනාංශය | 2 | 3 | | 5 | 10 |
| යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය | 2 | | 4 | 7 | 13 |
| **එකතුව** | 14 | 10 | 6 | 22 | 52 |
| පීඨයේ ආචාර්ය උපාධිය ලැබූ ආචර්යමණ්ඩලහ 14කි | | | | | |

## අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ | ආධුනික | කණිෂ්ඨ | එකතුව |
|---|---|---|---|---|---|
| පීඨකාර්යාලය | 0 | 1 | 5 | 7 | 13 |
| සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය | 0 | 0 | 2 | 3 | 5 |
| පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය | 0 | 0 | 3 | 3 | 6 |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය | 0 | 0 | 1 | 1 | 2 |
| විශයාන්තර අධ්‍යයනාංශය | 0 | 0 | 3 | 3 | 6 |
| යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය | 0 | 0 | 2 | 4 | 6 |
| එකුතව | 0 | 1 | 16 | 21 | 38 |

## සිදුකරන ලද පර්යේෂණ, නිවෝත්පාදන සහ ප්‍රදර්ශණ ප්‍රමානය

| විෂය | ප්‍රකාශිත | වාණිජ කරනය කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ) පර්යේෂණ ප්‍රමනය | 04 | - | 02 |
| ආ) නවෝත්පාදන ප්‍රමානය | - | | - |
| ඇ) ජර්නල් ප්‍රමානය | 01 | - | - |
| ඇ) පොත් ප්‍රමානය | - | - | - |

| | | | |
|---|---|---|---|
| ඉ) ලිපි ප්‍රමානය | 05 | - | 01 |
| ඊ)වෙනත් ( පර්යේෂණ පත්‍රිකා | | - | |
| එකතුව | 10 | 00 | 03 |

## වැඩ සටහන්,සම්මන්ත්‍රණ හා වැඩමුළු විස්තර

| විෂය | සහභාගීවූ | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ) පශ්චාද් උපාධි වැඩසටහන් | - | - | - |
| ආ) පශ්චාද් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් | - | - | - |
| ඇ) උපාධි වැඩසටහන් | - | - | - |
| ඉ)ඩිප්ලෝමා වැඩසටහන් | - | - | - |
| ඊ) සමාතික පත්‍ර වඩසටහන් | - | - | - |
| උ) වෙනත් | - | - | - |
| එකතුව | - | - | - |

## ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රදාන ප්‍රමානය | අධ්‍යයන කාර්යමණ්ඩලය | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය ප්‍රදාන | | - | - |
| ජාතික ප්‍රදාන | - | - | - |
| ජාත්‍යාන්තර ප්‍රදාන | - | - | - |
| වෙනත් ( විශේෂ ප්‍රදාන,ත්‍යාග සහ රන් පදක්කම්) | - | - | - |
| එකතුව | - | - | - |

## සම්මානයෙන් පිදුම් ලද විස්තර

| ප්‍රකාශන වර්ගය | | ගණන | | සටහන |
|---|---|---|---|---|
| | | දේශීය ප්‍රකාශිත | විදේශ ප්‍රකාශිත | |
| සුවිගත සඟරාවල පළ කරන ලද සම්පූර්ණ ලිපිලේඛන | | | 01 | |
| සුවිගත නොකළ විමර්ශන ජර්නලවල පළ කරන ලද සම්පූර්ණ අත්පත්‍රිකා සංඛ්‍යාව | | | | |
| සම්මන්ත්‍රණ ක්‍රියාවලියෙහි සම්පූර්ණ ලියකියවිලි ප්‍රකාශයට පත් කළ සම්මන්ත්‍රණ පත්‍ර සංඛ්‍යාව | | 02 | 04 | |
| නිබන්ධන ප්‍රකාශන ගණන | | 02 | 03 | |
| ප්‍රකාශිත ග්‍රන්ථ පරිච්ඡේද ගණන | | | | |
| ප්‍රකාශිත පොත් සංඛ්‍යාව | ප්‍රකාශකයෙකු විසින් | | | |
| | කර්තෘ විසින් | | | |
| එකතුව | | 04 | 08 | |

## සුවිගත සගරාතඅළ ප්‍රකාශිත සම්පූර්ණ පත්‍රිකා ලැයිස්තුව

| මාතෘකාව | ප්‍රකාශිත වර්ෂය | ප්‍රධාන කතෘගේ නම | | | සම කතෘගේ නම | ජර්නලයේ නම |
|---|---|---|---|---|---|---|
| | | (මයා/මෙය/ මිය/කුමි | මුලකුරු | අවසන් නම | | |
| Roboust regenerator allocation in nonlinear flexible grid optical networks with time varying data rates | 2018 | Mr. | Li. | Yan | Li Yan<br>M.B. Perera<br>N. Dharmaweera<br>E. Agrell | JOCN |

## 2018 දී පේටන් බලපත්‍ර විස්තර

| වර්ගය | සංඛ්‍යාව | | වෙනත් |
|---|---|---|---|
| | ජාතික | ජාත්‍යාන්තර | |
| පේටන්ට් බලපත්‍ර ගොනු කර නැත | | 1 | |
| ලැබුණු පේටන්ට් බලපත්‍ර ගණන | 2 | | |
| බලපත්‍රලාභී පේටන්ට් බලපත්‍ර ගණන | | | |

## 2018 දී විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුම් විස්තර

| වර්ගය | වැඩසටහන් මාතෘකාව | සහභාගීවූ සංඛ්‍යාව |
|---|---|---|
| නව නිෂ්පාදන / ක්‍රියාවලි සංවර්ධනය | 1 | 0 |

## අභ්‍යන්තර උපාධි /පශ්චාද් උපාධි ඉගැන්වීම් කටයුතු සඳහා අන්තර්ජාතික කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පැවැත්වූ වැඩමුළු

| වැඩසටහනේ නම | රට | කාර්යමණ්ඩලය |
|---|---|---|
| Workshop of sustainability Innovation at Sri Lanka Institute of Design programmers | Sri Lanka | 1 |

## ශිෂ්‍ය කටයුතු හා ශිෂ්‍ය සුභසාධන කටයුතු

### සිසුන් ලියාපදිංචි කිරීම

2017/2018 **අධ්‍යයන වර්ෂ ආරම්භ සහ අවසානය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| පීඨය | 2017/2018 | අධ්‍යයන වර්ෂය ආරම්භ වන දිනය | අධ්‍යයන වර්ෂය අවසාන වන දිනය |
|---|---|---|---|
| පීඨය | 942 | 14.03.2019 | March 2020 |
| මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 743 | 02.01.2019 | 17.11.2019 |
| ව්‍යාවහාරික විද්‍යා පීඨය | 1223 | 27.09.2018 | 13.10.2019 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 121 | 19.11.2018 | 04.11.2019 |
| ඉංජිනේරු පීඨය | 318 | 25.02.2019 | 19.01.2020 |
| තාක්ෂණ පීඨය | 235 | MBBS -07.01.2019<br>හෙද, ඖෂධවේදී සහ MLS - 05.02.2019 | - |

### සිසුන් ලියාපදිංචිය පිළිබඳ තොරතුරු

| **අධ්‍යයන වර්ෂය** | **මානව ශාස්ත්‍ර පීඨය** | **ව්‍යාවහාරික විද්‍යා පීඨය** | **කළමනාකරණ පීඨය** | වෛද්‍ය විද්‍යා පීඨය | **ඉංජිනේරු පීඨය** | **තාක්ෂණ පීඨය** | **මුළු සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|---|---|
| 2015/2016 | 837 | 628 | 1215 | 150 | 121 | 321 | **3272** |
| 2016/2017 | 877 | 698 | 1213 | 231 | 120 | 321 | **3460** |
| 2017/2018 | 942 | 743 | 1223 | 235 | 121 | 318 | 3347 |

## මහපොළ ශිෂ්‍යත්ව

2018 වසරේ විවිධ පීඨ අනුව මහපොළ ශිෂ්‍යත්ව ලැබූ ලේඛණය හා කුසලතා ශිෂ්‍යත්ව සඳහා රු.5050/බැගින් මහපොළ ශිෂ්‍යත්ව ලබාගත් සිසුන්ගේ ලයිස්තුව විවිධ පීඨ යටතේ පහත දැක්වේ.

කුසලතා ශිෂ්‍යත්ව සඳහා රු .5050 / - ක් සහ රු. 5000 / - සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා

| අධ්‍යයන වර්ෂය | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | ව්‍යවහාරික විද්‍යා | කළමනාකරණ | වෛද්‍ය විද්‍යා | ඉංජිනේරු | තාක්ෂණ | මාස සඳහා වැය කළ මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|
| 2011/2012 | - | - | - | 60 | - | | 2,290,350.00 |
| 2012/2013 | - | - | - | 67 | - | - | 4,144,150.00 |
| 2013/2014 | 557 | 94 | 910 | 88 | - | - | 65,334,100.00 |
| 2014/2015 | 587 | 222 | 860 | 115 | - | - | 82,379,850.00 |
| 2015/2016 | 487 | 171 | 829 | 87 | 37 | 213 | 93,923,350.00 |
| 2016/2017 | 508 | 215 | 835 | 105 | 52 | 220 | 106,410,100.00 |
| එකතුව | 2039 | 702 | 3434 | 522 | 82 | 416 | 354,481,900.00 |

## ශිෂ්‍යාධාර

2018 වසර තුළ ගෙවන ලද ශිෂ්‍යාධාර විස්තර පහත දැක්වේ.
(පීඨ සඳහා අධ්‍යයනවර්ෂය අනුව දක්වා
ඇත)

| අධ්‍යයන වර්ෂය | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | කළමනාකරණ | වෛද්‍ය විද්‍යා | ඉංජිනේරු | තාක්ෂණ | ව්‍යවහාරික විද්‍යා | වියදම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 2011/2012 | | | 5 | | | | 78,500.00 |
| 2012/2013 | | | 2 | | | | 86,900.00 |
| 2013/2014 | 90 | 50 | 11 | | | 44 | 6,236,400.00 |
| 2014/2015 | 109 | 66 | 12 | | | 110 | 9,225,900.00 |
| 2015/2016 | 159 | 60 | 23 | 7 | 12 | 110 | 11,228,400.00 |
| 2016/2017 | 108 | 32 | 16 | 2 | 7 | 69 | 5,734,100.00 |
| **එකතුව** | 466 | 208 | 69 | 9 | 19 | 333 | 32,590,200.00 |

# විභාග අංශය

## විභාග රාජකාරී කටයුතු

2018 වර්ෂයේ වර්ෂාර්ධ පරීක්ෂණ ජනවාරි සිට පෙබරවාරි සහ මැයි සිට දෙසැම්බර් දක්වා පැවැත්වීණි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා, ව්‍යාවහාරික විද්‍යා සහ තාක්ෂණ යන පීඨයන්ට අදාළ විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම, අමුණුම් කටයුතු, පැකට් කිරීම,මුද්‍රා තැබීම සහ විභාග පැවැත්වීටම නියමිත දිනයන්හි දී ප්‍රශ්න පත්‍ර පැකට් ශාලාධිපතිවරුන් වෙත භාරදීම සම්පූර්ණයෙන්ම විභාග අංශය මගින් සිදු කරනු ලබයි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ විභාග ප්‍රශ්න පත්‍ර යතුරු ලියනය කිරීම හා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයන්හි පිලිතුරු පත්‍ර පැකට්ටු අදාළ පරීක්ෂකවරුන් වෙත භාරදීම ද විභාග අංශය මගින් සිදුකරනු ලබයි. ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපාධිලාභී සිසුන්ගේ සමත් ලේඛන සැකසීම හා එම ලේඛන සනාතන සභා අනුමැතිය සඳහා යොමු කිරීම ද විභාග අංශය මගින් සිදුකරනු ලබයි.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ කළමානාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ, ව්‍යයහාරික විද්‍යා පීඨයේ ,තාක්ෂණ පිඨයේ හා ඉංජිනේරු පීඨයේ විභාග වලට අදාළව හා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සමාජ විද්‍යා ඩිප්ලෝමා පරීක්ෂණයන්ට අදාළව විභාග අක්‍රමිකතා සිදුකර අති සිසුන් සම්බන්ධයෙන් සනාතන සභා විභාග අක්‍රමිකතා කමිටු රැස්වීම් පැවැත්වීම හා අදාළ අභියාචනා කමිටු රැස්වීම් පැවැත්වීම ද විභාග අංශය මගින් සිදු කරන ලදී. එම කමිටු රැස්වීම්වල නිර්දේශ ඇතුලත් වාර්තා සනාතන සභාව වෙත යොමු කිරීම හා අදාළ තීරණ නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම ද මෙම අංශය මගින් සිදු කරන ලදී.

ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවක භවතුන්ගේ විභාග ගෙවීම් වවුචර්පත් පරීක්ෂා කිරීම සහ අදාළ පරිදි මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ විභාග රාජකාරී කටයුතුවල නියැලුණු අධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාළ විභාග ගෙවීම් වවුචර්පත් පරීක්ෂා කිරීම ද විභාග අංශය මගින් සිදු කරන ලදී.

## උපාධි ප්‍රදානෝත්සව කටයුතු

2018 සැප්තැම්බර් මස 06 සහ 07 යන දිනයන්හිදී පැවති විශ්වවිද්‍යාලයීය 44 වැනි උපාධි ප්‍රදානෝත්සවයට අදාළව පුවත්පත් දැන්වීම් පළ කිරීම, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා සහ ව්‍යවහාරිකවිද්‍යා යන පීඨයන්හි 2777 ක් පමණ උපාධිලාභීන්ගෙන් උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත් බාරගැනීමේ සිට එම පීඨවල සියලුම උපාධිලාභීන්ගේ නාම ලේඛන සැකසීම හා පාලක සභා අනුමැතිය සඳහා උපාධිලාභී නාම ලේඛන සනාතන සභා නිර්දේශය සඳහා යොමු කිරීම දක්වා සියලු කටයුතු විභාග අංශය මගින් සිදු කරන ලදී. මීට අමතරව උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත් හා මුදල් ගෙවීමේ කුවිතාන්සි උපාධිලාභීන්හට විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් බාගත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලස්වන ලදී. ඉහත සඳහන් කරන ලද පීඨ තුනෙහි සියලු උපාධිලාභීන්ගේ උපාධි සහතික පත්‍ර මුද්‍රණය හා සම්පූර්ණ නම (සිංහලෙන් හා ඉංග්‍රීසියෙන්) ලිවීමට අදාළ සියලු කටයුතු සිදු කිරීම මෙන්ම එකී උපාධිලාභීන් සියලු දෙනා වෙත උපාධි ප්‍රදානෝත්සවයේදීම නිසි පරිදි උපාධි සහතිකයේ මුල් පිටපත නිකුත් කිරීමට අදාළ කටයුතු ද විභාග අංශය මගින් සිදු කරන ලදී. .









## ස්වර්ණ මුද්‍රිකා

අදාළ උපාධිලාභීන් වෙත උපාධි ප්‍රදානෝත්සවයේ දී පිරිනැමීමට නියමිත ස්වර්ණ මුද්‍රිකා, ත්‍යාග, ශිෂ්‍යත්ව හා ඊට අදාළ සහතික පත් සම්බන්ධ සියලු කටයුතු විභාග අංශය මගින් සිදු කරන ලදී.

### සහතික නිකුත් කිරීම හා සනාථ කිරීම

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා සහ ව්‍යවහාරිකවිද්‍යා යන පීඨයන්හි මෙතෙක් උපාධි සහතික ලබා නොගත් උපාධිධාරීන්ට උපාධි සහතික නිකුත් කිරීම, උපාධිධාරීන්ගේ ඉල්ලීම් අනුව දේශීය හා විදේශීය ආයතන සඳහා විස්තරාත්මක සහ සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම හා දේශීය හා විදේශීය ආයතනවල ඉල්ලීම් අනුව ප්‍රතිඵල සනාථ කර යැවීමේ කටයුතු විභාග අංශය මගින් සිදු කරන ලදී. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇතුළු අවසරලත් විවිධ ආයතන මගින් උපාධිධාරීන්ගේ තොරතුරු ලබාගැනීම සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් සඳහා අවශ්‍ය පරිදි පිළිතුරු සැපයීම ද විභාග අංශය මගින් ඉටු කරන ලදී.

### වෙනත් කටයුතු

විශ්වවිද්‍යාලයේ ගුණාත්මකභාවය සහතික කිරීම (Quality Assurance) සොයා බැලීම සඳහා පත් කරන ලද කමිටු විභාග අංශය වෙත පැමිණි අතර ඊට අදාළය විභාග අංශය විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ලේඛන සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

## විශ්වවිද්‍යාලීය වෛද්‍ය මධ්‍යස්ථානය

විශ්ව විද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පහසුකම් රැසක් සපයයි. ඒවාට වෛද්‍ය හා දන්ත ප්‍රතිකාර, පරීක්ෂණ, එන්නත් සහ උපදේශනය ඇතුළත් වේ. ඩෙංගු මර්දන ව්‍යාපාර, පළිබෝධ පාලනය කිරීම සඳහා පළිබෝධනාශක ඉසීම, විශ්ව විද්‍යාල නේවාසිකාගාර හා ආපනශාලා වල ආහාර පරීක්ෂණ වැඩසටහන්, ජල සාම්පල පරීක්ෂා කිරීම සහ සෞඛ්‍ය හා සමාජීය කරුණු පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම් සඳහා ධායක වී ඇත.

2018 වර්ෂය තුළ වෛද්‍ය ශාන්තා හෙට්ටිආරච්චි ප්‍රධාන වෛද්‍ය නිලධාරී ලෙසත්, වෛද්‍ය එස්. සිල්වා(මිය), ආචාර්ය ඩී.එම්.එල්.ආර්.එච්. පෙරේරා (මිය) වෛද්‍ය නිලධාරීන් ලෙස සේවය කර ඇති අතර වෛද්‍ය ඩී.පී.ඩී. සේලගේ දන්ත ශල්‍ය වෛද්‍යවරයා ලෙස සේවය සපයා ඇත

| 2018 දී සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සේවාවන් පිළිබඳ සංඛ්‍යාලේඛන | |
|---|---|
| ශාරීරික රෝග සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යා | 27,533 |
| ඖෂධ ලබාගත් රෝගීන් සංඛ්‍යාව | 25,007 |
| හෙද ඒකකයෙන් ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව | 4,832 |
| දන්ත සායනයේ සහභාගීවූවන් සංඛ්‍යාව | 1,927 |

## ශාරීරික අධ්‍යාපන අංශය

### හැඳින්වීම

විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා ක්‍රීඩා ක්‍රියාකාරකමෙහි සැලසුම් කරණය හා ක්‍රියාවට නැංවීමල ක්‍රීඩක ක්‍රීඩිකාවන් තරග 38 ක් සඳහා පුහුණු කරවීම සහ ක්‍රීඩාව හා සම්බන්ධ විෂයන් සංවිධානය කිරීම, ශාරීරික අධ්‍යාපන අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. අන්තර් විශ්වවිද්‍යාල තරග ජාතික ක්‍රීඩා සංගමය හෝ ජාත්‍යන්තරව සංවිධානය කරනු ලබන තරග සඳහා විධිමත් පුහුණුව ලබා දීම සහ විවිධ ක්‍රීඩාවන් සඳහා ක්‍රීඩාපිටි පරිපාලනය සහ නඩත්තුව ශාරීරික අධ්‍යාපන අංශයේ අනෙකුත් කාර්යයන් වේ.

එන්.නිශාන්ති විදානගේ මහත්මිය ශාරීරික අධ්‍යාපන අංශයේ වර්තමාන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂිකා වේ. ස්ථිර ක්‍රීඩා උපදේශකයන් ලෙස රමණී කුලතිලක මහත්මිය හා තමරා කුමාරි ජයසේකර මහත්මිය සිය සේවය ලබා දෙන අතර කොන්ත්‍රාත් පදනම මත එම්.ජී.එස්.එස්. කීර්තිරත්න මහතා, එච්.එල්.එල්.දිලංකර මහතා,බී.එන්.එම්.පෙරේරා මහතා,එල්.ජී.ඩී.ප්‍රියදර්ශණ මහතා සහ බී.එම්.සී.එන්.නිරෝෂණ මහතා ශාරීරික අධ්‍යාපන අංශයේ තාවකාලික උපදේශකවරු ලෙස සේවය කරයි.

## ශාරීරික අධ්‍යාපන අංශයේ අරමුණු

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශාරීරික අධ්‍යාපනයේ වටිනාකම් පිළිබඳව අවබෝධයක් ලබා දීම හා මානසික සංවර්ධනය තුළින් කායික සංවර්ධනය ඇති කිරීම
2. ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ හැකියාවන්හි වැඩි දියුණුව සඳහා අවස්ථාවක් ලබා දීම
3. අභ්‍යන්තර හා බාහිර ක්‍රීඩා සංගම් සමඟ ක්‍රීඩා තරග පැවැත්වීමෙන් ක්‍රීඩා සහභාගිත්වය දිරි ගැන්වීම
4. ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරේ ක්‍රීඩා ක්‍රියාකාරකම් දිරි ගැන්වීම මඟින් විනය සංවර්ධනයක් ඇති කිරීම
5. ක්‍රීඩාව මගින් විශ්ව විද්‍යාලයීය නාමය ඉදිරියට ගෙන යාම

අධ්‍යයන හා පරිපාලන නිලධාරීන්ගෙන් ක්‍රීඩා උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වය සෑදි ඇත. විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා ක්‍රියාකාරකම් සහයෝගිතාවයෙන් ගෙන යාම සඳහා ක්‍රීඩා සංගමය නායක/උප නායකයන්ගෙන් සමන්විත වන අතර, ඒ සඳහා සෑම වසරක දීම සම සභාපතිවරුන් දෙදෙනෙකු සහ විධායක සභාවක් පත් කර ගනු ලැබේ.

## ක්‍රීඩා උපදේශක මණ්ඩලය

**ක්‍රීඩා උපදේශක මණ්ඩලයෙහි පහත සඳහන් සාසමාජිකයින් අන්තර්ගත වන්නේය.**

ක්‍රීඩා විෂය කෙරෙහි ඇල්මක් ඇති අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දොළොස් දෙනෙකු බැගින් නිත්‍ය සාමාජිකයින් ලෙස උපකුලපති වරයා විසින් පත්කෙරේ(එක් පීඨයකින් සාමාජිකයින් තිදෙනා බැගින්)

1. ශාරීරික අධ්‍යාපන අධ්‍යාක්ෂිකා
2. පූර්ණ කාලින ශාරීරික අධ්‍යාපන උපදේශකයන් අතරින් තිදෙනෙකු (මෙයින් එක් අයෙකු උපදේශිකාවක් විය යුතුය)
3. ක්‍රීඩා සංගමයේ සම සභාපතිවරු දෙදෙනෙකු,ලේකම් හෝ වෙනත් නියෝජිතයෙකු (එක් අයෙකු ක්‍රීඩිකාවක් විය යුතුය)
4. විශ්වවිද්‍යාලයීය ප්‍රධාන වෛද්‍ය නිලධාරීන් හෝ ඔහුගේ නියෝජිතයෙකු (විශ්වවිද්‍යාලයේ නිලධාරියෙකු විය යුතුය)
5. අධ්‍යක්ෂක / ශිෂ්‍ය කටයුතු
6. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සුබසාධනය) හෝ ඇයගේ නියෝජිතයෙකු
   මූල්‍යාධිකාරී හෝ ඔහුගේ හෝ ඇයගේ නියෝජිතයෙකු
7. වැඩ ඉංජිනේරු හෝ ඔහුගේ නියෝජිතයෙකු
8. සහකාර ලේඛකාධිකාරී (මූල ධන වැඩ අංශය)
9. ව්‍යාපෘති ඉංජිනේරු (මූලධන වැඩ අංශය)

## ක්‍රීඩා සංගමය

විවිධ ක්‍රීඩා කණ්ඩායම් වල නායකයින් උපදේශකයන්ගෙන් විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ සාමාජිකත්වය සුසැදි ඇත. ඊට සම සභාපතිවරු දෙදෙනෙකු, උප සභාපති, ලේකම්, සහකාර ලේකම්, කනිෂ්ඨ භාණ්ඩාගාරික, සම්පාදකවරු දෙදෙනෙකු සහ කමිටු සාමාජිකයන් දෙදෙනෙකු අයත් වන්නේය.

අධ්‍යයන වර්ෂයක පළමු රැස්වීමේදී මොවුන් තෝරා පත් කර ගැනේ.

විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අංශයේ ශාරීරික අධ්‍යාපන උපදේශකයින්ගේ සුපරික්ෂණය යටතේ පහත සඳහන් ක්‍රීඩා පුහුණු කිරීම් සහ පහසුකම් ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| **එන්. නිශාන්ති විදානගේ මහත්මිය**<br>(ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ) | **ජේ.එම්. රමණී කුලතිලක මහත්මිය** (ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>වෙස් (ගැහැනු / පිරිමි)<br>දැල්පන්දු (ගැහැනු)<br>අත්පන්දු (ගැහැනු / පිරිමි)<br>වායු වෙඩිතැබීම් (ගැහැනු / පිරිමි)<br>යෝග ව්‍යායාම් | **එම්.ජී.එස්.එස්.කිර්තිරත්න මහතා** (ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>පාපන්දු (පිරිමි)<br>පිහිණුම්(ගැහැනු / පිරිමි)<br>රගර් (පිරිමි) |
| **එච්.එල්.එල්.දිලංකර මහතා**<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>මලල ක්‍රීඩා(ගැහැනු / පිරිමි)<br>මැරතන් තරඟ (ගැහැනු / පිරිමි)<br>කැරම් (ගැහැනු / පිරිමි)<br>පැසිපන්දු (පිරිමි / ගැහැනු)<br>කරාටේ (ගැහැනු / පිරිමි)<br>ඇරොබික්ස්<br>සුම්බා | **බී.එන්.එම්.පෙරේරා මහතා**<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>බර ඉසිලිම (ගැහැනු / පිරිමි)<br>මල්ලවපොර (පිරිමි)<br>එල්ලේ (ගැහැනු / පිරිමි) | **එල්.ඒ.ඩී.ප්‍රියදර්ශණ මහතා**<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>ටෙනිස් (ගැහැනු / පිරිමි)<br>බේස්බොල් (පිරිමි)<br>කබඩි (ගැහැනු / පිරිමි)<br>බැඩ්මින්ටන් (ගැහැනු / පිරිමි)<br>මේස පන්දු (ගැහැනු / පිරිමි) |
| **බී.එම්.සී.එන්.නිරෝෂණ මහතා**<br><br>තයිකොන්ඩෝ (ගැහැනු / පිරිමි)<br>හොකි (ගැහැනු / පිරිමි).<br>ක්‍රිකට් (පිරිමි) | | |

**ශාරීරික අධ්‍යාපන අංශය විසින් පහත සඳහන් තරග සංවිධානය කරනු ලබන්නේ ය.**

1). අන්තර් පීඨ ආධුනික / නවක තරග

2). අන්තර් පීඨ ක්‍රීඩා තරග

3). ආරාධිත හා සුහද තරග

4). අන්තර් විශ්වවිද්‍යාල තරග

මීට අමතර වශයෙන් බාහිර කණ්ඩායම් සමඟ සුහද තරඟ සංවිධානය සහ අන්තර් විශ්වවිද්‍යාල ශූරතා තරග සංවිධානය හා ඒකාබද්ධ විශ්වවිද්‍යාල කණ්ඩායම් තරග ද පවත්වනු ලැබේ.

ජාතික ශූරතා තරග ලෝක විශ්වවිද්‍යාල තරග සහ ශූරතා තරඟ සඳහා සියලු ම විශ්වවිද්‍යාල වලින් තෝරා ගත් ඒකාබද්ධ විශ්වවිද්‍යාල ක්‍රීඩා කණ්ඩායම්හි ද අපගේ ශිෂ්‍යයින් සහභාගි වන්නේය.

විශ්වවිද්‍යාල කිහිපයක් විසින් පමණක් අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා උත්සව සංවිධානය කරන අතර මෙය වසරක් පාසා පැවැත් වෙන අතර එක් තනි විශ්වවිද්‍යාලයක් විසින් පමණක් සංවිධානය කරනු ලබන Mini Olympics තරග සෑම වසර තුනකටම වරක් පැවැත්වෙන්නේය.

## 2018 දී අප විසින් මෙහෙයවන ලද විශේෂ සිදුවීම්

- "විදුදය අන්තර් පාසල් පිහිණුම් තරගාවලිය - 2018"
  අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව ශාරීරික අධ්‍යාපන අංශය හා ක්‍රීඩා සංගමය එක්ව සංවිධානය කරන ලදුව, විශ්වවිද්‍යාලයීය පිහිණුම් තටාක පරිශ්‍රයේ දී පවත්වනු ලැබීය.

- "Smashes – 2018"
  විශ්වවිද්‍යාලයීය බැඩ්මින්ටන් කණ්ඩායම හා ශාරීරික අධ්‍යාපන අංශය සංවිධානය කරන ලදුව, වෙළද සංගම් ගෘහස්ත ක්‍රීඩාංගන පරිශ්‍රයේ දී පවත්වනු ලැබීය.

- "ආරාධිත අන්තර් විශ්වවිද්‍යාලයීය 3×3 පැසි පන්දු ශූරතාව - 2018"
  ජපුර Basketball family හා ශාරීරික අධ්‍යාපන අංශය සංවිධානය කරන ලදුව, විශ්වවිද්‍යාලයීය පරිශ්‍රයේ දී පවත්වනු ලැබීය.

- 2018 පෙබරවාරි මස 02 වන දා සිට පෙබරවාරි 05 වන දා තෙක් ශාරීරික අධ්‍යාපන අංශයෙන් සංවිධානය කරන ලදුව, ඌව කුඩා ඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසැලේදී දී බාහිර පුහුණු වැඩසටහනක්, අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා තරග සඳහා සූදානම් කරලනු පිණිස, කණ්ඩායම් නායකයන්ගේ සහ උප නායකයන්ගේ නායකත්ව ගුණාංග අභිප්‍රේරණය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පවත්වනු ලැබීය.

- සියලුම පීඨයන්හි පළමු වසර සිසුන් සඳහා 2018 ජුනි 30 සහ ජුලි 01 දින අන්තර් පීඨ නවක ක්‍රීඩා උළෙල පැවැත්විණි.
  - 1 ස්ථානය - ව්‍යවහාරික විද්‍යා පීඨය
  - 2ස්ථානය - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
  - 3 ස්ථානය - තාක්ෂණ පීඨය

- 2018 වර්ෂයේ අන්තර් විශ්ව විද්‍යාල ක්‍රීඩා තරගාවලිය 2018 මැයි මාසයේ සිට ඔක්තොම්බර් මාසය දක්වා පැවැත්වූ අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දෙවන ස්ථානය දිනාගත්තේය.

| | තරගය | පිරිමි | ගැහැනු |
|---|---|---|---|
| 1 | බැඩ්මින්ටන් | 2 වන ස්ථානය | 1 වන ස්ථානය |
| 2 | බේස් බෝල් | 1 වන ස්ථානය | - |
| 3 | පැසි පන්දු | 1 වන ස්ථානය | 2 වන ස්ථානය |
| 4 | කැරම් | පළමු කාර්තුවෙන් සුදුසුකම් ලැබීය | 3 වන ස්ථානය |
| 5 | චෙස් | 1 වන ස්ථානය | 2 වන ස්ථානය |
| 6 | ක්‍රිකට් | අර්ධ අවසන් පූර්ව වටය | - |
| 7 | එල්ලේ | අර්ධ අවසන් පූර්ව වටය | 1 වන ස්ථානය |
| 8 | පා පන්දු | අර්ධ අවසන් පූර්ව වටය | - |
| 9 | හොකී | 1 වන ස්ථානය | අර්ධ අවසන් පූර්ව වටය |
| 10 | කරයටේ | අර්ධ අවසන් පූර්ව වටය | 4 වන ස්ථානය |
| 11 | දැල් පන්දු | - | 1 වන ස්ථානය |
| 12 | මාර්ග ධාවන | 2 වන ස්ථානය | - |
| 13 | රගර් | අර්ධ අවසන් පූර්ව වටය | - |
| 14 | පිහිනුම් | 1 වන ස්ථානය | 1 වන ස්ථානය |
| 15 | මේස පන්දු | 3 වන ස්ථානය | 2 වන ස්ථානය |
| 16 | තෛයිකොන්ඩෝ | 3 වන ස්ථානය | අර්ධ අවසන් පූර්ව වටය |
| 17 | ටෙනිස් | 4 වන ස්ථානය | 1 වන ස්ථානය |
| 18 | ජවන හා පිටිය | 2 වන ස්ථානය | 2 වන ස්ථානය |
| 19 | අත් පන්දු | පළමු කාර්තුවෙන් සුදුසුකම් ලැබීය | අර්ධ අවසන් පූර්ව වටය |
| 20 | බර ඉසිලීම | අර්ධ අවසන් පූර්ව වටය | - |
| 21 | මල්ලව පොර | 2 වන ස්ථානය | - |

- ❖ පිරිමි ශූරතාවය - 3 වන ස්ථානය
- ❖ කාන්තා ශූරතාවය – 2 වන ස්ථානය
- ❖ සමස්ත ශූරතාවය – 2 වන ස්ථානය




එල්ලේ කණ්තඩායම



බැඩ්මින්ටන් කණ්ඩායම(කාන්තා/පිරිමි)




චෙස් කණ්ඩායම(කාන්තා/පිරිමි)




දැල් පන්දු කණ්ඩායම




පැසි පන්දු කණ්ඩායම




බේස්බෝල් කණ්ඩායම




**පිහිනුම් කණ්ඩායම (කාන්තා/පිරිමි)**

වසර තුළ සහභාගි වූ දේශීය ක්‍රීඩා තරගාවලින් (ආරාධිත හා අනෙකුත් තරග)

## අන්තර් විශ්ව විද්‍යාල ක්‍රිකට් තරගාවලිය -2018

- 3rd SSC Open International rating චෙස් තරගාවලිය -2018
- Sri Lanka Inter club super league චෙස් තරගාවලිය -2018
- ජාතික Blitz තරගාවලිය - පිරිමි දෙවන ස්ථානය හා කාන්තා තෙවන ස්ථානය
- Eva නෙට්බෝල් තරගාවලිය - 2018
- මෝරා හොකි 6 තරගාවලිය - 2018 - දෙවන ස්ථානය
- පේරා හොකී 6 තරගාවලිය– 2018 - තෙවන ස්ථානය
- කැළණි අන්තර් විශ්වවිද්‍යාලීය එල්ලේ තරගාවලිය පිරිමි - අනුශූරතාවය
- FA කුසලාන පාපන්දු තරගාවලිය -2018 ශූරතාවය
- අන්තර් විශ්වවිද්‍යාල ලීගය 2018 - ශූරතාවය
- ආරාධිත බරඉසිලීම් කාන්තා තරගාවලිය 2018 - ශූරතාවය
- ආධුනික බරඉසිලීම් තරගාවලිය -2018
- මෝරා 7 විවෘත රගර් තරගාවලිය - 2018
- NSBM පුහුණු රගර් තරගාවලිය
- මහේෂ් ප්‍රනාන්දු අනුස්මරණ බේස්බෝල් තරගාවලිය - අනුශූරතාවය
- UMISF ( බැඩ්මින්ටන් ) තරගාවලිය -2018 - කාන්තා, ශූරතාවය
- මෝරා Smashes තරගාවලිය -2018

## ජාත්‍යන්තර වශයෙන් ක්‍රිඩක ක්‍රිඩිකාවන්ගේ තරග නියෝජනය

❖ පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා තරගාවලිය - 2018
අප විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩක/ ක්‍රීඩිකාවන් හයදෙනෙකු සහභාගි විය.

❖ ආසියානු ක්‍රීඩා තරගාවලිය -2018
අප විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් දෙදෙනෙකු සහභාගි විය.

- මලයාසියාවේ පැවැති ලෝක විශ්වවිද්‍යාල බැඩ්මින්ටන් ශූරතාවලිය 2018 සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සාමාජිකයින් පස්දෙනෙකු සහභාගි විය.
- උගන්ඩාවේ පැවැති ලෝක විශ්වවිද්‍යාල නෙට්බෝල් ශූරතාවලිය 2018 සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සාමාජිකයින් සිව්දෙනෙකු සහභාගි විය.
- බ්‍රසීලයේ පැවැති ලෝක විශ්වවිද්‍යාල චෙස් ශූරතාවලිය 2018 සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සාමාජිකයින් සහභාගි විය.
- නැමීබියාවේ පැවැති ලෝක විශ්වවිද්‍යාල රගර් ශූරතාවලිය 2018 සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සාමාජිකයින් දෙදෙනෙකු සහභාගි විය.
- පෝලන්තයේ පැවැති ලෝක විශ්වවිද්‍යාල බරඉසිලීම් ශූරතාවලිය 2018 සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් එක් සාමාජිකයෙකු සහභාගි විය.
- ස්විස්ටලන්තයේ පැවැති ලෝක විශ්වවිද්‍යාල මාර්ග ධාවන ශූරතාවලිය 2018 සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් එක් සාමාජිකයෙකු සහභාගි විය.
- ජමනියේ පැවැති ලෝක විශ්වවිද්‍යාල වෙරළ වොලිබෝල් ශූරතාවලිය 2018 සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් එක් සාමාජිකයෙකු සහභාගි විය.
- ජපානයේ පැවැති ලෝක විශ්වවිද්‍යාල කරාතේ ශූරතාවලිය 2018 සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් එක් සාමාජිකයෙකු සහභාගි විය.

### වර්ණ ප්‍රදානය

එක් එක් වර්ෂාවසානයේ දී ශාරීරික අධ්‍යාපන අංශය හා ක්‍රීඩා සංගමය එක්ව මෙම වර්ණ ප්‍රදන උත්සවය සංවිධානය කරනු ලබයි. නිර්දේශිත සාධන මට්ටම් යටතේ අපේක්ෂිත ප්‍රමිත අත්පත් කරගනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් උපදේශන සභාවේ නිර්දේශයෙන් වර්ණ ලබන්නේය. මෙම සම්මාන සඳහා වන සාධන මට්ටම් හා වැඩිදුර විස්තර ශාරීරික අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත හැකිය. වැඩිදුරටත්, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා සංගමය විසින් අන්තර් විශ්වවිද්‍යාලයීය තරගාවලියේ දී වැඩි දක්ෂතා පෙන්වන ක්‍රීඩක ක්‍රීඩිකාවනට කුසලතා සම්මාන ලබා දෙනු ලබන්නේය.

### ක්‍රීඩා පහසුකම්

අද්විතීය ක්‍රීඩා පහසුකම් සහිත ගෞරව සම්ප්‍රයුක්ත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ ක්‍රීඩා ක්ෂේත්‍රය මෙහෙය වන යාන්ත්‍රණය වන්නේ ශාරීරික අධ්‍යාපන අංශයයි.

#### එළිමහන් අත්පන්දු පිටි

විශ්වවිද්‍යාලයේ අත් පන්දු ක්‍රීඩා පිටි දෙකක් පිහිනුම් තටාකය ආසන්නයේ පිහිටා ඇති අතර මෙම අත්පන්දු පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට ලබා ගත හැකිය.

#### පැසිපන්දු පිටි

එළිමහන් පැසි පන්දු පිටි, අත් පන්දු පිටින්ට ආසන්නයේ පිහිටා ඇති අතර ප්‍රධාන වශයෙන් මෙම පාටිය තාර පෘශ්ටයක් සහිතව සකස්කර ඇත. මෙම පැසි පන්දු පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට ලබා ගත හැකිය.

## ටෙනිස් පිටි

මෙම ටෙනිස් පිටි මැටි පෘෂ්ඨයක් සහිතව මැනවින් නඩත්තු වන්නකි. මෙම ටෙනිස් පිටි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට මෙන්ම බාහිර පුද්ගලයිනට ද ලබා ගත හැකිය.

## පිහිණුම් තටාක

මෙම පිහිනුම් තටාකය මීටර් 50 ක සම්මත දිගින් යුතු වන අතර ඊට ධාවන පථ 10 ක් ඇතුළත් වේ. මෙහි නොගැඹුරු අන්තය මීටර් 1.5 ක ගැඹුරකින් යුතු වන අතර ගැඹුරු අන්තය මීටර් 5.5 ක් වන්නනේය. පිහිනුම්කරුවනට ඇඳුම් මාරු කිරීමට හා නෑමට අවශ්‍ය පහසුකම් වලින් සමන්විත ගොඩනැගිල්ලක් මෙම පිහිනුම් තටාකයට යාබදව පිහිටා තිබෙන්නේය. මෙම පිහිනුම් තටාකය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවනට හා කාර්ය මණ්ඩලයට විවෘත වනාතර පිටස්තරයනට ද මෙහි පහසුකම් ලබා ගත හැකිය.

## ක්‍රිකට් ක්‍රීඩා පිටි

විශ්වවිද්‍යාලයීය ක්‍රිකට් තණතිල්ල ප්‍රධාන වශයෙන්ම තණ පෘශ්ටයක් සහිත මීටර් 65 ක සම්පූර්ණ දිගකින් යුතු වන්නේය. මෙම හොඳින් නඩත්තු වන පිටියෙහි එක් කලාල තණතිල්ලක් හා මැටි තණතිලි දෙකක් අන්තර්ගත වන්නේය. ක්‍රීඩකයනට හා ක්‍රීඩා විනිසුරුවරුන්ට ප්‍රයෝජනය පිණිස යාබද නාන කාමර සහිත ඇඳුම් මාරු කර ගැනීමේ කුටිවලින් සහ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත එක් මහල් ගොඩනැගිල්ලක් මෙම ක්‍රිකට් පිටියට යාබදව පිහිටා තිබෙන්නේය. ක්‍රීඩාපිටිය පිහිටා ඇත්තේ ඉතාමත් රමණීය පරිසරයකය. අන්තර් විශ්වවිද්‍යාලයීය තරග විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර තරග මෙන්ම අනෙකුත් ක්‍රීඩා සමාජ තරග සඳහා මෙම ක්‍රිකට් ක්‍රීඩා පිටිය පහසුකම් සලසන්නේය.

## වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය (සීඑස්ඩීඑස්) සහ ගැවෙල් ක්ලබ් සමඟ එක්ව සියළුම වෘත්තීය මාර්ගෝපදේශන ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. එම වැඩසටහන් පහත දැක්වේ.

## වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමය (CSDS)

වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය යටතේ ක්‍රියාත්මක වන ක්‍රියාකාරී ශිෂ්‍ය සමාජයක් වන අතර එම සංගමය ආයතනික ව්‍යුහයක් මත සම්පූර්ණයෙන්ම පදනම් වී ඇත. මෙම සංගමය වසර පුරා කර්මාන්ත හා සමාජ ආශ්‍රිත ක්‍රියාකාරකම් රාශියක නිරත වේ. 2018 වර්ෂයේ දී, වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමය මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් හා උත්සව අවස්ථා සම්පූර්ණ කර ඇත.

**වාර්ෂික මහා සභා රැස්වීම 2018**

2018 නිල වර්ෂය සඳහා වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම 2018 ජනවාරි 5 වන දින උපාධි අධ්‍යයන පීඨයේ දී පවත්වන ලදී. මෙම මහා සභා රැස්වීමේ දී 2018 වර්ෂය සඳහා නව විධායක නිලධාරී මණ්ඩලයක් නිල වශයෙන් තෝරාපත් කර ගන්නා ලදී.

**වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමයේ (CSDS) ඓශ්වර්යමත් රාත්‍රිය**

වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතියේ වාර්ෂික හමුව සහ උපහාර පිදීමේ උත්සවය වූ **වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමයේ (CSDS) ඓශ්වර්යමත් රාත්‍රිය** 2018 ජනවාරි මස 7 වන දින මත්තේගොඩ ස්ටාර් පැලස් පිළිගැනීමේ ශාලාවේදී පවත්වන ලදී. ශනිල්ක තත්සර මෙම උත්සවයේ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කරන ලද අතර මෙම උත්සව අවස්ථාවේ දී, තේරී පත් වූ නව නිලධාරී මණ්ඩලය විශ්ව විද්‍යාලයේ වෘත්තීය උපදේශකයින් වෙත නිල වශයෙන් හඳුන්වා දෙන ලදී. තවද, විධායක නිලධාරී මණ්ඩලයෙන් ඉවත්ව යන නිලධාරීන් මෙම සංගමයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කරන ලද ප්‍රකට මෙහෙවර සහ කැපවීම අගයමින් ඔවුන් වෙත උපහාර පිරිනැමීමක් ද සිදු කරන ලදී.

**<u>සාර්ථකත්වයේ සෙවණැලි - 2 වන අදියර (ලසිත් මාලිංග මහතා)</u>**

සාර්ථකත්වයේ සෙවණැලි වැඩමුළු මාලාවේ දෙවන අදියර ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩක ලසිත් මාලිංග මහතාගේ ගෞරවනීය සහභාගීත්වයෙන් 2018 ජනවාරි 9 වන දින විශ්ව විද්‍යාලයේ ව්‍යාවහාරික විද්‍යා පීඨයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. චන්දිකා ජයපෙමා සහ පටුම් හෙට්ටිගේ මෙම උත්සව අවස්ථාවේ ප්‍රධාන සංවිධායකයෝ වූහ. විශ්ව විද්‍යාලයේ සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා මෙම වැඩමුළුව විවෘත කරන ලදී. විශ්ව විද්‍යාලයේ සියලුම ශිෂ්‍යයන්ට මෙම වැඩමුළුවට සහභාගී වීමේ අවස්ථාව උදා කර දී තිබූ අතර ශිෂ්‍යයන් 800 කට ආසන්න පිරිසක් මේ සඳහා සහභාගී වූහ. වැඩමුළුව අතරතුර, ලසිත් මාලිංග මහතා සමඟ ඉතා කුළුපගව සාකච්ඡාවේ නිරතවීමට උපාධි අපේක්ෂකයින්ට අවස්ථාව උදා විය. උපාධි අපේක්ෂකයින්ගේ වෘත්තීය මාවත සැලසුම් කිරීම සඳහා ක්‍රීඩකයෙකුගේ දෘෂ්ටිකෝණයෙන් ලබා දිය හැකි වටිනා උපදෙස් හා මාර්ගෝපදේශ කිහිපයක් ලසිත් මාලිංග මහතා මෙම උපාධි අපේක්ෂකයින් වෙත ලබා දී ඇත.

**Donate Happiness (ප්‍රීතිය පරිත්‍යාග කිරීම)**

**Donate Happiness (ප්‍රීතිය පරිත්‍යාග කිරීම)** යනු සංස්ථාපිත සමාජ වගකීම් ව්‍යාපෘතියක් වන අතර එය වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මහරගම අපේක්ෂා රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නා දරුවන් සඳහා පහසුකම් සැලසීම පිළිබඳව මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අවධානය යොමු වී ඇත. 2018 වර්ෂයේ දී, දිනින්දු කැතිපේආරාච්චි සහ එරංග දඹගොල්ල ප්‍රධාන සංවිධායකයින් වශයෙන් මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී.

මෙම වැයම තවදුරටත් පුළුල් කරමින්, මෙවර වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමය (CSDS) මගින් මහරගම අපේක්ෂා රෝහලේ ළමා වාට්ටුවට අවශ්‍ය ඖෂධ පරිත්‍යාග කිරීමට සැලසුම් කරන ලදී. දුර බැහැර සිට පැමිණෙන පිළිකා රෝගීන්ට ප්‍රතිකාර සඳහා පහසුකම් සපයන, "සුව මන්සල" මධ්‍යස්ථානයට ඇඳ ඇතිරිලි, සබන් වැනි පරිත්‍යාග ප්‍රදානය කරන ලදි. ගාල්ල, මාහෝ හන්දිය සහ පොල්ගහවෙල වෙත දුම්රිය චාරිකා සැපයීමෙන් සහ බඩ ඉරිඟු විකිණීමෙන් සහ විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ අරමුදල් ඉහළ නැංවීමේ කුටි ස්ථාපනය කිරීම ආදි ක්‍රියාකාරකම් මගින් ඉහත ව්‍යාපෘතිය සඳහා අරමුදල් රැස් කරන ලදී. "**Donate Happiness" (ප්‍රීතිය පරිත්‍යාග කිරීම)** ව්‍යාපෘතිය වෙනුවෙන් එම සංගමයේ සාමාජිකයින්ට 300,000.00 ක පමණ මුදලක් රැස් කර ගැනීමට හැකි විය.

**සාර්ථකත්වයේ සෙවනැලි - 3 වන අදියර (ඩිලන්ත මලගමුව මහතා)**

වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමය (CSDS) මගින් සාර්ථකත්වයේ සෙවනැලි වැඩමුළු මාලාවේ 3 වන අදියර ද ක්‍රියාත්මක කිරීම මගින් විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා තවත් දුර්ලභ අවස්ථාවක් ලබා ගත හැකි විය. මෙම අදියර 2018 ජුනි මස 18 වන දින කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය පීඨයේ මුණසිංහ ශාලාවේදී පැවැත්විණි. සමුදි අබේසූරිය, ප්‍රදීපිකා ඒකනායක සහ සඳමිණී කරුණානායක මෙම අවස්ථාවේ ප්‍රධාන සංවිධායකයින් වශයෙන් කටයුතු කළහ. ප්‍රසිද්ධ ෆෝමියුලා 1 මෝටර් රේසින් ධාවන තරග ධාවකයකු වූ ඩිලන්ත මලගමුව මහතා ආරාධිත කථිකයා වශයෙන් මෙම අවස්ථාවට සත්කාරකත්වය ලබා දෙන ලදී. මෙම අවස්ථාවට ශිෂ්‍යයින් 400 කට ආසන්න පිරිසක් සහභාගී වූහ.

## ජ'පුර සේවා නියුක්ති නිපුණතා සම්මාන 2018 (JESA 2018)

ජ'පුර සේවා නියුක්ති නිපුණතා සම්මාන (JESA) 2018 යනු විශ්ව විද්‍යාලයේ වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවය වන අතර එහිදී උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්ති නිපුණතා ඇගයීම සිදු කරනු ලැබේ. මෙම ඇගයීම් කාණ්ඩ 10 ක් යටතේ සිදු කරන ලදී.

- විශිෂ්ඨතම නායකත්වය
- විශිෂ්ඨතම කණ්ඩායම් ක්‍රීඩකයා
- විශිෂ්ඨතම නිර්මාණශීලි මෝස්තරකරු
- විශිෂ්ඨතම සන්නිවේදකයා
- විශිෂ්ඨතම නවෝත්පාදකයා
- විශිෂ්ඨතම යොවුන් ව්‍යවසායකයා
- විශිෂ්ඨතම සේවා නියුක්ති නිපුණතාව (ව්‍යවහාරික විද්‍යා පීඨය)
- විශිෂ්ඨතම සේවා නියුක්ති නිපුණතාව (කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨය)
- විශිෂ්ඨතම සේවා නියුක්ති නිපුණතාව (මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය)
- විශිෂ්ඨතම සේවා නියුක්ති නිපුණතාව (වෛද්‍ය විද්‍යා පීඨය)

විශ්ව විද්‍යාලයේ වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවයේ නව්‍ය වැඩිදියුණු කිරීමක් වශයෙන් විශිෂ්ඨතම යොවුන් ව්‍යවසායකයා සම්මානය හඳුන්වා දෙන ලදී. 2018 වර්ෂයේ පවත්වන ලද මෙම උත්සවයේ ප්‍රධාන සංවිධායක වශයෙන් කටයුතු කළ චන්දිකා ජයපේම මෙම උත්සවයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

මෙම වැඩසටහන මාසයක කාලයක් සඳහා පුළුල් කරන ලද අතර එය ''සේවා නියුක්ති මාසය'' ලෙස නම් කර ඇත. ප්‍රධාන සංවිධායක ශංකී එෂාරා විසින් සම්බන්ධීකරණය කරන ලද ජීව දත්ත ප්‍රදර්ශනයක්, වැඩමුළු මාලාවක් සහ සම්මුඛ පරීක්ෂණවලින් මෙම වැඩසටහන සමන්විත විය.

වැඩමුළු මාලාව 2018 ජූලි 10, 11 සහ 13 දිනවල පවත්වන ලද අතර ඒවා පිළිවෙලින් පහත පරිදි විය.

- **'සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීම සහ ඔබ විසින් ඔබව අලෙවිකිරීම'**
  කුමාර ගල්හේනගේ මහතා,
  ජ්‍යෙෂ්ඨ කළමනාකරු, (කණ්ඩායම් කුසලතා සංවර්ධනය) - බ්‍රැන්ඩික්ස්

- **'ජීව දත්ත සහ ලේඛන කුසලතා සනාථ කිරීම සඳහා ලේඛනකරණය'**
  බෙනට් පැටර්නට් මහතා
  සීමාසහිත කාර්සන්ස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) ලිමිටඩ් හි මානව සම්පත් ප්‍රධානී

- **'කාර්මිකව පිළිගත් නව්‍යකරණ පර්යේෂණ සිදු කරන්නේ කෙසේද'**
  තුෂාර පෙරේරා මහතා
  අධ්‍යක්ෂ, තත්ත්ව, අනුකූලතා සහ පර්යේෂණ සහ සංවර්ධන - ජේ. එල්. මොරිසන් පුත්‍රයෝ සහ ජෝන්ස් (සිලෝන්) පීඑල්සී.

සම්මාන ප්‍රදානෝත්සවය සඳහා පළමු වටයේ සම්මුඛ පරීක්ෂණ 2018 ජූලි 18, 19 සහ 20 යන දිනවලදී පවත්වන ලදී.
ජීව දත්ත ප්‍රදර්ශනය 2018 ජූලි මස 26 වන දින මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සුමංගල කියවීම් ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලදි.
සම්මාන ප්‍රදානෝත්සවය සඳහා දෙවන වටයේ සම්මුඛ පරීක්ෂණ 2018 අගෝස්තු 2, 3 සහ 4 යන දිනවල දී පවත්වන ලදි.
අවසාන සම්මාන ප්‍රදානෝත්සවය 2018 අගෝස්තු 10 වන දින පවත්වන ලදී.

**විශිෂ්ඨතම නායකත්වය**

ජයග්‍රාහකයා - මධුෂ ද සිල්වා | මූල්‍ය අධ්‍යයනාංශය (3 වන වසර) - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨය
දෙවන ස්ථානය - සමුද්‍රා අමරසිංහ | තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය (3 වන වසර) - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨය
තෙවන ස්ථානය - අදිෂා ගම්මන්පිල | පරිගණක විද්‍යා අධ්‍යයනාංශය (3 වන වසර) - ව්‍යවහාරික විද්‍යා පීඨය

**විශිෂ්ඨතම කණ්ඩායම් ක්‍රීඩකයා**

ජයග්‍රාහකයා - අශානි බුලතගම | ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය (4 වන වසර) - ව්‍යවහාරික විද්‍යා පීඨය

දෙවන ස්ථානය - අබීල් මොහොමඩ් | ගිණුම්කරණ අධ්‍යයනාංශය (2 වන වසර) - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨය

තෙවන ස්ථානය - කෙවින් ජැන්ස් | ව්‍යාපාරික ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය (3 වන වසර) - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨය

**විශිෂ්ඨතම නිර්මාණශීලි මෝස්තරකරු**

ජයග්‍රාහකයා - ඉරංග පරණගම | ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය (දෙවන වසර) - ව්‍යවහාරික විද්‍යා පීඨය

දෙවන ස්ථානය - ප්‍රනීතා අන්පලගන් | 3 වන වසර - ව්‍යවහාරික විද්‍යා පීඨය

තෙවන ස්ථානය - සෙනාල් පෙරේරා | 3 වන වසර - ව්‍යවහාරික විද්‍යා පීඨය

**විශිෂ්ඨතම සන්නිවේදකයා**

ජයග්‍රාහකයා - යෂ්මි චාමිකා | ගිණුම්කරණ අධ්‍යයනාංශය (දෙවන වසර) - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨය

දෙවන ස්ථානය - උදිතා කරුණරත්න | 3 වන වසර - ව්‍යවහාරික විද්‍යා පීඨය

තෙවන ස්ථානය - නවෝදා ලියනපතිරණ | ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය (4 වන වසර) - ව්‍යවහාරික විද්‍යා පීඨය

**විශිෂ්ඨතම නවෝත්පාදකයා**

ජයග්‍රාහකයා - ප්‍රභාත් සෙනෙවිරත්න | සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය (4 වන වසර) - වෛද්‍ය විද්‍යා පීඨය දෙවන ස්ථානය - අශානි බුලතගම | ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය (4 වන වසර) - ව්‍යවහාරික විද්‍යා පීඨය

තෙවන ස්ථානය - දුලාන් ඩයස් | පරිගණක විද්‍යා අධ්‍යයනාංශය (3 වන වසර) - ව්‍යවහාරික විද්‍යා පීඨය

**විශිෂ්ඨතම යොවුන් ව්‍යවසායකයා** (අලුතින් හඳුන්වා දී ඇත)

ජයග්‍රාහකයා - එන්.වී.ආර්. දුලංජන | අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයනාංශය (දෙවන වසර) - එෆ්එම්එස්සී

දෙවන ස්ථානය - සසින්දු පෙරේරා | අලෙවිකරණ කළමනාකරණ දෙපාර්තමේන්තුව (4 වන වසර) - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨය

තෙවන ස්ථානය - දිවාන් සම්පත්, සහන් කුලරත්න, සචිනි නිමාෂා | ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය (4 වන වසර) - කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨය

**විශිෂ්ඨතම සේවා නියුක්ති නිපුණතාව (BESA) - කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය**

ජයග්‍රාහකයා - එම්.ඒ.ජී.එන්. ජයසූරිය | ගිණුම්කරණ අධ්‍යයනාංශය (3 වන වසර)

රිදී පදක්කම්ලාභීන්;

- නදී මහීම් කාංචනා | මූල්‍ය අධ්‍යයනාංශය (3 වන වසර)
- සකුනි ආදිකාරම් | මූල්‍ය අධ්‍යයනාංශය (4 වන වසර)
- සමුද්‍රා අමරසිංහ | තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය (3 වන වසර)

**විශිෂ්ඨතම සේවා නියුක්ති නිපුණතාව (BESA) - ව්‍යවහාරික විද්‍යා පීඨය**

ජයග්‍රාහකයා - සමීර ලක්රුවන් පෙරේරා | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ අධ්‍යයනාංශය (4 වසර)

රිදී පදක්කම්ලාභීන්;

- දූලාන් ඩයස් | පරිගණක විද්‍යා අධ්‍යයනාංශය (3 වන වසර)
- තුසාරි ඒකනායක | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ අධ්‍යයනාංශය (දෙවන වසර)
- යනුක කුරුප්පු | ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය (4 වසර)

**විශිෂ්ඨතම සේවා නියුක්ති නිපුණතාව (BESA) - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

ජයග්‍රාහකයා - සමාරා පොල්වත්ත | භූගෝල විද්‍යා අධ්‍යයනාංශය (4 වන වසර)

රිදී පදක්කම්ලාභීන්;

- වාමින්ද්‍රි විශ්වාදරි | සමාජ සංඛ්‍යාලේඛන අධ්‍යයනාංශය (3 වන වසර)
- බුද්ධි දිසානායක | පාලි සහ බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය (4 වසර)
- පියුමි ද සොයිසා | සමාජ සංඛ්‍යාලේඛන අධ්‍යයනාංශය (3 වන වසර)

**විශිෂ්ඨතම සේවා නියුක්ති නිපුණතාව (BESA) - වෛද්‍ය විද්‍යා පීඨය**

ජයග්‍රාහකයා - සහන් පෙරේරා | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය (5 වසර)

රිදී පදක්කම්ලාභීන්;

- තරින්දු වික්‍රමසිංහ | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය (4 වන වසර)
- තිරාන්යා පෙරේරා | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය (4 වන වසර)
- ඉසුරු ගුණතිලක | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය (දෙවන වසර)

සම්මාන ප්‍රදානය කිරීමේ අනුග්‍රාහකයන් පහත දක්වා ඇත.

ප්ලැටිනම් අනුග්‍රාහකයන්

- මාස් හෝල්ඩින්ස්
- ෆොන්ටෙරා බ්‍රෑන්ඩ්ස් ලංකා
- චාර්ටර්ඩ් ඉන්ස්ටිටියුට් ඔෆ් පර්සනල් මැනේජ්මන්ට්
- ග්ලැක්සෝ ස්මිත්ක්ලයින් පුද්ගලික සමාගම
- මොරිසන්ස් පීඑල්සී
- වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය
- බ්‍රෑන්ඩික්ස්
- ඔමේගා ලයින් ගෲප්

රන් අනුග්‍රාහකයන්

- ඒඅයිඒ ශ්‍රී ලංකා
- ආසිරි හොස්පිටල්ස්
- හේමාස් හොස්පිටල්ස්
- හේමාස් පාරිභෝගික වෙළඳ නාම
- ජේකේ මාර්කටින් සර්විසස්
- සිටිසන් ඩෙවලප්මන්ට් බැන්ක්
- ඩයලොග් ඇක්සියාටා පීඑල්සී
- මූඩීස් ඇනලිටික්ස්
- හේලීස්
- මොබිටෙල් ශ්‍රී ලංකා
- සීඑම්ඒ ශ්‍රී ලංකා

- එල්ඕඑල්සී

රිදී අනුග්‍රාහකයන්

- ජෝන් කීල්ස් ස්ට්‍රැටජික් පාර්ට්නර්ස්
- යුනිලීවර් ශ්‍රී ලංකා

ආහාර සහ පාන හවුල්කරුවන්

- නෙස්ලේ ලංකා පීඑල්සී

අයවැයෙන් 66% ක් අනුග්‍රාහකයන්ගේ අනුග්‍රාහකත්වය මගින් සපුරා ගන්නා ලද අතර ඉතිරි 34% විශ්වවිද්‍යාල ප්‍රදාන මගින් ද සපුරා ගැනීමට හැකියාව ලැබී ඇත. සම්මාන ප්‍රදානෝත්සවය හා සමගාමීව, සේවා නියුක්තිය පිළිබඳ ලිපි සහ පණිවිඩ සහිත සඟරාවක් ද මෙම සංගමය මගින් ප්‍රකාශයට පත් කරන ලදී. දිල්රුක්ෂි වික්‍රමසිංහ, අමානි වීරරත්න සහ සයිනුබ් ජුනයිඩ් මෙම සඟරාව සංස්කරණය කළහ.

**අරුණැල්ල**

අරුණැල්ල යනු වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය මගින් සම්පූර්ණ කරන ලද තවත් සංස්ථාපිත සමාජ වගකීම් ව්‍යාපෘතියක් වන අතර එමගින්, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන සිසුන් ප්‍රමාණය වැඩි දියුණු කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලදී. වෘත්තීය නිපුණතා සංවර්ධන සංගමය මෙවර මෙම වැයම තවදුරටත් පුළුල් කරමින් මෙම ව්‍යාපෘතිය සමඟ ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහනකට ද සම්බන්ධ වෙමින් විශාල ඉදිරි පියවරක් තබන ලදී.

2018 වර්ෂය සඳහා, විධායක කමිටුව මගින් දිනිත් පවන් අනුරාධ සහ සචින්ත රුක්මාල් ප්‍රධාන සංවිධායකයින් වශයෙන් තෝරා පත් කර ගන්නා ලද අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා බෙලිඅත්තේ අරන්වෙල මහා විද්‍යාලය තෝරා ගන්නා ලදී.

ගාල්ල, මාහෝ සහ පොල්ගහවෙල වෙත දුම්රිය චාරිකා පැවැත්වීම මගින් සහ බඩ ඉරිඟු විකිණීමෙන් සහ විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ සහ ගාලු කොටුව තුළ අරමුදල් ඉහළ නැංවීමේ කුටි ස්ථාපනය කිරීම මගින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් රැස් කර ගන්නා ලදී. සාමාජිකයින් විසින් 150,000/= කට ආසන්න මුදල් ප්‍රමාණයක් එකතු කර ගන්නා ලදී.

ප්‍රධාන ශාලාව ඇතුළු පාසලේ ගොඩනැගිලි දෙකක් මුළුමනින්ම ප්‍රතිසංස්කරණය කිරීමට සමිතියේ සාමාජිකයින්ට හැකි විය. ශිෂ්‍යයන් සඳහා දේශන සහ විනෝද වැඩසටහන්වලින් සමන්විත වූ ප්‍රධාන වැඩසටහන 2018 සැප්තැම්බර් මස 7 වන දින පවත්වන ලදී.

**"Touch The Peak" (උසස්ම තත්ත්වයට ළඟාවන්න) - වැඩමුළු මාලාව (කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨයේ ඉදිරිපත් කිරීමකි.)**

| වැඩමුළුව | සම්පත් දායකයා | දිනය | ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| • ජීව දත්ත සහ ලේඛන කුසලතා සනාථ කිරීම සඳහා ලේඛනකරණය | **බෙනට් පැටර්නට් මහතා**<br>සීමාසහිත කාර්සන්ස් කම්බර්බාච් පුද්ගලික සමාගමේ මානව සම්පත් ප්‍රධානී | ඔක්තෝබර් 30 | මහාචාර්ය කේ.ඒ. මුණසිංහ ශාලාව | 200 |
| • සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීම | **කුමාර ගල්හේනගේ මහතා**<br>ජ්‍යෙෂ්ඨ කළමනාකරු - කණ්ඩායම් කුසලතා කළමනාකරණය, බ්‍රැන්ඩික්ස් | ඔක්තෝබර් 30 | | 300 |

| | | | | |
|---|---|---|---|---|
| • ව්‍යවසායකයෙකු වීමේ වරප්‍රසාද | **ෂෙහාන් අධිකාරි මහතා**<br>ඇවිවර්ස් ලංකා බිස්නස් ස්කූල් හි අධ්‍යක්ෂ, FITZKY හි ප්‍රධාන විධායක නිලධාරී<br>**අනුරුද්ධ කරුණාතිලක මහතා**<br>සාමාන්‍යාධිකාරී - ඉන්ටර්ප්‍රිඩ් සමූහය | ඔක්තෝබර් 30 | | 200 |
| • පුද්ගලයාගේ පෙනුම | **ලක්ෂිත ධර්මවංස මහතා**<br>සාමාන්‍යාධිකාරී - ඇවරි ඩෙනිසන් ලංකා (පුද්) සමාගම.<br>**ඉරුෂි අලුවිහාරේ මෙනවිය**<br>අධ්‍යක්ෂ - ඉමේජ් කන්සල්ටන්ට් | ඔක්තෝබර් 31 | | 175 |
| • මානව සම්පත් සංසදය | **ආචාර්ය පවිත්‍රා මධුවන්ති (ප්‍රමාණනකරු)**<br>ප්‍රධානි, රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය පීඨය<br>**හරිනි ඉදිකෙටිය මෙනෙවිය**<br>ඉගෙනුම් හා සංවිධාන සංවර්ධන කළමනාකරු - ෆොන්ටෙරා | ඔක්තෝබර් 31 | | 200 |
| | **ඉමාලි ජයතිලක මෙනවිය**<br>ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කළමනාකරු (නායකත්ව සංවර්ධන) සහ<br>මානව සම්පත් ව්‍යාපාරික හවුල්කරු (අලෙවිකරණ) - යුනිලීවර් ශ්‍රී ලංකා ලිමිටඩ් | | | |
| | **යසිරු බණ්ඩාරනායක මහතා**<br>ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මානව සම්පත්,<br>ජීඑස්කේ ෆාර්මසියුටිකල්ස් (ශ්‍රී ලංකා) | | | |
| | **මාධවී ශිල්පාධිපති මහත්මිය**<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී \| මානව සම්පත් සමූහය - මාස් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම | | | |

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය පීඨය මගින් “උසස්ම තත්ත්වයට ළඟාවන්න” යන තේමාවෙන් පැවැත් වූ - ජ’පුර වාර්ෂික රැකියා ප්‍රදර්ශනය සහ ව්‍යවසායකත්ව ව්‍යාපාරික වැඩමුළුව විශ්ව විද්‍යාලයේ නවක උපාධි අපේක්ෂකයින්ට සුදුසු රැකියාවකට බඳවා ගනු ලැබීමට සහ වෘත්තීය මාවත සොයා ගැනීමට හා සැලසුම් කිරීමට ලැබුණු දුර්ලභ අවස්ථාවක් විය. මෙම වැඩසටහන වැඩමුළු මාලාවකින් සහ වෘත්තීය ප්‍රදර්ශනයකින් සමන්විත විය. සඳරුවන් වික්‍රමසිංහ සහ දිනිඳු ධනජය ප්‍රධාන සංවිධායකයින් වශයෙන් මෙම උත්සවය සම්බන්ධීකරණය කරන ලදී. මෙම අවස්ථාවට ශිෂ්‍යයින් 1000 කට ආසන්න පිරිසක් සහභාගී වූහ.

පර්යේෂණ සභාව යටතේ පර්යේෂණ මධ්‍යස්ථාන 21 ක් දැනට ක්‍රියාත්මක වේ. ශක්තිමත් පර්යේෂණ පසුබිමක් ඇති කැපවීමෙන් කටයුතු කරන හා උද්යෝගිමත් විද්වතුන් විසින් අදාළ පීඨ තුළ මෙම මධ්‍යස්ථාන ආරම්භ කර ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සභාව (RC-USJP) ස්ථාපනය කිරීමත් සමඟ, එකට හමු වීම සහ සහයෝගීතාව වෙනුවෙන් පොදු පර්යේෂණ හා සංවර්ධන නවෝත්පාදන වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණින් එවැනි සියලු මධ්‍යස්ථාන විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සභාවේ (RC-USJP) විෂය පථය යටතට ගන්නා ලදී.

**පර්යේෂණ මධ්‍යස්ථාන පහත දකවා ඇත:**

| | පර්යේෂණ මධ්‍යස්ථාන | අධ්‍යක්ෂ |
|---|---|---|
| 1 | ජලයේ ගුණාත්මකභාවය සහ ඇල්ගී පර්යේෂණ මධ්‍යස්ථානය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.එම්.පත්මලාල් |
| 2 | වකුගඩු පර්යේෂණ මධ්‍යස්ථානය (සීකේඩී - පර්යේෂණ) | මහාචාර්ය ජේ.කේ.පී. වනිගසූරිය |
| 3 | ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානය (සීඩීආර්) | මහාචාර්ය ජී.එන්. මලවිගේ |
| 4 | ජෛව තාක්ෂණය හා ස්නායු විද්‍යාව පිළිබඳ නවෝත්පාදන සඳහා අන්තර්ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථානය | මහාචාර්ය රනිල් ද සිල්වා |
| 5 | බහුවිධ පර්යේෂණ මධ්‍යස්ථානය | මහාචාර්ය සී.ඒ.ඩී. නහල්ලගේ |
| 6 | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය මධ්‍යස්ථානය | මහාචාර්ය වයි.කේ. වීරකෝන් බණ්ඩා |
| 7 | පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානය (CCR) | ආචාර්ය එම්.බී.එස්. සෙනෙවිරත්න |
| 8 | උසස් ද්‍රව්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය (නැනෝ තාක්ෂණය) | ආචාර්ය කේ.එම්.ටී.ඩී ගුණසේකර |
| 9 | ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය | මහාචාර්ය බී.ජී.ඩී.එන්.කේ. ද සිල්වා |
| 10 | වන විද්‍යා හා පරිසර මධ්‍යස්ථානය | ආචාර්ය එස්.එම්.සී.යූ.පී. සුබසිංහ |
| 11 | රොබෝ විද්‍යාව හා කෘත්‍රිම බුද්ධි පද්ධතිය සඳහා නවෝත්පාදන මධ්‍යස්ථානය | ආචාර්ය පී. රවීන්ද්‍ර එස් ද සිල්වා |
| 12 | ඇපල් පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | මහාචාර්ය ආර්.ජී.එන්. මීගම |

| | | |
|---|---|---|
| 13 | ප්‍රාථමික සත්කාර හා අසාත්මිකතා පර්යේෂණ සඳහා ජාතික මධ්‍යස්ථානය | ආචාර්ය ජේ.එම්.කේ.සී. ජීවන්දර |
| 14 | වතු කළමනාකරණ හා තක්සේරු කිරීමේ, පර්යේෂණ සහ වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (EMVRPC) | ආචාර්ය එන්.සී. වික්‍රමාරච්චි |
| 15 | පාලන හා රාජ්‍ය ප්‍රතිපත්ති කේන්ද්‍රය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්.එල්.එස්. ප්‍රනාන්දු |
| 16 | ශාක ද්‍රව්‍ය හා ශාකසාර නිෂ්පාදන පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය එම්.ජී.සී. පදුමදාස |
| 17 | පරිසර ප්‍රතිරෝධීතා පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය එම්.එස්. විතානගේ |
| 18 | බෝ නොවන රෝග පර්යේෂණ මධ්‍යස්ථානය (NCDRC) | මහාචාර්ය ෂාමිනි ප්‍රතාපන් |
| 19 | මනස පදනම් කරගත් පර්යේෂණ හා පරිචයන් සඳහා මධ්‍යස්ථානය | ආචාර්ය සනත් මහවිතානගේ |
| 20 | උසස් අධිකරණ වෛද්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය | මහාචාර්ය මුදිතා විදානපතිරණ |
| 21 | සමුද්‍ර විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (CMST) | ආචාර්ය. ආර් ආර් එම් කේ පී රණතුංග |

## පර්යේෂණ සම්මාන 2017

**සම්මාන ලැයිස්තුව - පර්යේෂණ සම්මාන උළෙල 2017**

| ප්‍රවර්ග | සම්මාන |
|---|---|
| **1** | **දේශීය / විදේශීය සම්මන්ත්‍රණයක රැස්වීම් වාර්තාවේ හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක පළ කරන ලද සාරාංශයකි** |
| **2** | **දේශීය / විදේශීය සම්මන්ත්‍රණ වාර්තාවේ ප්‍රකාශයට පත් කරන ලද** |
| **3** | **විශ්ව විද්‍යාල සඟරාවක ප්‍රකාශයට පත් කරන ලද සම්පූර්ණ පත්‍රිකාව (නව)** |

| | |
|---|---|
| **4** | **සමියුරු සමාලෝචිත සඟරාවේ (සුචිගත කරන ලද සඟරාව) පළ වූ සම්පූර්ණ පත්‍රිකාව** |
| **5** | **සුචිගත කරන ලද ඕනෑම සඟරාවක පළ වූ සම්පූර්ණ පත්‍රිකාව (පහත 6 වන කාණ්ඩයේ ලැයිස්තුගත කර ඇති සුචිගත කිරීමේ සේවාවක් හැර වෙනත් ඕනෑම සුචිගත කිරීමේ සේවාවක්)** |
| **6** | **SCI1 හි සුචිගත කරන ලද සමියුරු සමාලෝචිත සඟරාවේ පළ වූ සම්පූර්ණ පත්‍රිකාව. පිළිගත් සුචිගත කරන ලද සඟරා http://www.isinet.com/journals හි ලැයිස්තුගත කර ඇත:**<br><br>**අ. පුළුල් කරන ලද විද්‍යා උපහරණ අනුක්‍රමණිකාව (™) (Web of Science)**<br>**ආ. සමාජ විද්‍යා උපහරණ අනුක්‍රමණිකාව (Web of Science)**<br>**ඇ. කලා හා මානව ශාස්ත්‍ර උපහරණ අනුක්‍රමණිකාව (Web of Science)**<br>**ඈ. ස්කොපස් ජර්නල්**<br>**ඉ. කැබෙල්'ස් ඉන්ටර්නැෂනල්** |
| **7** | **2017 වර්ෂය සඳහා වැඩිම උපුටා දැක්වීම් ඇති පර්යේෂකයන්**<br>• **7 වන කාණ්ඩයේ සම්මාන සඳහා සලකා බැලීමට, පර්යේෂකයාට එච්-දර්ශකය 5 හෝ ඊට වැඩි ප්‍රකාශන සංඛ්‍යාවක් තිබිය යුතුය.**<br>• **ඒ ඒ පීඨයට සම්මාන තුනක් පිරිනැමේ.**<br>• **2016 වසරේ සිට බලපැවැත්වෙන පරිදි එකම අපේක්ෂකයා සඳහා වසර තුනකට වරක් 1, 2 සහ 3 ස්ථාන ප්‍රදානය කෙරේ.** |
| **8** | **2017 වර්ෂය සඳහා ඉහළම එච්-දර්ශකය ඇති පර්යේෂකයන්**<br>• **8 වන කාණ්ඩයේ සම්මාන සඳහා සලකා බැලීමට, පර්යේෂකයාට එච්-දර්ශකය 5 හෝ ඊට වැඩි ප්‍රකාශන සංඛ්‍යාවක් තිබිය යුතුය.**<br>• **ඒ ඒ පීඨයට සම්මාන තුනක් පිරිනැමේ.**<br>• **2016 වසරේ සිට බලපැවැත්වෙන පරිදි එකම අපේක්ෂකයා සඳහා වසර තුනකට වරක් 1, 2 සහ 3 ස්ථාන ප්‍රදානය කෙරේ.** |
| **9** | **ඉහළම උපුටා දැක්වීමේ බලපෑමක් ඇති පර්යේෂකයා (2017, 2016 සහ 2015 වර්ෂ සඳහා උපුටා දැක්වීම් මත පදනම්ව)**<br>• **ඒ ඒ පීඨයට සම්මානයක් බැගින් පිරිනැමේ.** |
| **10** | **වර්ෂය සඳහා වැඩිම සමුච්චිත උපුටා දැක්වීම් සහිත අධ්‍යනාංශ සඳහා**<br>• **ඒ ඒ පීඨයට සම්මාන තුනක් පිරිනැමේ.** |
| **11** | **පූර්ව වෘත්තීය පර්යේෂක සම්මානය පිරිනැමීම සඳහා**<br>• **එච්-දර්ශකය 5 හෝ 5 ට වඩා වැඩි විය යුතුය.**<br>• **ජොෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය.** |

| | |
|---|---|
| | • පර්යේෂණ සම්මාන සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පර්යේෂකයාගේ වයස අවුරුදු 40 ට අඩු විය යුතුය.<br>• ප්‍රකාශිත ලිපියට අදාළ කතෘවරයා විය යුතුය.<br>• අදාළ කතෘවරයා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අනුබද්ධ ආයතනයක සේවයේ නිරතව සිටිය යුතුය.<br>• සුවිගත කළ සඟරාවල (SCI / SSCI / AHCI) ප්‍රකාශයට පත් කරන ලද සම්පූර්ණ පත්‍රිකා සඳහා ඉහළම සමුච්චිත බලපෑම් සාධකය ඇති අපේක්ෂකයාට සම්මානය ප්‍රදානය කෙරේ.<br>• විශ්ව විද්‍යාල විද්‍යුත් තැපැල් ලිපිනය පර්යේෂණ ලිපියේ දක්වා තිබිය යුතුය. |
| **12** | උපකුලපති සම්මානය සඳහා උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ (CVCD) මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය:<br>• අයදුම්කරුවන් පසුගිය වසර පහක කාලය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ස්ථිර සේවයේ යෙදී සිටිය යුතුය.<br>• සෑම වසර පහකට වරක් එක් වරකට වඩා වැඩි වාර සංඛ්‍යාවක් සඳහා සම්මාන ලබා ගැනීමට කිසිදු පීඨ සාමාජිකයකුට අවසරයක් නොමැත. |
| **13** | විශ්ව විද්‍යාලයේ ප්‍රකාශයට පත් කරන ලද සඟරා (නව) |
| **14** | විශ්ව විද්‍යාලය විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මන්ත්‍රණයේ රැස්වීම් වාර්තාව (නව) |
| **15** | බාහිර පර්යේෂණ ප්‍රදාන ලබා ඇති පර්යේෂකයන් (පීඨ අනුව) |
| **16** | ගෞරවනීය ලෙස විශ්‍රාම ලත් මහාචාර්යවරු (එච්-දර්ශකය 10 ට වැඩි හෝ ඊට වැඩි පර්යේෂකයා) |



# අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය (IQAU)

විශ්ව විද්‍යාලයක් යනු රාජ්‍ය ආයතනයක් වන බැවින් එහි ගුණාත්මකභාවය හා ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා විශ්ව විද්‍යාලය මගින් එහි වගකීම ඉටු කළ යුතුය. තත්ත්ව ආරක්ෂණය යනු විශ්ව විද්‍යාලයකට එහි සම්මානවල ප්‍රමිතීන් සහ අධ්‍යාපනය ලබා දීමේ ගුණාත්මකභාවය සහ දැනුම උත්පාදනය නිසි පරිදි පවත්වා ගන්නා බව විශ්වසනීයභාවයෙන් හා ස්ථිරභාවයෙන් සහතික කළ හැකි උපක්‍රමයකි.

තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන කවුන්සලයේ (QAAC) මාර්ගෝපදේශයන්ට අනුකූලව තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ මෙම ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකය (IQAU) වගකීම දරයි. විශ්ව විද්‍යාලයේ ගුණාත්මකභාවය පිළිබඳ අපේක්ෂිත ප්‍රමිතීන් පවත්වා ගැනීම දැවැන්ත කාර්යයක් වුවද, විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ අධ්‍යක්ෂ, මහාචාර්ය සමන්ති සේනාරත්න මහත්මිය, අර්ධ කාලීන පදනමින්, අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයට අදාළ වන අධ්‍යයන හා පරිපාලනමය කාර්යයන් ඉටු කිරීම සඳහා කටයුතු කරයි.

2018 වර්ෂය තුළ, අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAU) ක්‍රියාකාරකම් පහත දැක්වේ.

**1. ආයතනික සමාලෝචනය:**

2017 නොවැම්බර් 13 සිට 17 දක්වා පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආයතනික සමාලෝචනයේ (IR) පරිශ්‍ර චාරිකාව සඳහා සහභාගි වූහ. 2018 ජනවාරි 13 වන දින සමස්ථ ලකුණු 73.2 ක් සහ “බී” ශ්‍රේණියක් සහිතව ඔවුහු සිය කෙටුම්පත් සමාලෝචන වාර්තාව යැවූහ. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට “බී” ශ්‍රේණියට වඩා ඉහළ ලකුණු ලබා ගත හැකිව තිබුණ බව ප්‍රබලව හැඟුණු බැවින්, සමාලෝචකයන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් දැක්වීම් සඳහා පිළිතුරු ද ඇතුළත් කරමින් සවිස්තරාත්මක වාර්තාවක් 2018.01.30 දින විද්‍යුත් තැපැල මගින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී. 2018.02.01 දින මෙම වාර්තාවේ දෘඪ පිටපතක් ද සභාපතිවරයා වෙත යවා ඇත.

**(i) ප්‍රමිතිවලට අනුව ලකුණු ඉල්ලීම:**

අදාළ ප්‍රමිති 145 ට අනුව ලබා දුන් සියලුම ලකුණු අඩංගු වන ආයතනික සමාලෝචන (IR) කෙටුම්පත් සමාලෝචන වාර්තාවේ ලකුණු ලබා දීමේ ආකෘතිය ඉල්ලා සිටිමින්, සමාලෝචකයින් වෙත ද පිළිතුරු ලබා දෙමින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී. ප්‍රමිති 145 සඳහා ලබා දී ඇති ලකුණු විශ්ව විද්‍යාලයට ලබා දීම සඳහා 2018.02.20 දින පැවති තත්ත්ව ආරක්ෂණ ස්ථාවර කමිටුවේ 87 වන රැස්වීමේදී එකඟත්වයක් ඇති විය. 2018.04.04 දින පැවති තත්ත්ව ආරක්ෂණ ස්ථාවර කමිටුවේ 88 වන රැස්වීමේදී ප්‍රමිතිවලට අනුව ලබා දී ඇති ලකුණු ඉදිරිපත් කිරීමට සහ සමාලෝචන කණ්ඩායම සමඟ සාකච්ඡාවක් ලබා දීමට ද නැවතත් එකඟතාවක් ඇති කර ගන්නා ලදී.

2018.04.17 දින සමාලෝචන කණ්ඩායම සමඟ සාකච්ඡාවක් සඳහා උපකුලපතිවරයා විසින් ඉල්ලීමක් යැවීම අවශ්‍ය වන බව සඳහන් කරමින් තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන කවුන්සලයේ (QAAC) අධ්‍යක්ෂ විසින් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAU) අධ්‍යක්ෂ වෙත විද්‍යුත් තැපැලෙන් ලිපියක් යවා ඇත. එබැවින්, සමාලෝචන කණ්ඩායම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (USJP) උසස් නිලධාරීන් අතර රැස්වීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ඉල්ලා උපකුලපතිවරයා විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

2018.05.18 දින තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන කවුන්සලයේ (QAAC) අධ්‍යක්ෂවරයා විසින් විද්‍යුත් තැපැලෙන් එවන ලද ලිපියක් මගින් අදාළ සාකච්ඡාව 2018.05.18 දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බව දැනුම් දෙන ලදී. මෙම රැස්වීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා උපකුලපතිවරයා විසින් එදිනම පස්වරු 2.00 ට රැස්වීමක් කැඳවන ලදී. 2018.05.18 දින රැස්වීමේදී සාකච්ඡා කළ යුතු කරුණු සාරාංශගත කිරීම සඳහා 2018.05.15 දින නැවත රැස්වීමට එහි දී තීරණය කරන ලදී. සමාලෝචන කණ්ඩායම සමඟ රැස්වීමේදී සාකච්ඡා කළ යුතු ක්ෂේත්‍ර සඳහන් කරමින්, 2016.05.15 දින රාත්‍රී 8.00 ට හෝ ඊට පෙර ලිපියක් යවන ලෙස ඉල්ලා තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන කවුන්සලයේ (QAAC) අධ්‍යක්ෂවරයා විසින් 2018.05.10 දින නැවත වරක් විද්‍යුත් තැපැලෙන් ලිපියක් එවා තිබුණි.

"කෙටුම්පත් ආයතනික සමාලෝචන වාර්තාවේ සමාලෝචන කණ්ඩායමේ අදහස් දැක්වීම්වලට ප්‍රතිචාර" යන වාර්තාවේ දක්වා ඇති, එහෙත් සමාලෝචන කණ්ඩායමට එකඟ විය නොහැකි / තවදුරටත් ගැටළු සහිත අංශ පිළිබඳව ද, ලකුණක් හෝ ලකුණු දෙකක් ලබා දී ඇති ප්‍රමිතීන් පිළිබඳව ද අවධානය යොමු කිරීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) අපේක්ෂා කරන බව සඳහන් කරමින් උපකුලපතිවරයා විසින් 2018.05.15 දින සවස 6.30 ට තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන කවුන්සලයේ (QAAC) අධ්‍යක්ෂවරයා වෙත ලිපියක් යවා ඇත.

**(ii) සමාලෝචන කණ්ඩායම සමඟ සාකච්ඡා කිරීම:**

සමාලෝචන කණ්ඩායම සමඟ සමාලෝචන වාර්තාවට අදාළව සාකච්ඡාවක් ලබා ගැනීම සඳහා නැවත නැවතත් කරන ලද ඉල්ලීම් කිහිපයක් සලකා බැලීමෙන් අනතුරුව, 2018.05.18 දින පෙරවරු 10.00 සිට දහවල් 12.00 දක්වා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) දී, සමාලෝචන කණ්ඩායම සමඟ සාකච්ඡාවක් සඳහා සහභාගී වන ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (USJP) ඉහළ නිලධාරීන් වෙත තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන කවුන්සලය (QAAC) මගින් ආරාධනා කර තිබුණි. ආයතනික සමාලෝචන සංග්‍රහයේ කතෘවරයකු වන මහාචාර්ය උමා කුමාරස්වාමි මෙම රැස්වීමේ මුලසුන දරන ලදී. සමස්ත රැස්වීමේ කටයුතු පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) සහ තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන කවුන්සලය (QAAC) වාර්තා තබන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) සැලකිල්ලක් දැක් වූ කරුණු සම්බන්ධයෙන් අර්ථවත් සාකච්ඡාවක් නොපැවැත්වූ බැවින් මෙම රැස්වීම සාර්ථක කර ගත නොහැකි විය.

මෙම රැස්වීමෙන් අනතුරුව, සමාලෝචන කණ්ඩායම සමඟ පැවැත්වූ රැස්වීමේ ප්‍රතිඵලය සහ ආයතනික සමාලෝචනයේ (IR) ප්‍රතිඵලය සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ද උප කුලපතිවරයා විසින් 2016.05.30 දින විශේෂ රැස්වීමක් කැඳවන ලදී. පහත සඳහන් කරුණු පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සභාපතිවරයාගේ අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සභාපතිවරයා වෙත ලිපියක් ඉදිරිපත් කිරීමට මෙම රැස්වීමේදී තීරණය විය.

1. 2018 ජනවාරි 11 වන දින විශ්ව විද්‍යාලය වෙත ලැබුණු සමාලෝචන කණ්ඩායමේ (RT) කෙටුම්පත් ආයතනික සමාලෝචන වාර්තාව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) පිළි නොගනී.
2. එකඟ නොවීම් සඳහා හේතු 2018 ජනවාරි 30 දින යවන ලද 'කෙටුම්පත් ආයතනික සමාලෝචන වාර්තාවේ සමාලෝචන කණ්ඩායමේ අදහස්වලට පිළිතුරු' වාර්තාවේ සවිස්තරව දක්වා ඇත.
3. නැවත නැවතත් ඉල්ලීම් කිරීමෙන් අනතුරුව, සමාලෝචන කණ්ඩායම (RT) සමඟ පැවැත්වීමට නියමිතව තිබූ රැස්වීමට සතියකට වහාම පෙර එනම්, 2018 මැයි 10 වන දින, ආයතනික සමාලෝචනයේ (IR) සියලුම ප්‍රමිතීන් සඳහා ලකුණු පිරිනැමීමේ කාඩ්පත විශ්ව විද්‍යාලය වෙත ලැබුණි.

4. සමාලෝචන කණ්ඩායම සමඟ රැස්වීම සතුටුදායක අයුරින් නොපැවැත් වූ අතර එම රැස්වීම අත්පොතේ 7.41 වගන්තිය යටතේ 106 වන පිටුවේ දක්වා ඇති පරිදි එක් දිනක් පවත්වනවා වෙනුවට පැය දෙකක් සඳහා සීමා කර තිබූ අතර එය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (USJP) සැලකිල්ලට භාජනය වූ ගැටළු ප්‍රකාශයට පත් කිරීමට එම කාලය කිසිසේත්ම ප්‍රමාණවත් නොවීය.
5. 2018 මැයි 18 වන දින පැවති රැස්වීමේ දී, 2018 ජනවාරි 30 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) විසින් ඉදිරිපත් කරන ලද 'කෙටුම්පත් ආයතනික සමාලෝචන වාර්තාවේ සමාලෝචන කණ්ඩායමේ අදහස් වලට ප්‍රතිචාර දැක්වීම' පිළිබඳ සමාලෝචන කණ්ඩායම (RT) අදහස් ප්‍රකාශ කරනු ඇතැයි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, මෙම රැස්වීමේ දී එවැනි අදහස් දැක්වීම් වාචිකව හෝ ලිඛිතව හෝ ලැබී නොමැත.
6. අවසන් වාර්තාව පිළිගැනීම / ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ තීරණයක් ගැනීමට පෙර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) ට ‘අවසාන ආයතනික සමාලෝචන වාර්තාව’ පරීක්ෂා කිරීමට අවස්ථාවක් ලැබිය යුතුය. ආයතනික සමාලෝචන (IR) සංග්‍රහයේ 27 පිටුවේ 2.7 වන වගන්තියට අනුව, අවසාන වාර්තාව පොදු මහජනතාවට විවෘත වන්නේ විශ්ව විද්‍යාලය එය පිළිගත් පසුව පමණි.

**(i) ආයතනික සමාලෝචනයේ අවසාන සමාලෝචන වාර්තාව:**

සමාලෝචන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද ආයතනික සමාලෝචනයේ (IR) අවසාන සමාලෝචන වාර්තාව දීර්ඝ ප්‍රමාදයකින් පසුව 2018 ඔක්තෝබර් 02 දින විශ්ව විද්‍යාලයට ලැබී තිබුණි. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික හා ප්‍රතිතන කවුන්සිලයේ (QAAC) අධ්‍යක්ෂ විසින් මෙම වාර්තාව 2018 ජුලි 25 වන දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති බව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) වෙත දැනුම් දෙන ලදී.

මෙම වාර්තාව ලැබීමෙන් අනතුරුව, ඉතා ප්‍රවේශමෙන් සහ සියුම්ව මෙම වාර්තාව පරීක්ෂා කරන ලද අතර කෙටුම්පත් සමාලෝචන වාර්තාව සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) මගින් ලබා දී ඇති බොහෝ ප්‍රතිචාරවලට සමාලෝචන කණ්ඩායම සාධාරණ විභාග කිරීමක් සිදුකර නොමැති බව විශ්ව විද්‍යාලයට සොයා ගත හැකි විය. කෙටුම්පත් සමාලෝචන වාර්තාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) මගින් පිළිතුරු ලබා දීමේ දී, ආයතනික සමාලෝචන (IR) සංග්‍රහයේ දක්වා තිබූ ප්‍රමිතීන්ට අනුකූලව විශ්ව විද්‍යාලය කටයුතු කර ඇති ආකාරය පැහැදිලිව දක්වා ඇති අතර, ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම වෙනුවෙන් සමාලෝචන කණ්ඩායම විසින් ලකුණු 01 ක් ලබා දී තිබුණි. අනෙක් ප්‍රමිති සඳහා සමාලෝචන කණ්ඩායම පිරිනමන ලද ලකුණු පිළිබඳ සවිස්තර ලකුණු පත්‍රය ඒ වන විට අප වෙත ලැබී නොමැති වීම නිසා නිර්ණායක 10 යටතේ සඳහන් කර ඇති වෙනත් අදහස් දැක්වීම් සඳහා සාර්ථකව පිළිතුරු ලබා දීමට අපට නොහැකි විය. විශ්ව විද්‍යාලයේ තත්ත්ව ආරක්ෂණ ක්‍රියාවලීන් තවදුරටත් වැඩිදියුණු කිරීම පිළිබඳ ඔවුන්ගේ නිර්දේශවලට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) එකඟත්වය පළ කරන ලදී. කෙසේ වෙතත්, බොහෝ අවස්ථාවල සමාලෝචකයින් විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (USJP) මෙම ප්‍රතිචාර විශ්ව විද්‍යාලය මගින් ඔවුන්ගේ අදහස් පිළිගැනීමක් ලෙස අර්ථකථනය කර ඇති බව අවබෝධ කර ගැනීමට විශ්ව විද්‍යාලයට හැකි විය. මෙම පසුබිම තුළ, වාර්තාවේ ඇති වැරදි විනිශ්චයන් ගණනාවක් හේතුවෙන් ද, විශ්ව විද්‍යාලයට එකඟ විය නොහැකි ඇතැම් ප්‍රමිති සම්බන්ධයෙන් සමාලෝචන කණ්ඩායමේ විනිශ්චයට ප්‍රතිචාර දැක්වීමට විශ්ව විද්‍යාලයට අවස්ථාවක් ලබා දී නොමැති වීම හේතුවෙන් ද, සමාලෝචන කණ්ඩායම විසින් එවන ලද අවසන් වාර්තාව පිළිගැනීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) ට නොහැකි වී ඇත.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) ආයතනික සමාලෝචන (IR) සංග්‍රහයේ 2.7 (පිටුව 27) වගන්තියට අනුව, විශ්ව විද්‍යාලයක ආයතනික සමාලෝචන (IR) වාර්තාව අදාළ විශ්ව විද්‍යාලය මගින් පිළිගත් විට එය පොදු මහජනතාව වෙනුවෙන් විවෘත කළ හැකි වන බව ද සඳහන් කර ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) වාර්තාවේ අන්තර්ගත ඇතැම් කරුණු සම්බන්ධයෙන් එකඟ

නොවන බැවින්, එකඟත්වයක් ඇති නොවූ ගැටළු නිරාකරණය වන තෙක් එය පොදු මහජනතාව වෙනුවෙන් විවෘත කළ නොහැකි වේ. එම නිසා, මෙම ලේඛනය ප්‍රකාශයට පත් කිරීමෙන් වළකින ලෙස තත්ත්ව සහතික හා ප්‍රතීතන කවුන්සිලයේ (QAAC) වෙත උපදෙස් ලබා දෙන ඉල්ලා සිටිමින් 2018 ඔක්තෝබර් 26 දින උපකුලපතිවරයා විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සභාපතිවරයා වෙත ලිපියක් යවන ලදි.

ආයතනික සමාලෝචනය (IR) පිළිබඳ අවසාන සමාලෝචන වාර්තාව පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (USJP) සවිස්තරාත්මක ප්‍රතිචාරය ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සභාපතිවරයා විසින් 2018 දෙසැම්බර් 11 දින පිළියෙළ කර, 2018 දෙසැම්බර් 19 වන දින එවන ලද ලිපිය විශ්ව විද්‍යාලයට ලැබුණු අතර 2019 ජනවාරි මස මුලදී, අවසාන සමාලෝචන වාර්තාව පිළිබඳව සවිස්තරාත්මක ප්‍රතිචාරයක් ඉදිරිපත් කිරීමට විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකය (IQAU) අපේක්ෂා කරයි.

## 1. වැඩසටහන් සමාලෝචනය:

### (i) ස්වයං ඇගයීම් වාර්තාව (SER) ලිවීම:

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යා පීඨය මගින් එහි සියලුම උපාධි අපේක්ෂක පාඨමාලා සඳහා ස්වයං ඇගයීම් වාර්තා (SER) සකස් කර ඇත. මේ අනුව, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යා පීඨය මගින් ස්වයං ඇගයීම් වාර්තා (SER) දොළහ (12) ක් සම්පාදනය කර ඇත. ස්වයං ඇගයීම් වාර්තා (SER) සකස් කළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යා පීඨය මගින් 2018 පෙබරවාරි මාසයේ සිට පීඨ මට්ටමින් මෙන්ම දෙපාර්තමේන්තු මට්ටමින් ද රැස්වීම් පවත්වනු ලබයි.

2018 මාර්තු මාසයේ සිට, ස්වයං ඇගයීම් වාර්තා (SER) වඩාත්ම සුදුසු ආකාරයෙන් ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යා පීඨය මගින් ඒවා කෙටුම්පත් කිරීම, නැවත කෙටුම්පත් කිරීම සහ සංශෝධනය කිරීම සිදු කර ඇත. ස්වයං ඇගයීම් වාර්තාවල (SER) නිර්ණායකය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (USJP) තත්ත්ව ආරක්ෂණ උපදේශිකා මහාචාර්ය කල්‍යාණි පෙරේරා මහත්මිය සහ විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAU) අධ්‍යක්ෂිකා මහාචාර්ය සමන්ති සේනාරත්න මහත්මියගේ සහභාගීත්වයෙන් පහත දක්වා ඇති වැඩමුළු කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යා පීඨයේ දී පවත්වන ලදී.

| දිනය | නිර්ණායක අංකය | නිර්ණායක ඉදිරිපත් කරන්නන් |
|---|---|---|
| 2018.02.21 | 2 | ආචාර්ය යූ.පෙරේරා, වතු කළමනාකරණ හා තක්සේරු අධ්‍යයනාංශය |
| 2018.02.28 | 3 | පී.ඩී.සී. උදයශාන්ත මහතා, ගිණුම්කරණ අධ්‍යයනාංශය |
| 2018.03.05 | 4 | ආචාර්ය. ඩී. දයාරත්න, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය |
| 2018.03.07 | 5 | ආචාර්ය. එච්. ගුණතිලක, ව්‍යාපාර කළමනාකරණ විද්‍යා අධ්‍යයනාංශය |
| 2018.03.08 | 6 | ඩී. පුංචිහේවා මහතා, තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය |
| 2018.03.16 | 7 | ආචාර්ය. ඩී. කුරුප්පුආරච්චි, අධ්‍යයනාංශය දෙපාර්තමේන්තුව ඩී.එස්.සී. |

| | | |
|---|---|---|
| 2018.03.19 | 8 | එස්.සෝමසිරි මෙනවිය, අලෙවිකරණ අධ්‍යයනාංශය |
| 201803.19 | 1 | මහාචාර්ය ජේ. එදිරිසිංහ, සම්බන්ධීකාරක, අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකය |

**ස්වයං ඇගයීම් වාර්තා (SER) සමාලෝචනය:**

මහාචාර්ය කල්‍යාණි පෙරේරා මහත්මිය පහත සඳහන් පරිදි ඒ ඒ අධ්‍යයනාංශය සඳහා වන ස්වයං ඇගයීම් වාර්තා (SER) කෙටුම්පත් පහත සඳහන් දිනවල දී සමාලෝචනය කළාය.

| දිනය | වේලාව | අධ්‍යයනාංශය |
|---|---|---|
| 2018.05.03 | පෙරවරු 9.00 සිට පස්වරු 6.00 | වතු කළමනාකරණ හා තක්සේරු අධ්‍යයනාංශය |
| 2018.05.04 | පෙරවරු 9.00 සිට පස්වරු 6.00. | ගිණුම්කරණ අධ්‍යයනාංශය |
| 2018.05.08 | පෙරවරු 9.00 සිට පස්වරු 6.00 | මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය |
| 2018.05.09 | පෙරවරු 9.00 සිට දහවල්12.00 | රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය |
| | පස්වරු 1.00 සිට පස්වරු 6.00 | ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශය |
| 2018.05.10 | පෙරවරු 9.00 සිට දහවල් 12.00 | වාණිජ අධ්‍යයනාංශය |
| | පස්වරු 1.00 සිට පස්වරු 6.00 | තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය |
| 2018.05.11 | පෙරවරු 9.00 සිට දහවල් 12.00 | තීරණ විද්‍යා අධ්‍යයනාංශය |
| | පස්වරු 1.00 සිට පස්වරු 6.00 | ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය |
| 2018.05.14 | පෙරවරු 9.00 සිට දහවල් 12.00 | මූල්‍ය අධ්‍යයනාංශය |
| | පස්වරු 1.00 සිට පස්වරු 6.00 | අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයනාංශය |
| 2018.05.15 | පෙරවරු 9.00 සිට දහවල් 12.00 | ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය |

**(i) කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය පීඨය (FMSC) මගින් ස්වයං ඇගයීම් වාර්තා (SER) ඉදිරිපත් කිරීම:**

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය මගින් එමගින් පවත්වනු ලබන සියලුම උපාධි අපේක්ෂක උපාධි පාඨමාලා සඳහා ස්වයං ඇගයීම් වාර්තා දොළහක් (12) සකස් කර ඇති අතර ඒවා ගිවිස ගත් දිනය වන 2018.05.31 වන දා තත්ත්ව සහතික හා ප්‍රතීතන කවුන්සිලය (QAAC) වෙත ඉදිරිපත් කරන ලදී. උපාධි පාඨමාලා සහ ඒ පාඨමාලා සඳහා වගකිවයුතු අධ්‍යනාංශ පහත දක්වා ඇත.

**(ii) වැඩසටහන් සමාලෝචනය ආරම්භ කිරීම:**

කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය පීඨයේ (FMSC) වැඩසටහන් සමාලෝචන (PR) 2018.11.12 දින ආරම්භ කරන ලදී. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍ය පීඨයේ (FMSC) වැඩසටහන් සමාලෝචන (PR) පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | උපාධි වැඩසටහන් | අධ්‍යයනාංශය | සමාලෝචන කණ්ඩායම | නැරඹන ලද දින |
|---|---|---|---|---|
| 1 | විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය | ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශය | ආචාර්ය රත්නම් විජයකුමාරන් (සභාපති)<br>ආචාර්ය අමින්ඩා මෙත්සිලා පෙරේරා<br>මහාචාර්ය රංජිත් ඩබ්ලිව්. පල්ලේගම | 2018.11.12 |
| 2 | විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලනය (ව්‍යාපාර ආර්ථික විද්‍යා) (විශේෂ) උපාධිය | ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය එෆ්.එච්. අබ්දුල් රවුෆ් (සභාපති)<br>ආචාර්ය එස්.ඩී.කේ. විජේසුන්දර<br>මහාචාර්ය විජිත් එස්. ජයමාන්න | 2018.11.12 |
| 3 | විද්‍යාවේදී වතු කළමනාකරණය සහ තක්සේරුකරණ (විශේෂ) උපාධිය | වතු කළමනාකරණය සහ තක්සේරු අධ්‍යයනාංශය | මහාචාර්ය ප්‍රසාදිනි ගමගේ (සභාපති)<br>මහාචාර්ය ජේ.එම්.පී.කේ. ජයසිංහ<br>ඉන්ජි. (ආචාර්ය) සුධිර ද සිල්වා | 2018.11.12 |
| 4 | විද්‍යාවේදී මූල්‍ය (විශේෂ) උපාධිය | මූල්‍ය අධ්‍යයනාංශය | ආචාර්ය ආනන්තිනි නන්දකුමාරන් (සභාපති)<br>මහාචාර්ය කේ.ඒ.එස්. ධම්මිකා<br>ආචාර්ය පී.ඒ.පී. සමන්ත කුමාර | 2018.11.25 |
| 5 | විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂ) උපාධිය | රාජ්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය | මහාචාර්ය පී.එම්.ඒ.එස්. කරුණාරත්න (සභාපති)<br>ආචාර්ය රතිරානි යෝගේන්ද්‍රරාජා<br>ආචාර්ය වී. සිවලෝගතාසන් | 2018.11.25 |
| 6 | විද්‍යාවේදී අලෙවිකරණ කළමනාකරණය (විශේෂ) උපාධිය | අලෙවිකරණ කළමනාකරණය අධ්‍යයනාංශය | ආචාර්ය එස්.ජේ.එම්.එන්.ජී. සමරකෝන් (සභාපති)<br>මහාචාර්ය කේ.ඒ.එස්. ධම්මිකා<br>ආචාර්ය එච්.ඒ.ඩබ්ලිව්.එස්. ගුණතිලක | 2018.12.06 |
| 7 | විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ) උපාධිය | ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය | ආචාර්ය රතිරානි යෝගේන්ද්‍රරාජා (සභාපති)<br>මහාචාර්ය එච්.එම්. නවරත්න බණ්ඩා<br>ආචාර්ය පී.එල්.එස්. පීටර් | 2018.12.06 |
| 8 | විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ) උපාධිය | මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය | මහාචාර්ය එන්. ෂන්මුගලිංගම් (සභාපති)<br>ආචාර්ය එෆ්.එච්. අබ්දුල් රාවුෆ්<br>ආචාර්ය පී.කේ.ටී.එන්.එස්. පල්ලේවත්ත | 2018.12.06 |

| | | | | |
|---|---|---|---|---|
| 9 | විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) උපාධිය | තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය | මහාචාර්ය එස්.සී. ජයමාන්න (සභාපති)<br>ආචාර්ය අමින්ඩා මෙත්සිල පෙරේරා<br>ආචාර්ය අතම්බාවා ජාෆර් | 2018.12.06 |
| 10 | වාණිජවේදී (විශේෂ) උපාධිය | වාණිජ අධ්‍යයනාංශය | ආචාර්ය එච්.එස්.ආර්. රොසයිරෝ (සභාපති)<br>ආචාර්ය අමින්ඩා මෙත්සිලා පෙරේරා<br>මහාචාර්ය බී. නිමලදාසන් | 2018.12.09 |
| 11 | විද්‍යාවේදී මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ (විශේෂ) උපාධිය | තීරණ විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය කේ.ඒ.එස්. ධම්මිකා (සභාපති)<br>ආචාර්ය ජී.ඒ.එස්.ගිනිගද්දර<br>මහාචාර්ය පී. හේවගේ | 2018.12.09 |
| 12 | විද්‍යාවේදී ගිණුම්කරණ (විශේෂ) උපාධිය | ගිණුම්කරණ අධ්‍යයනාංශය | මහාචාර්ය ඩබ්ලිව්.ඒ. ලියනගේ අමරකීර්ති (සභාපති)<br>මහාචාර්ය ප්‍රසාදිනි ගමගේ<br>ආචාර්ය එම්.අයි.එස්. සෆීනා | 2018 වර්ෂයේ දී සමාලෝචනය කර නොමැත |

**1. තත්ත්ව සහතික හා ප්‍රතීතන කවුන්සිලය (QAAC) මගින් ඉල්ලා ඇති ප්‍රගති වාර්තා:**

විශ්ව විද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAU) 2017 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රගති වාර්තාව සහ එම ඒකකයේ (IQAU) 2018 වර්ෂය සඳහා කාර්තුමය ප්‍රගති වාර්තා තත්ත්ව සහතික හා ප්‍රතීතන කවුන්සිලය (QAAC) මගින් ඉල්ලා සිටි කාල පරිච්ඡේදවලදී එම ආයතනය වෙත යවා ඇත.

**4. ප්‍රතිපත්ති ලේඛන:**

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (USJP) සඳහා පහත සඳහන් ප්‍රතිපත්ති ලේඛනවල වැඩ කටයුතු අවසන් කිරීම සඳහා වැඩමුළුවක් 2018.08.24 දින පින්ගරා ටවුන් ඇන්ඩ් කන්ට්‍රි ක්ලබ් (පුද්.) ලිමිටඩ් හිදී පවත්වන ලදී. අවසන් කරන ලද ප්‍රතිපත්ති ලේඛන දහ අට (18) ක් 2018.09.27 දින පවත්වන ලද 364 වන සනාතන සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන ලදී.

1. අධ්‍යයන අවංකභාවය සහ අඛණ්ඩතාව පිළිබඳ ප්‍රතිපත්තිය
2. පරිපාලනය පිළිබඳ ප්‍රතිපත්තිය
3. ප්‍රජා සේවා / පුද්ගලයන් වෙත සේවා හා තොරතුරු රැගෙන යෑම සහ කර්මාන්ත සම්බන්ධතා / කර්මාන්තවල නිරතවීම පිළිබඳ ප්‍රතිපත්තිය
4. පර්යේෂණ පැවැත්වීම සහ ඒ සඳහා සහාය දීම පිළිබඳ ප්‍රතිපත්තිය

5. ශිෂ්‍ය නවෝත්පාදනයන් දිරිගැන්වීම සහ ඒ සඳහා ප්‍රතිලාභ ලබා දීම පිළිබඳ ප්‍රතිපත්තිය
6. විභාග ප්‍රතිපත්තිය
7. මූල්‍ය ප්‍රතිපත්තිය
8. සාමාන්‍ය පරිපාලනය පිළිබඳ ප්‍රතිපත්තිය
9. මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්තිය
10. තොරතුරු පිළිබඳ ප්‍රතිපත්තිය
11. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය
12. නවෝත්පාදන, නව නිපැයුම් සහ ව්‍යාපාර නිර්මාණය පිළිබඳ ප්‍රතිපත්තිය
13. අභ්‍යන්තරකරණය සහ අක්වෙරළ අධ්‍යයන වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්තිය
14. වැඩසටහන් / විෂයමාලා අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, සමාලෝචනය සහ නතර කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය
15. වැඩසටහන් / විෂයමාලා සැලසුම් කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය
16. කලාපීය හා ජාතික මට්ටමේ තරඟ සඳහා ශිෂ්‍ය සහභාගීත්වය පිළිබඳ ප්‍රතිපත්තිය
17. ඉගැන්වීම සහ ඉගෙනීම පිළිබඳ ප්‍රතිපත්තිය
18. වෙබ් අන්තර්ගත කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්තිය

## 5. විශ්ව විද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAU) වෙබ් පිටුව:

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ (USJP) කුලපති විසින් විශ්ව විද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකය (IQAU) සඳහා වන වෙබ් පිටුව විශ්ව විද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAU) සාමාජිකයන් ඉදිරියේ දී 2018 නොවැම්බර් 08 දින නිල වශයෙන් ආරම්භ කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය (USJP) වෙබ් අඩවියේ 'ආයතන සහ මධ්‍යස්ථාන' යන ශීර්ෂය යටතේ විශ්ව විද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAU) වෙබ් පිටුව ලැයිස්තුගත කර ඇත. විශ්ව විද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයේ (IQAU) ප්‍රතිපත්ති අත්පොත, අතුරු ව්‍යවස්ථා, අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකය (IQAU) සඳහා මෙහෙයුම් මඟ පෙන්වීම් සහ ප්‍රගති වාර්තා ඇතුළුව අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකයට අදාළ සියලු විස්තර එහි ඇතුළත් වේ.

# ඉදිරි සැලසුම්

<u>**සංයුක්ත සැලස්ම** (2017-2021)</u>

- ඉගෙනීම හා අධ්‍යාපනය
- පර්යේෂණ හා සංවර්ධන:
- පර්යේෂණ, නිර්මාණශීලීත්වය, නවෝත්පාදන ප්‍රකාශන සහ මහජන සහභාගීත්වය
- ජනතාව: පීඨය හා කාර්ය මණ්ඩලය
- යටිතල පහසුකම්: ආයතනික ව්‍යුහයන්, සම්පත් පරිපාලනය සහ සංවර්ධනය (ප්‍රතිරූප ගොඩනැගීම සහ ප්‍රවර්ධන)

- මූල්‍ය
- කැපී පෙනෙන ශිෂ්‍ය ක්‍රියාකාරකම්
- දිවි නැගුම සමාජය, සමාජ වගකීම් සහ ජාතික දායකත්වය

# වාර්ෂික ගිණුම් වාර්තා

# 2018

## පුනරාවර්තන වියදම් විස්තර 2018

| විෂය | 2018 |
|---|---|
| **සේවක වැටුප් හා දීමනා** | 2,989,044 |
| **ගමන්වියදම්** | 41,015 |
| **සැපයීම්** | 126,643 |
| **නඩත්තු වියදම්** | 74,378 |
| **කොන්ත්‍රාත්තු සේවා** | 577,564 |
| **වෙනත්** | 379,604 |
| මූලධන ආධාර - පුනරාවර්තන වියදම් | 391,920 |
| **මුළු එකතුව** | 4,580,168 |



## මුලා කාර්යසාධන විශ්ලේෂණය 2018 පීඨ වශයෙන් එක් ශිෂ්‍යයකු සඳහා වන වියදම (අභ්‍යන්තර උපාධි අපේක්ෂ)

| පීඨය | මුලු වියදම (රු.) | 2018 වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාව | එක් ශිෂ්‍යයකු සඳහා වියදම (රු.) |
|---|---|---|---|
| අ) ව්‍යවහාරික විද්‍යා | 896,084,576 | 2206 | 406,203.34 |
| ආ) මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | 898,710,924 | 3575 | 251,388 |
| ඇ) වෛද්‍ය විද්‍යා | 725,566,219 | 1225 | 592,299 |
| ඈ) කළමනාකරණ හා වාණිජ විද්‍යා | 1,330,863,524 | 6045 | 220,159 |
| ඉ)ඉංජිනේරු | 172,749,349 | 363 | 475,894 |
| ඊ)තාක්ෂණ | 220,986,406 | 642 | 344,216 |

## මුලධන වියදම් විස්තරය 2015-2018 (රු'000)

| විෂය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| **අ) දේපල අත්පත්කරගැනීම** | 126,744 | 239,151 | 542,137 | 724,950 |
| **ආ)** ගොඩනැගිලි හා සැලසුම් අත්පත් කර ගැනීම | 520,910 | 658,309 | 269,169 | 1,395,075 |
| **ඇ)පුස්තකාල පොත්** | 14,340 | 13,962 | 33,337 | 30,914 |
| **ඈ) දැනුම වර්ධන අරමුදල්** | 154,973 | - | - | - |
| **ඉ) මානව මුලධන සංවර්ධන ව්‍යාපෘති** | - | 121,084 | 1,650 | 9,253 |
| **ඊ) බලගැන්වුම් පර්යේෂණ** | - | 137,341 | 146,417 | 369,062 |
| **උ) අනෙකුත් ( පුනරුත්තාපන)** | 70,826 | 126,343 | 142,472 | 127,597 |
| **එකතුව** | 887,793 | 1,296,190 | 1,135,182 | 2,656,851 |

## මුලා කාර්යසාධනය පිළිබඳ පුනරාවර්තන වියදම් – 2018 රු. ( '000)

| විෂය | නියමය | එක් ශිෂ්‍යයටකුට වියදම |
|---|---|---|
| අ)එක් ශිෂ්‍යයකු සඳහා වන පුනරාවර්තන වියදම් (පුන වි.) | පු.වි./ ශිෂ්‍යයන් ගණන | 326 |
| ආ) එක් ශිෂ්‍යයකු සඳහා වන ප්‍රග්ධන වියදම් (ප්‍රාග්.වි.) | ප්‍රා.වි/ශිෂ්‍යයන් ගණන | 189 |

## පසුගිය වසර 5ක කාලය තුළ මූල්‍යමය තත්වය (අගයන් රු.'000 වශයෙන්)

| විෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| 1. සේවක වැටුප් හා දීමනා | 1,538,113 | 1,938,192 | 2,181,660 | 2,384,967 | 2,989,044 |
| 2. ගමන් වියදම් | 9,973 | 27,594 | 46,122 | 32,170 | 41,015 |
| 3. සැපයීම් | 80,508 | 95,291 | 105,859 | 117,133 | 126,643 |
| 4. නඩත්තු සේවා | 73,135 | 96,239 | 129,262 | 35,884 | 74,378 |
| 5. කොන්ත්‍රාත් සේවා | 253,417 | 280,647 | 350,182 | 496,041 | 577,564 |
| 6. වෙනත් | 285,827 | 319,590 | 313,821 | 385,306 | 377,922 |
| 7. පර්යේෂණ හා සංවර්ධන | 31,060 | 44,341 | 945 | 293 | 1,682 |
| 8. විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් | 6,758 | 62,115 | 114,359 | 259,834 | 391,920 |
| **එකතුව** | **2,278,791** | **2,864,009** | **3,242,210** | **3,711,628** | **4,580,168** |

## පසුගිය වසර 5ක කාලයේ දී මූල්‍යමය තත්වය (අගයන් රු.'000)

| විෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| මූලධන ආධාර | 947,550 | 875,000 | 1,297,200 | 1,139,312 | 2,653,700 |
| පුනරාවර්තන ආධාර | 1,861,285 | 2,360,000 | 2,537,702 | 2,907,750 | 3,590,000 |



## පසුගිය වසර 5ක කාලයේදී මූල්‍ය ප්‍රතිපාදනයන්හි තත්වය (අගයන් රු.'000)

| විෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| මුලධන වියදම් | 964,384 | 887,793 | 1,296,190 | 1,135,182 | 2,656,851 |
| පුනරාවර්තන වියදම් | 2,278,791 | 2,864,009 | 3,242,210 | 3,711,628 | 4,580,168 |



## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
## මූල්‍ය ප්‍රකාශන 2018
## 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | 2018.දෙසැ:31 දිනට | 2017.දෙසැ:31 දිනට (ගැලපු) |
|---|---|---|
| (ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත) | | |
| | **(රු)** | **(රු)** |
| <u>වත්කම්</u> | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපල පිරියත හා උපකරණ | 9,342,136,008 | 9,145,370,103 |
| පුස්තකාල පොත් සහ උපාධි ලෝගු | 51,025,615 | 51,649,602 |
| කෙරීගෙන යන වැඩ | 1,393,602,358 | 66,134,421 |
| ආයෝජන | 19,543,268 | 8,510,971 |
| සේවක ණය | 1,612,763,872 | 1,245,657,770 |
| | **12,419,071,121** | **10,517,322,865** |
| <u>ජංගම වත්කම්</u> | | |
| ගබඩා තොගය | 40,058,196 | 40,870,906 |
| විවිධ ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ | 138,010,552 | 98,840,010 |
| සේවක අත්තිකාරම් | 970,758 | 541,408 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් | 490,537,100 | 324,387,374 |
| මුදල් හා මුදල් සමානයන් | 70,432,850 | 48,439,662 |
| | **740,009,456** | **513,079,360** |
| වත්කම් එකතුව | **13,159,080,574** | **11,030,402,225** |

| (ශේෂ පත්‍රය පිටු අංක 01 සිට ඉදිරියට ගෙන ආවා) | | | |
|---|---|---|---|
| | 2018.දෙසැ:31 දිනට | | 2017.දෙසැ:31 දිනට (ගැලපූ) |
| | (රු) | | (රු) |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | |
| මූලධන ආධාර | 5,804,452,314 | | 4,009,121,724 |
| මූලධන ආධාර - වෙනත් | 430,580,383 | | 491,159,322 |
| ත්‍යාග හා පරිත්‍යාග | 30,075,835 | | 13,108,504 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 5,123,774,169 | | 5,123,774,169 |
| රඳවා ගත් ඉපයීම් | (488,764,645) | | (306,616,420) |
| | **10,900,118,057** | | **9,330,547,299** |
| | | | |
| **සංචිත හා අරමුදල්** | | | |
| අභ්‍යන්තර ශුද්ධ වත්කම් | 583,279,328 | | 396,758,843 |
| මූලධන සංචිතය | 1,574,237 | | 1,574,237 |
| අනුස්මරණ අරමුදල් | 29,932,386 | | 28,559,542 |
| විවිධ ව්‍යාපෘති ආධාර | 110,712,440 | | 94,793,969 |
| විලම්භිත ආදායම - ස්වයං මූල්‍ය හා ව්‍යාපෘති | 445,860,667 | | 265,989,158 |
| | **1,171,359,059** | | **787,675,750** |
| | | | |
| **ජංගම නොවන වගකීම** | | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 506,796,798 | | 498,851,043 |
| | **506,796,798** | | **498,851,043** |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 20,225,125 | | 13,310,835 |
| උපචිත හා වෙනත් ගෙවිය යුතු වියදම් | 560,581,535 | | 400,017,298 |
| | **580,806,660** | | **413,328,133** |
| | | | |
| **ස්කන්ධය හා වගකීම් වල එකතුව** | **13,159,080,574** | | **11,030,402,225** |
| | | | |
| | | | |
| මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත. | | | |
| | | | |
| | | | |
| කේ.එස්.ටී.එස්. ජයසූරිය | | | කේ.ජී. බ්‍රිටෝ |
| වැඩ බලන මූල්‍යාධිකාරී | | | ලේඛකාධිකාරී |
| | | | |
| | | | |
| පාලක සභාව වෙනුවෙන් අනුමත කලේ: | | | |
| | | | |
| මහාචාර්ය සම්පත් අමරතුංග | | | වී. ධර්මරාජ |
| උපකුලපති | | | පාලක සභා සාමාජික |
| | | | |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

( ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත)

| | 2018 | 2017 ගැලපූ |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | රු: | රු: |
| රජයේ ආධාර - පුනරාවර්තන | 3,590,000,000 | 2,907,750,000 |
| රජයේ ආධාර - මූලධන - පුනරාවර්තන ස්වභාවයේ වියදම් | 387,926,049 | 254,407,152 |
| අභ්‍යන්තර ආදායම් | 606,609,357 | 499,734,029 |
| දේපල පිරියත උපකරණ ඉවත්කිරීමේ ලාභ | - | 3,334,094 |
| රජයේ ආධාර සහ පරිත්‍යාග ක්‍රමක්ෂය | 545,661,575 | 392,567,004 |
| මහපොළ ශිෂ්‍යත්ව | 453,492,500 | - |
| ශිෂ්‍යාධාර | 65,561,600 | - |
| මුළු ආදායම | **5,649,251,082** | **4,057,792,280** |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වැටුප් හා දීමනා | 2,989,043,825 | 2,384,967,083 |
| ගමන් වියදම් | 41,014,803 | 32,170,123 |
| සැපයීම් | 126,642,848 | 117,133,277 |
| නඩත්තු සේවා | 74,378,113 | 35,883,799 |
| කොන්ත්‍රාත් සේවා | 577,563,951 | 496,041,104 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 379,604,040 | 385,599,206 |
| නිර්වචිත ප්‍රතිලාභ බැදීම් | 33,225,295 | 90,112,283 |
| ආයුගණක ලාභ සහ පාඩු මත නිර්වචිත ප්‍රතිලාභ බැදීම් | 8,963,789 | - |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම් පාඩු | 540,359 | - |
| මූලධන ආධාර - පුනරාවර්තන වියදම් | 391,919,826 | 259,833,971 |
| ක්ෂය වීම් | 660,576,278 | 476,257,158 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 6,693,709 | 3,886,053 |
| ශිෂ්‍යාධාර | 65,561,600 | |
| මහපොළ ශිෂ්‍යත්ව | 453,492,500 | |
| මුළු වියදම් | **5,809,220,936** | **4,281,884,058** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ඌනතාවය/ අතිරික්තය | **(159,969,855)** | **(224,091,778)** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2018.12.31 | | 2017.12.31 |
|---|---|---|---|
| | දිනට | | දිනට ගැලපූ |
| | (රු:) | | (රු:) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් (ඌනතාවය) /අතිරික්තය** | (159,969,855) | | (224,091,778) |
| | | | |
| **ගැලපීම්** | | | |
| ක්ෂය කිරීම | 660,576,278 | | 476,257,158 |
| ණය හානිකරණය | 222,895 | | - |
| පුස්තකාල පොත් ලියහැරිම | - | | 64,395 |
| ආයෝජන පොලී | (114,879,276) | | (84,399,207) |
| විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරිම | 33,225,295 | | 90,112,283 |
| ආයුගණක ලාභ සහ පාඩු මත නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් | 8,963,789 | | - |
| රජයේ ආධාර සහ පරිත්‍යාග ක්‍රමක්ෂය | (545,661,575) | | (392,567,004) |
| වත්කම් ඉවත් කිරීම් | 540,359 | | (3,334,094) |
| පුනුරුත්තාපන වියදම් සඳහා මාරු කිරීම | 2,336,090 | | - |
| අස්පෘශ්‍ය වත්කම් ක්ෂය | 6,693,709 | | 3,886,053 |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | (387,926,049) | | (254,407,152) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(495,878,340)** | | **(388,479,346)** |
| | | | |
| ගබඩා තොගය (වැඩිවීම/අඩුවීම) | 812,710 | | 1,624,013 |
| ණයගැතියෝ සහ ලැබියයුතු දෑ (වැඩිවීම/අඩුවීම) | (26,815,476) | | 725,630 |
| සේවක ණය හා අත්තිකාරම් (වැඩිවීම/අඩුවීම) | (429,350) | | 298,300 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | (166,149,726) | | (166,518,554) |
| | | | |
| උපචිත හා වෙනත් ගෙවිය යුතු වියදම් (වැඩිවීම/අඩුවීම) | 160,564,237 | | (40,113,963) |
| ආපසු ගෙවියයුතු තැන්පත් (වැඩිවීම/අඩුවීම) | 6,914,290 | | (3,155,228) |
| විස්තිරණ පාඨමාලා සඳහා විලම්භිත ආදායම් (වැඩිවීම/අඩුවීම) | 179,871,509 | | 102,632,027 |
| **කාරක ප්‍රාග්ධන වෙනස ගැලපීමෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ව ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(341,110,145)** | | **(492,987,121)** |
| පාරිතෝෂික ගෙවීම | (34,243,329) | | (30,334,398) |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරි මුදල් ප්‍රවාහය** | **(375,353,474)** | | **(523,321,519)** |

| | 2018.12.31 දිනට | 2017.12.31 දිනට |
|---|---|---|
| | (රු:) | (රු:) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (793,851,739) | (529,966,128) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමේ ක්‍රියාවලිය | 1,723,097 | 4,919,500 |
| ආයෝජන පොලී | 102,524,210 | 76,816,504 |
| කෙරීගෙන යන වැඩ | (1,381,053,340) | (132,765,928) |
| වසර තුළ ආයෝජනය කළ මුදල් | (459,222,948) | (319,141,229) |
| ආයෝජන ලැබීම් | 89,614,478 | 179,009,120 |
| සේවක ණය ගෙවීම් | 2,279,476 | (14,029,781) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(2,437,986,766)** | **(735,157,942)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ආධාර | 2,653,700,000 | 1,139,312,280 |
| පරිත්‍යාග මුදල් භාවිතය | 1,372,844.00 | 3,407,642 |
| බාහිර අරමුදල් භාවිතය | (22,178,370) | (20,522,012) |
| විශේෂිත අරමුදල් | 186,520,485 | 104,530,839 |
| පර්යේෂණ අරමුදල් | 15,918,471 | 14,816,028 |
| ව්‍යාපෘති පාඨමාලා | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **2,835,333,430** | **1,241,544,777** |
| | | |
| මුදල් හා ආසන්න මුදලින් සදුව ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | 21,993,190 | (16,934,683) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් වලට සමානයන් | 48,439,662 | 65,374,347 |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් වලට සමානයන්** | **70,432,850** | **48,439,662** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## මූල්‍ය ප්‍රකාශන 2018

### 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | පොදු සංචිතය | ප්‍රත්‍යාගණන අතිරික්තය | ප්‍රාග්ධන ප්‍රතිපාදන | | | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | | | වැය කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන (රු) | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන (රු) | පරිත්‍යාග හා අනෙකුත් ප්‍රතිපාදන | |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(306,616,420)** | **5,123,774,169** | **4,003,673,298** | **5,448,425** | **504,267,827** | **9,330,547,299** |
| වර්ෂය තුළ දී වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | | | 2,656,851,005 | (2,656,851,005) | | - |
| වසර තුළ ලද අරමුදල් | | | | 2,653,700,000 | | **2,653,700,000** |
| ප්‍රාග්ධන අරමුදල් සඳහා උපයාගත් අරමුදල් දායකත්වය | | | | | 9,009,006 | **9,009,006** |
| ප්‍රාග්ධන අරමුදල් පුනරුත්තාපන හා නඩත්තු | | | (387,926,049) | | | **(387,926,049)** |
| වර්ෂය තුළ ලද පරිත්‍යාග | | | | | 22,597,601 | **22,597,601** |
| ප්‍රාග්ධන අරමුදල් හා ත්‍යාග ක්‍රමක්ෂය | | | (470,443,360) | | (75,218,215) | **(545,661,575)** |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත/(ඌනතාවය) | | | | | | - |
| අරමුදල් - ගිවිසුම් හා බැඳුම්කර කඩවීම් | (22,178,370) | | | | | **(22,178,370)** |
| විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල | (159,969,855) | | | | | **(159,969,855)** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **(488,764,645)** | **5,123,774,169** | **5,802,154,894** | **2,297,420** | **460,656,220** | **10,900,118,057** |
| | | | | | | - |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සඳහා**

**යොදාගනු ලැබූ වැදගත් ගිණුම් ප්‍රත්පත්ති පිළිබඳ සාරාංශය - 2018**

## 1. වාර්තාකරණ අස්ථිත්වය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ස්ථාපනය කොට ඇති අතර එහි ප්‍රධාන පරිපාලන පරිශ්‍රය නුගේගොඩ ගංගොඩවිල පිහිටා ඇත. නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වේ.

### 1.1 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත දිනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා පාලක සභාව විසින් 2019 අප්‍රේල් 04 වැනි දින අනුමැතිය ලබා දෙන ලදී.

### 1.2 වාර්තාකරණ කාලපරිච්ඡේදය

විශ්වවිද්‍යාලයේ වාර්තාකරණ කාලපරිච්ඡේදය 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වේ.

## 2. අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං. රා. ගි. ප්‍ර.) අනුකූලව පිළියෙළ කොට ඉදිරිපත් කර ඇත. කෙසේවෙතත් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත භාවිතයේ නොමැති අවස්ථා වල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ද භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අඩංගුවේ.

### 2.2 මිනුම් කිරීමේ පදනම

පහත සඳහන් අයිතමය හැර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව උපචිත පදනම මත පිළියෙළ කර ඇත. සාධාරණ වටිනාකම මත මනිනු ලබන දේපල පිරියත හා

උපකරණ හැර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු වෙනස් කිරීමක් කර නොමැත.

## 2.3 සංසන්දනාත්මක තොරතුරු

විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ලද සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති පූර්ව වර්ෂයේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුකූල වන පරිදි යොදාගෙන ඇති අතර ප්‍රවර්තන වර්ෂයේ සංඛ්‍යා පිළියෙළ කිරීමේ දී පෙර වර්ෂවල ශේෂයන් අවශ්‍ය අවස්ථාවල වෙනස්කම්වලට අනුකූල වන පරිදි සංඛ්‍යා ගලපනු ලැබ ඇත.

## 2.4 ප්‍රමාණවත්භාවය සහ රාශීකරණය

සෑම සමාන වැදගත් අයිතම පංතියක්ම මූල්‍ය ප්‍රකාශන තුළ වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වරූපයේ හෝ අසමාන ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම නොවැදගත් නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කොට ඇත.

## 2.5 හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති යටතේ අවශ්‍ය වන්නේ නම් හෝ අවසර දී ඇත්නම් හැර වත්කම් සහ බැරකම් හා ආදායම් සහ වියදම් හිලව්කර නොමැත**.**

## 2.6 අඛණ්ඩ පැවැත්ම

විශ්වවිද්‍යාලය එහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ශක්‍යතාවය තහවුරු කරගැනීම සඳහා විශ්වවිද්‍යාලය පිළිබඳව සහ එහි වත්කම් පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර ආයතනයක් වශයෙන් බොහෝ කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සම්පත් පවතින බවට විශ්වවිද්‍යාලය සෑහීමට පත්වී ඇත. තවද අඛණ්ඩව ආයතනයක් වශයෙන් පවත්වාගෙන යාම සම්බන්දයෙන් වන කිසියම් ප්‍රමාණවත් සැකයක් උපදවන තරම් වන අවිනිශ්චිත තාවයක් පවතින බවට පාලක සභාව තුළ අදහසක් නොමැත. ඒ මත මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ පදනම මත පිළියෙළ කොට ඇත.

## 2.7 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

වාර්තාකරණ දිනයට පසුව සිදු වූ සියළු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගනු ලැබූ අතර අවශ්‍ය අවස්ථාවලදී උචිත ගැළපීම් සහ අනාවරණයන් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකර ඇත.

## 2.8 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකක

විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුළ භාවිතා වන මුදල් ඒකක භාවිතා කරමින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළ පවතින අයිතම මිනුම් කරනු ලැබේ **(ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකක)**. විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඉදිරිපත් කරනු ලැබේ.

## 2.9 විදේශීය මුදල් ඒකක ගනුදෙනු

සියළුම විදේශ විනිමය ගනුදෙනු එම ගනුදෙනු සිදුවන අවස්ථාවේ පවතින විනිමය හුවමාරු අනුපාතයට අනුව, වාර්තාකරණ මුදල් ඒකක වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

## 2.10 වැටයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව වෙනත් ආකාරයකට දක්වා ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන තුළ සඳහන් සංඛ්‍යා ආසන්නතම රුපියලට වැටයීම් කර ඇත.

## 2.11 දේපළ, පිරියත සහ උපකරණ

විශ්වවිද්‍යාලයේ දේපළ, පිරියත සහ උපකරණ තුළ ඉඩම්, ගොඩනැගිලි, රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ, කාර්යාලීය උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම්, පුස්තකාල පොත් සහ වාර සඟරා, මෝටර් රථ, උපාධි ලෝගු, ක්‍රීඩා උපකරණ හා අනෙකුත් වත්කම් යන අයිතමයන් ඇතුළත්වේ.

### (අ) හඳුනාගැනීමේ පදනම

අයිතමයේ ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒනම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකිනම් එවිට දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනී.

### (i) මූලික හඳුනාගැනීම

දේපල, පිරියත සහ උපකරණ මුලින් හඳුනාගෙන ඇත්තේ මිලදී ගැනීමේ පිරිවැය ද ඇතුළුව වත්කම් එහි සේවා කොන්දේසි සපුරා ගැනීම සඳහා වන ඕනෑම අමතර සිදුවීමක් සමඟ ය. හඳුනාගැනීමේ දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය ලෙස අයිතමයක මිල හෝ සාධාරණ අගය යොදා ගනී.

**(ii)** **පවත්නා දේපළ, පිරියත සහ උපකරණ මත වන පසුකාලීන පිරිවැය**

පහත සඳහන් නිර්නායක සපුරන්නේ නම් ස්ථාවර වත්කම් සඳහා දරණ වියදම් මත ප්‍රාග්ධනිත කළ හැකි අතර ක්ෂය කළ යුතුය. එසේ නොවන අවස්ථාවල ස්ථාවර වත්කම් මත වන පිරිවැය එම පිරිවැය දරනු ලබන කාලපරිච්ඡේදයේ දී කාර්ය සාධන ප්‍රකාශනයට ගනු ලැබේ.

- ස්ථාවර වත්කම්වල වෙළඳපොළ අගය ඉහළ යාම.
- අයිතමයේ ධාරිතාවය ඉහළ යාම.
- නිමවුමේ ගුණාත්මකභවේ වර්ධනය හෝ මෙහෙයුම් පිරිවැයේ පහළයාම.
- අලුත්වැඩියා සහ නඩත්තු මගින් සහතික කරන ලද වත්කමේ ආයුකාලයේ සැලකියයුතු මට්ටමේ වැඩිවීම.
- තක්සේරු කරන ලද කාර්යසාධනයේ ප්‍රමිතියෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පත් කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම, වියදමක් ලෙස හඳුනා ගැනේ.

**(iii)** **හඳුනාගැනීමෙන් පසු ගණනය කිරීම්**

**පිරිවැය ආකෘතිය**

ඉඩම්, ගොඩනැගිලි, මෝටර්රථ,රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ, ක්‍රීඩා උපකරණ, කාර්යාලීය උපකරණ, අනෙකුත් උපකරණ සහ ගෘහභාණ්ඩ සහ සවිකිරීම් පංති හැර සියලු දේපළ, පිරියත සහ උපකරණ ඒවා හඳුනා ගැනීමෙන් පසු සමුච්චිත ක්ෂය අඩුකරන ලද එහි පිරිවැයට ගණනය කරනු ලැබේ.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

පහත සඳහන් දේපළ, පිරියත සහ උපකරණ පංති මූලික හඳුනාගැනීමෙන් අනතුරුව විශ්වසනීය ලෙස ගණනය කළ හැකි සාධාරණ අගය ප්‍රත්‍යාගණිත දිනය වන විට කිසියම් පසුකාලීන සමුච්චිත ක්ෂයවීමක් හෝ පසුකාලීන හානිකරණ පාඩුවක් වේනම් එය අඩුකරන ලද ප්‍රත්‍යාගණිත අගයට ධාරණය කරනු ලැබ ඇත. ඉඩම, ගොඩනැගිලි, මෝටර් රථ, කාර්යාලීය උපකරණ, රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම්, ක්‍රීඩා උපකරණ, අනෙකුත් වත්කම්.

දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම රැගෙන යාම එක් එක් වාර්තාකරණ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. වත්කමක් රැගෙන යා හැකි මුදල එහි අයකර ගත හැකි මුදල ඉක්මවා ගියහොත් හානියක් නැතිවීමක් ලෙස හඳුනා ගැනේ. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ දුර්වලතා අඩුපාඩු හඳුනාගෙන ඇත.

**(iv)** **<u>පුස්තකාල පොත් සහ උපාධි ලෝගු</u>**

පුස්තකාල පොත් සහ උපාධි ලෝගුවල පිරිවැය වසර 5 ක කාලයක් පුරා සරල මාර්ග පදනම මත ලියාහරිනු ලැබේ.

**(v)** **<u>අස්පෘශ්‍ය වත්කම්</u>**

වත්කම් වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යවසායයට ගලා යා හැකි අතර වත්කම්වල පිරිවැය විශ්වසනීයව මැනිය හැකි විට පරිගණක මෘදුකාංග සහ මාර්ගගත ජ'නල අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන තිබේ. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැය අඩු සමුච්චිත ක්‍රමක්ෂය සහ හනිකරණය ලෙස සඳහන් වේ. මෙම පිරිවැය ඔවුන්ගේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත වලට වඩා ක්‍රමක්ෂය කර ඇත.

(ආ) **<u>ක්ෂයවීම්</u>**

මූල්‍යප්‍රකාශන තුළ සින්නක්කර ඉඩම හැර දේපළ, පිරියත සහ උපකරණ සෑම අයිතමයක්ම සරල මාර්ග පදනම මත ක්ෂය කිරීම හඳුනා ගනී. වත්කමක් භාවිතය සඳහා පවතින විට ක්ෂය කිරීම ආරම්භ වන අතර එය විකිණීම සඳහා වර්ග කර ඇති මුල් දිනයේ දී සහ වත්කම හඳුනාගැනීම අවසන් වන දිනයේ දී ක්ෂයවීම අවසාන වේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ.

| **වත්කම් ඛාණ්ඩය** | **ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය** |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 යි. |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | වසර 10 යි |
| රසායනාගාර සහ ඉගෙනුම් උපකරණ | වසර 05 යි |
| කාර්යාලීය උපකරණ | වසර 05 යි |
| මෝටර්රථ | වසර 2-5 දක්වා |
| පරිගණක සහ උපාංග | වසර 05 යි |
| ක්‍රීඩා උපකරණ | වසර 05 යි |

| | |
|---|---|
| අනෙකුත් වත්කම් (ජලය, දුරකථන සහ විදුලි යෝජනා ක්‍රම ඇතුළුව) | වසර 10 යි |
| අභ්‍යන්තර කොටස් නිර්මාණය | වසර 05 |
| භූ දර්ශනයන් කිරීම | වසර 05 |

වත්කම් ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි ප්‍රමාණයට වඩා වැඩි නම්, එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වත්කමේ ධාරණ අගය එහි අයකර ගත හැකි මුදලට වහාම ලියා තබනු ලැබේ. බැහැර කිරීම්වල ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ ලැබෙන ආදායම ධාරණ අගය හා සංසන්දනය කිරීමෙන් වන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන්හි ලාභ අලාභ හඳුනා ගැනේ.

(ඇ) **<u>හඳුනාගැනීම ඉවත් කිරීම</u>**

දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය ඒවා අපහරණය කිරීමේ දී හෝ එහි භාවිතයෙන් ඉවත් කිරීම හෝ අපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවයේ යෙදවීමක් විභවතා අපේක්ෂා නොකරන විට දී හඳුනා ගැනීම අවසන් වේ. අයිතමය හඳුනානොගැනීමේ දී එසේ හඳුනානොගැනීම හේතුකොටගෙන සිදුවන ලාභය හෝ අලාභ අතිරික්තයට හෝ ඌනතාවයට ඇතුළත් කළ යුතුය.

## 2.12 <u>මූල්‍ය වත්කම්</u>

**<u>ආයෝජනයන්</u>**

ස්ථාවර තැන්පතු හා ඉතිරුම් ගිණුම්වල ආයෝජකයින් ආයෝජනය කරයි. මෙම ආයෝජන LKAS 39 ට අනුව ආයෝජනය කර ඇත. LKAS 39 විසින් නියම කරනු ලබන පරිදි ඵලදායී පොලී අනුපාත භාවිතා කිරීමෙන් සාධාරණ වටිනාකමක් ගණනය කරනු ලබන අතර සාධාරණ වටිනාකම අඩු පිරිවැයකින් පිරිවැය ගණනය කරනු ලැබේ.

**<u>කාර්ය මණ්ඩල ණය</u>**

මාණ්ඩලික ණය සඳහා ආපදා ණය, පරිගණක ණය, ප්‍රකාශන ණය, වාහන ණය සහ වෙනත් කාර්ය මණ්ඩල ණය ඇතුළත් වේ. SLFRS 09 ට අනුව කාර්ය මණ්ඩල ණය ක්‍රමවත් පිරිවැයකින් මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

## 2.13 <u>කෙරීගෙනයන ප්‍රාග්ධන වැඩ</u>

වාර්තාකරන දිනය වන විට සම්පූර්ණ කර නොමැති දරණ ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දැක්වේ. කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයයන් භාවිතය සඳහා සුදානම්ව පවතින විට දේපළ, පිරියත සහ උපකරණවලට මාරු කළ හැකිය.

## 2.14 <u>ජංගම වත්කම්</u>

මූල්‍ය තතත්ව ප්‍රකාශනයේ වර්ග කර ඇති ජංගම වත්කම් වනුයේ උපලබ්ධි වීමට අපේක්ෂිත හෝ විකිණීම හෝ ආයතනයේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියේදී යොදා ගැනෙන හා ප්‍රයෝජනය ගැනෙන බවත් වාර්තාකරන දිනෙන් පසු මාස 12 ක් ඇතුලත උපලබ්ධි වීම අපේක්ෂා කරන වත්කම් හෝ මුදල් හෝ මුදල් සමාන දෑ වේ.

## 2.15 <u>භාණ්ඩ තොග</u>

යල්පැන ගිය සහ අඩු චලනයන් සහිත වත්කම් සඳහා නියමිත දීමනා වෙන් කිරීමෙන් අනතුරුව භාණ්ඩ තොග පිරිවැයේ අවමයට සහ ශුද්ධ උපලබ්ධි අගයට භාණ්ඩ තොග තක්සේරු කරනු ලැබේ. සාමාන්‍යයෙන් පිරිවැය පළමු ගැණුම් පළමු නිකුතු පදනම මත තීරණය කරනු ලබන අතර භාණ්ඩ තොග අත්පත් කර ගැනීමේ දී දරන ලද වියදම් සහ පවත්නා තත්ත්වයට සහ පවත්නා ස්ථානයට ගෙන ඒම සඳහා දරණ ලද වියදම් ඇතුළත් වේ.

## 2.16 <u>කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් සහ ලැබිය යුතු දෑ</u>

කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් සහ ලැබිය යුතු දෑ යන්නට සේවක අත්තිකාරම්, තැන්පතු සහ වෙළඳ ලැබිය යුතු දෑ ඇතුලත් වේ.

## 2.17. <u>මුදල් සහ මුදල් සමාන දෑ</u>

මුදල් සහ මුදල් සමාන දෑ යන්න අතැති මුදල් සහ ඉල්ලුම් තැන්පතු සහ අගයේ සැලකිය යුතු තරම් නොවන වෙනස්වීමේ අවධානයකට භාජනය වන සහ දන්නා මුදල් ප්‍රමාණයකට වහා පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන වශයෙන් නිර්වචනය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යයන් සඳහා අතැති මුදල් සහ බැංකු තැන්පතු මුදල් සහ මුදල් සමාන දෑ ලෙස සලකනු ලබන අතර අත්පත් කර ගැනීම සඳහා හය මාසයකට අඩු කාලයක් පවතින කෙටි කාලීන පරිණතියක් සහිත ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ. වක්‍ර ක්‍රමය මත පදනම්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශ වාර්තා කරනු ලැබේ.

## 2.18 ප්‍රාග්ධන වියදම් සඳහා වන රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම

### 2.18.1 පුනරාවර්තන ප්‍රදාන

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ පුනරාවර්තන ප්‍රදාන මුදල් පදනම මත හඳුනාගනී. ස්ථාවර වත්කම් පුනරුත්තාපනය සඳහා වන පිරිවැය සහ ඉදිකිරීම් සහ නව කාර්යයන් සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍ය පරිදි කෙරීගෙන යන වැඩ හෝ ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනාගනී.

### 2.18.2 ප්‍රාග්ධන වැය සඳහා බාහිර ප්‍රදානවලින් දරන දායකත්වය

ප්‍රාග්ධන වැය සඳහා බාහිර ප්‍රදානවලින් දරන දායකත්වය යන්නට උත්පාදිත අරමුදල් සහ විවිධ ව්‍යාපෘති අරමුදල්වලින් සිදු කරන ලද දේපළ, පිරියත සහ උපකරණ මිලදීගැනීම් දැක්වේ.

### 2.18.3 ප්‍රාග්ධන ප්‍රදාන

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති නොමැතිවීම හේතුකොටගෙන මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 20 අනුව ඉදිරිපත්කොට ඇත. ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල විලම්භිත ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර වත්කමේ  ප්‍රයෝජනවත් ආයු කාලය පුරාවට ක්‍රමක්ෂය කර ඇත.

### 2.18.4 අභ්‍යන්තර වශයෙන් සීමා කරන ලද ශුද්ධ වත්කම්

නිශ්චිත කාර්යයක් සඳහා වෙන් කරන ලද අරමුදල් අභ්‍යන්තර වශයෙන් සීමා කරන ලද ශුද්ධ වත්කම්වලට ඇතුලත් වේ. වර්ෂය අවසානයේදී වැය නොකරන ලද ශුද්ධ ශේෂයක් සහිත පීඨ / සංවර්ධන අරමුදල් පීඨ සංවර්ධන අරමුදල් නියෝජනය වේ.

### 2.4.5 පරිත්‍යාග අරමුදල්

පරිත්‍යාගවලින් උත්පාදිත විශ්වවිද්‍යාලයේ ආයෝජන ප්‍රතිලාභ හා ලද පරිත්‍යාගන් පරිත්‍යාග අරමුදල්වලට ඇතුලත් වන අතර ඒවා පරිත්‍යාගශීලීන් විසින් ස්ථාපිත විවිධ අරමුණු වලට අනුකූලව භාවිත කරනු ලැබේ.

## 2.19 සේවක ප්‍රතිලාභ

**නිශ්චිත දායක සැලසුම්**

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල (UPF) දායක මුදල්, සේවක භාරකාර අරමුදල (ETF) විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල, අදාළ තත්වයන්ට සහ රෙගුලාසි වලට අනුකූල වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සේවක සේවිකාවන්ගේ ජීවන වියදම් දීමනා සඳහා අමතර දායක මුදල් ගෙවනු ලබන අතර තවදුරටත් මුදල් ගෙවීමට හා නීතිමය හෝ වගකිව යුතු බැදීමක් නොමැත.

**නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම වන්නේ අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම් වලට අමතරව පශ්චාත් සේවක සැලසුම් ය. 1983 අංක 12 දරණ පාරිතෝෂික මුදල් ගෙවීම් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පාරිතෝෂිකය ගෙවනු ලැබේ.

## 2.20 බැරකම් සහ ප්‍රතිපාදන

**ජංගම බැරකම්**

ජංගම බැරකම් ඒවායේ පොත් අගයට දක්වනු ලැබේ.

**ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් විශ්වවිද්‍යාලය සතුව වර්තමාන බැඳීමක් (නෛතික සහ ව්‍යුහාත්මක) පවතින විට ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර එම බැඳීම නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත්වල අවශ්‍ය විය හැකි අතර බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කළ හැකිය.

### 2.20.1 ප්‍රතිලාභ බැඳීම් නිර්වචනය කරන්න

1983 අංක 12 හි පාරිතෝෂික පනතට අනුකූලව, සේවකයින්ට අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණයේ විෂය පථයට අයත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැඳීම් සේවක ප්‍රතිලාභ SLPSA 19 යටතේ පෙන්නුම් කෙරේ. ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය

(PUC) භාවිතා කරමින් සුදුසුකම් ලත් පනතක් මඟින් ගණනය කිරීම වාර්ෂිකව සිදු කෙරේ. මූල්‍යමය කාර්යසාධන ප්‍රකාශයේ දී ක්‍රියාකාරී ලාභ සහ අලාභයන්ගෙන් සමන්විත අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් නැවත ගණනය කිරීම හඳුනා ගැනේ. වර්ෂය තුළ සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් සඳහා (වර්තමාන සේවා පිරිවැය) ලාභය හෝ අලාභය සහ පොලී වියදම් සමඟ අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම්වල වැඩිවීම විශ්ව විද්‍යාලය හඳුනා ගනී.

ගිණුම්කරණ ඇස්තමේන්තුව
ක්‍රියාකාරී තක්සේරුවට ඇතුළත් වන්නේ වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම සහ මරණ අනුපාතිකයන් පිළිබඳ උපකල්පන සිදු කිරීම ය.

### 2.20.2. <u>අවිනිශ්චිත වගකීම් සහ අවිනිශ්චිත වත්කම්</u>

අවිනිශ්චිත වගකීමක් යනු වැඩසටහනේ පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ අඛණ්ඩව පැවතීම හෝ සිදුවිය නොහැකි වීම නිසා හඳුනා නොගත් වර්තමාන වගකීමක් වන අතීත සිදුවීම් වලින් පැනනැඟිය හැකි වගකීමකි. වගකීම පියවීම සඳහා සම්පත් ගලා ඒමක් අවශ්‍ය වනු ඇත.
අවිනිශ්චිත වත්කමක් යනු විශ්වවිද්‍යාල පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම මගින් තහවුරු වන අතීත සිදුවීම් වලින් ඇතිවිය හැකි වත්කමකි. විශ්ව විද්‍යාලය අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා අතර ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇත.

## 2.21 ආදායම් හඳුනාගැනීම

### 2.21.1 <u>ගාස්තු අය කරන පාඨමාලාවලින් ලැබෙන ආදායම</u>

ගාස්තු අය කරන පාඨමාලා සහ වෙනත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම උපචිත පදනම මත පාඨමාලා හා උපාධි කාලය තුළ හඳුනා ගැනේ.

### 2.21.2 <u>මූල්‍ය ආදායම</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත නොමැතිවීම හේතුකොටගෙන පොළී ආදායම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 39 ට අනුව ඵලදායී පොළී අනුපාත ක්‍රමවේදය භාවිත කර උපචිත පදනම මත හඳුනා ගනී.

### 2.21.3 <u>පිරිවැය හඳුනා ගැනීම</u>

විශ්වවිද්‍යාලයේ සියලුම කටයුතු සඳහා දරනු ලබන වියදම උපචිත පදනම මත හඳුනාගනු ලබන අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ දැක්වේ.

## 2.22 <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශනය</u>

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත 2 ට අනුකූලව වක්‍ර ක්‍රමයට පිළියෙළ කර ඇති අතර එමගින් මෙහෙයුම් කටයුතුවල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම්, මූල්‍ය කටයුතු සහ ආයෝජන කටයුතු හඳුනාගෙන ඇත. අගයේ සැලකියයුතු තරම් නොවන වෙනස්වීමකට භාජනය වන සහ මුදල් වලට වහා පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන මුදල් සහ මුදල් සමාන දෑ තුළ ඇතුළත් වේ.

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(I) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

23 OCT 2019
VICE - CHANCELLOR'S OFFICE
NUGEGODA.

මගේ අංකය / எனது இல. / My No. HED/D/USJ/FA/18/4

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019 ඔක්තෝබර් 10 දින

RECEIVED
24 OCT 2019
OFFICE OF THE REGISTRAR USJP

උපකුලපති

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යෝජිත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා

සහකාර විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1.1 මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ස්වයං මූල්‍ය පාලන වැඩසටහන්වල ආදායම සහ වියදම සමාන විය යුතු නමුත් අධ්‍යයනාංශ තුනක එකතුව රු. 1,801,162 ක් වූ ආදායමට වැඩි වියදම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | මෙම වියදම් පාඨමාලා ගාස්තු අයකිරීමට පෙර සිදුවූ බැවින් අදාල ගිණුම් වල හර ශේෂයක් පෙන්වීමට හේතුවිය. තිරසර සංවර්ධන අරමුදල් ගිණුම් සෑම අධ්‍යයන අංශ දෙපාර්තමේන්තුවකටම අදාලව පවතින අතර 2013 වර්ෂයේදී ජ´නල් සටහනක් මඟින් අදාල ගිණුම් වල බැර ශේෂයන් පොදු සංචිතයට මාරු කර ඇත. ඒ හේතුවෙන් අදාල ගිණුම්වල හර ශේෂයක් පෙන්නුම් කරනු ලබයි. | ස්වයං මූල්‍ය පාඨමාලා ආදායමට සරිලන ලෙස වියදම් දැරිය යුතු අතර ආදායමට වැඩි වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වෙන රජයේ ප්‍රදාන සහ වෙනත් ආදායම්වලින් පියවීම නොකල යුතුය. |
| (ආ) ඉකුත් වර්ෂයට අදාළ ත්‍යාග අරමුදල් 8 ක් සඳහා ලැබුණු රු. 216,821 ක් වූ පොලී ආදායම පෙර වර්ෂයේ ආදායමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2017 වසරේදී ඉතිරිකිරීම් ගිණුම් වලට අදාල රු. 216,821 වූ පොලී මුදල 2017 වසරේ අවසාන ගිණුම් වලට ඇතුලත් නොවී තිබුණු අතර එය 2018 වසරේදී ගිණුම් ගත කර ඇත. | වර්ෂයට අදාළ ආදායම් කාලානුරූපව ගැලපීමට කටයුතු කළ යුතුය. |

Page 3

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45.2 (XV) ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 290,214,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | මුදල් අතිරික්තයක් ඇති බව හඳුනාගත් අවසථාවේදී එම මුදල් ඉහළ පොලී ප්‍රතිශතයක් ලබාදෙන රාජ්‍ය බැංකුවක ආයෝජනය කරනු ඇත. අනුමැතිය ලබා ගැනීමට වැඩිපුර කාලයක් ගත වන බැවින් රු. මිලියන 290,214,000 සඳහා ආවරණ අනුමැතිය ලබාදී ඇත. | විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බැඳුම්කර අයකර ගැනීමේදී නිවැරදි ලෙස තක්සේරු නොකිරීම නිසා නිලධාරීන් 7 දෙනෙකුගෙන් රු. 400,737 ක් වැඩිපුර අයකර ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැඳුම්කර ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වැඩියෙන් ලැබුණු බැඳුම්කර වටිනාකම් වලින් නිලධාරීන් දෙදෙනෙකුගේ අගයන් 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. ඉතිරි නිලධාරීන් පස්දෙනාගේ වටිනාකම්ද 2019 වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | සියළුම බැඳුම්කර ශේෂයන් සමාලෝචනය කර ඒවා අයකර ගැනීමේ කටයුතු විධිමත් කළ යුතු අතර ක්‍රමානුකූලව සටහන් පවත්වා ගැනීමද කළ යුතුය. |
| (ආ) වර්ෂයකට වැඩි කාලයක් පැරණි එකතුව රු. 1,109,500 ක් වූ ටෙන්ඩර් තැන්පතු නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | 2014, 2015 සහ 2016 වර්ෂ වලට ආදාලව පැවති නැවත ලබා නොගත් ටෙන්ඩර් තැන්පතු 2018 වර්ෂයේ අදායමට ගලපා ඇති අතර වර්ෂයකට වැඩි කාලයක් පැරණි නැවත ලබා නොගත් ටෙන්ඩර් තැන්පතු මෙම වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) අවුරුදු 5 කට වඩා පැරණි රු. 519,200 ක් වූ පුස්තකාල තැන්පතු විශ්වවිද්‍යාලයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල පුස්තකාල තැන්පතු ආපසු ගෙවිය යුතු තැන්පතු වන අතර මේවා බොහෝදුරට පාඨමාලා නිමකොට නැති සිසුන්ට අදාලව ලැබී ඇත. පාඨමාලා නිමකිරීමෙන් පසු අදාල තැන්පතු ආපසු ගෙවනු ලැබේ. | පාඨමාලා නිම කළ සිසුන්ගේ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1985 අංක 07 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත 44 (1) (V) වගන්තිය | විශ්වවිද්‍යාලයේ පාලක සභාව සඳහා සාමාජිකයන් 21 දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කර තිබුණි. එසේ වුවද එම වගන්තිය ප්‍රකාරව පරිපාලන ක්ෂේත්‍රය නියෝජනය කරමින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නියෝජිතයකු සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් පත්කිරීමට හැකියාව තිබුණද ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ බාහිර සාමාජිකයන් පත්කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකළ යුතුය. | විශ්වවිද්‍යාලය සඳහා භාණ්ඩාගාර ප්‍රදාන ලැබෙන බැවින් භාණ්ඩාගාර නියෝජිතයෙකු සහභාගී කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය | | | |
| (i) 3.7. සහ 3.8 ඡේද | සේවකයන්ගෙන් ණය වාරික අඛණ්ඩව සහ මාසිකව අයකර ගත යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 2,431,720/- ක් වූ ණය ශේෂ පැවති නිලධාරීන් 22 දෙනෙකුගෙන් එසේ මාසිකව සහ අඛණ්ඩව ණය වාරික අයකර ගෙන නොතිබුණි. | නිලධාරීන්ගෙන් 8 දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරු වී යාම නිසා ණය පවරා ගැනීමද සේවයෙන් ඉවත් වීම මත සේවකයින් 2 දෙනෙකුගෙන් අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී පියවීමටද කටයුතු කර ඇත. ඉහත සඳහන් කල හේතු මත ණය මුදල් වාරික වශයෙන් නොව මුළු ණය මුදලම පියවීම සිදු කර ඇත. ඉතිරි සේවකයින් දෙදෙනාගෙන් එක අයෙකු සේවයෙන් ඉවත් වීම මත අදාල මුදල අර්ථසාධක අරමුදලින් අය කිරීමට කටයුතු කර ඇත. අනෙක් සේවකයන්ගෙන් ණය මුදල අයවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව මාසිකව හා අඛණ්ඩව ණය වාරික අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) 3.18 ඡේදය | නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 384,870 ක් වූ ආපදා ණය ශේෂ අයකර ගැනීමට හෝ අයකර ගැනීමේ සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු නොකර වැටුප් රහිත නිවාඩු ලබාදී තිබුණි. | වර්තමානයේ වැටුප් රහිත නිවාඩු ලබා දීමට පෙර අදාළ ණය මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති අතර වැටුප් අංක 3805 දරණ නිළධාරියාගේ ණය මුදල් 2019.05.29 දින විශ්වවිද්‍යාලයට ලැබී ඇත. | වැටුප් රහිත නිවාඩු ලබාදීමේදී අයවිය යුතු ණය මුදල් අයකර ගැනීමේ විධිමත් පාලන ක්‍රම ඇතිකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වැටුප් අංක 8061, 7729 හා 6682 දරණ කථිකාචාර්යවරුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම සඳහා මාස 03 ක වැටුප අයකර ගැනීමට කැමැත්ත ලබා නොදීම මත ප්‍රමාද වී ඇතිබැව් දන්වමි. | |
| (ඈ)ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------<br>මුදල් රෙගුලාසි 757 (2) (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ පැවති වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තාව මේ වන විට ලබා දී ඇත. | මුදල් රෙගුලාසි අනුව නියමිත කාලය තුළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය<br>----------- | | | |
| (i) 20වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙය විශ්වවිද්‍යාල පද්ධතියටම බලපාන කරුණක් වන බැවින් මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතුය. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ii) XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය | මුදල් වර්ෂය අවසාන දිනට ආයතනයට අයත් සියලුම භාණ්ඩ සහ ස්ථාවර වත්කම්, අදාළ කාර්යය සඳහා පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් විසින් හරි වැරදි බැලිය යුතු වුවත්, 2015 වර්ෂයෙන් පසුව විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් ඉතා විශාල සංඛ්‍යාවක් පවතින බැවින් වාර්ෂිකව සමීක්ෂණයක් සිදු කිරීම අපහසු වේ. වසර 5 කට වතාවක් සමීක්ෂණය සඳහා උපදෙස් ලබා දී ඇත. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ)2002 නොවැම්බර් 28 දිනැති අංක එච්ඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන්, චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | පවතින ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇත. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 06.05.1 ඡේදය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද 2016 සහ 2017 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටද කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය වෙත භාරදී ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (උ)2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරුන් 07 දෙනා විසින් වෙන්කර තිබුණු වාහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී මාසයකට හිමි ඉන්ධන ලීටර් 140 ඉක්මවා රු. 757,719 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 6,272 ක් භාවිතා කර තිබුණි. කළමනාකරණ පීඨයේ හා ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිවරුන් සිය අනුමත ඉන්ධන සීමාව ඉක්මවා පිළිවෙලින් රු. 344,598 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 2,624 ක් ද, රු. 173,556 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 1,282 ක් ද භාවිතා කර තිබුණි. | අවශ්‍යතාවය මත පාලක සභාව විසින් අතිරේක ඉන්ධන චක්‍රලේඛ ප්‍රකාරව අනුමත කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ වැටුප් වාර්තා කරන පරිගණක මෘදුකාංග පද්ධතියෙහි පැවති අඩුපාඩු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයෙහි එම පරිගණක පද්ධතියේ නිවැරදිතාවය පෞද්ගලික විගණිත ආයතනයක් විසින් පරීක්ෂා කිරීමේදී යෙදුම් පාලන අවදානම් 26 ක් සහ තොරතුරු තාක්ෂණ පාලන අවදානම් 25 ක් හඳුනාගෙන තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ගෙවන ලද එකතුව රු. 2,989,043,825 ක් වූ සේවක පාරිශ්‍රමික වටිනාකමෙහි නිවැරදිතාව පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | බාහිර විගණිත ආයතනය විසින් විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා විගණන කමිටුවේ නිර්දේශ මත මෙම විගණනය සිදු කළ අතර එම හඳුනාගත් අඩුපාඩු නැවත වරක් විශ්ව විද්‍යාලයේ කළමනාකරණය සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. එම නිර්දේශයන් අනුව අභ්‍යන්තර පාලන පද්ධතිය නිවැරදි කල අතර ගෙවූ වැටුප් ගණනය නිවැරදි බව තහවුරු කරමි. වැටුප් පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම පරීක්ෂා කිරීම, සහ ගෙවීමට පෙර අනුමැතිය සිදු කර වැටුප ගෙවා ඇත. | පවතින අඩුපාඩු හඳුනාගෙන එම අඩුපාඩු නිවැරදි කිරීම හෝ නව පරිගණක පද්ධතියක් හඳුන්වා දීම හෝ සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 159,969,855 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 224,091,778 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 64,121,923 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වියදම් රු. 1,008,282,778 කින් වැඩි වී තිබුණද ඊට සාපේක්ෂව රජයේ පුනරාවර්තන ප්‍රදාන රු. 815,768,897 කින්ද, අභ්‍යන්තර ආදායම රු. 106,875,328 කින් සහ ක්‍රමක්ෂය රු. 153,094,571 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- විශ්වවිද්‍යාලයේ සමස්ථ ආදායමෙන් සියයට 77 කට වැඩි ප්‍රමාණයක් රජයේ ප්‍රදානවලින් සමන්විත වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන සියයට 25 කින් වැඩිවී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදමද ඇතුළුව සේවක පාරිශ්‍රමික රු. මිලියන 3,031.23 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 22.47 කින් වැඩි වී තිබුණි. රු. මිලියන 3,977.93 ක් වූ සමස්ත රජයේ පුනරාවර්ථන ප්‍රතිපාදනවලින් රු. මිලියන 3,031.23 ක් එනම් සියයට 76.2 ක් සේවක පාරිශ්‍රමික සඳහා වැය කර තිබුණු අතර විශ්වවිද්‍යාලයේ අනෙකුත් සියලුම වියදම් සඳහා රු. මිලියන 946.7 ක් හෙවත් සමස්ත රජයේ පුනරාවර්ථන ප්‍රතිපාදනවලින් සියයට 23.8 ක් පමණක් යෙදවී තිබුණි.

- ඉකුත් වර්ෂයේ රු. මිලියන 35.9 ක් වූ විශ්වවිද්‍යාලයේ නඩත්තු වියදම සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 74.4 ක් දක්වා සියයට 107 කින් වැඩි වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

**ලාභදායී අනුපාතය**

සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 159,969,855 ක්ද, මුළු ආදායම රු. 5,649,251,082 ක්ද, වූයෙන් ලාභදායී අනුපාතය සියයට ( 2.83) ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය සියයට - 5.23 ක් ලෙස පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පීඨ 5 කට අදාළව සිසුන් 54 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එවා ඇති ලේඛනයට අනුව සිසුන් බඳවාගෙන ඇත. | නොපැමිණෙන සිසුන් වෙනුවට ඉන් පහළ සිටින සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට බැඳුම්කර කඩවීම හේතුවෙන් කථිකාචාර්යවරුන් 42 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 119,464,310 ක ශේෂයක් විය. එම අයවිය යුතු බැඳුම්කර ශේෂයෙන් රු. 52,706,308 ක් අවුරුදු 10 ට අඩු වූ අතර අවුරුදු 10 ට වඩා වැඩි ශේෂය රු. 6,785,622 ක් විය. බැඳුම්කර කඩ කළ වර්ෂය පවා හඳුනාගත නොහැකි වූ ශේෂය රු. 4,972,380 ක් විය. | 2018.12.31 දිනට අයවිය යුතු බැඳුම්කර වටිනාකම වන රු.119,063,568 ක් වූ ශේෂයෙන් 2019.05.31 දිනට රු.4,825,279.52 ක් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත. අඛණ්ඩව බැඳුම්කර අයකර ගැනීමේ සිදු කරන අතර මෙම අයවීම් ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම ලෙස අයකර ගැනීමට අවශ්‍යතාවය පිළිබඳ යෝජනාවලියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. | සියළු බැඳුම්කර ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. එමෙන්ම මෙවැනි බැඳුම්කර කඩවීම් ඉදිරියේදී ඇති නොවීමට ගිවිසුම්වල කොන්දේසි ශක්තිමත් කිරීම කෙරෙහි කළමනාකරණය අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) වෙනත් විශ්වවිද්‍යාලවලින් සප්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණෙන නිලධාරීන් සේවයේ යොදවා ගැනීමේදී ඔවුන්ගේ පාරිශ්‍රමිකවලින් උපයන විට ගෙවීම් බදු අඩුකිරීමේ දී නියමිත බදු වක්‍රය උපයෝගී කර නොගැනීම හේතුවෙන් නිලධාරීන් 3 දෙනෙකුගේ පාරිශ්‍රමිකවලින් රු. 318,850 ක් අඩුවෙන් බදු අයකර ගෙන තිබුණි. | අඩුවෙන් අයකරගෙන ඇති උපයනවිට බදු මුදල් අදාල නිලධාරීන්ට ආපසු ගෙවන ලෙස දැනුම් දී ඇත. | සප්ත වාර්ෂික නිවාඩු නිමවීමට පෙර දැනට සිටින නිලධාරීන්ගෙන් අදාළ බදු අයකර ගත යුතු අතර වෙනත් විශ්වවිද්‍යාලවල නිලධාරීන් පිළිබඳ තොරතුරු අදාළ විශ්වවිද්‍යාලවලට දැනුම් දීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම්වල මුළු එකතුව රු. 11,170,465,273 ක් වුවද එය තහවුරු කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් මෘදුකාංගයේ එදිනට පවතින ශේෂවල එකතුවක් ලබා ගැනීමට පහසුකම් නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුවද එදිනට පැවති වත්කම් වටිනාකම සඳහා මෘදුකාංගය තුළ සංශෝධනයන් සිදු කිරීමට පහසුකම් ඇති බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂයේදී භෞතික පරීක්ෂාවන් සිදුකර ස්ථාවර වත්කම් තොග යාවත්කාලීන කරමින් පවතී. | ස්ථාවර වත්කම් ලේඛනය භෞතික සත්‍යාපේක්ෂණ වාර්තා සමඟ සැසඳිය හැකි ආකාරයට පරිගණක මෘදුකාංගය වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භය දක්වා වූ වර්ෂ 6 ක කාලසීමාව තුළ ඇස්තමේන්තු පිරිවැය රු. 420,458,710 ක් වූ විවිධ පර්යේෂණ 317 ක් වෙනුවෙන් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් සඳහා ලබාදී තිබුණි. ඉන් පර්යේෂණ යෝජනා 27 ක් අතහැර දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉහත සඳහන් පර්යේෂණවලින් සියයට 59 ක් එනම් පර්යේෂණ 187 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකර පර්යේෂණ අතහැර දමා ඇති කථිකාචාර්යවරුන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. පර්යේෂණ කමිටුව මඟින් මෙය නියාමනය කිරීමට කටයුතු කර ඇත. | පර්යේෂණ කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායී කර ගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කරමින් නව පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. |
| (ඇ) වෛද්‍ය පීඨයේ මහාචාර්යවරියකට පිළිවෙලින් 2012, 2013, 2014 සහ 2016 වර්ෂවල එකතුව රු.4,313,800 ක් වූ පර්යේෂණ ප්‍රදාන 04 ක් අනුමත කර තිබුණු අතර එක් පර්යේෂණයක් නිම කිරීමට පෙර තවත් පර්යේෂණ ප්‍රදානයක් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් එක් පර්යේෂණයක් හෝ නිම කර නොතිබූ අතර මහාචාර්යවරිය විසින් 2012 පර්යේෂණ ප්‍රදානවලින් රු. 800,850 ක්ද, 2013 පර්යේෂණ ප්‍රදානවලින් රු. 1,575,000 ක්ද, අත්තිකාරම් වශයෙන් ලබා ගෙන තිබුණි. එහිදී සාවද්‍ය ප්‍රගති වාර්තා සහ සාවද්‍ය බිල්පත් ඉදිරිපත් කිරීම්ද නිරීක්ෂණය විය. | අවසන් වාර්තාව ඉතා ඉක්මනින් පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූලව පර්යේෂණ සඳහා මුදල් වැය කළයුතු අතර පර්යේෂණ සම්බන්ධ පසුවිපරම් කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මුදල් ලැබීම් ඉක්මවා චෙක්පත් නිකුත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා දෛනිකව රු. 15,706,750 ක සිට රු. 163,374,592 ක් දක්වා මුදල් පොතේ හිඟ ශේෂ උද්ගතව තිබුණි. | සමාලෝචිත වර්ෂය තුල ජනවාරි සිට දෙසැම්බර් දක්වා දෛනික රු.15,706,750 සිට රු.163,374,592 ක් දක්වා මුදල් පොතේ හිඟ ශේෂයක් පෙන්නුම් කරනු ලැබුවද චෙක්පත් නිකුත් කිරීමේදී සැමවිටම බැංකු ශේෂයට සෘණ බලපෑමක් ඇති නොවන පරිදි නිකුත් කිරීම සිදුවේ. එසේම භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන තුරු චෙක්පත් පිළියෙළ කර තබාගනු ලැබේ. | මුදල් පොතේ සෘණ ශේෂ ඇති නොවන පරිදි ලැබීම්වලට සාපේක්ෂව ගෙවීම් සිදු කළ යුතුය. |

**3.3** වත්කම් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජුනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු 2019 සැප්තැම්බර් 30 දක්වාම සිදුකර නොතිබුණි. | කඩිනමින් පවරා ගැනීමට අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු කර ඇත. | පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

**3.4** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් කාර්යසාධන බැඳුම්කරයෙන් අයකරගෙන නොතිබුණු අතර එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | මේ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇත. | කාර්යසාධන බැඳුම්කරයේ කාලය ඉකුත්වීමට පෙර අයවිය යුතු මුදල් අයකර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එසේම මෙම මුදල් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3.5 වෙනත් සංවිධානවලට මුදාහැරි සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 වර්ෂයෙහි රු. මිලියන 61.5 ක් වැය කර මිලදී ගෙන තිබුණු කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයට නොගැලපෙන හෙයින් කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත පවරා දී තිබු නමුත් මෙම පැවරීම ගිණුම්ගත කර නොතිබුණු අතර, විශ්වවිද්‍යාලය භාවිතා නොකරන වත්කමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබුණි. | 2017.03.07 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණය පරිදි උසස් අධ්‍යාපන ලේකම්ගෙන් මෙම ඉඩම හා ගොඩනැගිල්ල නැවත පවරා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා ඇතත් සෞන්දර්ය විශ්වවිද්‍යාලය විසින් අප විශ්වවිද්‍යාලයට ලබාදීමට කටයුතු කර නොමැත. | නියමිත පරිදි පවරා ගැනීම හෝ පවරා දීම නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) රජයේ හෝ රජයේ අනුබද්ධිත ආයතනවල සේවය සඳහා වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත 2009 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යංශයට මුදාහැර තිබුණු කථිකාචාර්යවරියකට ගෙවන ලද වැටුප් තුළ ඇතුළත් රු. 1,437,882 ක අධ්‍යයන දීමනා අදාළ ආයතනය වෙතින් ප්‍රතිපූරණය කළ නොහැකි බව දන්වා තිබුණි. එබැවින් එම මුදල් අදාළ කථිකාචාර්යවරියගෙන් අය කළ යුතු වුවත්, ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් විසින් 2019.04.26 දින දීමනා සම්බන්ධව කරන ලද විමසීමට 2019.06.21 දින පිළිතුරු ලිපි යවා ඇත. ඒ අනුව මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. | අයකර ගැනීම් කඩිනමින් කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 2,506 ක් වූ අතර එයින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 249 ක්ද, පරිපාලන කාර්ය මණ්ඩලයේ තනතුරක්ද, අනෙකුත් විධායක කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක්ද, වෛද්‍ය තනතුරු 03 ක් ද, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ තනතුරු 32 ක්ද පුරප්පාඩුව පැවතුණි. තවද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 152 ක් පුරප්පාඩුව පැවතුණි. | ඉංජිනේරු සහ තාක්ෂණ පීඨයන් අළුතින් ආරම්භ කළ පීඨ බැවින් ඒවායේ තනතුරු සඳහා බඳවා ගනිමින් පවතී. එම පුරප්පාඩු ද මෙහි ඇතුළත්ය. නව පීඨ සඳහා තනතුරු ඇතුලත් කරනු ලැබුවද බඳවා ගැනීමේ පටිපාටිය 2018 වර්ෂයතුල ලැබී නොතිබුණි. ඇතැම් විශේෂිත විෂයන් සඳහා සුදුසුකම් සහිත ආචාර්යවරුන්ගේ අයදුම්පත් නොලැබෙන බැවින් බඳවා ගැනීම් ප්‍රමාද වී ඇත. පරිපාලන නිලධාරීන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

876 චක්‍රලේඛය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශය විසින් පුහුණු නිලධාරී තනතුරු (කාර්මික නිලධාරී වැනි) සඳහා ලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 102 වගන්තියට පටහැනිව මූල්‍ය වගකීම් ඇති වීමෙන් පසුව එම වටිනාකම්වලට සමානුපාතිකව අයවැය ඇස්තමේන්තුව පිළියෙල කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 10 කදී වරින්වර අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන චක්‍රලේඛ මත වැඩිවූ වැටුප් ගෙවීම් සිදුකිරීමට හා විශ්වවිද්‍යාලයේ පසුව හඳුනා ගත් අනන්‍යතාවය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අමතර ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව මුල් අයවැය ලේඛනය වරින් වර සංශෝදනය කර ඇත. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම, මහා භාණ්ඩාගාරය සහ විශ්වවිද්‍යාලයේ පාලනාධිකාරිය එක්ව සාකච්ඡා මගින් ලබා ගන්නා එකඟතාවයන්ට අනුව වර්ෂය ආරම්භ වීමට පෙර අයවැය ලේඛනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලයේ 2017 වර්ෂයේ හිඟ බිල්පත් ගෙවීම සඳහා අවශ්‍ය රු. 730,000,000 ක මුදල් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ඇස්තමේන්තුව තුළ හඳුනාගෙන නොතිබුණි. | 2018 වර්ෂයේ ඇස්තමේන්තුව පිළියෙළ කිරීමේදී 2018 වසරට අදාල වියදම් පමණක් පදනම් කොට ඇති අතර රු.730,000,000 ක් 2017 වසරේදී ගෙවීමට තිබූ බිල්පත් පියවීම සඳහා ලැබූ මුදල් වන අතර ප්‍රධාන වශයෙන්ම මෙහි ඇතුලත්ව් තිබුණේ ඉංජිනේරු පීඨයේ ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු අත්තිකාරම් මුදල්ය. මේ සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුනේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වන අතර අදාල වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම නිසා 2018 වසරේදී ප්‍රතිපාදන ලබාදී ඇත. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම, මහා භාණ්ඩාගාරය සහ විශ්වවිද්‍යාලයේ පාලනාධිකාරිය එක්ව සාකච්ඡා මගින් ලබා ගන්නා එකඟතාවයන්ට අනුව වර්ෂය ආරම්භ වීමට පෙර අයවැය ලේඛනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල දර්ශකයන් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී ඉටු කරනු ලැබේ. | අදාළ දර්ශකයන් හඳුනා ගැනීම කඩිනම් කළ යුතුය. |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අනුකූලව ගන්නාලද ක්‍රියාමාර්ග

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

| | |
|---|---|
| **1.2 මතය සඳහා පදනම**<br>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.<br><br>(අ) විශ්වවිද්‍යාලයේ වැටුප් වාර්තා කරන පරිගණක මෘදුකාංග පද්ධතියෙහි පැවති අඩුපාඩු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයෙහි එම පරිගණක පද්ධතියේ නිවැරදිතාවය පෞද්ගලික විගණිත ආයතනයක් විසින් පරීක්ෂා කිරීමේදී යෙදුම් පාලන අවදානම් 26 ක් සහ තොරතුරු තාක්ෂණ පාලන අවදානම් 25 ක් හඳුනාගෙන තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ගෙවන ලද එකතුව රු. 2,989,043,825 ක් වූ සේවක පාරිශ්‍රමික වට්ටෝරුවෙහි නිවැරදිතාව පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | බාහිර විගණිත ආයතනය විසින් විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා විගණන කමිටුවේ නිර්දේශ මත මෙම විගණනය සිදු කළ අතර එම හඳුනාගත් අඩුපාඩු නැවත වරක් විශ්ව විද්‍යාලයේ කළමනාකරණය සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. ප්‍රධාන වශයෙන්ම එම නිර්දේශයන් පරිගණක මෘදුකාංගයන්හි අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම සහ කාර්ය බෙදීම සම්බන්ධ වන අතර එහිදී වැටුප් ප්‍රමාණයන් හඳුනාගැනීමත්, ඒ පිලිබඳ විගණනයක් නොවූ අතර වට්ටෝරුවෙහි සාවද්‍යතාවක් වාර්තා කර නොමැත. එම නිර්දේශයන් අනුව අභ්‍යන්තර පාලන පද්ධතිය නිවැරදි කල අතර ගෙවූ වැටුප් ගණනය නිවැරදි බව තහවුරු කරමි.<br>වැටුප් පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම පරීක්ෂා කිරීම, සහ ගෙවීමට පෙර අනුමතය සිදු කර වැටුප ගෙවා ඇත. සෑම මසකම |

| | |
|---|---|
| (ආ) ත්‍යාග අරමුදල්වලට අදාළ ඉතිරි කිරීම් ගිණුම් 7 ක එකතුව රු. 3,635,784 ක් වූ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මුදල් හා මුදල් සමාන දෑ යටතේ හඳුනා නොගෙන ආයෝජන යටතේ හඳුනාගෙන තිබුණි. | පරිගණක පද්ධතියට ඇතුලත් කරන නව යෙදවුම් සම්පූර්ණයෙන්ම පරික්ෂා කරනු ලබන අතර සෑම අංශයන්ම නියෝජනය වන පරිදි නියැදි පරීක්ෂාවක් සිදු කරනු ලබයි. කෙසේ වෙතත් ගිණුම් පද්ධතිය, වැටුප් වැටුප් සකස් කිරීම, වත්කම් ලේඛන සඳහා පරිගණක පද්ධතිය මිලදී ගැනීමට පාලක සභාවේ අනුමැතිය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ඇති අතර එම මිලදී ගැනීමේ කටයුතු වර්තමානයේදී සිදුවෙමින් පවතී.<br><br>ත්‍යාග අරමුදල් ගිණුම් මගින් ලැබෙන පොලී අදායම මගින් අදාල ලබා දෙන අතර එම අරමුදලේ ඇති ප්‍රග්ධනිත මුදල් ලබා ගැනීම සිදු කල නොහැක. එම නිසා එහි තැන්පත් මුදල ආයෝජනයක් වන අතර ද්‍රවශිලතාවයෙන් අඩු වත්කමක් වන බැවින් මුදල් හා මුදල් සමාන යටතේ ගිණුම් ගත කල නොහැක. |
| <u>**නීතිරීති / විධානයට යොමුව**</u><br><br><u>**නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව**</u> <u>**විස්තරය**</u> | |

| | | |
|---|---|---|
| (අ) 1985 අංක 07 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 (1) (V) වගන්තිය | විශ්වවිද්‍යාලයේ පාලක සභාව සඳහා සාමාජිකයන් 21 දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කර තිබුණි. එසේ වුවද එම වගන්තිය ප්‍රකාරව පරිපාලන ක්ෂේත්‍රය නියෝජනය කරමින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නියෝජිතයකු සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් පත්කිරීමට හැකියාව තිබුණද ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. | 1978 අංක 16 දරණ විශ්වවදයාල පනත යටතේ බාහිර සාමාජිකයන් පත්කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකළ යුතුය. |
| (ආ) <u>**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය**</u> | | |
| **(i)** 3.7. සහ 3.8 ඡේද | සේවකයන්ගෙන් ණය වාරික අඛණ්ඩව සහ මාසිකව අයකර ගත යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට | 2017.12.31 දිනට පැවති ශේෂයන්ගෙන් 20 දෙනෙකුගේ ශේෂය 2018 වර්ෂය තුලදී පියවී ඇත. එම සේවක ණය ලබාගත් |

| | | |
|---|---|---|
| | එකතුව රු. 2,431,720/- ක් වූ ණය ශේෂ පැවති නිලධාරීන් 22 දෙනෙකුගෙන් එසේ මාසිකව සහ අඛණ්ඩව ණය වාරික අයකර ගෙන නොතිබුණි. | නිලධාරීන්ගෙන් 8 දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරු වී යාම නිසා ණය පවරා ගැනීම්ද සේවයෙන් ඉවත් වීම මත අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී සේවකයින් 5 දෙනෙකුගෙන්ද, අර්ථසාධක ණය මුදල් ලබාගැනීමේදී සේවකයින් 7 දෙනෙකු ආපදා ණය මුදලින් පියවීමටද කටයුතු කර ඇත. ඉහත සඳහන් කල හේතු මත ණය මුදල් වාරික වශයෙන් නොව මුළු ණය මුදලම පියවීම් සිදු කර ඇත.<br>ඉතිරි සේවකයින් දෙදෙනාගෙන් එක අයෙකු සේවයෙන් ඉවත් වීම මත අදාල මුදල අර්ථසාධක අරමුදලින් අය කිරීමට කටයුතු කර ඇත. අනෙක් සේවකයන්ගෙන් ණය මුදල අයවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ii) 3.18. ඡේදය | ණය මුදල් අයකර ගැනීමට හෝ අයකර ගැනීමේ සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු නොකර ආපදා ණය ලබාගෙන තිබුණු නිලධාරීන් 04 දෙනෙකුට වැටුප් රහිත නිවාඩු ලබා දී තිබුණි. | වර්තමානයේ වැටුප් රහිත නිවාඩු ලබා දීමට ප්‍රථම ණය මුදල් පියවීමට කටයුතු කරමින් පවතී. විගණන වාර්තාවේ ඇති ණය මුදලින් එක් පුද්ගලයකුගේ මුදල් දැනටමත් ලැබී ඇති අතර අනෙකුත් සේවකයින්ගේ ණය මුදල් අර්ථසාධක නිදහස් කිරීමේදී අය කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| (ඇ) **<u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය</u>** | | |
| 20 වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙය විශ්වවිද්‍යාල පද්ධතියටම බලපාන කරුණක් වන බැවින් මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතුය. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක එච්ඒඅයි/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන්, චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | පවතින ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර ඇත. |
| (ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 06.05.1 ඡේදය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත | අමාත්‍යාංශය වෙත භාරදී ඇත. |

| | | |
|---|---|---|
| | ඉදිරිපත් කර නොතිබුණි. තවද 2016 සහ 2017 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටද කටයුතු කර නොතිබුණි. | |
| (ඊ) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 සහ 2001 පෙබරවාරි 09 දිනැති 13/2008 (iv) යන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය සහ 2017 ඔක්තෝබර් 10 දිනැති සා.පා/01/2017 දරන අභ්‍යන්තර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරුන් 07 දෙනා වෙනුවෙන් වෙන්කර තිබුණු වාහන සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 2,512,528 ක් වටිනා ඉන්ධන ලීටර් 18,032 ක් සපයා තිබුණු අතර මාසකට ඉන්ධන ලීටර් 140 ක් බැගින් ඉන්ධන ලීටර් 11,760 ක් හිමි ඔවුන් විසින් එම ප්‍රමාණය ඉක්මවා රු. 757,719 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 6,276 ක් භාවිතා කර තිබුණි. සිය අනුමත ඉන්ධන සීමාව ඉක්මවා කළමනාකරණ පීඨයේ | අවශ්‍යතාවය මත පාලක සභාව විසින් අතිරේක ඉන්ධන චක්‍රලේඛ ප්‍රකාරව අනුමත කර ඇත. |

| | | |
|---|---|---|
| | පීඨාධිපතිවරයා රු. 344,598 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 2,624 ක් භාවිතා කිරීමත්, ඉංජිනේරු පීයයේ පීඨාධිපතිවරයා රු. 173,556 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 1,282 ක් භාවිතා කිරීමත් මෙම වියදම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණු අතර සාපේක්ෂව වැඩිදුරක් ගමන් කරන අය සඳහා අඩු ඉන්ධන දහනයක් සහිත වාහන වෙන් කර නොදීමත්, නිසි පාලනයකින් තොරව අතිරේඛ ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීමත් හේතුවෙන් මෙසේ අතිරේඛ ඉන්ධන වියදම වැඩිවී තිබුණු බව නිරීක්ෂණය විය. | |

| | |
|---|---|
| **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**<br>• **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.** | |
| **3. <u>වෙනත් නිරීක්ෂණ</u>**<br>(අ) 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පීඨ 6 කට අභ්‍යන්තර සිසුන් 3,528 ක් බඳවා ගෙන තිබුණු අතර ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා බඳවා ගැනීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව 785 ක් වන අතර ඒ සඳහා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 744 ක් වීමෙන් පුරප්පාඩු 41 පැවති අතර කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සඳහා සිසුන් 7 ක් ද, තාක්ෂණ විද්‍යා පීඨය සඳහා සිසුන් 04 ක් ද, භෙද විෂය ධාරාව සඳහා එක් සිසුවෙන්ද, ඖෂධවේදී විෂය ධාරාව සඳහා එක් සිසුවෙක්ද බඳවා ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එවා ඇති ලේඛනයට අනුව සිසුන් බඳවාගෙන ඇත. |

| | | |
|---|---|---|
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 2,506 ක් වූ අතර එයින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 249 ක්ද, පරිපාලන කාර්ය මණ්ඩලයේ තනතුරු 01 ක්ද, අනෙකුත් විධායක කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක්ද, වෛද්‍ය තනතුරු 03 ක් ද, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ තනතුරු 32 ක්ද පුරප්පාඩුව පැවතුණි. | ඉංජිනේරු සහ තාක්ෂණ පීඨයන් අළුතින් ආරම්භ කළ පීඨ බැවින් ඒවායේ තනතුරු සඳහා බඳවා ගනිමින් පවතී. එම පුරප්පාඩු ද මෙහි ඇතුළත්ය. නව පීඨ සඳහා තනතුරු ඇතුලත් කරනු ලැබුවද බඳවා ගැනීමේ පටිපාටිය 2018 වර්ෂයතුල ලැබී නොතිබුණි. ඇතැම් විශේෂිත විෂයන් සඳහා සුදුසුකම් සහිත ආචාර්යාවරුන්ගේ අයදුම්පත් නොලැබෙන බැවින් බඳවා ගැනීම් ප්‍රමාද වී ඇත.<br>පරිපාලන නිලධාරීන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ. |
| (ඇ) | අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 1,172 ක් විය. ඉන් 1,006 ක් ස්ථිර පදනමින් ද, 14 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින්ද බඳවා ගෙන තිබුණු අතර තනතුරු 152 ක් පුරප්පාඩුව පැවතුණි. | 876 චක්‍රලේඛය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශය විසින් පුහුණු නිලධාරී තනතුරු (කාර්මික නිලධාරී වැනි) සඳහා ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජුනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂය සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන | කඩිනමින් පවරා ගැනීමට අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කර කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු 2019 ජුනි 30 දක්වාම සිදුකර නොතිබුණි. | |
| (ඉ) | 2014 වර්ෂයෙහි රු. මිලියන 61.5 ක් වැය කර මිලදී ගෙන තිබුණු කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයට නොගැලපෙන හෙයින් කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත පවරා දී තිබූ නමුත් මෙම පැවරීම ගිණුම්ගත කර නොතිබුණු අතර, විශ්වවිද්‍යාලය භාවිතා නොකරන වත්කමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබුණි. | 2017.03.07 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණය පරිදි උසස් අධ්‍යාපන ලේකම්ගෙන් මෙම ඉඩම හා ගොඩනැගිල්ල නැවත පවරා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා ඇතත් සෞන්දර්ය විශ්වවිද්‍යාලය විසින් අප විශ්වවිද්‍යාලයට ලබාදීමට කටයුතු කර නොමැත. |
| (ඊ) | රජයේ හෝ රජයේ අනුබද්ධිත ආයතනවල සේවය සඳහා වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත 2009 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යාංශයට මුදාහැර තිබුණු කථිකාචාර්යවරියකට ගෙවන ලද වැටුප් තුළ ඇතුළත් රු. 1,437,882 ක අධ්‍යයන දීමනා අදාළ ආයතනය වෙතින් ප්‍රතිපූරණය කළ නොහැකි බව දන්වා තිබූ බැවින්, එම මුදල් අදාළ කථිකාචාර්යවරියගෙන් අය කළ යුතු වුවත්, ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි. | 2017.03.07 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය පරිදි මෙම දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිතව දන්වා ඇති අතර සිහි කැඳවීම් ද යවා ඇති නමුත් ප්‍රතිචාරයන් ලැබී නොමැත. ලියා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.<br><br>මේ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇත. |

| | |
|---|---|
| (උ) රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් කාර්යසාධන බැඳුම්කරයෙන් අයකරගෙන නොතිබුණු අතර එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.<br><br>(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම්වල මුළු එකතුව රු. 11,170,465,273 ක් වුවද එය තහවුරු කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් මෘදුකාංගයේ එදිනට පවතින ශේෂවල එකතුවක් ලබා ගැනීමට පහසුකම් නොතිබුණි. තවද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් කිරීමෙන් පසුවද මෘදුකාංගයේ ස්ථාවර වත්කම් අයිතමවල සංශෝධනයන් සිදු කරන බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂයේදී භෞතික පරීක්ෂාවන් සිදුකර තොග යාවත්කාලීන කරමින් පවතී. |

| | |
|---|---|
| (ඵ) සමාලෝචිත වර්ෂය අවසානයට බැඳුම්කර කඩ කරන ලද කථිකාචාර්යවරුන්ගෙන් ලැබිය යුතු රු. 119,464,310 ක් වූ අයවිය යුතු බැඳුම්කර ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | ගිණුම් අනුව ශේෂ නිවැරදි වන අතර අධ්‍යයන ආයතන අංශයේ උපලේඛනය නිවැරදි කිරීමට කටයුතු සිදු කර ඇත. |
| (i) බැඳුම්කර කඩ කළ වර්ෂ අනුව සලකා බැලීමේදී සමාලෝචිත වර්ෂයේ අවසානයට කථිකාචාර්යවරුන් 42 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 119,464,310 ක් වූ ශේෂයෙන් රු.52,706,308 ක් එනම් සියයට 44 ක් අවුරුදු 5 ට අඩු බැඳුම්කර ශේෂ වන අතර රු. 55,516,711 ක් හෙවත් සියයට 47 ක් ම අවුරුදු 10 කට වඩා පැරණි බව නිරීක්ෂණය විය. එකතුව රු. 6,268,911 ක් හෙවත් මුළු ශේෂයෙන් සියයට 5 ක් වර්ෂ 20 කටත් වඩා පැරණි ශේෂයන් බවත් රු. 5,073,694 ක් එනම් සියයට 4 ක් සම්බන්ධයෙන් අදාළ බැඳුම්කරය කඩ කළ වර්ෂය පවා හඳුනාගෙන නොතිබුණු බවත් වැඩි දුරටත් නිරීක්ෂණය විය. | 2018.12.31 දිනට අයවිය යුතු බැඳුම්කර වටිනාකම වන රු.119,063,568 ක් වූ ශේෂයෙන් 2019.05.31 දිනට රු.4,825,279.52 ක් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත. අඛණ්ඩව බැඳුම්කර අයකර ගැනීම් සිදු කරන අතර මෙම අයවීම් ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම ලෙස අයකර ගැනීමට |

| | |
|---|---|
| (ii) ඉකුත් වර්ෂයේ අවසානයට පැවති අයවිය යුතු බැඳුම්කර රු. 132,974,791 ක් වූ ශේෂයෙන් අවුරුදු 5 ට අඩු බැඳුම්කරවලින් සියයට 80.52 ක් හෙවත් රු. 52,706,308 ක්ද, අවුරුදු 5 ට වැඩි හා අවුරුදු 10 ට අඩු ලැබිය යුතු බැඳුම්කරවලින් සියයට 98.55 ක් හෙවත් රු. 32,036,025 ක්ද, අවුරුදු 20 ට වැඩි බැඳුම්කරවලින් සියයට 95.44 ක් හෙවත් රු. 6,268,911 ක්ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය වී නොතිබුණි. එසේම අවුරුදු 20 ට අඩු එකතුව රු. 23,379,372 ක් වූ බැඳුම්කරවලින් සහ කඩකළ වර්ෂ සොයා ගත නොහැකි එකතුව රු. 5,073,694 ක් වූ බැඳුම්කරවලින් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | අවශ්‍යතාවය පිළිබඳ යෝජනාවලියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර ඇත.<br><br>මුදල් අතිරික්තයක් ඇති බව හඳුනාගත් අවසථාවේදී එම මුදල් ඉහළ පොලී ප්‍රතිශතයක් ලබාදෙන රාජ්‍ය බැංකුවක ආයෝජනය කරනු ඇත.<br>ආයෝජනය කළ රු. මිලියන 290,214,000 සඳහා ආවරණ අනුමැතිය ලබාදී ඇත. ආයෝජනයට අනුමැතිය ලබාගෙන ආයෝජනය කිරීමේදී වැඩිපුර කාලයක් ගත වන බැවින් මෙම ක්‍රමවේදය අනුගමනය කර ඇත. |
| (ඒ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තියෙහි (ආ) ප්‍රකාරව විශ්වවිද්‍යාලවල මුදල් ආයෝජනය කිරීමේ දී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය සහිත අනුමැතියක් උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගෙන් ලබා ගැනීම සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45.2 (XV) ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා | මෙම නඩුවේ පැමිණිල්ලේ සාක්ෂි අවසන් වී ඇත. විත්ති පාර්ශවය වෙනුවෙන් සාක්ෂි විමසීම ආරම්භ කර ඇත. නැවත නඩු දිනය 30/07/2019. |

| | | |
|---|---|---|
| | ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 290,214,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | මෙම නඩුව කම්කරු විනිශ්චය සභාවේ නියෝගය සනාත කර ඇත. |
| (ඔ) | විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ඔහු එම තනතුරෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට එරෙහිව දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | නඩුවේ නියෝගය 2019.08.09. |
| (ඕ) | කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සේවය කළ නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයකුගේ දෙවන වර සේවා දිගුව විශ්වවිද්‍යාලය විසින් ලබා නොදීම සම්බන්ධයෙන් ඔහු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව මහාධිකරණයේ නඩු පවරා තිබුණි. | බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් අයවිය යුතු රු. 5,103,826 ක් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් හිටපු කථිකාචාර්යවරයකුට එරෙහිව දිසා අධිකරණයේ නඩු පවරන ලදී. එම නඩුවේ ඇපකරුවන් ගල්කිස්ස සිවිල් මහාධිකරණයේ නඩු පවරා ඇත. නැවත නඩු දිනය 2019.09.10. |
| (ක) | විධිමත් විනය පරීක්ෂණයකින් සේවය අවසන් කළ ලිපිකරු III ශ්‍රේණියේ නිලධාරියකු නැවත සේවයේ පිහිටුවීමට කම්කරු විනිශ්චය සභාව ලබා දුන් නඩු තීන්දුවට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් මහාධිකරණයේ අභියාචනයක් ගොනු කර තිබුණි. | නඩු විභාගය ආරම්භ කර ඇත 2019.09.23 |

| | |
|---|---|
| (ච) බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් අයවිය යුතු රු. 5,103,826 ක් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් හිටපු කථිකාචාර්යවරයකුට එරෙහිව අභියාචනාධිකරණයේ නඩු පවරා තිබුණි. | 2019.09.20 නැවත කැඳවීමට නියමිතය. |
| (ට) බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් අයවිය යුතු රු. 10,762,632 ක් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ආධුනික කථිකාචාර්යවරයකුට එරෙහිව දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි. | පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකර පර්යේෂණ අතහැර දමා ඇති කථිකාචාර්යවරුන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. පර්යේෂණ කමිටුව මඟින් මෙය නියාමනය කිරීමට කටයුතු කර ඇත. |
| (ත) විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි දෙකක් අලුත්වැඩියා කිරීමේ කටයුතු අතහැර ගොස් තිබුණු කොන්ත්‍රාත්කරුවකුගෙන් රු. 1,785,240 ක් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය දිසා අධිකරණයේ නඩු දෙකක් ගොනු කර තිබුණි. | අවසන් වාර්තාව ඉතා ඉක්මනින් පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ප) සමාලෝචිත වර්ෂයේ ආරම්භය දක්වා වූ වර්ෂ 6 ක කාලසීමාව තුළ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් සඳහා ඇස්තමේන්තු පිරිවැය රු. | |

| | | |
|---|---|---|
| | 420,458,710 ක් වූ විවිධ පර්යේෂණ 317 ක් වෙනුවෙන් පර්යේෂණ හා ප්‍රකාශන කම්ටුවේ අනුමැතිය ලබාදී තිබුණි. ඉන් පර්යේෂණ යෝජනා 27 ක් අතහැර දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉහත සඳහන් පර්යේෂණවලින් සියයට 32.5 ක් එනම් පර්යේෂණ 103 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | |
| (ග) | වෛද්‍ය පීඨයේ මනෝවිද්‍යා මහාචාර්යවරියකට පිළිවෙලින් 2012, 2013, 2014 සහ 2016 වර්ෂවල පර්යේෂණ ප්‍රදාන 04 ක් අනුමත කර තිබුණු අතර එක් පර්යේෂණයක් නිම කිරීමට පෙර තවත් පර්යේෂණ ප්‍රදානයක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. 2012 වර්ෂයේ සිට එකතුව රු.4,313,800 ක් වූ ඉහත සඳහන් පර්යේෂණ ප්‍රදාන ලබාදී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් එක් පර්යේෂණයක් හෝ නිම කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, අදාළ මහාචාර්යවරිය විසින් 2012 පර්යේෂණ ප්‍රදානවලින් රු. 800,850 ක්ද, 2013 පර්යේෂණ ප්‍රදානවලින් රු. 1,575,000 ක්ද, අත්තිකාරම් වශයෙන් ලබා ගෙන තිබුණු අතර සාවද්‍ය ප්‍රගති වාර්තා සහ සාවද්‍ය බිල්පත් ඉදිරිපත් කිරීම්ද නිරීක්ෂණය විය. | අදාල දර්ශකයන් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී ඉටු කරනු ලැබේ. |
| (ජ) | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ජයවර්ධනපුර | |

| | | |
|---|---|---|
| | විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | |

# තිරසාර සංවර්ධනය පිළිබඳ අනාගත අපේක්ෂිත වාර්තාව

# ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

# 2018

# තිරසාර සංවර්ධනය පිළිබඳ අනාගත අපේක්ෂාවන් 2018

**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය**

## අපගේ දැක්ම

අධ්‍යාපනයෙන් ජීවිත සෞභාග්‍යමත් කිරීම

## අපගේ මෙහෙවර

අපගේ අධ්‍යාපන සම්ප්‍රදාය තුලින් තිරසාර අනාගතයක් උදෙසා සංස්කෘතික උරුමයෙන් හා ප්‍රඥාවෙන් ප්‍රබෝධමත් වූ ගෝලීය ප්‍රවීණත්වයෙන් යුතු පුරවැසියන් බිහි කිරීම

තිරසාර අනාගතයක් සඳහා ඉදිරි දශකය තුළ අපගේ උපායමාර්ගික අධ්‍යාපන ප්‍රවේශය පදනම් වී ඇත්තේ අපගේ අද්විතීය 4-H ආකෘතිය මත වන අතර එමඟින් අවස්ථාව සැකසෙනුයේ ● විචාරශීලිව සිතීමට ● සදාචාරාත්මකව දැනීමට ● තරඟකාරී ලෙස ක්‍රියා කිරීමට ● නිරෝගීව සිටීමට සහ ● මිනිසුන් ● ග්‍රහලෝකය ● සෞභාග්‍යය පිළිබඳ ගැඹුරු ලෙස සිතා බැලීමට 3 - P මොඩියුලය




තිරසාර අනාගතයක් සඳහා අධ්‍යාපනය

3 - P මොඩියුලය - ● මිනිසුන් ● ග්‍රහලෝකය සහ ● සෞභාග්‍යය:

තිරසාර අනාගතයක් උදෙසා ඉදිරි දශකය තුළ අපගේ අධ්‍යාපන ප්‍රවේශය

තිරසාරභාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව විශ්වීය වශයෙන් එකඟ වූ අර්ථකතනයක් ඇත. එය කුමක්ද සහ එය සාක්ෂාත් කරගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව විවිධ අදහස් ඇත. තිරසාරභාවය පිළිබඳ අදහස පැන නගිනුයේ තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පයෙන් වන අතර 1992 දී රියෝ නුවර පැවති ලොව ප්‍රථම පෘථිවි සමුළුවේදී එය පොදු මාතෘකාවක් බවට පත් විය. පරිසරය හා සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසමේ බ්‍රන්ට්ලන්ඩ් වාර්තාවේ (1992) දක්වා ඇති පරිදි තිරසාර සංවර්ධනය යනු අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාවට හානියක් නොවන අයුරින් වර්තමාන අවශ්‍යතා සපුරාලන සංවර්ධනය "යන්නයි. "අපේ

ලෝකය පරිවර්තනය කිරීම: 2030 එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය" මගින් 2015 වර්ෂයේදී හඳුන්වා දුන් තිරසාර සංවර්ධන අරමුණු 17 අනුව ක්‍රියාත්මක වීමට අප එකඟවී තිබේ. මෙම න්‍යාය පත්‍රය. මිනිසුන්, අපගේ ග්‍රහලෝකය සහ සෞභාග්‍යය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මකි (6 රූපසටහන ).

1) මිනිසුන් - සමාජ ගැටළු (සියළු ජනතාවගේ යහපැවැත්ම වැඩි දියුණු කිරීම)
2) ග්‍රහලෝකය - පාරිසරික ගැටළු (පාරිසරික පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රකෘතිමත් කිරීම)
3) සෞභාග්‍යය – ආර්ථික ගැටළු (ආර්ථික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම)




**3-Ps – (**මිනිසුන්, ග්‍රහලෝකය සහ සෞභාග්‍යය)

තිරසාර විශ්ව විද්‍යාලයකට පරිවර්තනය වීම

තිරසාර හෝ හරිත විශ්ව විද්‍යාලයකට ඵලදායි ලෙස පරිවර්තනය වීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය පහත සඳහන් ප්‍රධාන කරුණු පහ අත්‍යවශ්‍ය යැයි සලකනු ලැබේ ; ඉහළ කළමනාකාරිත්වයේ කැපවීම, අධ්‍යාපනික යෙදවුම්, විශ්ව විද්‍යාල පර්යේෂණ ප්‍රයත්නයන්, දේශීය ප්‍රජාවගේ ආධාර සහ මධ්‍යම සම්බන්ධීකරණ මධ්‍යස්ථානය




ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය තිරසාර විශ්ව විද්‍යාලයක් බවට පත් වීමට

**1.** ඉහළ කළමනාකාරිත්වයේ කැපවීම– පරිපාලනමය බලපෑම

තිරසාරභාවය සඳහා විශ්ව විද්‍යාලයේ ඉහළ කළමනාකාරිත්වයේ කැපවීම ආරම්භයේදී සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. ඔවුන් ගන්නා ප්‍රධාන තීරණ අතරට නව ගොඩනැගිලි සැලසුම්, ප්‍රතිසංස්කරණ හා නවීකරණ ව්‍යාපෘති, ගොඩනැගිලි මෙහෙයුම් සහ නඩත්තු, බලශක්ති කළමනාකරණ ප්‍රසම්පාදන පිළිවෙත්, භූමි අලංකරණය, විවිධ මට්ටම්වල ප්‍රතිචක්‍රීකරණය, අපද්‍රව්‍ය කළමනාකරණය, ප්‍රවාහනය, ආහාර සේවා සහ භෝජන මෙහෙයුම් සහ නේවාසිකාගාර මෙහෙයුම් ආදිය ඇතුළත් වේ.

## 2. අධ්‍යාපනික යෙදවුම් - අධ්‍යාපන පීඨයේ සහ සිසුන්ගේ කාර්යභාරය (අධ්‍යයන දෙපාර්තමේන්තු)

අධ්‍යාපනික පැතිකඩ ද වැදගත් වන අතර එය වෙනස් ආකාරවලින් විය හැකිය. අනාගත තිරසාරභාවය සඳහා මෙය ආයෝජනයකි. විෂයමාලා හා විෂය බාහිර ක්‍රියාකාරකම් වල නිරතවීම් ඔස්සේ තිරසාරභාවය පිළිබඳ අධ්‍යාපනය ඔස්සේ සිසුන්ට එම විෂයයන් වලට අදාළව දිගු කාලීන ප්‍රතිලාභ සහ යම් යම් කෙටි කාලීන ප්‍රතිලාභද ලබා දෙනු ඇත. අවසානයේදී ප්‍රජාවේ නායකයින් බවට පත්වීමට ඔවුනට හැකියාව ලැබෙන අතර ඒ ඔස්සේ තිරසාරභාවය පිළිබඳ දැනුම ඔවුනට ප්‍රායෝගිකව භාවිතා කිරීමට හැකිවනු ඇත. සිසුන්ට අවශ්‍ය විෂයමාලා ඉගෙන ගැනීමට විවිධ ඉගැන්වීම් ක්‍රම මගින් ඉඩ සැලසීම තුළින් සැබෑ ලෝකයේ ගැටළු වලට ඔවුන් ඉගෙනගත් දෑ වලින් විසඳුම් ලබා ගැනීමට හැකි වේ. මෙම ඉගෙනුම් ආකෘතිය විශ්ව විද්‍යාල පරිසරයට ඉතා හොඳින් ගැලපෙන අතර එය දේශීය අවශ්‍යතා සහ යෙදුම් සමඟ දැනුම ඒකරාශී කර ගැනීමේ මාර්ගයකි. ස්වභාවය අනුව මෙය ක්ෂණික ප්‍රතිලාභයක් ලබා දෙන්නක් විය හැකිය. එසේම, තිරසාර සංවර්ධනය, වැඩමුළු සහ පුහුණුව මෙන්ම දුරස්ථ හෝ විද්‍යුත් ඉගෙනුම් ක්‍රම ආශ්‍රිත පාඨමාලා සංවර්ධනය කිරීම සමඟ තවදුරටත් අධ්‍යාපන අවස්ථා විහිදී පවතී. එක්සත් ජාතීන්ගේ සංවිධානය (http://www.un.org/sustainabledevelopment/takeaction/) තිරසාර සංවර්ධනය සඳහා බලපෑමක් ඇති කිරීම සඳහා කළ හැකි බොහෝ දේවලින් කිහිපයක් පමණක් ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, අපගේ එදිනෙදා ජීවිතයට අනුව අපට අනුගමනය කළ හැකි ඉතා පහසු දේවල් කිහිපයක් තිබේ. , සැවොම එක්ව ක්‍රියාකළ හැකි නම්, විශාල වෙනසක් සිදු කළ හැකිය . අපගේ ප්‍රයත්නයන් තුළ, සුවිශේෂී වශයෙන් සලකා බලනුයේ ;

- **අපගේ පුටුවේ වාඩිවී සිට අපට කළ හැකි දේවල්**
- **අපගේ නිවසේ සිට අපට කළ හැකි දේවල්**
- **අපගේ නිවසෙන් පිටත සිට අපට කළ හැකි දේවල්**

## 3. පර්යේෂණ ප්‍රයත්නයන්

විශ්ව විද්‍යාලයේ පර්යේෂණ කවුන්සිලය එහි කෙටි කාලීන හා දිගු කාලීන බලපෑම් සම්බන්ධයෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. පාරිසරික වාසස්ථාන සහ අනෙකුත් පාරිසරික ගැටළු, සමාජ ගැටළු සහ ආර්ථික ගැටළු පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති දැනටමත් ක්‍රියාත්මක කර තිබේ. මෙහිදී මහා පරිමාණ කොම්පෝස්ට් සංචිත ඇති කිරීම් , නිෂ්පාදන ක්‍රම, විකල්ප බලශක්ති ප්‍රභවයන් සහ ගොඩනැගිලි සැලසුම්, ඉදිකිරීම්, මෙහෙයුම් සහ නඩත්තු පිළිවෙත් ආදිය පර්යේෂණ සඳහා වූ විෂය ක්ෂේත්‍රවලට ඇතුළත්ව තිබේ.

## 4. දේශීය ප්‍රජාවගේ ආධාර

විවිධ මට්ටමේ සම්පත් ලබා දෙමින් සහ සහභාගී වීම තුළින් විශ්ව විද්‍යාලීය දේශිය ප්‍රජාවටද තිරසාර ප්‍රයත්නයන් වලට සහයෝගය ලබාදිය හැක. මේ සඳහා ආදි සිසුන්, ව්‍යාපාරික ප්‍රජාව, උපයෝගිතා සැපයුම්කරුවන්, වෙළෙන්දන්, වෙනත් සේවා සපයන්නන්, ප්‍රජා සංවිධාන සහ වෘත්තිකයන්ගේ සංගම් වල සහාය ලබා ගත හැක.

## 5. මධ්‍යම සම්බන්ධීකරණ මධ්‍යස්ථානය

තිරසාරභාවය සඳහා වන මධ්‍යස්ථානය හරහා සමස්ත තිරසාර ප්‍රයත්නයන් කේන්ද්‍රීයව සංවිධානය කළ යුතුය. මෙම මධ්‍යස්ථානය හරහා සියළුම සැලසුම්වල ආරම්භය , ව්‍යාපෘති, ජාලකරණය සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම් වලට අදාළව වැඩසටහනේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම ආදිය සිදු වේ. අනාගත වැඩසටහන් සඳහා සැලසුම් සකස් කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීම සහ ගැටළු හා සංකල්ප අවබෝධ කර ගැනීම වැඩසටහන් ආරම්භයේ දී අත්‍යවශ්‍ය වේ. මෙහිදී සෑම අධ්‍යයන පීඨයක්, දෙපාර්තමේන්තුවක්, මධ්‍යස්ථානයක් සහ ඒකකයක් සතුවම සැලකිය යුතු කාර්යභාරයක් පවතී.

### 4-H ප්‍රතිඥාව :

විශ්ව විද්‍යාලයට සෑම දෙනාගේම කැපවීම අවශ්‍ය බැවින්, 4- H ප්‍රතිඥාව සිදු කරනු ලැබේ.

“මම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රැඳී සිටින කාලය තුළ සහ ඉන්පසුව පවා පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් වන බවට ප්‍රතිඥා දෙමි ”;

“මම, මගේ විශ්ව විද්‍යාලය, මගේ සමාජය, මගේ රට සහ මගේ ලෝකය වෙනුවෙන්

මගේ **හිස** විචාරශීලිව සිතීමට,

මගේ **හදවත** සදාචාරාත්මකව දැනීමට,

මගේ **දෙඅත්** තරගකාරීව ක්‍රියා කිරීමට,

මගේ **සෞඛ්‍යය** නිරෝගීව ජීවත් වීමට”

### මූලික වටිනාකම්

හවුල් වටිනාකම් යනු වැඩ කටයුතු සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය ප්‍රජාව විසින් කරන ලද කැපවීම් ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය අපගේ වටිනාකම් වනුයේ:

- ❖ අධ්‍යයන විශිෂ්ටත්වය සහ කාර්ය සාධනය
- ❖ සර්වසම ආදර කරුණාව සහ අනුකම්පාව
- ❖ නිහතමානිබව සහ අඛණ්ඩතාව
- ❖ සමාජ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම
- ❖ බුද්ධිමය චින්තනයේ නිදහස සහ නිර්මාණශීලීත්වය
- ❖ වගවීම සහ සමාජ වගකීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය දැක්ම, මෙහෙවර සහ මූලික සාරධර්ම මානව ප්‍රාග්ධනයේ සංවර්ධනය තුළින් තිරසාරත්වයේ පුළුල් විෂය පථය සමඟ පැහැදිලිවම පෙළ ගැසී ඇත. මෙම අදාළත්වය ආයතනික සැලැස්ම 2017-2021 හි විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

අරමුණු

තිරසාරබවට සිය දායකත්වය ලබාදීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් සුවිසල් ප්‍රවේශයත් සහිත පුළුල් ඉලක්ක හතක් යටතේ අරමුණු සහ උපාය මාර්ග සකස් කර ඇත;

1. ඉගෙනුම සහ අධ්‍යාපනය: තිරසාරබව උදෙසා විචාරශීලිව සිතීමට, සදාචාරාත්මකව දැනීමට සහ තරඟකාරීව ක්‍රියා කිරීමට
2. පර්යේෂණ සහ සංවර්ධනය : පර්යේෂණ, ප්‍රකාශන, පොදු කටයුතු, නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදන
3. පුද්ගලයන්: අධ්‍යයන පීඨය සහ කාර්ය මණ්ඩලය
4. යටිතලපහසුකම් : සංවිධාන ව්‍යුහයන්, සම්පත් පරිපාලනය සහ සංවර්ධනය (ප්‍රතිරූප ගොඩනැංවීම සහ උසස් වීම් ද ඇතුළුව)
5. මූල්‍යකරණය
6. දීප්තිමත් ශිෂ්‍යයන්ගේ අත්දැකීම්: හොඳින් සිටීම
7. සජීවී ප්‍රජාව, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය / කලාපීය බලපෑම (ප්‍රතිඵල)

**උපාය මාර්ගික ඉලක්ක ආශ්‍රිත ප්‍රදේශ**

| ප්‍රදේශ | පොදු අරමුණු වල ක්ෂේත්‍ර |
|---|---|
| **1. ප්‍රධාන ලෙස අවධානය යොමු කිරීම** | 1. ඉගෙනුම සහ අධ්‍යාපනය: තිරසාරබව උදෙසා විචාරශීලිව සිතීමට, සදාචාරාත්මකව දැනීමට සහ තරඟකාරී ලෙස ක්‍රියා කිරීමට |
| | **2.** පර්යේෂණ සහ සංවර්ධනය : පර්යේෂණ, ප්‍රකාශන, පොදු කටයුතු, නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදන |
| **2. පහසුකම් සපයන්නන්** | **3.** පුද්ගලයන්: අධ්‍යයන පීඨ සහ කාර්ය මණ්ඩලය |
| | **4.** යටිතලපහසුකම් : සංවිධාන ව්‍යුහයන්, සම්පත් පරිපාලනය සහ සංවර්ධනය (ප්‍රතිරූප ගොඩනැංවීම සහ උසස් වීමද ඇතුළුව) |
| | **5. මූල්‍යකරණය** |
| **3. උපායමාර්ගික සම්බන්ධතා** | **6.** දීප්තිමත් ශිෂ්‍යයන්ගේ අත්දැකීම්: තෘප්තිමත් ලෙස ජීවත් වීම |
| | **7.** සජීවී ප්‍රජාව, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය / කලාපීය බලපෑම (ප්‍රතිඵල) |

## තිරසාර සංවර්ධන අරමුණු

පහත වගුවේ දැක්වෙන්නේ 2017 සිට 2021 දක්වා කාලය සඳහා ප්‍රකාශයට පත් කරන ලද සංයුක්ත සැලැස්මේ සඳහන් තිරසාර සංවර්ධන අරමුණු හතක් ළඟාකර ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ක්‍රියාමාර්ග සැලසුම් කර ඇති ආකාරයයි.

| තිරසාර සංවර්ධන අරමුණු | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය සංයුක්ත සැලැස්ම 2017 - 2021 මඟින් ආවරණය කිරීම | | | |
|---|---|---|---|---|
| | සටහන් | ඉලක්ක | අරමුණ (ණු) | උපාය මාර්ග |
| 1. දුප්පත්කම නැති කිරීම | මේවා දැක්ම , මෙහෙවර සහ වටිනාකම් මගින් පැහැදිලිව ආවරණය කරනු ලැබේ | ඉලක්ක 1 | 1.3<br>2.1 | 1.2.4<br>1.3.2<br>2.1.3<br>2.4.1 |
| 2. කුසගින්න නැති කිරීම | | ඉලක්ක l 1 | 1.3<br>2.1 | 1.2.4<br>1.3.2<br>2.1.3<br>2.4.1 |
| 3. නිරෝගී බව සෞඛ්‍යමත්ව සිටීම සහ යහපැවැත්ම | දැක්ම මගින් පිළිබිඹු වේ | ඉලක්ක 1 | 1.1<br>2.1<br>2.4<br>6.5 | 1.1.4<br>2.1.3<br>2.4.1<br>6.5.1<br>6.5.2 |
| 4. ගුණාත්මක අධ්‍යාපනය | දැක්ම , මෙහෙවර සහ වටිනාකම් මගින් පිළිබිඹු වේ | ඉලක්ක 1 සහ 2 | ඉලක්කය 01 හි සියළුම අරමුණු<br>2.2 | ඉලක්කය 01 හි සියළුම උපායමාර්ග<br>2.2.1 |
| 5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | වටිනාකම් සමඟ පෙළ ගැසී ඇත | ඉලක්ක 2 සහ 3 | 2.1<br>2.4<br>3.1 | 2.1.1<br>2.1.3<br>2.4.1<br>3.1.4 |
| 6. පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව | දැක්ම , මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 2 සහ 7 | 2.1<br>2.4<br>7.3 | 2.1.1<br>2.1.3<br>2.4.1<br>7.3.3<br>7.3.5 |
| 7. දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය | මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 2 සහ 7 | 2.1<br>2.4<br>7.3 | 2.1.1<br>2.1.3<br>2.4.1<br>7.3.3 |
| 8. සුනීත කාර්යයන් සහ ආර්ථික වර්ධනය | මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 1, 2 සහ 7 | 1.3<br>2.1<br>2.4<br>7.4 | 1.3.2<br>2.1.1<br>2.1.3<br>2.4.1<br>3.1.1<br>7.4.1 |
| 9. කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් | | ඉලක්ක 1, 2 සහ 7 | 2.3<br>2.4<br>2.6 | 2.3.3<br>2.3.4<br>2.4.1<br>2.4.2<br>2.4.3<br>2.6.1<br>2.6.2<br>2.6.3<br>2.6.5 |

| | | | | |
|---|---|---|---|---|
| 10. අසමාන තාවය අඩු කිරීම | වටිනාකම් | ඉලක්ක 1, 2 සහ 7 | 1.2<br>2.1<br>2.4<br>3.1<br>3.2<br>3.3<br>ඉලක්කය 07 හි සියළුම අරමුණු | 1.2.2<br>2.1.3<br>2.4.3<br>3.1.1<br>3.1.4<br>3.2.1<br>ඉලක්කය 07 හි සියළුම උපායමාර්ග |
| 11. තිරසාර නගර සහ ප්‍රජාවන් | දැක්ම , මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 1, 2, 6 සහ 7 | 2.1<br>2.4<br>6.3<br>7.3<br>7.5 | 2.1.3<br>2.4.1<br>6.3.1<br>7.3.1<br>7.3.2<br>7.3.3<br>7.5.2 |
| 12. වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය | ඉලක්ක 1,2 සහ 7 | ඉලක්ක 1, 2 සහ 7 | 1.8<br>2.1<br>2.2<br>2.4<br>3.2<br>3.3<br>4.1<br>4.2<br>5.1<br>5.2<br>5.4<br>7.3 | 1.8.1<br>1.8.2<br>2.1.3<br>2.2.1<br>2.2.2<br>2.2.3<br>3.2.1<br>3.3.1<br>ඉලක්කය 04 හි සියළුම උපායමාර්ග<br>5.1.2<br>5.1.3<br>5.2.1<br>5.4.1<br>7.3.3 |
| 13. දේශගුණික ක්‍රියාකාරිත්වය | වටිනාකම් | ඉලක්ක 1, 2 සහ 7 | 1.1<br>2.1<br>2.4<br>7.3 | 1.1.4<br>2.1.3<br>7.3.1<br>7.3.3 |
| 14. ජලය යට ජීවිත | දැක්ම | ඉලක්ක 1 සහ 2 | 1.1<br><br>2.1<br>2.4 | 1.1.4<br>2.1.3 |
| 15. ගොඩබිම ජීවිත | දැක්ම සහ මෙහෙවර | ඉලක්ක 1 සහ 2 | 1.1<br>2.1<br>2.4 | 1.1.1<br>2.1.3 |
| 16. සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන | දැක්ම , මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක 1 සහ 2 | 1.1<br>1.2<br>1.3<br>1.8<br>2.1<br>2.2<br>3.1<br>3.2<br>3.3<br>5.3<br>5.5 | 1.1.1<br>1.2.2<br>1.3.1<br>1.3.2<br>1.8.1<br>1.6.1<br>1.6.2<br>1.8.1<br>1.8.2<br>2.1.1<br>2.1.3<br>3.1.1<br>3.1.2<br>3.1.4 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 3.2.1<br>3.3.2<br>3.3.3<br>5.3.2<br>5.5.1<br>5.5.2 |
| 17. ඉලක්ක ලඟා කර ගැනීම සඳහා හවුල්කාරිත්වයන් | මෙහෙවර සහ වටිනාකම් | ඉලක්ක | 1.3<br>2.3<br>2.4<br>6.2<br>6.6 | 1.2.5<br>1.3.1<br>2.1.3<br>2.3.3<br>2.3.4<br>2.4.1<br>2.4.2<br>2.4.3<br>2.6.1<br>2.6.2<br>2.6.3<br>2.6.4<br>2.6.5<br>6.2.1<br>6.6.1 |

**උපාය මාර්ගික අරමුණු අංක 1 : ඉගෙනුම සහ අධ්‍යාපනය**

**පුරෝගාමී, නවෝත්පාදක අදහස් ඇති සහ ස්වාධීන පෞරුෂයකින් හෙබි දක්ෂ ගෝලීය පුරවැසියන් ලෙස වර්ධනය වීමට සිසුන් පෙළඹවීම**

මෙම අරමුණ මගින් සෑම තරාතිරමකම සිටින අපගේ සිසුන්ගේ පුළුල් බව, නොවෙනස් ගුණාත්මකභාවය සහ අධ්‍යාපනයේ අදාළත්වය අවධාරණය කෙරේ.

මෙම අරමුණ සමඟ සම්බන්ධ වනුයේ :

- දීප්තිමත් ශිෂ්‍යයන්ගේ අත්දැකීම්
- සමාජ වගකීම්
- ජාතික සංවර්ධනය
- ගෝලීය බලපෑම්

ප්‍රධාන අරමුණු :

පළමු අරමුණ ළඟාකර ගැනීම සඳහා අප විසින් :

1.1 අපගේ අද්විතීය අභ්‍යන්තර උපාධි, පශ්චාත් උපාධි සහ වෙනත් උපාධි පාඨමාලා තුළින් සිසුන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමටත් එය ඔවුන්ගේ සැබෑ ජීවිතයට අදාළ කර ගැනීමටත් පහසුකම් සැලසීම, මග පෙන්වීම සහ සහාය දීම.

1.2 විමසීම් සහ ක්‍රියාකාරී ඉගෙනුම් ප්‍රවේශයන් තුළින් ඉගෙන ගැනීමට එක් එක් ශිෂ්‍යයාගේ හැකියාව වර්ධනය කිරීම.

1.3 අපගේ සිසුන් ගෝලීය වශයෙන් තරඟකාරී කොට ශක්තිමත් කිරීම සඳහා උපාධිධාරී ගුණාංග සහ සේවා නියුක්තියේ නිපුණතා ඇතුළත් අපගේ විෂය මාලාව නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම

1.4 ව්‍යාප්ත වූ සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම සහ දිරිගැන්වීම මෙන්ම හිතකර සාමූහික ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.

1.5 සිසුන්ගේ පෞරුෂත්වය සහ මෘදු කුසලතා, එනම් සන්නිවේදන නිපුණතා, ව්‍යවසායකත්වය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා වර්ධනය කිරීම

1.6 කාලෝචිත හා සවිස්තරාත්මක ඇගයීම් ප්‍රතිපෝෂණ අත්දැකීම් කැටුව යන ඵලදායි ඉගෙනුම් ආරක්ෂණ පද්ධතියක් (effective assurance of learning) පවත්වා ගැනීම

1.7 අධ්‍යාපනයේ සෑම අංශයකම ගුණාත්මකභාවය සහතික කිරීම සහ ලෝක මට්ටමේ පිළිගැනීමක් ලබා ගැනීම

1.8 සදාචාරාත්මක හැසිරීම සහතික කිරීම සහ ගෝලීයව පිළිගත් හොඳම භාවිතයන් අනුගමනය කිරීම.

උපායමාර්ග :

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

1.1.1 විවිධ ප්‍රවේශ සහ පිටවීමේ ස්ථාන හඳුන්වා දීමෙන් අපගේ විෂය මාලාව නම්‍යශීලී කිරීම.

1.1.2 උපාධි පාඨමාලා වල කොටසක් වශයෙන් ක්ෂේත්‍ර වැඩ, ස්වේච්ඡා සේවය, වෘත්තිය හා ජාතික හෝ ජාත්‍යන්තර පුහුණුවීම් හා ඉගෙනුම් පාඨමාලා ඔස්සේ විදේශීය අවස්ථා ලබා ගැනීමට අපගේ සිසුන් පෙළඹවීම.

1.1.3 අපගේ පර්යේෂණ නිපුණතා සහ සොයාගැනීම් මත පදනම්ව පර්යේෂණ ප්‍රමුඛ ඉගැන්වීම් සහ ඉගෙන ගැනීම් දිරිමත් කිරීම.

1.1.4 විවිධ ක්ෂේත්‍ර ඒකාබද්ධ වූ සංයුක්ත පාඨමාලා සහ වැඩසටහන් හඳුන්වා දීම

1.2.2 අපගේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් පරාසය සහ ඊට අදාළ පහසුකම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම

1.2.4 සෑම සිසුවෙකුගේම අධ්‍යයන සැලැස්ම සහ අධ්‍යාපන ප්‍රගතිය වෙනුවෙන් මඟ පෙන්වීම සඳහා 'උපදෙස් උපදේශක'(Consulting Tutor) ප්‍රවේශය හඳුන්වා දීම, ඔවුන්ගේ ඉගෙනීමේ හා සංවර්ධනයේ හිමිකාරිත්වය ලබා ගැනීමට සහ ඔවුන්ගේ අනාගත වෘත්තීන් සැලසුම් කිරීමට සහාය වීම

1.2.5 පර්යේෂණ ක්‍රියාකාරකම් හා දැනුම හුවමාරු කර ගැනීම තුළින් අපේ සිසුන්ට ඉගෙනීමේ අවස්ථාව ලබා දීම

1.3.1 අපගේ උපාධි වැඩසටහන් වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලව ක්‍රියා කරන බව සහතික කිරීම සඳහා වෘත්තීය සංවිධාන, කර්මාන්ත, ආදි ශිෂ්‍යයින් සහ වෙනත් පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කිරීම

1.3.2 ආර්ථික හා සමාජීය වශයෙන් වටිනා ගුණාංග, විශේෂඥතාව සහ ප්‍රායෝගික දැනුම සහිත උපාධිධාරීන් බිහිකිරීම සඳහා විෂයමාලා සකස් කිරීම

1.6.1 දැනට පවතින ඇගයීම් ක්‍රමය වැඩිදියුණු කිරීම සහ වෙනස්කම් වලට භාජනය කිරීම

1.6.2 ඵලදායි සහ විනිවිදභාවයෙන් යුතු ඇගයීම් ක්‍රමවේදයන් භාවිතා වන බවට සහතික වීම

1.8.1 වෙනස් කළ හැකි හා නම්‍යශීලී පුද්ගලයන් සංවර්ධනය කිරීම සඳහා නිවැරදි ආකල්ප, සාරධර්ම, වෘත්තීයභාවය සහ ජීවිතය පිළිබඳ නිවැරදි දැක්ම අපගේ වැඩසටහන් වලට ඇතුළත් කිරීම

1.8.2 ඉගැන්වීම හා ඉගෙනීම සඳහා චර්යාධර්ම සංග්‍රහ සහ හොඳම භාවිතයන් හඳුන්වා දීම.

**උපාය මාර්ගික අරමුණු අංක 2: පර්යේෂණ සහ සංවර්ධනය: පර්යේෂණ, ප්‍රකාශන, මහජන සහභාගීත්වය, නිර්මාණශීලිත්වය සහ නවාකරණය**

**ශ්‍රී ලංකාව, ආසියාව සහ ගෝලීය ප්‍රජාවන්ගේ තිරසාර සංවර්ධනය සඳහා විවිධ විෂය ක්ෂේත්‍රයන්හි නව දැනුම හා මෙවලම් නිර්මාණය, ගවේෂණය සහ ව්‍යාප්තිය සඳහා ප්‍රාණවත් , සාර්ථක හා අන්තර්ක්‍රියාකාරී පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම.**

මෙම අරමුණ සවිමත් වනුයේ අපගේ පර්යේෂණයේ පෘථුලභාවය හා ගුණාත්මකභාවය ඒකරාශී කර ගනිමින් වන අතර එයට උපාධි හා පශ්චාත් උපාධි පර්යේෂණ යන දෙයංශයද ඇතුළත් වේ. ගැඹුරින් මුල් බැසගත් අපගේ දැනුම පර්යේෂණ මඟින් ඉස්මතු වන අතර කුසලතා අපගේ කාර්යයන්හි විශිෂ්ටත්වය දැක්වීමට උපකාරී වේ.

මෙම අරමුණ සමඟ සම්බන්ධ වනුයේ:

- ඉගෙනුම සහ අධ්‍යාපනය
- ගෝලීය බලපෑම
- සජීවී ප්‍රජාව

ප්‍රධාන අරමුණු :

දෙවන අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

2.1 සාම්ප්‍රදායික සීමාවන් ඉක්මවා නව හා නැගී එන පර්යේෂණ ක්ෂේත්‍ර ගවේෂණය කිරීමෙන් වඩා සාර්ථක පර්යේෂණ න්‍යාය පත්‍රයක් සකස් කිරීම

2.2 ගුණාත්මක පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා පර්යේෂකයන්ගේ පර්යේෂණ හැකියාවන් සහ නිපුණතාවන් වැඩි දියුණු කිරීම

2.3 පර්යේෂණ හා නවාකරණය ඔස්සේ ජනනය කර ගනු ලබන දැනුම ප්‍රකාශයට පත් කිරීම, ජනප්‍රිය කිරීම, වාණිජකරණය කිරීම සහ භාවිතයේ යෙදවීම

2.4 පර්යේෂණ සාර්ථකත්වය සහ ඒවායේ බලපෑම සෙසු පිරිස් අතර බෙදා හැරීම සහ ප්‍රසිද්ධියට පත් කිරීම

2.6 පර්යේෂණ කටයුතු සහ ඒ ආශ්‍රිත අරමුදල් සපයා ගැනීම සඳහා කර්මාන්ත, ජාතික සහ ජාත්‍යන්තර ආයතන සමඟ ඵලදායි ලෙස සහයෝගීතාවයක් පවත්වා ගෙන යාම

උපායමාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

2.1.1 ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අදාල පර්යේෂණ න්‍යාය පත්‍රයක් සකස් කිරීම සහ වැදගත් පර්යේෂණ ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛත්වය ලබාදීම

2.1.3 උග්‍රව පවතින දේශීය, කලාපීය හා ගෝලීය ගැටළු විසඳීම සඳහා නායකත්වය සැපයීම.

2.2.1 අපගේ පර්යේෂණ ශක්තීන්ගේ පෘථුලභාවය, ගුණාත්මකභාවය සහ හැකියාවටට අදාළ පූර්ණ ශක්‍යතාවය අවබෝධ කර ගැනීම

2.2.2. ජාතික හා ජාත්‍යන්තර පුහුණු අවස්ථා සහ සහයෝගීතාවයන් තුළින් අපගේ පර්යේෂණ නිපුණතා සංචිතය වැඩි දියුණු කිරීම.

2.2.3 උපකරණ සහ මෘදුකාංග ආදියේ කාර්යක්ෂම සහ තිරසාර භාවිතය සම්බන්ධයෙන් ජනතාව දිරි ගැන්වීම

2.3.3 කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ අදහස් වාණිජමය වශයෙන් යථාර්ථයක් බවට පත් කිරීම සඳහා සුදුසුම මාධ්‍යයන් ගවේෂණය කිරීම

2.3.4 අධ්‍යයන ක්ෂේත්‍රයන්ගේ වෘත්තිකයන්ගේ දැනුම හුවමාරු කර ගැනීම තුළින් බුද්ධිමය දේපල හඳුනා ගැනීම සහ ප්‍රාග්ධනීකරණය කිරීම සහ බුද්ධිමය දැනුම සමාජය වෙත ප්‍රවේශය සැලසීම

2.4.1 අපගේ පර්යේෂණ සාර්ථකත්වය ආර්ථික, පාරිසරික, සෞඛ්‍ය හා අවසානයේ සමස්ත සමාජයේ යහපත වෙනුවෙන් යෙදවීම

2.4.2 දැඩි කථාබහක් සහිත මාතෘකා සම්බන්ධ දැනුම හුවමාරුව, මහජන සහභාගීත්වය සහ උපදේශනය වැඩි දියුණු කිරීම සඳහා පෙළඹවීම

2.4.3 ඉලක්කගත හා ක්‍රියාශීලී මැදිහත් වීමක් තුළින් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් සමඟ දිගු කාලීන, තිරසාර සම්බන්ධතා වර්ධනය කිරීම

2.6.1 පර්යේෂණ අරමුදල් සපයන්නන් සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයක් සුරක්ෂිත අයුරින් පවත්වා ගැනීම

2.6.2 කැපී පෙනෙන කලාපීය හා ගෝලීය පර්යේෂණ සහයෝගීතා දිරිගැන්වීම ඇතුළුව බහු න්‍යායාත්මක පර්යේෂණ සඳහා නව ප්‍රවේශයන් සංවර්ධනය කිරීම

2.6.3 නවෝත්පාදනයන්ට සහාය වීම සඳහා ව්‍යාපාරික හා මූල්‍ය ප්‍රජාව සමඟ සම්බන්ධතා වර්ධනය කිරීම.

2.6.4 විදේශ අරමුදල් සුරක්ෂිත කිරීම වෙනුවෙන් අපගේ ප්‍රවේශය වෘත්තීයකරණය සහ අරමුදල් ලබා ගැනීම සඳහා සාර්ථක ලෙස තරග වැදීමට අපගේ පර්යේෂණ ස්ථානගත කිරීම

2.6.5 හවුල්කරුවෙකු ලෙස හවුල්කාරිත්ව කර්තව්‍යයන් වලට අවස්ථාවක් ලබා ගැනීම සඳහාත් සහ නව සමාගම්, ව්‍යාපෘති, නිෂ්පාදන සංවර්ධනය සහ නිර්මාණය සඳහා විශාල වශයෙන් ආධාර ලබාදෙන ආධාරකරුවෙකු ලෙස අපගේ කීර්තිය භාවිතා කිරීම.

පහසුකම් සපයන්නන් :

**උපාය මාර්ගික අරමුණු අංක 3: මිනිසුන්**

**වීශ්වවිද්‍යාලීය පරිසරය වැඩ කිරීමට පහසු සහ උත්තේජක ස්ථානයක් බවට පත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ හැකියාවන් සියල්ල අගය කිරීම, සහාය දීම, සංවර්ධනය කිරීම සහ ඒවා ඵලදායි ලෙස උපයෝගී කර ගැනීම**

අපගේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ සාර්ථකත්වය මුළුමනින්ම රඳා පවතින්නේ අපගේ සියළුම අධ්‍යයන පීඨ හා කාර්ය මණ්ඩලයේ කැපී පෙනෙන ක්‍රියාකාරිත්වය සහ දායකත්වය මත ය

මෙම පහසුකම් සපයන්නා සමඟ සම්බන්ධ වනුයේ :

- **සමානාත්මතාවය**
- **සජීවී ප්‍රජාව**
- **සමාජ වගකීම්**
- **ජාතික සංවර්ධනය**

ප්‍රධාන අරමුණු :

තුන්වන අරමුණ ළඟාකර ගැනීම සඳහා අප විසින්:

3.1 ලොව වටා සිටින දක්ෂ පුද්ගලයන් වෙත ප්‍රවේශ වෙමින් එවැනි පුද්ගලයින් ආකර්ෂණය කර ගනිමින් ඔවුනට ප්‍රතිලාභ ලබා දීම

3.2 ගුණාත්මකභාවයෙන් යුතු පර්යේෂණ හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම ඉහල නැංවීම සඳහා අපගේ සමස්ත කාර්ය මණ්ඩලයේ දැනුම, හැකියාවන් සහ කුසලතා වැඩි දියුණු කිරීම

3.3 අභිමානය, ගෞරවය, විවිධත්වය, සෞඛ්‍යය සහ යහපැවැත්මට අනුබල දෙන සහායක සහ සාමූහික පරිසරයක් නිර්මාණය කිරීම.

උපාය මාර්ග

අපගේ අරමුණු ළඟාකර ගනුයේ පහත අයුරින් වේ :

3.1.1 කලාපීය හා ගෝලීය වශයෙන් වැදගත් ආයතනයක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ නව කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වඩාත් ඵලදායී කිරීමට සහාය වීම.

3.1.2 විශිෂ්ටත්වයට හා සාර්ථකත්වයට විවිධාකාරයෙන් ප්‍රතිලාභ ලබා දීම

3.1.4 අපගේ අනාගත අභියෝගාත්මක අවශ්‍යතා සපුරාලන තිරසාර කාර්ය මණ්ඩල පැතිකඩක් පවත්වා ගැනීම

3.2.1 වෘත්තීයභාවය, වෘත්තීය සංවර්ධනය සහ දියුණුව සඳහා සහාය වීම තුළින් විවිධ කුසලතා සකස් කිරීම , පාලනය කිරීම සහ මෙහෙයවීම සඳහා දිරිගැන්වීම සහ සුදානම් කිරීම පිණිස අපගේ කාර්ය මණ්ඩලය තුළ උපායමාර්ගිකව ආයෝජනය කිරීම.

3.3.1 නම්‍යශීලී, අන්තර් ක්ෂේත්‍ර (අධ්‍යයන), කණ්ඩායම් වැඩ සහ එකඟතා ප්‍රවේශයන් තුළින් සමබර වැඩ-ජීවිතය ප්‍රවර්ධනය කිරීම

3.3.2 ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි හා ප්‍රසන්න සේවා පරිසරයක් සැපයීම

3.3.3 ඵලදායි සේවක නියුක්ත වීම සහ සවිබල ගැන්වීම, විනිවිදභාවය සහ සාර්ථක සන්නිවේදනය තුළින් සාමූහිකත්වය, ඉවසීම, දයානුකම්පාව සහ ශක්තිමත් ආචාර ධර්ම වලින් සවිමත් අපගේ සංස්කෘතියේ ගුණාංග වැඩිදියුණු කිරීම.

**උපාය මාර්ගික අරමුණු අංක 4:** යටිතල පහසුකම්

**ඉතා උසස් අධ්‍යයන සහ උපකාරක ක්‍රියාකාරකම් පවත්වා ගැනීම සඳහා අති නවීන, කාර්යක්ෂම හා උත්තේජක ඉගෙනුම් හා වැඩ කරන පරිසරයක් සැපයීම.**

අපගේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට උසස් තත්වයේ යටිතල පහසුකම් යනු යතුරකි.

මෙම පහසුකම් සපයන්නා සමඟ සම්බන්ධ වනුයේ**:**

- ඉගෙනුම සහ අධ්‍යාපනය
- මිනිසුන්
- සමාජ වගකීම්

ප්‍රධාන අරමුණු **:**

සිවුවැනි අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

4.1 හරිත සංකල්පය සැලකිල්ලට ගනිමින් අපගේ භෞතික, පුස්තකාල, තොරතුරු තාක්ෂණය සහ අනෙකුත් යටිතල පහසුකම්වල සියළු අංග හරහා ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම

4.2 පවත්නා අවකාශය කළමනාකරණය කරන අතරම අපගේ උරුමයේ ප්‍රධාන අංගයක් වන පෞරාණික ගොඩනැගිලි ඇතුළු නව වැදගත් පහසුකම් ගොඩනගමින් අප පරිශ්‍රයේ වටිනාකම හා තිරසාර බව ඇගයීම.

උපාය මාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

4.1.1 විවිධ අදහස් ඇති පුද්ගලයන්ගෙන් සැදී කාර්ය මණ්ඩලයේ, ශිෂ්‍යයන්ගේ සහ පුළුල් ප්‍රජාවේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා අපගේ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම

4.1.2 සම්පත් පරිභෝජනය ප්‍රශස්ත කිරීම සඳහා ඔරොත්තු දීමේ හැකියාව ඇති තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය පද්ධතියක් ස්ථානගත කිරීම

4.1.3 විශ්ව විද්‍යාලය සතු වටිනාකමක් සහිත විවිධ සම්පත් සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම

4.1.4 අපගේ සමස්ත යටිතල පහසුකම් සැලසුම් ක්‍රියාවලිය තුළ තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් සහ ප්‍රධාන උපකරණ ප්‍රසම්පාදනය ඵලදායි ලෙස ඒකාබද්ධ කිරීම (අනාගත තාක්‍ෂණික සංවර්ධනය හඳුනා ගැනීම සහ මේවාට ක්ෂණිකව හා නම්‍යශීලීව ප්‍රතිචාර දැක්වීමට ක්‍රියා කිරීම ).

4.1.5 ඉගෙනීම, ඉගැන්වීම, පර්යේෂණ කිරීම සහ ඵලදායී තීරණ ගැනීම සඳහා සහාය වීම සඳහා තත්‍ය කාලීන සහ මාර්ගගත තොරතුරු පද්ධති ඇති කිරීම (අපගේ සම්පත් අත්පත් කර ගැනීම, නිර්මාණය කිරීම, රඳවා තබා ගැනීම, ගබඩා කිරීම, ඉදිරිපත් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් ගැනීම)

4.2.1 කාර්යක්‍ෂම සහ වේගවත් ව්‍යපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

4.2.2 අවශ්‍ය අවස්ථාවන්හිදී ව්‍යාපෘති ඒකාබද්ධ කිරීම සහ නැවත සකස් කිරීම.

4.2.3 අනාගත ඉල්ලීම් සඳහා නව ඉඩක් ලබා ගැනීම සහ පවතින අවස්ථාව උපරිම අයුරින් භාවිතා කිරීම

4.2.4 අපගේ අවකාශය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සඳහා මුදල් යෙදවීම සහ මුදල් සඳහා වැඩි වටිනාකමක් ලබා දීම (මෙය අපගේ කාලසටහන් ප්‍රතිපත්තියේ දිගුකාලීන අරමුණු ඉටු කිරීම, කුඩා ගොඩනැගිලි වැඩි ප්‍රයෝජනයක් ගැනීම සහ අධ්‍යයන පීඨ අතර අවකාශය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මනා සන්නිවේදනයක් පවත්වා ගැනීම ).

**උපාය මාර්ගික අරමුණු අංක 5: මූල්‍යකරණය**

**තිරසාර තරඟකාරී තත්ත්වයක් ගොඩනැගීම සඳහා සමස්ත මූල්‍ය ශක්තිය පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම**

විශ්ව විද්‍යාලයේ සියළුම උපාය මාර්ගික අරමුණු හා අභිමතාර්ථ ලඟා කර ගැනීම අපගේ සමස්ත මූල්‍යමය හැකියාව මත රඳා පවතී

ප්‍රධාන අරමුණු **:**

පස්වැනි අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

5.1 සුරක්ෂිත දිගුකාලීන මූල්‍ය ශක්‍යතාවයක් පවත්වා ගැනීම

5.3 වගවීම, විනිවිදභාවය, අඛණ්ඩතාව සහ මූල්‍ය පාලනය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් සහතික කිරීම

5.4 අපගේ සියලු ක්‍රියාකාරකම් කාර්යක්ෂමව හා නිසි වේලාවට ක්‍රියාත්මක කිරීම

5.5 මනා විශ්ව විද්‍යාල යහපාලනයක් සහතික කිරීම

උපායමාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

5.1.1 ආර්ථික හා අරමුදල් සපයන පරිසරය සක්‍රියව අධීක්ෂණය කිරීම සහ සියළු ප්‍රධාන තීරණ වල දිගුකාලීන මූල්‍ය සබඳතා තක්සේරු කිරීම මගින් අපගේ සම්පත් උපාය මාර්ගික ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීම

5.1.2 අපගේ දිගුකාලීන මූල්‍ය අනාවැකි නිතිපතා යාවත්කාලීන කිරීම සහ තීරණ ගැනීමේදී මේවා මාර්ගෝපදේශ ලෙස භාවිතා කිරීම.

5.1.3 අපගේ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමට සහ නව තිරසාර ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමට අපගේ අරමුදල් සුරක්ෂිත කිරීම සහ කළමනාකරණය කිරීම

5.2.1 වරින් වර අපගේ මූල්‍ය උපායමාර්ග සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සහ අපගේ මූල්‍ය තිරසාරභාවය පිළිබඳ වාර්ෂික තක්සේරුවක් ලබා ගැනීම.

5.4.1 මූල්‍යමය වශයෙන් තිරසාර අධ්‍යාපනයේ පුළුල් පරාසයක් සහ නැවත ආයෝජනය සඳහා අතිරික්තයක් ජනනය කරන වාණිජ ක්‍රියාකාරකම් තුළින් අපේ ආදායම වර්ධනය කිරීම හා විවිධාංගීකරණය කිරීම

5.5.1 අපගේ ආයෝජන හා භාණ්ඩාගාර උපාය මාර්ග ඔස්සේ විශ්ව විද්‍යාලයට උපරිම මූල්‍ය ප්‍රතිලාභ ලැබීම සහතික වීම සහ අදාළ ක්‍රියාකාරකම් සඳහා උපරිම මූල්‍ය ආධාර සැපයීම.

5.5.2 තීරණ ගැනීම සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා අපගේ විශ්ව විද්‍යාල පාලන රාමුව වැඩි දියුණු කිරීම.

**උපාය මාර්ගික සම්බන්ධතා:**

**උපාය මාර්ගික අරමුණු අංක 6: විශිෂ්ඨ ශිෂ්‍ය අත්දැකීම්**

**තම අධ්‍යයනවලින් ඔබ්බට යමින් ජීවිතය සඳහා සූදානම් වීමට සිසුන්ට සුවිශේෂී හා ගුණාත්මක අත්දැකීමක් ලබා ගැනීමට අවස්ථාව නිර්මාණය කිරීම**

මෙම පහසුකම් සපයන්නා සමඟ සම්බන්ධ වනුයේ:

- ඉගෙනුම සහ අධ්‍යාපනය
- පර්යේෂණ සහ සංවර්ධනය
- සජීව ප්‍රජාව
- සමාජ වගකීම්

ප්‍රධාන අරමුණු :

හයවන අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

6.2 අපගේ අධ්‍යයන හා මානුෂික ආධාරක රාමුව පුනර්ජීවනය කිරීම .
6.3 ඉගෙනුම් ප්‍රජාවක කොටස් කාරයන් වීම පිළිබඳ අපගේ සිසුන් හා ආදි ශිෂ්‍යයින් තුළ සැබෑ හැඟීමක් ඇති කිරීම.
6.5 සිසුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යය, යහපැවැත්ම සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම .
6.6 කලාපීය හා ගෝලීය සහභාගී වීම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

උපාය මාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

6.2.1 සිසුන්ට අත්දැකීම් ලබා ගැනීම පහසු කිරීම සඳහා අපගේ සබඳතා වැඩිදියුණු කිරීම

6.3.1 අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා ආදි ශිෂ්‍යයන් සමඟ දීර්ඝකාලීන සම්බන්ධතා ඇති කර ගැනීම සහ අපගේ ශිෂ්‍යයන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම.

6.5.1 සියළු ආකාරයේ මානසික හා ශාරීරික සෞඛ්‍යය, යහපැවැත්ම සහ ආරක්ෂිත කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශ්ව විද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම.

6.5.2 සිසුන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සහතික කරමින් ශිෂ්‍ය සුභසාධන පහසුකම් වැඩි දියුණු කිරීම.

6.6.1 අපගේ උපාධිධාරීන්ට කලාපීය හා ගෝලීය ප්‍රජාව තුළ ඔවුන්ගේ පූර්ණ හැකියාවන් ළඟා කර ගැනීමට අවශ්‍ය විශේෂඥතාව හා ගුණාංග වලින් සවිමත් පහසුකම් සැලසීම.

**උපාය මාර්ගික අරමුණු අංක 7: සජීවී ප්‍රජාව , සමාජ වගකීම් , ජාතික සංවර්ධනය සහ ගෝලීය / කලාපීය බලපෑම්**

**සජීවී ප්‍රජාව නඟා සිටුවීම සහ පාර්ශවකරුවන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතා තුළින් ජාතික, කලාපීය සහ ගෝලීය සංවර්ධනයට දායක වීම**

මෙම උපාය මාර්ගික කාර්යයන් හා සම්බන්ධ වනුයේ:

- ඉගෙනීම් සහ අධ්‍යාපනය
- පර්යේෂණ සහ සංවර්ධන යටිතල පහසුකම්

ප්‍රධාන අරමුණු :

හත්වන අරමුණ ළඟාකර ගැනීම සඳහා , අප විසින්:

7.1 අපගේ සම්පත් සහ විශේෂඥතාව පුළුල් ලෙස ලබා ගත හැකි අයුරින් සකස් කිරීම සහ වගකිවයුතු සහ බලගතු උපදේශකයෙකු, අසල්වැසියෙකු හා සේවා යෝජකයෙකු ලෙස ක්‍රියා කිරීම

7.2 ජීවිත කාලය පුරාම සම්බන්ධතා පැවැත්වීම තුළින් ආදි ශිෂ්‍යයින්ගේ සහ ආශ්‍රිත ජාලයන්හි දැනුවත්, නියැලී සිටින සහ සහාය දක්වන ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවක් ගොඩනැගීම.

7.3 ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සහ අපගේ ප්‍රජාවට පහසුකම් සැලසීම සඳහා ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ කොන්දේසි නිර්මාණය කිරීම සහ විශ්ව විද්‍යාලය තුළ සහ ඉන් ඔබ්බට සමාජ වගකීම් සහ තිරසාරභාවය සඳහා දායක වීමට පෙළඹවීම

7.4 අපගේ කාර්යයන් වලට අදාලව ජාතික සංවර්ධනය සඳහා උපරිම දායකත්වය ලබාදීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ජාතික ආයතන සමඟ ශක්තිමත් සහයෝගීතාවයක් ඇති කිරීම සහ එමඟින් වෙනසක් ඇති කිරීමට ක්‍රියා කිරීම

7.5 අපගේ අභිලාෂයන් තුළින් සමස්තයක් ලෙස විශ්ව විද්‍යාලයේ සහ සමාජයේ යහපත සඳහා ගෝලීය වශයෙන් ක්‍රියා කිරීම

උපාය මාර්ග

අපගේ අරමුණු ලඟාකර ගනුයේ පහත අයුරින් වේ :

7.3.3 අපගේ ප්‍රධාන සමාජ, පාරිසරික හා ආර්ථික බලපෑම් නිරූපණය කිරීම.

7.3.5 නැවත භාවිතා කිරීම, අපද්‍රව්‍ය අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය උපරිම කිරීම, පුනර්ජනනීය බලශක්තිය (ජෛව වායු / සූර්ය) භාවිතා කිරීම සහ විශ්ව විද්‍යාලය තුළ සහ ඉන් පිටත වනාන්තරකරණය සඳහා හරිත සංකල්ප ප්‍රවර්ධනය කිරීම.

7.4.1 මහජන කටයුතුවල නියැලීම අපගේ අරමුණෙහි ප්‍රධාන අංගයක් බවට අපගේ මතය ඉදිරිපත් කිරීම සහ පර්යේෂණ වල හිතකර බලපෑම් ඔස්සේ මෙම ක්ෂේත්‍රයේ සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම, හඳුනා ගැනීම සහ සැමරීම